# 2011 වර්ෂය සඳහා
# පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලන වාර්තාව


**සෙනරත් බණ්ඩාර දිසානායක**

**MSc, PhD.**

2025

**2011 වර්ෂය සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලන වාර්තාව**

ආචාර්ය සෙනරත් බණ්ඩාර දිසානායක

© පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ISBN 978-624-5840-29-8

# ගවේෂණ හා ලේඛනගත කිරීම් අංශය

## ප්‍රධාන කාර්යාලය විසින් සිදුකරන ලද කටයුතු

**ක්‍රියාත්මක කරන ලද ගවේෂණ ව්‍යාපෘති**

**පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් සමීක්ෂණ**

මෙම වර්ෂයේ පහත සඳහන් බලපෑම් ඇගයීම් සමීක්ෂණ ව්‍යාපෘති ගවේෂණ අංශය මගින් සිදු කරන ලදී.

**මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය**

කඩිනම් මහවැලි යෝජනා ක්‍රමය යටතේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා සංවිධාන ආධාර මත (JICA) ඉදිවන මොරගහ ජලාශ ව්‍යාපෘතියේ දී, මොරගහකන්ද ජලාශයට යටවන භූමියේ පවතින පුරාවිද්‍යා ස්ථාන හඳුනාගැනීම හා ජලාශය ඉදිකිරීම මඟින් එම පුරාවිද්‍යා ස්ථානවලට සිදුවන හානිය අවමකර ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග තීරණය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ග්‍රාම නිලධාරී වසම් 13කට අයත් වන අඹන් ගඟ දෙපස බිම් තීරය ගවේෂණයට ලක් වූ අතර ග්‍රාම නිලධාරී වසම් 7ක් මුළුමනින් ම ජලාශයට යට වන බව හඳුනා ගැනිණි.

**හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන**

1) පට්ටිපොල ගල් කෙවෙනි
2) කඹරව බෙත්තාලෝක විහාරය
3) කඹරව අටුව බැන්ද ගල
4) රජාවෙල වෙහෙරගොඩැල්ල පුරාවිද්‍යා ස්ථානය
5) රජාවෙල වෙහෙරගොඩැල්ල - නටබුන් ගොඩැල්ල
6) රාජාවෙල වෙහෙරගොඩැල්ල - යබොර ගොඩැල්ල
7) මැදකිඳ වෙහෙර ගොඩැල්ල
8) කෝන්ගහවෙල බෝධිය
9) කෝන්ගහවෙල මංසන්ධිය අසල ගොඩනැගිලි ශේෂ
10) මොරගොල්ල තලංගමුව පුරාවිද්‍යා ස්ථානය
11) දම්මැන්නාතැන්න ගල්ලෙන පුරාවිද්‍යා ස්ථානය
12) ගලබොඩ වලව්ව
13) ඇළගමුව බෝමළුව
14) ඇළගමුව අස්වැන්දුම වත්ත
15) ඇළගමුව කේ. ජී. පැලිස් මයාගේ ඉඩමේ නටබුන්
16) මැදපිහිල්ල වෙහෙර ගොඩැල්ල
17) තලාගොඩ වෙහෙර ගොඩැල්ල පුරාවිද්‍යා ස්ථානය
18) ඇළහැර ටැම් ලිපිය

19) ඇළහැර අමුණේ පිටවාන

20) ඇළහැර පැන්නුම යන ස්ථාන පුරාවිද්‍යාත්මක අගයක් සහිත ස්මාරක සහිත ස්ථාන වේ.

**නිගමන**

ක්‍රිස්තු වර්ෂ මූලාරම්භයේ බිහි වූ ඉපැරණි වාපි තාක්ෂණය මැනවින් විද්‍යමාන වන පැරණි අමුණක් ලෙස ඇළහැර අමුණ සැලකිය හැකි ය. මහවැලි ගඟ ආශ්‍රිත ව වාරි තාක්ෂණයේ තීව්‍ර අවස්ථාවක්වන ඇළහැර අමුණ පොළොන්නරුවේ ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි සෘජුව ම බලපා ඇත. පාරිසරික තත්වය පිළිබඳ ව මනා හැදෑරීමකින් පසුව අමුණක් සඳහා සුදුසු ම ස්ථානය තෝරා ගැනීමත්, දිගු කාලීන පැවැත්ම සඳහා සුදුසු වූ අපාරගම්‍ය පාෂාණ තට්ටුව හා වෙනත් ස්වභාවික සම්පත් මනා කළමනාකරණයකින් යුතුව භාවිත කළ අයුරුත් පැහැදිලි වේ.

අතීත සම්පත් පරිහරණය, ශ්‍රම සම්පත්, ශ්‍රම ශක්තිය හඳුනාගැනීම හා ද්‍රව්‍ය හා ශ්‍රම සම්පත් මනා කළමනාකරණයකින් යුතුව භාවිත කිරීමත්, ඒ තුළින් මනා කළමනාකරණය හා දේශීය කෘෂි ආර්ථිකය ගොඩනැංවීමට අතීත ශ්‍රී ලාංකිකයාගේ දායකත්වය සඳහන් කිරීම නිදසුනක් ලෙස ඇළහැර අමුණ හඳුනාගත හැකි ය.

**ජලාශය ඉදිකිරීම නිසා ස්ථානයට සිදුවන බලපෑම**

උක්ත ජලාශය ඉදිකිරීමෙන් ස්ථානය යටවීමත් හෝ හුදකලාවීමක් සිදු නොවේ. ජලාශය ඉදිකිරීම මගින් අමුණ වෙත පාලනයකින් යුතුව ජලය මුදාහැරීමට හැකිවන අතර, පැරණි අමුණ මගින් ජලය බෙදා හරින ලද කෘෂි ක්ෂේත්‍රය තවදුරටත් පුළුල්වීම මෙමගින් සිදු වේ.

**යෝජනා**

01. පැරණි අමුණේ ඉවුරු නිසි ලෙස දිගුකාලීනව නඩත්තු නොවීම නිසා ගැලවී ගිය කොටස් පවතී. අතීත වාරි තාක්ෂණයේ උරුමය කියාපාන ස්ථානයක් ලෙස සංරක්ෂණය කිරීම ඉතා වැදගත් වන අතර අවම තරමින් මෙහි නැගෙනහිර ඉවුර සංරක්ෂණය කර තහවුරු කිරීම වැදගත් වේ.

02. උක්ත ස්ථානයේ නැගෙනහිර ඉවුර සංරක්ෂණය සඳහාත්, සාචාරකයන් දැනුවත් කිරීම සඳහාත් අදාළ ස්ථානයේ විස්තරාත්මක පුවරුවක් ද මාර්ග සංඥා පුවරුවක් ද ඇළහැර නාඋල ප්‍රධාන මාර්ගයේ යෙදීමත් වැදගත් වේ.

03. එසේම මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියේ යෝජිත කෞතුකාගාරය සඳහා රූප රාමු එලක හා විස්තර ඇතුළත්කර ස්ථානය පිළිබඳ ප්‍රදර්ශන පුවරු යෙදීම ද වඩාත් සුදුසු බව පෙනී යයි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන ලදී.

- ❖ ජලාශයට යටවන තලාගොඩ පුරාවිද්‍යා ස්ථානය කැණීම්කොට තවදුරටත් ස්ථානය හඳුනා ගැනීමෙන් පසු සංරක්ෂණය කිරීම.
- ❖ මැදකිඳ වෙහෙරගොඩැල්ල ලෙස හඳුන්වන ස්ථානය කැණීම්කොට සංරක්ෂණය කිරීම.

- ❖ ඇළගමුව ග්‍රාමයේ හමුවන නටබුන් ස්මාරකවල තවදුරටත් තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා කැණීම් සිදුකිරීම.
- ❖ ඇළගමුව අස්වැද්දුම ඉඩමේ නටබුන් කැණීම් කිරීම.
- ❖ මැදපිහිල්ල වෙහෙරගොඩැල්ල ලෙස හඳුන්වන ස්මාරක භූමියේ ඉහළ බැම්ම සහ ආශ්‍රිත ස්මාරක කැණීම්කොට සංරක්ෂණය කිරීම.
- ❖ හුදකලා වන ප්‍රදේශ ලෙස හඳුනා ගනු ලැබ තිබුණ ද එය එතරම් දුඩිව බලනොපාන රජාවෙල වෙහෙර ගොඩැල්ල නටබුන් ස්ථානය කැණීම්කොට සංරක්ෂණය කිරීම.
- ❖ මොරගොල්ල තලංගමුව ගම්මානය ජලයෙන් යටවන අතර මොරගොල්ල තලංගමුව පුරාවිද්‍යා ස්ථානයට මඳක් දුරින් ජලාශයේ රක්ෂිත කලාප මායිම්කොට ඇති බැවින් මොරගොල්ල පුරාවිද්‍යා ස්ථානය කැණීම්කොට වැඩිදුරටත් තොරතුරු අනාවරණය කර ගැනීම.

**I. ලුණුගම්වෙහෙර යෝජිත පළතුරු වගාකිරීමේ ව්‍යාපෘතිය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහඅලුත්ගම්ආර අංක 47 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මහඅලුත්ගමආර ග්‍රාමයේ මෙම ඉඩම පිහිටා ඇත. දැනට පළතුරු වගාව සඳහා සංවර්ධනය කර ඇති අතර ඝන කැලෑ ප්‍රදේශය තුළ මෙම ගවේෂණය සිදු කරන ලදී.

ඒ අනුව වනගතව පවතින කිසිදු කටයුත්තක් සඳහා යොදාගෙන නොමැති මායිම් සීමාවේ මීටර් 2ක් පමණ තිරස්ව කැලය ඉවත් කර ඇති කොටසේ ස්ථාන කිහිපයක ම සුලභව පැරණි මැටි බඳුන් කැබලි හමු විය. එමෙන් ම අත්හැර දමන ලද වැවක් වූ ගොඩැන් බැඳි වැව ආශ්‍රිත පැරණි මැටි බඳුන් කැබලි සුලභව හමු වේ.

එබැවින් වගා කටයුතු සිදුකිරීමේ දී එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂා කළ යුතු බවත් සංවර්ධනය කර නොමැති ඉඩමේ ඉදිකිරීම් සිදු නො කළ යුතු බවටත් නිර්දේශ ලබා දෙන ලෙස මෙම සංවර්ධන යෝජනාවලියෙන් ඉදිරිපත් විය. අලුතින් වැවක් ඉදිකිරීම දක්වා තිබූ අතර එවැනි කටයුත්තක් සිදු වේ නම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදුකළ යුතු බවට යෝජනා ඉදිරිපත් කරන ලදී.

**II. කළුගල් කැඩීමේ ව්‍යාපෘතිය වැල්ලවාය අංජලීගම**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුගයාය ග්‍රාම නිලධාරී වසමේ, වඳිනහෙල නම් කඳුයාය ආශ්‍රිතව පිහිටි එක් පර්වතයක කළුගල් කැඩීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා (වසරක කාලයකට) 2010.06.29 දින පුරාවිද්‍යා නිර්දේශය ලබා දෙන ලදී. ඒ සඳහා පැමිණි විරෝධතා හේතුවෙන් නැවත ගවේෂණය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර අවට ප්‍රදේශයේ පුරාවිද්‍යා සාධක ඇත්දැයි පරීක්ෂා කරන ලදී.

ඒ අනුව ගල්බිඳුම් සිදුකරන ස්ථානයේ පුරාවිද්‍යා සාධක හමු නොවිය. ගල් බිඳුම් ස්ථානයෙන් මීටර් 300ක් පමණ උතුරු දෙසින් පිහිටි විහාරස්ථානය ආශ්‍රිතව චතුරස්‍රාකාර හැඩැති බොරදම් සහිත ගල් පුවරු, අනුරාධපුර යුගයට අයත් ගඩොල් හමු විය. එමෙන් ම කඳුවැටියට ගමන් කරන මාර්ගයේ ගරා වැටුණු දාගැබ් ගොඩැල්ලකි. මෙම විහාර භූමියේ පුරාසාධක විනාශ වී ඇති බව බලපෑම් ඇගයීම් වාර්තාවෙහි සඳහන් කර ඇත.

**III. ෆොරස්ට් රොක් ගාඩ්න් හෝටල් ව්‍යාපෘතිය - අනුරාධපුර (කොඩ්ඩියාගම අන්දරවැව)**

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 341 අන්දරවැව ග්‍රාමයේ මෙම හෝටල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා විය. මෙම හෝටල් ව්‍යාපෘතිය අක්කර 100ක පමණ භූමි ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ය. ඒ අනුව පළමු අදියර යටතේ අක්කර 50ක භූමිය තුළ ඉදිකිරීම් සිදු කිරීමට යෝජනා වී ඇත. ඒ අනුව හෝටල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන භූමියේ නැගෙනහිර දෙසින් පැරණි ගල් බිඳුම් ලක්ෂණ (Cut marks) දක්නට ලැබෙන අතර අඩක් යට වූ ගල් පුවරු කොටස් ද හමු විය. පළමු අදියරට අයත් අක්කර 50 තුළ කිසිදු පුරාවිද්‍යා සාධකයක් හමු නොවීය. එම භූමියට නැගෙනහිර දෙසින් පිහිටි සිරම්බාගම වැවට ගලා යන ඇළ මාර්ග කිහිපයක් ම මේ කොටස තුළ පිහිටා තිබේ.

ලබාගත් නිරීක්ෂණ අනුව ගල්කටු ලක්ෂණ සහිත ස්ථානයට හානියක් නොවන පරිදි ඉදිකිරීම් කටයුතු සිදුකිරීමටත් ලබා දී ඇති නිර්දේශවලට අනුව පුරාවිද්‍යා සාධක නොමැති බැවින් මෙම හෝටල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

**IV. කළුගල් කැඩීමේ ව්‍යාපෘතිය - සෙවනගල නුගේගලයාය**

මොණරාගල දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුගේගලයාය ග්‍රාම නිලධාරී වසමේ මෙම ස්ථානය පිහිටා ඇත.

මෙම කළුගල් ව්‍යාපෘතිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් පෙර අවස්ථාවක තහනම්කොට ඇති ව්‍යාපෘතියකි. මෙම භූමියට යාබඳව පිහිටි යෝජිත භූමිය ආශ්‍රිතව පිහිටි ගල් තලාව ආශ්‍රිතව කිසිදු පුරාවිද්‍යා සාධකයක් හමු නොවීය. ගල්තලාව මතුපිට පුරාවිද්‍යා සාධක හමු නොවූ බැවින් ව්‍යාපෘතිය පවත්වා ගෙන යාම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත.

**V. කළුගල් කැඩීමේ ව්‍යාපෘතිය වව්නියාව - නාවක්කුලම**

උතුරු පළාතේ, වව්නියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වව්නියාව දකුණ සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැදුන්කුලම ග්‍රාමයේ නාවක්කුලම ග්‍රාමයේ මෙම ස්ථානය පිහිටා ඇත. ඒ අනුව උතුරු, උතුරුමැද පළාත සහ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් එක් වී බලපෑම් ඇගයීම් සමීක්ෂණය සිදුකරන ලදී. යෝජිත භූමිය පුරා ගවේෂණය සිදු කළ ද කිසිදු පුරාවිද්‍යාත්මක සාධකයක් අනාවරණය නොවීය. එබැවින් මේ සඳහා අවසර ලබාදීමට යෝජනා ඉදිරිපත් කර ඇති අතර එහි දී පසුවිපරම් සිදුකිරීම අවශ්‍ය බවත් වාර්තාගත කර ඇත.

**පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක ප්‍රකාශයට පත්කිරීම**

පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක වශයෙන් පහත සඳහන් දිස්ත්‍රික්කවලට අදාළව ආරක්ෂිත ස්මාරක ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව ආරක්ෂිත ස්මාරක 134 ක් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

| දිස්ත්‍රික්කය | ස්මාරකය පිහිටි ස්ථානය | ස්මාරකය | ගැසට් අංකය/දිනය |
|---|---|---|---|
| අනුරාධපුරය | ගලපිටගල නාග විහාර භූමිය | කටාරම් සහිත ලෙන, නාගපෙණ සහිත ලෙන | 2011.07.22 1716 |
| | ගල්ලෑව වන රක්ෂිතය | කටාරම් සහ බ්‍රාහ්මීය අක්ෂර සහිත ලෙන්, ස්තූපය සහ පොකුණ | 2011.07.22 1716 |
| | ඒරුවැව කදුවැටිය | කටාරම් සහිත ලෙන් සහ ගල් කෙමි | 2011.07.22 1716 |
| | කහල්ල පුරාවිද්‍යා ස්ථානය | පැරණි ස්ථූපය සහ ගල් කණු සහිත ගොඩනැගිල්ල | 2011.07.22 1716 |
| | මොරොත්තේගම තිසල ආරණ්‍ය සේනාසන භූමිය | කටාරම් සහ ශිලා ලිපි සහිත සියලුම ලෙන් සහ පර්වත ලිපිය | 2011.07.22 1716 |
| | ඇල්ලවැව නැමති ප්‍රදේශය | පියගැටපෙළ, පොකුණ සහ වෙනත් පුරා විද්‍යාත්මක සාධක සහිත ගල් තලාව | 2011.07.22 1716 |
| | දියතිත්ත වැව සෙන්පති නන්දිමිත්‍ර ආරණ්‍ය සේනාසනය | කටාරම් සහිත සියළුම ලෙන් | 2011.07.22 1716 |
| | ගල්කිරිකන්ද ශ්‍රී භාතිකතිස්ස රජමහා විහාරය | පර්වත ලිපිය කටාරම් සහ බ්‍රාහ්මීය අක්ෂර සහිත ලෙන් | 2011.07.22 1716 |
| | මහඇළගමුව | පැරණි අම්බලම | 2011.07.22 1716 |
| | දානියගල ශ්‍රී වනසිංහ රජමහා විහාරය | කටාරම් සහිත ලෙන්, පැරණි ස්ථූපය, ටැම්පිට ගොඩනැගිල්ල | 2011.12.30 1739 |
| | මහකුඹුක්ගොල්ලෑව ශ්‍රී දළදා විහාර භූමිය | ටැම්පිට ගොඩනැගිල්ල | 2011.12.30 1739 |
| | කහටගස්දිගිලිය ගෝණගිරි රජමහා විහාර භූමිය | ලෙන් විහාර ඇතුළු කටාරම් කෙටූ සියලුම ලෙන්, පියගැටපේළි, පොකුණු සහ පැරණි දාගැබ් | 2011.12.30 1739 |
| | පහළතලාව ජයසුන්දරාරාම විහාර භූමිය | ගල්කණු, පාදම් ගල් සහිත නටබුන් | 2011.12.30 1739 |
| | අන්දරවැව ශෛල බිම්බාරාම විහාර භූමිය | පැරණි දාගැබ්, ගොඩැල්ල ගොඩනැගිලි නටබුන් ප්‍රතිමා ගෘහය | 2011.12.30 1739 |
| | මලියදේවපුර තෙල්හිරියාව පුරාණ විහාර භූමිය | පැරණි පියගැට පෙළ, පොකුණ නටබුන් ගොඩනැගිලි දෙක | 2011.12.30 1739 |
| | බිල්ලෑව බරතනාග ලෙන් සේනාසන භූමිය | සිතුවම් සහ බ්‍රාහ්මීඅක්ෂර සහිත සියලුම ලෙන්, සහ වෙනත් පුරාවිද්‍යාත්මක සාධක | 2011.12.30 1739 |
| මොණරාගල | බඹරගල | කටාරම් සහිත ලෙන් | 2011.07.22 1716 |
| | වෙට්ටබුගල | කටාරම්, ලෙන්ලිපි සහ සිතුවම් සහිත සියලුම ලෙන්, පියගැටපෙළ, පර්වත ලිපිය 2 | 2011.12.30 1739 |
| කුරුණෑගල | කොටදෙනියාව ජනපදය ශ්‍රී සාරානන්ද බෞද්ධ මධ්‍යස්ථාන භූමිය | ශිලා කුළුණු සහිත නටබුන් ගොඩනැගිල්ල, පර්වත ලිපි | 2011.12.30 1739 |

| | | | |
|---|---|---|---|
| | මාළිගාවිල පුජාරාම පූර්ව ශ්‍රී පුෂ්පාරාම විහාර භූමිය | ගල්කණු සහිත නටබුන් ස්ථානය | 2011.12.30<br>1739 |
| පුත්තලම | හලාවත නගර මධ්‍යය | සීගිරි හෙවත් කොරයා වලව්ව | 2011.09.09<br>1723 |
| | නොච්චියාගම දැදුරුඔය නිම්නය | දාගැබ් ගොඩැල්ල සහ ටෙරාකොටා මැටි බඳුන් සහිත ස්ථානය | 2011.09.09<br>1723 |
| කෑගල්ල | | ජුබිලි අම්බලම | 2011.07.22<br>1716 |
| | කෑගල්ල අධිකරණ භූමිය | අධිකරණ සංකීර්ණයට අයත් වරිපණම් අංක 52,1/52,2/52,1/ 52ඒ/ 38/1/1 දරණ ගොඩනැගිල්ල | 2011.07.22<br>1716 |
| | සීතාවක මාළිගා භූමිය | ලන්දේසි බලකොටුව | 2011.07.22<br>1716 |
| | පෙතන්ගොඩ උයන | පැරණි උණ පඳුරු 2 | 2011.07.22<br>1716 |
| | පහළ කඩුගන්නාව | කඩුගන්නාව අම්බලම | 2011.07.22<br>1716 |
| | ගල්බොක්ක වෙහෙරගල | කටාරම් කෙටූ සියළු ලෙන් | 2011.07.22<br>1716 |
| | අම්බුළුගල ශ්‍රී දන්තපාය රජමහා විහාර භූමිය | දෙමහල් ටැම්පිට ප්‍රතිමා ගෘහය | 2011.09.09<br>1723 |
| | කැප්පටිපොල | ටැම්පිට විහාරය | 2011.09.09<br>1723 |
| | ඉහළ ගොඩිගමුව ගල්ලෙනේ වත්ත (පන්සලේ වත්ත) | කටාරම් කෙටූ ලෙන | 2011.09.09<br>1723 |
| | ඉලුක්ගොඩ ශෛලමස්ථාරාම විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය සහ ධර්ම ශාලාව | 2011.09.09<br>1723 |
| | ඉද්දමල්පාන කීර්ති ශ්‍රී රාජසිංහ රජමහා විහාර භූමිය | පැරණි විහාර ගෙය | 2011.12.30<br>1739 |
| | කෙහෙල්වතුගොඩ ගල්ලියද්ද | පැරණි නටබුන් ගොඩැල්ල හා ප්‍රාකාරය | 2011.12.30<br>1739 |
| | කොණ්ඩගලේ විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය හා පිහිටි ගලේ ඇති කාණුව | 2011.12.30<br>1739 |
| | දැදිගම ගල් තැන්ඕවිට වත්ත | නටබුන් ගොඩැල්ල | 2011.12.30<br>1739 |
| | ගල්කන්දේ දෙණිය කුඹුර | නටබුන් ගොඩැල්ල | 2011.12.30<br>1739 |
| | හේවාදිවෙල මිනියම්පිටිය වත්ත ඉඩම | චෛත්‍යය ගොඩැල්ල | 2011.12.30<br>1739 |
| | උඩගලදෙණිය දමුණු කන්ද මූකලාන ඉඩම | ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ස්ථාන, පිහිටි ගලේ සකසා ඇති ගල් කාණු, පැරණි බැමි, නටබුන් ගොඩැලි, වෙනත් සංකේත සහ නරාවිය හේන ඉඩමේ ඇති කණු වලවල් ආදි පුරාවිද්‍යාත්මක සාධක | 2011.12.30<br>1739 |
| | පාට්ටිගම උද්‍යානාගොඩ පුරාණ ගල්ලෙන් විහාර බිම | කටාරම් කොටන ලද පැරණි සිතුවම් මූර්ති සහිත ලෙන් විහාරය | 2011.12.30<br>1739 |
| | උඩවත්ත ශ්‍රී සුනන්දාරාම භූමිය | කටාරම් සහිත ලෙන | 2011.12.30<br>1739 |

| | | | |
|---|---|---|---|
| රත්නපුර | අළුපත්ගල වවුළගල කන්දේ | ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ලෙන හා කඳු මුදුන | 2011.07.22 1716 |
| | අඹගහවෙහෙර මංකඩ | පැරණි දාගැබ | 2011.12.30 1739 |
| | කොට්ටිඹුල්වල ගල්ලෙන් රජමහා විහාර භූමිය | පැරණි ආවාස ගෙය | 2011.12.30 1739 |
| | ගල්පාය බිසෝකොටුව | වල්දෙහිකොටුව බෝධිඝරය | 2011.12.30 1739 |
| | වැලිපතයාය ලංකා පබ්බත ගල්ලෙන් රජමහා විහාර භූමිය | කටාරම් සහ සෙල්ලිපි සහිත සියලුම ගල්ලෙන් | 2011.12.30 1739 |
| | මුල් ඇඩියාවල ශ්‍රී තාලරුක්ඛාරාම විහාරයට අයත් පිංහේන ඉඩම | පැරණි දාගැබ | 2011.12.30 1739 |
| | හල්මිල්ලකැටිය | පැරණි දාගැබ | 2011.12.30 1739 |
| | කුඹල්ගම ශ්‍රී විශුද්ධාරාම පුරාණ ටැම්පිට විහාරය භූමිය | පැරණි ටැම්පිට විහාරය හා ඒ වටා ඇති ප්‍රාකාරය | 2011.12.30 1739 |
| | එල්ලාවල ශ්‍රී ගංගාරාම මහා විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය | 2011.12.30 1739 |
| | පිඹුර වේරගම්වත්ත ඉඩම | ගුලන ගල්ලෙන | 2011.12.30 1739 |
| | අඹන්ඔලුව රජමහා විහාර භූමිය | කටාරම් සහිත ලෙන් විහාරය | 2011.12.30 1739 |
| | මාහර පුරාණ රජමහා විහාරය | පැරණි පිළිම ගෙය | 2011.12.30 1739 |
| කොළඹ | අළුත්කඩේ මහාධිකරණ භූමිය | මහාධිකරණ "දිසාධිකරණ" වාණිජ අධිකරණය පවත්වාගෙන යන ගොඩනැගිලි | 2011.07.22 1716 |
| | රත්මලාන අන්ධවිද්‍යාල භූමිය | පැරණි දෙමහල් ගොඩනැගිල්ල | 2011.09.09 1723 |
| | කොළඹ 1 යෝක්වීදිය අංක (40) ස්ථානය | කාගිල්ස් ගොඩනැගිල්ල | 2011.09.09 1723 |
| | කොළඹ (07) කුරුඳුවත්ත ජාතික කෞතුකාගාර ගොඩනැගිල්ල පිහිටි භූමිය | සීමා ප්‍රාකාරය | 2011.12.09 1736 |
| | කුරුඳුවත්ත | ශේක් උස්මාන් වලි-උලාහ් දර්ගා සහ දවටගහ පල්ලිය | 2011.12.30 1739 |
| | බ්‍රිස්ටල් වීදිය | ඩෙල්ෆ් දොරටුව | 2011.12.30 1739 |
| | නවගමුව දකුණ ඇඩුදොළ කන්ද | කටාරම් කෙටූ ලෙන ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ලෙන් දෙක | 2011.12.30 1739 |
| කළුතර | පයාගල ස්වර්ණාරාම විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය | 2011.09.09 1723 |
| ගම්පහ | මීගමුව උසාවි මාර්ගය | ඕලන්ද බලකොටුවේ පිවිසුම් දොරටුව හා ප්‍රාකාරය | 2011/07/22 1716 |
| | මීගමුව උසාවි මාර්ගය | පුරාණ වෙඩි බෙහෙත් ගබඩාව | 2011/07/22 1716 |
| | මීගමුව වට රවුම් පාරේ නව අධිකරණ සංකීර්ණ භූමියේ | පැරණි ඕක්ගස | 2011/07/22 1716 |
| | තෝරපිටිය වෙහෙරහේන ඉඩමේ | චෛත්‍ය ගොඩැල්ල, ගල්බිඳුම් ස්ථානය, ගල් පඩිපෙළ හා ප්‍රාග් | 2011.09.09 1723 |

| | | | |
|---|---|---|---|
| | | ඓතිහාසික සාධක සහිත ගුහා ආවරණය | |
| | මාලදෙනිය ශෛලකාන්තාරාම පුරාණ විහාර භූමියේ | ගිරිලිපිය, පැරණි ස්තූප ගොඩැල්ල, පියගැට පේළි, ලෙන් විහාරය, කටාරම් හා ලෙන් ලිපි සහිත සියළුම ලෙන් | 2011.09.09 1723 |
| | මීගමුව උසාවි මාර්ගයේ පිහිටි | ශාන්ත ස්තේපන් ක්‍රිස්තියානි දෙව් මැදුර | 2011.12.30 1739 |
| | මාලදෙනිය ශෛලකාන්තාරාම පුරාණ විහාර භූමියේ | කටාරම් කෙටු ගල් ලෙන | 2011.12.30 1739 |
| ත්‍රිකුණාමලය | පරණ මැදවච්චිය රන්මඩු රජමහා විහාර භූමිය | පිළිමගේ සහිත ගොඩනැගිලි නටබුන් සංකීර්ණය | 2011.09.09 1723 |
| | කන්නියා | උණු දිය ළිං (07) චෛත්‍ය ගොඩැල්ල සහ නටබුන් ගොඩනැගිල්ල | 2011.09.09 1723 |
| | අරිසිමලය කඳු වැටිය (පුල්මුඩේ වෙරළ තීරයට යාබඳ) | පුරාවිද්‍යාත්මක නටබුන් | 2011.09.09 1723 |
| යාපනය | කෝවිලන් | ප්‍රදීපාගාරය | 2011.07.22 1716 |
| | කවෝලෙයියම්පාලෙයි | බයෝබැබ් ගස | 2011.07.22 1716 |
| | ආලමාවනම් | ප්‍රදීපාගාරය (රැජින කුළුන) | 2011.07.22 1716 |
| | අත්තියඩි | ආරුමුග නාවලර්තුමාගේ නිවසේ නටබුන් | 2011.12.30 1739 |
| | වන්නාර්පන්නෛ | ශිවන්කෝවිල | 2011.12.30 1739 |
| | නාවලර් මහා විද්‍යාලය | පැරණි ගොඩනැගිල්ල සහ කුරවර් කෝවිල | 2011.12.30 1739 |
| | වන්නාර්පන්නෛ | කදිරේශන් කෝවිල | 2011.12.30 1739 |
| | පැරණි උද්‍යානය | පැරණි කච්චේරි ගොඩනැගිල්ල | 2011.12.30 1739 |
| | සංගිලියන් මාර්ගයේ ප්‍රධාන දොරටුව ආසන්නයේ | ගොඩනැගිලි අත්තිවාරම | 2011.12.30 1739 |
| | වන්නාර්පන්නෛ | කිල්නාර් ශාලාව | 2011.12.30 1739 |
| | යාපනයේ හින්දු විද්‍යාල භූමිය | පැරණි ගොඩනැගිල්ල | 2011.12.30 1739 |
| | නීරාවියඩි විද්‍යාල මාවත | සෛව පරිපාන සභාවේ මුද්‍රණාලය වශයෙන් භාවිතාකර ඇති ඉන්දු සාතනම් ශාලාව | 2011.12.30 1739 |
| | උඩුපිට්ටි වීරපත්තිරර් කෝවිල් භූමිය | දමිළ ශිලා ලේඛණ සහිත කුළුණු | 2011.12.30 1739 |
| | වතිරි ගණදෙවි කෝවිල් භූමිය | පැරණි පොකුණ හා ප්‍රාකාරය, අම්බලම, ළිඳ හා ඒ ආශ්‍රිත ශිලා නිර්මාණ | 2011.12.30 1739 |
| | මනල්කාඩු | ලන්දේසි පල්ලිය | 2011.12.30 1739 |
| | අච්චුවේලි නගරය | ක්‍රිස්තියානි පල්ලිය සහ එම භූමියේ ඇති පැරණි ලන්දේසි පල්ලියේ නටබුන් | 2011.12.30 1739 |

| | | | |
|---|---|---|---|
| | පේදුරුතුඩුව පසුපදීශ්වර කෝවිල අසල | තෙරිමුඩි අම්බලම | 2011.12.30 1739 |
| | මණ්ඩතිව් | ශාන්ත පීතර ක්‍රිස්තියානි පල්ලිය | 2011.12.30 1739 |
| | නගුලේශ්වරම් | නගුලේශ්වරම් කෝවිල සහ පැරණි අම්බලම | 2011.12.30 1739 |
| | මාවඩ්ඩිපුරම් | කන්දස්වාමි කෝවිල | 2011.12.30 1739 |
| | චුංඩිකුලි | ශාන්ත ජෝන් බැප්ටිස්ට් කතෝලික පල්ලිය | 2011.12.30 1739 |
| | නල්ලූර් | ශාන්ත ජේම්ස් ක්‍රිස්තියානි පල්ලිය | 2011.12.30 1739 |
| | වඩුක්කොඩෙයි | ක්‍රිස්තියානි පල්ලිය | 2011.12.30 1739 |
| | ඩෙල්ෆ්ට් | පරවි කුඩුව සහිත ගොඩනැගිල්ල සහ ගොඩනැගිලි නටබුන් | 2011.12.30 1739 |
| | කෝට්ටෙයිකාඩු - ඩෙල්ෆ්ට් | බෞද්ධ ස්තූප සහිත නටබුන් සංකීර්ණය | 2011.12.30 1739 |
| | සාරප්පිඩ්ඩි - ඩෙල්ෆ්ට් | ළිං සහ ඒ ආශ්‍රිත නටබුන් සංකීර්ණය | 2011.12.30 1739 |
| | සිකිරියාම්පල්ලම් - ඩෙල්ෆ්ට් | මීගාමන් බලකොටුව | 2011.12.30 1739 |
| | පුංගුඩුතිව් | දකුණු ඉන්දියානු ක්‍රිස්තියානි පල්ලිය | 2011.12.30 1739 |
| | අල්වායි උතුර | ශාන්ත ප්‍රැන්සිස් මුනිඳුනිගේ පල්ලිය | 2011.12.30 1739 |
| ගාල්ල | මීපේ වෙල්යාය | වගුරුස්සා ගලමත ඉදිකල පැරණි අම්බලම | 2011.07.22 1716 |
| | ගාලුකොටුව ලේන්බාන් වීදියේ ඇති | මහේස්ත්‍රාත් අධිකරණ සහ කාර්යාල ගොඩනැගිල්ල | 2011.07.22 1716 |
| | ගාල්ල බන්ධනාගාර ගොඩනැගිල්ල ඇති භූමිය | කාර්යාල සංකීර්ණය, වට ප්‍රාකාරය, කොටු පවුර දෙසට ඇති උමග | 2011.07.22 1716 |
| | තුවක්කුගල වත්ත පුරාණ විහාරය | පැරණි පිළිමගෙය | 2011.12.30 1739 |
| | කොග්ගල දේවගිරි විහාරය | පැරණි දේවාලය සහිත පිළිමගෙය | 2011.12.30 1739 |
| | අම්පාවිල ශ්‍රී විජයසුන්දරාරාම විහාරය | පැරණි සිතුවම් සහ මූර්ති සහිත ප්‍රතිමා ගෘහය | 2011.12.30 1739 |
| මාතර | මාතර කොටුව | ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල ගොඩනැගිල්ල | 2011.07.22 1716 |
| | මාතර කොටුව | බන්ධනාගාර විශේෂ රැඳවුම් මැදිරිය | 2011.07.22 1716 |
| | ගොඩපිටිය | මොහිදීන් ජුම්මා මස්ජිද් පල්ලියේ "දර්ගා" කොටස | 2011.12.30 1739 |
| | වේරගම්පිටිය | ගජමන්නෝනා කිවිදිය විසූ නිවස | 2011.12.30 1739 |
| හම්බන්තොට | වෙහෙරගල පුරාවිද්‍යා ස්ථානය | ශිලා කුළුණු, සිරිපතුල් ගල්, පර්වත ලිපිය, පාදම් ගල්, ශිලා බුද්ධ ප්‍රතිමාව, ස්තූප ගොඩැල්ල, පියගැටපෙළ, නටබුන් ගොඩැලි, යන්ත්‍ර ගල් ආදී පුරාවස්තු සහිත ගල්තලාව | 2011.07.22 1716 |
| | කරුවලවැව පුරාණ විහාර භූමිය | ලෙන් සංකීර්ණ සහ ස්ථූප ගොඩැල්ල | 2011.07.22 1716 |

| | | | |
|---|---|---|---|
| | ගල්වැව රජමහා විහාර භූමිය | ආරාම සංකීර්ණය | 2011.07.22 1716 |
| | බැරගම පුණ්‍යවර්ධනාරාම විහාර භූමිය | ආරාම සංකීර්ණය | 2011.12.30 1739 |
| | බැරගම විල්ගම් වෙහෙර | ආරාම සංකීර්ණය | 2011.12.30 1739 |
| | මහබෝලාන උච්චවාලිත රජමහා විහාර භූමිය | පැරණි ස්ථූපය, ප්‍රතිමා ගෘහය, නටබුන් ගොඩනැගිලි, ස්ථූප ගොඩැලි | 2011.12.30 1739 |
| | අතුබොදය පුරාණ විහාර භූමිය | පැරණි ප්‍රතිමා ගෘහය | 2011.12.30 1739 |
| මහනුවර | වතුපොල | අම්බලම | 2011.07.22 1716 |
| | කරගල | දේවාල ගොඩනැගිල්ල සහිත කටාරම් කෙටූ ලෙන, දිග්ගල පර්වතයේ ඇති කටාරම් කෙටු ලෙන | 2011.07.22 1716 |
| | මහනුවර නගරය | ගැරිසන් සුසාන භූමිය | 2011.07.22 1716 |
| | බලන කුමාරකන්ද දේවාල භූමිය | කටාරම් සහිත ලෙන් | 2011.07.22 1716 |
| | දොරමඩලාව රජමහා විහාරය | ලෙන් විහාරය, පියගැටපේළි, සණ්ඨාර කුළුණ | 2011.09.09 1723 |
| | නුවර වීදිය (ගම්පොල නගරය) | කදිරේශන් කෝවිල | 2011.09.09 1723 |
| | අග්‍රබෝධි විහාර භූමිය (දෙහිපාගොඩ) | ප්‍රතිමා ගෘහ 02, චෛත්‍යය, පියගැට පේළි, සඳකඩපහන් 2 | 2011.09.09 1723 |
| | සදසිරි දුනුවිල ලෙන් විහාර භූමිය (බඹරගහදෙණිය) | ලෙන් ආවාස ගෘහය ස්වාභාවික ලෙන | 2011.09.09 1723 |
| | කටුගොඩ දිගන කැලේ වත්ත | කටාරම් ලෙන් 03, කේතුකාවාට ත්‍රිශූල සලකුණු | 2011.09.09 1723 |
| | උඩරත්මීවල ශ්‍රී සද්දෝදයාරාම විහාර භූමිය | කටාරම් ලෙන | 2011.09.09 1723 |
| | කොටුමුදුන්ගල රජමහා විහාර භූමිය | ලෙන් විහාරය, ලෙන් ලිපිය සහිත ලෙන, ජලකාණුව, පා දෝවනය | 2011.09.09 1723 |
| | බටගල්ල ශ්‍රී සුධර්මාරාම රජමහා විහාර භූමිය | පැරණි සිතුවම් සහිත දෙමහල් ප්‍රතිමා ගෘහය | 2011.09.09 1723 |
| | වත්තේගම මලියදේව පුරාණ ලෙන් විහාර භූමිය | කටාරම් සහිත ලෙන | 2011.09.09 1723 |
| මාතලේ | ශ්‍රී ධම්මජෝත්‍යාරාම විහාරය (වෙලන්ගහවත්ත) | ධර්ම ශාලාව සහිත ටැම්පිට විහාර ප්‍රතිමා ගෘහය | 2011.09.09 1723 |
| | අම්බොක්ක රජමහා විහාරය | ලෙන් විහාරය පර්වත ලිපිය, පිහිටි ගලේ සකස් කර ඇති පියගැට පේළි හා අනෙකුත් පුරාවස්තු | 2011.12.30 1739 |
| | දුල්ලෑව | දුල්ලෑව වලව්ව | 2011.12.30 1739 |
| නුවරඑළිය | උඩුපුස්සැල්ලෑව මාර්ගයේ වරිපනම් අංක 68,70 | දිසාවන කාර්යාලය සහ අඩවි වන කාර්යාල ගොඩනැගිල්ල | 2011.07.22 1716 |
| | ගල් පාලම | පැරණි දුම්රිය පාලම | 2011.07.22 1716 |
| | ගලපිටයාය ලියන්වෙල | අළුත්නුවර දේවාලය නමින් හඳුන්වන කටාරම් කෙටූ ලෙන | 2011.07.22 1716 |
| | කොහොඹගාන හම්බිලිය | කටාරම් කොටන ලද සෙල්ලිය සහිත ගල්ලෙන | 2011.07.22 1716 |

| | | | |
|---|---|---|---|
| | කොටගේ පිටිය | අම්බලම | 2011.12.30<br>1739 |
| | නුවරඑළිය ගොල්ෆ්ක්ලබ් ක්‍රීඩා සමාජ ගොඩනැගිල්ල අසල | තෝමස් විලියම්, රොජෙන්සන්, ලුතිනන් කර්නල් මොන්රෝ, සර් විලියම් රොගීත්, හෙන්රි පෝල් සහ මේජර් බේලිගේ බිරිඳ යනාදීන්ගේ සොහොන් කොත් | 2011.12.30<br>1739 |
| | නියම්ගම්දොර පුරාණ පත්තිනි දේවාල භූමිය හා පුරාණ රජමහා විහාර භූමිය | පත්තිනි දේවාලය, අළුත්නුවර දේවාලය හා පැරණි බෝධි ප්‍රාකාරය | 2011.12.30<br>1739 |

### පුරාවස්තු විනාශය වැළැක්වීමේ ඒකකයට වාර්තා වී ඇති සිද්ධි පිළිබඳ වාර්තාව

| අනු අංකය | දිස්ත්‍රික්කය | පුරාවස්තු අනවසරයෙන් | | | |
|---|---|---|---|---|---|
| | | සොරකම | විනාශය | කැණීම | වෙනත් |
| 01 | අනුරාධපුර | 01 | 03 | 24 | |
| 02 | පොළොන්නරුව | 01 | 02 | 23 | |
| 03 | පුත්තලම | | | 03 | |
| 04 | කුරුණෑගල | 02 | 04 | 13 | 03 |
| 05 | කළුතර | 01 | | 02 | 01 |
| 06 | කොළඹ | 01 | 02 | 02 | 02 |
| 07 | ගම්පහ | 02 | 01 | 04 | |
| 08 | මන්නාරම | | | | |
| 09 | වව්නියාව | | 01 | 06 | |
| 10 | යාපනය | | | | |
| 11 | කිලිනොච්චිය | | | | |
| 12 | මුලතිව් | | | | |
| 13 | මාතර | | 03 | 02 | |
| 14 | ගාල්ල | 01 | 01 | 01 | |
| 15 | හම්බන්තොට | 02 | 02 | 08 | |
| 16 | රත්නපුර | 01 | | 10 | |
| 17 | කෑගල්ල | 01 | 05 | 08 | |
| 18 | අම්පාර | | 01 | 14 | 02 |
| 19 | ත්‍රිකුණාමලය | 02 | 01 | 05 | |
| 20 | මඩකලපුව | | | 01 | |
| 21 | මහනුවර | 08 | 04 | 05 | |
| 22 | මාතලේ | 01 | | 09 | |
| 23 | නුවරඑළිය | 01 | | 02 | |
| 24 | මොණරාගල | | | 05 | |
| 25 | බදුල්ල | | 01 | 04 | |
| | එකතුව | 25 | 31 | 156 | 08 |

සමස්ථ සිද්ධි ප්‍රමාණය 226

**පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක හඳුනාගැනීමේ මූලික ගවේෂණය**

## උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක හඳුනාගැනීමේ හා සිතියම් ගත කිරීමේ මූලික ගවේෂණය

උතුරු පළාතේ යුධමය වාතාවරණය අවසන්වීමත් සමග ඇති වන සංවර්ධන කටයුතු හමුවේ එක් එක් ආයතන මගින් සිදු කරන කාර්යයන්හී දී සිදුවන ව්‍යාකූලතාවයන් අවම කරවනු වස් එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ ආධාර මත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙහෙයවීමෙන් සිදු කරනු ලැබූ රජයේ ආයතන, අර්ධ රාජ්‍ය ආයතනයන්හී ඒකාබද්ධතාවයෙන් සිතියම් මාලාවක් සකස් කරන ලදී. එම ව්‍යාපෘතිය යටතේ 2010 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ භූගෝලීය සිතියම් සැකසීමේ ඒකකය මගින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආයතනයට ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාවට ලද ආධාර මත මෙම ව්‍යාපෘතිය අදියර කිහිපයකින් සිදු කරනු ලැබීය. මෙම කාර්යය මගින් උතුරු පළාතේ සිදු කරනු ලබන සංවර්ධන කටයුතුවල දී පුරාවිද්‍යා ස්ථානයන්ට සිදුවන හානිය අවම කිරීම මුඛ්‍ය පරමාර්ථය විය.

### මන්නාරම දිස්ත්‍රික්කය

**මන්නාරම කොටුව**

උප්පුකුලම් ග්‍රාම නිලධාරි වසමේ මන්නාරම නගරයේ පිහිටි මෙම ස්ථානය පිහිටා ඇත.

පැරණි බලකොටුව හා දිය අගල ක්‍රි.ව. 1560 දී පෘතුගීසින් විසින් ඉදි කරන ලද්දකි. පසුව මෙම කොටුව වර්ෂ 1658 දී ලන්දේසින් විසින් යටත් කර ගැනීමත් සමග ඔවුන් විසින් ප්‍රතිසංස්කරණය කරවූ බවට ඓතිහාසික සාධක වේ. බහුල වශයෙන් හිරිගල් ද, ඊට අමතරව කොරල් ගල් හා පිළිස්සූ ගඩොල් භාවිත කර ඉදිකරන ලද මෙම බලකොටුවෙහි දේවස්ථානය, අධිකරණ ගොඩනැගිල්ල, මුර අට්ටාල හා වෙනත් ගොඩනැගිලි හඳුනාගත හැකි ය. දේවස්ථාන ගොඩනැගිල්ල වර්ෂ 1670 සිට 1964 දක්වා කාල පරාසයන් තුළ ඉදිකළ සොහොන් දැකිය හැකි ය. මෙම සොහොන් කොත්වල විවිධ නිර්මාණාත්මක ලක්ෂණ දැකිය හැකි ය. මෙම චතුරස්‍රාකාර වූ බලකොටුව උතුරු දකුණු දිශානුගතව පිහිටුවා තිබේ. දකුණු ප්‍රාකාරය මධ්‍යයේ ප්‍රධාන දොරටුව පිහිටුවා ඇති අතර ප්‍රධාන දොරටුව පිටත සහ ඇතුළත පවුරු දෙක මත වූ ආරුක්කු දෙක සම්පූර්ණයෙන් ම විනාශ වී ඇත.

හොඳින් ආරක්ෂා වූ බැස්ටියන් හතරක් දක්නට ලැබෙන මෙහි එක් බැස්ටියනයක පමණක් මුර කුටියක් (මුර අට්ටාල) නොමැත. පවුරේ දකුණු බැවුම මත තුවක්කු සහිත මුර සෙබලුන් වෙනුවෙන් තුවක්කු තබා ගැනීම සඳහා ගඩොලින් කළ අඩි 3 අඟල් 4 ක උස බැම්මකි. එය අඩි 1 අඟල් 9 පළල වන අතර කවුළු 45 ක් පමණ තිබී ඇතත් ප්‍රධාන දොරටුව කැඩී යාමත් සමග මෙම කවුළු 12 ද විනාශ වී ඇත. දකුණු සහ බටහිර ප්‍රාකාර දෙක ම සම්බන්ධව ගේබල් බිත්ති සහිත පළ දෙකේ වහල සහිත ගොඩනැගිලි දෙකකි. ඒවා ගබඩා ගොඩනැගිලි විය හැකි ය. උතුරු සහ නැගෙනහිර පැති දෙකෙහි තනි පලයට සකසන ලද වහලය සහිත ගොඩනැගිලි දෙකකි. මෙයට අමතරව නැගෙනහිර බැම්මට සමාන්තරව ගොඩනැගිලි දෙකකි. මෙම

ගොඩනැගිලි දෙක හටයින්ගේ බැරැක්ක විය හැකි ය. උතුරු බැම්ම මැදින් අඩි 30 ක් පමණ ඇතුළතින් තනිපල වහලයට සම්බන්ධ ගොඩනැගිල්ලට ම සම්බන්ධ කර පලදෙකේ ගොඩනැගිල්ලකි. එය අණ දෙන නිලධාරි නිවස්නය විය හැකි ය.

බලකොටුව තුළ ළිං කිහිපයක් ඇතත් ඒවා සමකාලින නිර්මාණ විය නො හැකි ය. උතුරු බැම්මට සම්බන්ධව බටහිර සහ නැගෙනහිර දෙසින් අඩි 15 ක පමණ ගැඹුරු ටැංකි දෙකකි. සියලු ගොඩනැගිලි බිත්ති හිරිගල්, කොරල් සහ සුළු වශයෙන් ගඩොල් භාවිත කර ඉදිකර ඇත. බලකොටුවේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ නිරීක්ෂණයේ දී දැනට ශේෂිත ගොඩනැගිලිවල සුලභ වශයෙන් දැකිය හැක්කේ ලන්දේසි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ වේ.







**බයෝබැබ් ගස**

පල්ලෙමුනෙයි බටහිර අංක 84 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මෙම ගස මන්නාරම නගරයෙන් පල්ලිමුනෙයි මාර්ගයේ මීටර් 800 පමණ ගමන් කර මාර්ගයේ වම් පසින් දැකගත හැකි ය. ක්‍රි.ව. 1477 දී අරාබි නැවියන් විසින් සිටුවන ලැබූ බවට සැළකෙන මෙම ගසෙහි වට ප්‍රමාණය මීටර් 19.51 ක් ද උස මීටර් 7.5 ක් ද වේ.

**සෙන්ට් මේරිස් පල්ලිය**



චාවට්කට්ටි ග්‍රාම නිලධාරි වසමේ චාවට්කට්ටි ග්‍රාමයේ පිහිටි 1834 දී ආරම්භ කරන ලද මෙම පල්ලිය 1907 දී ප්‍රතිසංස්කරණයට ලක්කොට ඇත. ප්‍රතිසංස්කරණයට ලක්වූ කොටස් අතර පිවිසුම් ආලින්දයේ වහලය සහ බිත්ති ප්‍රමුඛත්වයක් ගනී. සුරුවම තැන්පත්කොට ඇති කුටියේ පෞරාණිකත්වය ආරක්ෂා වී ඇත.

**මාතොට රජමහා විහාරය**

ඉලුක්පිටිය ග්‍රාම නිලධාරි වසමේ තිරුකේෂ්වරම් ග්‍රාමයේ පිහිටි  මෙම ස්ථානයට ලඟාවීම සඳහා මාන්තෙයි හන්දියෙන් තිරුකේෂ්වරම් කෝවිල මාර්ගයේ මීටර් 75 ක් පමණ ගමන් කළ යුතු වේ.



වර්තමාන ශ්‍රී ලංකා යුධ හමුදාවේ සිංහ රෙජිමේන්තුවේ මැදිහත්වීමෙන් ඉදිකළ කුඩා ප්‍රමාණයේ පිළිම ගෙයක් දැකිය හැකි ය. මෙම ස්ථානයේ ඇති බෝධිය වටා ආසන්න ස්ථානවලින් එක්රැස් කරන ලදැයි විශ්වාස කළ හැකි ශිලා ස්ථම්භ, ඇඹරුම් ගල්, කණු පාදම් ගල්, බෝධිසත්ව ප්‍රතිමා කොටසක් සහ බුදු පිළිමයක කොටසක්, ටැම් ලිපියක කොටසක් ද වේ. මෙම ටැම් ලිපියෙහි

සඳහන් වන ආකාරයට මෙම ස්ථානයේ පිළිම 500 ක් ස්ථාපනය කළ බවත්, එම පිළිම නඩත්තු කිරීම සඳහා විවිධ ගම්බිම් පූජා කිරීම් පිළිබඳවත් සඳහන් වේ. මෙම ටැම් ලිපිය නිශ්ශංකමල්ල රජු විසින් කරවන ලද්දකි. මීට අමතරව බෝධි වෘක්ෂයට ආසන්නව සිටුවන ලද කණු පාදම් ගල් දැකිය හැකි ය.







**මාන්තෙයි කැණීමෙන් පුරාවිද්‍යා නටබුන් හමුවූ ස්ථානය**

තිරුකේෂ්වරම් ග්‍රාම නිලධාරි වසමේ තිරුකේෂ්වරම් ග්‍රාමයේ පිහිටි මෙම ස්ථානයට ලඟාවීම මාන්තෙයි හන්දියෙන් තිරුකේෂ්වරම් කෝවිල මාර්ගයේ පැමිණ කෝවිල ඉදිරියෙන් වමට ඇති මාර්ගයේ මීටර් 200 ක් පමණ ගමන් කළ විට හමුවන සමුපකාරය පසුකර මීටර් 10 පමණ ඉදිරියට ගමන්කළ විට මාර්ගයේ දකුණු පසින් පිහිටි මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

පැරණි වරාය ආශ්‍රිතව කැණීම් සිදුකළ ස්ථානයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදුකර ඇති මූලික පර්යේෂණවලින් ක්‍රි.පූ. 1800 වන විට මධ්‍යශිලා අවධියට අයත් මානව ජනාවාසයක් පැවති බව හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ ගල් යුගයේ අවසාන සීමාව මාතොටින් නියෝජනය වේ. ජ්‍යාමිතික හැඩ ශිලා මෙවලම් රාශියක් ලැබී ඇති මෙම ස්ථානයේ වැදගත්ම සොයාගැනීම වන්නේ මුහුදු සත්ව අවශේෂ සොයා ගැනීමයි. ඉන් අනතුරුව ක්‍රි.පූ. 02 සියවසේ දී මූල ඓතිහාසික යුගයට අයත් ජනාවාසයක් පැවති බවට සාධක වශයෙන් කාලරක්ත මැටි බඳුන්, රූලේටඩ් වර්ගයේ මැටි බඳුන් හමු වී ඇත. මේ වන විට මාතොට වෙළෙඳ මධ්‍යස්ථානයක් හා ප්‍රධාන වරායක් ලෙස පවතින්නට ඇත. මෙම තත්වය ක්‍රි.පූ. 2 සියවසේ සිට ක්‍රි.ව. 13 සියවස දක්වා විහිදී ගිය බවත් ක්‍රි.ව. 13 සියවසෙන් පසුව මෙම ස්ථානය පරිහානියට පත්වන්නට ඇති බවත් කැණීම් තොරතුරුවලින් හෙළිදරව් වී ඇත.

**ඕලුතුඩුවාය කනර් පල්ලිය**

ඕලුතුඩුව ග්‍රාම නිලධාරි වසමේ ඕලුතුඩුවාය ග්‍රාමයේ පිහිටි මෙම පල්ලිය පිහිටා ඇත.



මෙම කතෝලික පල්ලිය වසර 150-200 ක් පමණ පැරණි යැයි ප්‍රදේශවාසීන් පවසන අතර, ඒ බව වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අනුව හඳුනාගත හැකි ය. වර්ෂ 1973 දී පමණ මෙම දේවස්ථානයේ ඉදිරි කොටස පමණක් ප්‍රතිසංස්කරණය කොට ඇත. සුරුවම තැන්පත් කොට ඇති කොටස මුල් යුගයට අයත් බව පෙනේ. මෙහි බිත්තියෙහි බැම්මෙහි පළල සෙ.මී. 70 ක් පමණ වේ. බිත්ති ගඩොල්, හුණුගල් හා කොරල්ගල් ආදියෙන් නිමවා ඇත.

**කප්ප කෝවිල් නටබුන් හෙවත් පැරණි පෘතුගීසි පල්ලිය**

මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 59 පෙරියකරසල් ග්‍රාම නිලධාරී වසමේ පෙරියකරසල් ග්‍රාමයේ පිහිටා ඇත.



මෙම ගොඩනැගිල්ල කෝවිලක් ලෙස වර්තමානයේ හැඳින්වුව ද, අතීතයේ පෘතුගිසී පල්ලියක් ලෙස භාවිත වූ බව සඳහන් වේ. 1947 පාලන වාර්තාවෙහි මෙය කරිසල් පල්ලිය ලෙස හඳුන්වා ඇත. එවකට මෙහි වහල නොතිබූ බවත්, බිත්ති මත වැවී තිබුණු ගස් ඉවත් කිරීම 1942 වසරේ සිදු කරන ලද බව දැක්වේ. මෙය රජයේ ඉඩමක් වන බැවින් පුරාවිද්‍යා රක්ෂිත භූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට යෝජිත බව එහි සඳහන් වේ.

පෘතුගීසි අවධියට අයත් ගොඩනැගිල්ලක් වන මෙය වර්තමානය වන විට ගරාවැටී ඇත. වහලක් දක්නට නොමැති මෙම ගොඩනැගිල්ලේ බිත්තියක ඝනකම මීටර් 2 ක් පමණ වේ. විශේෂයෙන් සකසාගත් ගඩොල් භාවිත කර ඇති අතර ගඩොලක දිග, පළල සහ උස පිළිවෙළින් අඩි 1, අඟල් 8 හා අඟල් 2 ක් වේ. හුණු බදාමයෙන් ගොඩනැගිල්ල බැඳ ඇති අතර, ගොඩනැගිල්ලේ ඉහළ අර්ධයේ බොරදම් දැකිය හැකි ය. ආරුක්කු සහිත දොරටු දක්නා ලැබෙන මෙහි සොල්දරයක් තිබෙන්නට ඇතැයි සිතිය හැකි සාධකය ලෙස ගිණිකොන දෙසින් පිහිටි බිත්තියෙහි වූ පියගැටපෙළ සාක්ෂි දරයි. කාමරයක් සහ දිග ශාලාවකින් සමන්විතය. මෙම ශාලාව මුළුමනින් ම ගරාවැටී ඇති අතර, පාදම හා කුඩා බිත්ති කොටසක් පමණක් දක්නට ලැබේ. මෙම පල්ලියට අයත් පැරණි ළිඳ මීටර් 50 ක් පමණ දුරින් මෙම ගොඩනැගිල්ලට උතුරු දෙසින් පිහිටා ඇත. එහි විෂ්කම්භය මීටර් 3 කි.



**නාරාපාඩු ඕලන්ද මුර කපොල්ල**

මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නාරාපාඩු ග්‍රාම නිලධාරි වසමේ නාරාපාඩු ග්‍රාමයේ පිහිටා ඇත. අතීතයේ ලන්දේසීන් විසින් ආරක්ෂක කටයුතු වෙනුවෙන් ඉදිකරන ලද්දක් විය හැකි මෙය උසින් මීටර් 10 ක් පමණ වන වෘත්තාකාර කුළුණකි. මෙහි පාදමේ විෂ්කම්භය මීටර් 4 ක් පමණ වන අතර ක්‍රමයෙන් ඉහළටයත්ම විෂ්කම්භය අඩු වේ. බෝක් (Boake) විසින් ක්‍රි.ව. 1888 Sampatturai old tower ලෙස මෙම ස්ථානය පිළිබඳව වාර්තා කර ඇත. ඔහු විසින් මෙය පෘතුග්‍රීසි අවධියේදී ඉදිකරන ලද බවත්, ඉංග්‍රීසි පාලකයන් විසින් ත්‍රිකෝණමිතිය සඳහා මෙම කුලුන භාවිත කර ඇති බව සඳහන් වෙයි.

දිගින් සහ පළලින් මීටර් 4.5 ප්‍රමාණයේ සමචතුරස්‍රකාර පාදමක් මත මෙම කුලුන ඉදිකර ඇති අතර නිරිත දෙසින් කුලුන තුළට පිවිසීමට දොරටුවක් පිහිටා ඇත. මෙම කුලුන තුළින් ඉහළට ගමන් කිරීම සඳහා සර්පිලාකාර පියගැට පෙලකි. කුලුනේ ශීර්ෂයට මීටර් 2 ක් පමණ පහළින් පියගැටපෙළ අවසන්වන අතර, මුදුනට නැගීමට කුමන ක්‍රමයක් භාවිත කළේද යන්න නිගමනය කර ගැනීමට සාධක දැකිය නො හැකි ය. මෙහි අවට පරිසරය නිරීක්ෂණය කිරීමට කුලුනේ පාදමේ සිට මීටර් 4 ක් පමණ උසින් බටහිර දිශාවට විවර වූ එක් කවුළුවක් ද, කුලුනු ශීර්ෂයෙහි එක් සිදුරක් ද වේ. මෙය ගඩොල් සහ කොරල් ගලින් බඳින ලද්දක් වන අතර කුළුණේ ඉහළ ම කොටස කොරල් ගලින් ඉදිකර ඇත.



**ඌරුමලෙයි ප්‍රදීපාගාරය**

මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 49 ඌරුමලෙයි දකුණ ග්‍රාම නිලධාරි වසමේ ඌරුමලෙයි ග්‍රාමයේ මෙම ප්‍රදීපාගාරය පිහිටා ඇත.

යකඩ ලෝහයෙන් නිර්මාණය කර ඇති මෙම ප්‍රදීපාගාරය යටත් විජිත අවධියට අයත් වේ. වෘත්තාකාරව යකඩ කුලුනු 07 ක් මත ප්‍රදීපාගාරය සකසා ඇත. එක කුලුනක විෂ්කම්භය මීටර් 1.3 ක් පමණ වන අතර ක්‍රමයෙන් සිහින්වන ලෙස සකසා ඇත. මෙය උසින් මීටර් 35 ක් පමණ වේ. ඉතාමත් අබලන් තත්වයේ ඇති මෙම කුලුනෙහි කොටස් කඩා වැටීමේ අවදානමක් පවතී. 1931 ප්‍රකාශයට පත් කරනලද "Sailing Directions for the West Coast of India" කෘතියෙහි මෙය කළු වර්ණයෙන් යුත් යකඩ ඉදිකිරීමක් ලෙස පවතින බවත් මීටර් 34.4 ක උසින් යුක්ත බවත් සඳහන් කර ඇත.





**තිරුකේතිශ්වරම් කෝවිල**

තිරුකේතිශ්වරම් ග්‍රාම නිලධාරි වසමේ තිරුකේතිශ්වරම් ග්‍රාමයේ පිහිටා ඇත.

ශිව දෙවියන් මුල්කොටගත් ශ්‍රී ලංකාවේ පිදුම් ලබන ප්‍රධාන කොවිල් අතර වැදගත් ස්ථානයක් ලෙස මෙම කෝවිල හැඳින්විය හැකි ය. මහාතිත්ථය හෙවත් පුරාණ මාතොට වරාය ආශ්‍රිතව මෙම කෝවිල ඉදිකර ඇත.

මෙම ස්ථානයට හින්දු බලපෑම තදින්ම පැවැති බවට සාධක ඇති අතර, සිරිමේඝවණ්ණ රජ සමයේ (ක්‍රි.ව. 301-328) මෙම ස්ථානයේ කෝවිලක් තිබූ බවට දාඨාවංසයෙහි සඳහන් වේ. ක්‍රිස්තු

වර්ෂ 7 වන සියවසේ දී රචිත තේවාරම් නම් දෙමළ ශිව ගී අනුව එකල ලංකාවේ මාන්තෝට්ටමේ සහ තිරුක්කෝණමලේ පමණක් ශිව කෝවිල් දෙකක් විය. ක්‍රි.ව. 993 දී පමණ තාළි කුමාරන් නම් චෝළ නිලධාරියෙක් මාතොට රාජ රාජේශ්වර නම් කෝවිලක් සාදන ලද අතර මහාතිත්ථ යනු රාජරාජපුර යයි නම්කරන ලදැයි වංශකථාවේ දැක්වේ.

ක්‍රි.ව. 1540 න් පසු පෘතුගීසි හා ලන්දේසින්ගේ බලපෑමෙන් මෙම කෝවිල විනාශ කරන ලද අතර, වර්තමානයේ දක්නට ලැබෙන ගොඩනැගිලි මෑතකාලයේ ඉදිකරන ලද ඒවා ය. දැනට මෙම සමස්ත භූමිය පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.





කෝවිලට ඇතුලුවන මාර්ගයේ මීටර් 200 ක් පමණ ගමන් කළ විට මාර්ගයේ දකුණු පසින් වැවට මුහුණලා ඉංග්‍රීසි අවධියට අයත් යැයි සැළකිය හැකි මෙය මිණුම් කටයුතු සඳහා භාවිත කළ කුළුණකි. මෙය උසින් මීටර් 8 ක් පමණ වේ. මෙය මාලක හතරක් පිටතට පෙනෙන ලෙස සැකසූවක් වන අතර පහතම මාලකය මීටර් 2.4 ක් උස මීටර් 2.3 ක් ද වන චතුරස්‍රකාර හැඩැති ඉදිකිරීමකි. එයට ඇතුලුවීම සඳහා සෙ.මී. 70 උසැති ආරුක්කුවකි. ආරුක්කුව ඇතුළත කුලුනු මධ්‍යයේ සමචතුරස්‍රාකාර සිදුරක් දැකිය හැකි ය. මෙය කුලුනේ ඉහළ කෙළවර දක්වා ම විහිදී යයි. මිණුම් උපකරණය සවිකළ පසු එය නිවැරදිව පිහිටුවීම සඳහා ලඹ කිරීමට මෙම සිදුර උපයෝගී වන අතර කුළුණ ඉදිකිරීම සඳහා හිරිගල් හා ගඩොල් භාවිත කර තිබේ.

**පැරණි ලන්දේසි පල්ලිය**

මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාන්තෙයි තිරුකේතිෂ්වරම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇත. මාන්තෙයි හන්දියෙන් තිරුකේෂ්වරම් කෝවිල මාර්ගයෙහි ආරම්භක ස්ථානයේ මාර්ගයේ වම්පසින් මෙම ස්ථානය පිහිටා ඇත.

මඩු මැණියන්ගේ සුරුවම පළමු වරට මෙම ස්ථානයේ තැන්පත් කර තිබූ බව ජනප්‍රවාදයයි. ඒ අනුව මෙහි ක්‍රි.ව. 1670 දී පමණ පැරණි පල්ලියක් තිබූ බවට මෙහි ඇති ඵලකය සාක්ෂි සපයන අතර, දැනට මෙම ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ම ඉවත් කොට ඇතත් එම ගොඩනැගිල්ලේ කොටස් තැන තැන දැකිය හැකි ය. තවද මෙම භූමියේ සුලභ වශයෙන් පැරණි මැටි බඳුන් කැබලි හා ගඩොල් කැබලි විසිරී ඇත. භූමියේ එක් අන්තයක පැරණි ස්තූපයක් පැවති බව සැළකේ. මේ වන විට එම ස්ථානයත් ඩෝසර් කර විනාශ කර ඇත.




**මාන්තෝට්ටම් නටබුන් ස්ථානය**

මාන්තෝට්ටම් ග්‍රාම නිලධාරි වසමේ මාන්තෝට්ටම් ගමෙහි පිහිටා ඇත. මෙම ස්ථානය පිහිටා ඇත්තේ A14 මාර්ගයේ මන්නාරම දෙසට ගමන්කළ විට හමුවන කිලෝමීටර් 68 කණුව පසුකර මීටර් 400ක් පමණ ඉදිරියට ගමන් කිරීමෙන් පසු මාර්ගයට මුහුණලා මාර්ගයේ දකුණු පසිනි.



මෙම ස්ථානයේ වර්තමානයේ කෝවිලක් ඉදිකර ඇත. මෙහි එක් ගල් කණුවක් පමණක් සිටුවා ඇති අතර, මෙය ඉතා රළු ලෙස සකසන ලද්දකි. කෝවිල සැකසීම සඳහා කොන්ක්‍රීට් කණු භාවිත කර ඇත. උස මීටර් 2.80 ක් හා දිග හා පළල සෙන්ටිමීටර් 35 ක් පමණ ද වන ගල් කණුව පිටතින් ගෙනවිත් සිටුවන ලද්දේ ද, මෙම ස්ථානයේ ම පැවති එකක් ද යන්න නිශ්චය කිරීම අපහසුය.

**ශාන්ත තෝමස් පල්ලිය**

අංක 88 නාගතාල්වු ග්‍රාම නිලධාරි වසමේ නාගතාල්වු ගමෙහි පිහිටා ඇත. A14 මාර්ගයේ මන්නාරම දෙසට ගමන් කිරීමෙන් හමුවන මුල්ලිපල්ලම් හන්දියෙන් දකුණට හැරී නාගතාල්වූ මාර්ගයේ කිලෝමීටර් 2.5 ක් පමණ ගමන් කිරීමෙන් හමුවන නාගතාල්වූ වැව ඉදිරියෙන් පිහිටි මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.



වසර 100 වඩා පැරණි පල්ලියකි. හුණුගල්, කොරල් ගල් හා ගඩොල් භාවිතයෙන් ඉදිකරන ලද මෙම පල්ලියේ වහලය විනාශ වී ඇති අතර, බිත්ති ද අබලන්ව ඇත. පල්ලියේ දිග මීටර් 26.2 ක් ද පළල මීටර් 10 ක් පමණ ද වේ. බිත්තියෙහි පළල සෙ.මී. 60 කි.

අල්තාරය කොටසට පිටුපසින් තවත් කාමරයක් ද වේ. පල්ලිය මධ්‍යයෙන් වහලය රැඳවීම සඳහා වෘත්තාකාර කුලුන 08ක් ඉදිකර ඇත. නැගෙනහිරට මුහුණලා ඇති මෙම දේවස්ථානයේ ඉදිරියෙන් දොරටු තුනක් ද දෙපසින් දොරටු දෙකක් ද වේ.

**මාන්තායි - අඩම්පන් මාර්ගයට යාබද ඉඩම්වල පුරාවිද්‍යා නටබුන් අංක 01**

තිරුකේතිෂ්වරම් ග්‍රාම නිලධාරි වසමේ මාන්තායි ග්‍රාමයේ පිහිටා ඇත. මාන්තායි හන්දියට පැමිණ අඩම්පන් මාර්ගයේ මීටර් 100-150 ක් පමණ ගමන් කිරීමෙන් මාර්ගයෙන් දකුණු පසින් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.



අඩම්පන් මාර්ගයේ මීටර් 200 ක් පමණ ගමන්කළ විට මාර්ගයේ දකුණු පසින් වූ පර්චස් 20 ක් පමණ වූ භූමියේ බහුලව ගඩොල්, උළු හා මැටි බඳුන් කැබලි දැකිය හැකි ය. වගා කටයුතු සඳහා ඉඩමෙහි පස් පෙරලා ඇත. එම පස් අතර ඇති මැටි බඳුන් කැබලි අතර කළු සහ රතු මැටි බඳුන් කැබලි, කළු මැටි බඳුන් කැබලි හා රතු මැටි බඳුන් කැබලි යන වර්ග තුනටම අයත් මැටි බඳුන් කොටස් හඳුනා ගන්න ලදී. ඉඩමෙහි නැගෙනහිර මායිමේ පැරණි ගල් කණු කොටසක් දැකිය හැකි ය. එය දිග සෙ.මී. 70 ක් හා පළලින් සෙ.මී. 27 ක් පමණ වේ. මෙම ස්ථානය පුරාණ මාන්තෙයි රජ මහා විහාරයට මීටර් 500 ක් පමණ දුරින් පිහිටා ඇත.

**මාන්තායි අඩම්පන් මාර්ගයට යාබද ඉඩම්වල පුරාවිද්‍යා නටබුන් අංක 02**

තිරුකේත්තිෂ්වරම් ග්‍රාම නිලධාරි වසමේ මාන්තායි ග්‍රාමයේ පිහිටා ඇත. මාන්තායි හන්දියෙන් අඩම්පන් මාර්ගයේ මීටර් 50 ක් පමණ ගමන් කිරීමෙන් මාර්ගයෙන් වම් පසින් වූ ඉඩම් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.





අක්කරයක් පමණ වන භූමියේ කණු පාදම් ගල් කිහිපයක්, ගල් කණු කොටස්, ගඩොල්, උළු හා මැටි බඳුන් කැබලි දැකිය හැකි ය. මෙම ස්ථානයේ දක්නට ඇති කණු පාදම් ගල් හුණු ගලින් කරන ලද ඒවා වන අතර, උළු හා ගඩොල් අනුරාධපුර අවධියට අයත් වේ. මේ අතර පිළිම පාදමක් ලෙස අනුමාන කළ හැකි පාදම් ගලක් ද වේ. මෙම කණු පාදම් ගල් පිහිටි ස්ථානයට මීටර් 25 ක් පමණ දුරින් ගල් කණු කොටස් කිහිපයක් දැකිය හැකි ය. බොහෝ කණු පාදම් ගල් කඩා දමා ඇත. මෙම ස්ථානය පුරාණ මාන්තෙයි රජ මහා විහාරයට මීටර් 400 ක් පමණ දුරින් පිහිටි ස්ථානයක් වන අතර එකම විහාර සංකීර්ණයකට අයත් වූ ප්‍රදේශයක් වන්නට ඇති බවට සැළකිය හැකි ය.

**මාතොට පැරණි වරාය සහ දිය අගල**

තිරුකේත්තිෂ්වරම් ග්‍රාම නිලධාරි වසමේ තිරුකේත්තිෂ්වරම් ග්‍රාමයේ මෙය පිහිටා ඇත. මාන්තායි හන්දියෙන් තිරුකේෂ්වරම් කෝවිල වටා පසුපසින් හා දෙපසින් මෙම දිය අගල දැකගත හැකි ය.

අතීතයේ දී මෙම ස්ථානය මහවොටි, මහපුටු, මහවුටු, මවතුතොට, මහපටන, මාතොට යන නම්වලින් හැඳින්වූ බවට ශිලාලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රමය තොරතුරු සාක්ෂි දරන අතර, දෙමළ භාෂාවෙන් මාන්තොට්ටම් ලෙස හඳුන්වයි. ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසේ දී ටොලමි විසින් මදොට්ටු (Madouttu) ලෙස ද නම්කරන ලද්දේ මෙම ස්ථානයයි. ශ්‍රී ලංකාවේ පැරණි ම වරාය හා අනුරාධපුර රාජධානියට ආසන්නතම වරාය මාතොට හෙවත් මහාතිත්ථ වරායයි. මෙම වරාය ක්‍රි.පූ. 2 සියවසේ සිට ක්‍රි.ව. 13 සියවස දක්වා සක්‍රීය තිබූ බව සැලකේ.



ක්‍රිස්තු වර්ෂ 6 වන සියවස වන විට වරායක් ලෙස විශාල වාණිජ වැදගත්කමක් අත්කර ගත් වරාය ඇතුලු වූ නැව් අතර පර්සියානු සහ අක්සුමයිට් නැව් ද, අඩුලීස්හි යාත්‍රා ද, ඉන්දියානු, චීන හා ඈත පෙරදිග නැව් සහ වෙළෙන්දෝ මෙහි පැමිණ ඇත. මෙය ස්වභාවික වරායක් වන අතර මෙහි විවිධ රටවල්වලින් පැමිණෙන නෞකා මාතොටට නුදුරු මුහුදේ නැංගුරම් දමන අතර, එහි සිට කුඩා යාත්‍රා ආධාරයෙන් ගොඩබිම හා ගනුදෙනු සිදුකරන්නට ඇති බවත්, ඒ සඳහා දිය අගල් දෙක උපයෝගි කරගන්නට ඇතැයි විශ්වාස කරයි. මේ හේතුවෙන් මාතොට ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස පවතින්නට ඇති බවට විශ්වාස කළ හැකි ය.



මෙම ස්ථානයේ දිය අගල් ද්විත්වයක් හා එයට මැදිවූ අශ්ව ලාඩමක හැඩය ගන්නා නගරයේ භූ දර්ශනය අතීතයේ දක්නට ලැබුණු බවට වාර්තා වන අතර වර්තමානයේ විවිධාකාර වූ පාරිසරික වෙනස්වීම් හේතුවෙන් මෙම භූ දර්ශනය හඳුනා ගැනීම අපහසු ය. දිය අගල් දෙක ස්ථාන කිහිපයකින් පමණක් හඳුනාගත හැකි ය. පැහැදිලි ව ම පසින් යටවූ නගරයක් ලෙස මෙම වරායට අයත් භූමිය හැඳින්විය හැකි ය.

මෙම වරාය 13 වන සියවසෙන් පසුව පරිහානියට පත්වන්නට ඇති බවට පුරාවිද්‍යාත්මක කැණීම්වලින් හඳුනාගෙන ඇත. මෙම නගරය තුළට තිරුකේතීෂ්වරම් කෝවිල, මාතොට විහාරය හා පැරණි ජනාවාස සාධක සහිත භූමිය ද අයත් වේ.

මෙම වෙළඳ නගරය පැවැති ප්‍රදේශයෙන් බහුලව මැටි බඳුන් කැබලි, චීන බඳුන් කැබලි, පබලු, ආභරණ (වළලු) තැනීම සඳහා භාවිතයෙන් පසු ඉතිරි වූ හක් බෙල්ලන්ගේ කොටස් ද හමුවේ. තවද මෙම ස්ථානයේ ඇති වැදගත්කම වැඩි කිරීමට හේතුදෙන සාධකයක් ලෙස හඳුනාගත හැකි පබලු නිෂ්පාදන උඳුන්වලට අයත් කොටස් හඳුනාගත හැකි ය. එහි දී උණු වූ අපද්‍රව්‍ය සමඟ බැඳුණු විවිධ වර්ණයේ වීදුරු අපද්‍රව්‍ය දක්නා ලැබේ. ඒ අනුව මෙම ස්ථානයේ යම් යම් දේ නිපදවීම හා අලෙවි කිරීම සිදුකරන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය.

**මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාර්තාගත කළ ස්මාරක**

**අරිප්පු කොටුව**

අරිප්පු බටහිර ග්‍රාම නිලධාරි වසමේ  මුක්තරිපුත්තුරයි ග්‍රාමයේ මෙය පිහිටා ඇත.

පෘතුග්‍රීසින් විසින් මෙම ස්ථානයේ පළමුව බලකොටුව ඉදිකර ඇති අතර, අනතුරුව ලන්දේසින් විසින් බලකොටුව අල්ලා ගන්නා ලදී. පසුව බලකොටුව ලන්දේසින් විසින් නවීකරණය කර ඇති අතර, ඒ බව 1672 අදින ලද සැලසුමකින් සනාථ වේ. මෙය ඉතා කුඩා ප්‍රමාණයේ බලකොටුවක් වන අතර, එහි කාලතුවක්කු අට්ටාල (Gun Bastion) දෙකකින් යුක්ත වේ. උක්ත සැලසුමට අනුව එහි දිග හා පළලින් මීටර් 20x20 ක් වන බව හඳුනාගත හැකි ය.



මෙහි මුතු කැඩීම ආශ්‍රිත කටයුතු සිදුකර අතර, මුතු එකතු කිරීම සඳහා යොදාගත් එකම බලකොටුව ලෙස මෙය හැඳින්විය හැකි ය. මුතු බෙල්ලන් කර්මාන්තය සෑම වසරකම මාර්තු හා අප්‍රේල් මාසවල සිදුකරනු ලබයි. කිමිදුම්කරුවන් සහ බෝට්ටු වැඩි ප්‍රමාණයක් යොදවා මෙම කාර්ය සිදුකර ඇති අතර, එකතු කරනු ලබන සියලුම මුතු ගබඩා කර අනතුරුව මුතුවල වර්ණය, ප්‍රමාණය හා ඔපය අනුව කාණ්ඩ කර වෙළඳපොළට නිකුත්කර ඇත.

බලකොටුවේ දක්නට ලැබෙන සාධක අනුව වයඹ දිශාවෙන් පිහිටි කාලතුවක්කු අට්ටාලයෙහි (Gun Bastion) අවශේෂ පමණක් තරමක් දුරට හඳුනාගත හැකි ය. කොරල් ගල්, හුණුගල් හා පිලිස්සු ගඩොල් භාවිතාකර ඉදිකර ඇති මෙම කොටුව තුළ පැරණි පල්ලිය ද හඳුනාගත හැකි අතර කොටුවේ කොටු තාප්පය ද තැන තැන දකගත හැකි වේ. කොටුව ආසන්නයෙන් පැරණි ළිඳක් සහ දකුණු අන්තයේ චාර්ලිස් ලෙයස් නම් ඉංග්‍රීසි ජාතික බැංකු නිලධාරියෙකුගේ සොහොන් කොතක් ද දැකිය හැකි ය. එහි ඔහු මියගිය වර්ෂය ලෙස 1878 අප්‍රේල් 14 ලෙස දක්වා ඇත.




**ඩොරික් ගොඩනැගිල්ල**

අරිප්පු නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ අරිප්පු ග්‍රාමයේ මෙය පිහිටා ඇත.

ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වන ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා වාසය කරන ලද නිවස මෙය බව සැළකේ. වර්ෂ 1804 දී ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ලේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අනුව එකල ඉතා අලංකාර ගෘහයක් වශයෙන් පැවති බව සිතිය හැකි ය. දෙමහල් ගොඩනැගිල්ලක් වන මෙම මන්දිරයේ පහත මාලයේ කුඩා නිදන කාමර හතරක් තිබූ බව කියැවෙන අතර, වර්තමානයේ කාමර දෙකක් පමණක් පැහැදිලි ව හඳුනාගත හැකි ය. ඉහළ මහලට නැගීමට සකස් කළ පියගැටපෙළක් ගොඩනැගිල්ලේ මධ්‍යයේ වේ. ඉහළ මාලය මධ්‍යයේ සුවිසල් භෝජන ශාලාවට යාබඳවම ආණ්ඩුකාරවරයාගේ නිදන කුටිය තිබූ බව සඳහන් වන නමුත් වර්තමානයේ මෙම අංග දැකිය නො හැකි ය. මේ වන විට මෙම ගොඩනැගිල්ල හඳුනාගත නො හැකි තරමට විනාශ වී ඇති අතර ගොඩනැගිල්ලේ පසුපස කොටස මුහුදු ඛාදනය නිසා සම්පූර්ණයෙන් ම මුහුද දෙසට කඩා වැටෙමින් පවතී.



ගොඩනැගිල්ල ගඩොලින් නිමවා හුණු බදාමයෙන් කපරාරු කර ඇත. ගොඩනැගිල්ලේ සියලු දොර ජනෙල් ආරුක්කු සහිතව නිර්මාණය කර ඇති අතර, මෙහි සිට කොන්ඩච්චි ප්‍රදේශයේ මුතු කැඩීම පිළිබඳ කටයුතු මෙහෙයවීම සිදු කර ඇති බව සැළකේ. මෙම ගොඩනැගිල්ලට දෙපසින් සේවකයන් සඳහා ගොඩනැගිලි ඉදිකර තිබූ බවට වාර්තාවන අතර, එම ගොඩනැගිලිවල පාදම් කොටස් ඉතා පැහැදිලිව දැකගත හැකි වේ.

**තලෙයිමන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාර්තාගත කළ ස්මාරක**

**තලෙයිමන්නාරම රෝහල**

තලෙයිමන්නාරම ග්‍රාම නිලධාරි වසමේ තලෙයිමන්නාරම ග්‍රාමයේ මෙය පිහිටා ඇත.



**විනාශ වෙමින් පවතින වාට්ටු ගොඩනැගිල්ල**

දැනට ගරාවැටෙන තත්වයක පවතින මෙම ගොඩනැගිලි ක්‍රි.ව. 1800 හෝ ඊට ආසන්න කාල වකවානුවක දී ඉදිකරන්නට ඇතැයි සැළකේ. පිළිස්සු ගඩොල්, කොරල් ගල් හා හුණු ගල් අමුද්‍රව්‍ය වශයෙන් යොදාගෙන ඇත. වහලය විනාශ වී ඇත.

**පිරිමි වාට්ටු ගොඩනැගිල්ල**

මෑතක දී භාවිතයෙන් ඉවත්කරන ලද මෙම ගොඩනැගිල්ලෙහි වහලය සම්පූර්ණයෙන් ම විනාශ වී ඇති අතර, අලුතින් උළු සෙවිලි කර ඇත. හොදින් ආරක්ෂා වී ගොඩනැගිල්ලේ පවතින බිත්ති සඳහා විශේෂයෙන් සකස් කරන ලද සිමෙන්ති ගලක් භාවිත කර ඇත. මෙය දිගින් අඩි 1 අඟල් 9 ක් ද පළලින් අඟල් 7 ක් වේ. පොළොවට ඇල්ලීමට ආනයනික බිම් ගඩොලක් භාවිත කර ඇත. වහලය වා කවුලු සහිත ව නිර්මාණය කර ඇත. මෙම ස්ථානය අවට ඇති ගොඩනැගිලිවලින් වැඩි ප්‍රමාණයක් වසර 100 කට වඩා පැරණි ය.



**තලෙයිමන්නාරම පැරණි ජැටිය**

තලෙයිමන්නාරම ග්‍රාම නිලධාරි වසමේ ඕල්ඩ්පියර් ග්‍රාමයේ පිහිටා ඇත.

ගොඩබිම සිට මුහුද දෙසට ඉදිකොට ඇති ජැටියේ යකඩ කණු 12ක් දැකිය හැකි ය. කණු දෙකක් සමාන්තරව සිටුවා ඒ මත ජැටිය ඉදිකර ඇති අතර, කණුවක වට රවුම මීටර් 1.5 ක් උස මීටර් 2.2 ක් පමණ ද වේ. කණු දෙකක් අතර පරතරය මීටර් 5.8 කි. ජැටියේ පළල මීටර් 7.8 කි. මෙම ජැටිය වසර 100 කට වඩා පැරණි එකක් වන අතර, මෙහි බොහෝ කොටස් මුහුදු ජලය සහ මුහුදු සුළඟ හේතුවෙන් ඛාදනය වී ඇත.



**නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාර්තාගත කළ ස්මාරක**

**මුරුන්ගන් රජමහා විහාරය**



නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 125 ඒ ඉරට්ටෛයිකුලම් කේ.කේ. කුලම් ග්‍රාමයේ පිහිටා ඇත. කේ.කේ. කුලම් හන්දියට පැමිණ කට්ටේඅඩම්පන් මාර්ගයේ ගමන්කර සුසාන භූමිය අසලින් වමට හැරී පන්සල්වත්ත නම් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය. (ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 500 - 750 ක් පමණ දුරින්) අනුරාධපුර යුගයට අයත් බෞද්ධාගමික ස්ථානයක අවශේෂ විසිරි ඇති මෙම භූමියේ වර්තමානයේ කෙසෙල් වගාවක් නිසා මුලුමනින්ම පාහේ විනාශ වී ඇත. මෙම විනාශ වූ අවශේෂ අතර කවන්ධ ශෛලමය හිටි බුද්ධ ප්‍රතිමා දෙකක කොටස් දැකිය හැකි ය. මෙම ප්‍රතිමා දෙකෙහි ම අත් හා පා කොටස් ද කඩා දමා ඇත. මින් එක් ප්‍රතිමාවක් බිම පෙරළී ඇති අතර, එය බඳෙන් වෙන්ව කොටස් දෙකක් ලෙස දැකිය හැකි ය. ඒ ආසන්නයෙන් අනෙක් පිළිමය සිටුවා ඇත. මෙම පිළිමවලට නැගෙනහිරින් ඒ අසලම ගඩොල් කොටස් දැකිය හැකි මද උස් භූමියකි. බොහෝ සේ වල් වැදී ඇති මෙම ගොඩැල්ල පැරණි දාගැබක් හෝ පිළිම ගෙයක් විය හැකි ය. අවට භූමියේ මැටි බඳුන් කැබලි විසිරී ඇත.



**මාලිගාපිටිටි නටබුන්**

නානාටාන් ග්‍රාම නිලධාරි වසමේ මාලිගාපිට්ටි ග්‍රාමයේ පිහිටා ඇත.



ස්ථානයට ඇතුල්වීමේ දී වම් පසින් දාගැබ් ගොඩැල්ලක් දැකිය හැකි ය. ගොඩැල්ල මීටර් 30x30 වපසරියකින් යුක්ත ය. මෙම ගොඩැල්ලට මීටර් 40 ක් පමණ බටහිරින් කණු පාදම් 05 කින් සහ ගල්කණු 04 කින් යුත් ගොඩනැගිල්ලක අවශේෂ දක්නට ඇත. උක්ත ගොඩනැගිල්ලට මීටර් 10 ක් පමණ දකුණින් මඳ උස් භූමියකි. එය අවට ද ගල් කණු කොටස්, ගඩොල්, උළු කැබලි දැකිය හැකි ය. මෙහි පැරණි රජ මාලිගයක් තිබූ බවත්, එබැවින් වර්තමානයේ මාලිගාපිට්ටි ලෙස මෙම ප්‍රදේශය හඳුන්වනු ලබන බවත් ජනප්‍රවාදයේ සඳහන් වේ.



### 03. මුරුන්ගන් රෝහල, සෙල්ලිපිය අවට ප්‍රදේශයේ නටබුන්

මුරුංගන් ග්‍රාම නිලධාරි වසමේ මුරුංගන් ග්‍රාමයේ පිහිටා ඇත. මුරුන්ගන් හන්දියට ආසන්නට පිහිටි මුරුන්ගන් රෝහල හා රෝහලට පිටුපසින් වූ නටබුන් ස්ථානයන්ට ළඟාවිය හැකි ය.



මුරුන්ගන් රෝහලේ රෝගීන්ට වාඩිවීම සඳහා සකස් කර ඇති ගල් පුවරුව අපර බ්‍රාහ්මී (ක්‍රි.ව. 3-4 සියවස්) අක්ෂරයෙන් ලියන ලද පුවරු ලිපියකි. දිගින් මීටර් 160 ක් ද පළලින් සෙ.මී. 61 ක් ද වූ මෙහි අක්ෂර ගෙවී ගොස් ඇත. ලිපියෙහි කොටසක් කඩා ඉවත්කර ඇත. මෙහි අක්ෂර පේළි 05ක් දැකිය හැකි අතර, සමහර අක්ෂර කියවිය හැකි ය. මෙම ලිපියෙහි සඳහන් වන්නේ මහල්ලකනාග රජ විසින් කරවන ස්තූපයක් සහිත විහාරයක් වෙනුවෙන් කිසියම් අයෙකු විසින් සිදු කරන ලද ප්‍රදානයක් පිළිබඳ විස්තරයකි. මෙම ලිපිය වෙනත් ස්ථානයකින් ගෙන ආ බව සැළකෙන අතර, එම ස්ථානය මෙම රෝහලේ වෛද්‍ය සහ හෙද නිල නිවාස සකස් කිරීමට භාවිත කර ඇත. අතීතයේ එම ස්ථානයේ විශාල ගල් කණු සහිත ගොඩනැගිල්ලක නටබුන් තිබූ බව ඇසින් දුටුවෝ පවසන අතර, වර්තමානයේ එම ස්ථානයේ කිසිවක් දක්නට නොමැත. ඒ අවට ප්‍රදේශයේ පැරණි ගඩොල් හා කඩා දමන ගල් කණු කොටස් දැකිය හැකි ය.

සෙල්ලිපිය තිබූ ස්ථානයේ සිට මීටර් 75 ක් පමණ ගිණිකොණ දෙසින් දාගැබක් පැවති බව ජනප්‍රවාදයේ සඳහන් ස්ථානයකි. මෙම පෞද්ගලික ඉඩමෙහි පැරණි ගඩොල් බහුලව දැකිය හැකි අතර, තැනින් තැන ගඩොල් බැමි දක්නට ලැබේ. මෙම ඉඩමේ මදක් ගෙවී ගිය සිරිපතුල් ගලක් ද වේ.



ඉහත ස්ථානයට ගිනිකොණ දෙසින් මාලතී ප්‍රනාන්දු මහත්මියගේ ඉඩමේ කණුපාදම් ගලක් සහ ගල් බාල්කයක් දක්නා ලැබේ. මෙම ස්ථානයට ගමන් කරන මාර්ගයන්හී පොළොවේ ද ගඩොල් බහුලව විසිරී ඇත. මෙය නටබුන් සංකීර්ණයක් වන අතර මෙය මූරුන්ගන් පිට්ටි නම් වූ ග්‍රාමය පුරාම විසිරී ඇති බව කිව හැකි ය.

රෝහලට දකුණු දෙසින් මීටර් 100-150 ක් පමණ දුරින් පිහිටි පෞද්ගලික ඉඩමක ද ගඩොල් බැම්මක් දැකිය හැකි ය. මීට අමතරව මෙම ඉඩම්වල කළු සහ රතු මැටි බඳුන් කැබලි හා රතු මැටි බඳුන් කැබලි ද දක්නා ලැබේ. ඉහත ඉඩමට බටහිරින් වූ ඉඩමෙහි සෙ.මී. 115 දිගින් හා

සෙ.මී. 30 ක් පළලින් වූ පෙරලී ගිය ගල් කණු කොටසක් ද එය අවට ගඩොල් කොටස් ද දැකිය හැකි ය.

රෝහලට බටහිරින් පිහිටි පල්ලියට ආසන්නයේ පිහිටි ඉඩමේ සෙ.මී. 170 ක් දිගින් හා සෙ.මී. 35 ක් පළලින් පෙරළී ගිය වූ ගල් කණු කොටසක් දැකිය හැකි ය.

**වංකාලෙයි ජනාවාස සාධක**

නරුවිලිතක්කුලම් ග්‍රාම නිලධාරී වසමේ වංකාලෙයි ග්‍රාමයේ පිහිටා ඇත. මන්නාරම මාර්ගයෙහි හමුවන තිරනාවිකුලම් හන්දියෙන් වමට ගමන්කර මාර්ගයේ දකුණු පසින් වූ නර්ලිකුලම් සුසාන භූමියට දෙපසින් වූ ප්‍රදේශයට ළඟාවිය හැකි ය.



මෙම ස්ථානයට මෙම නම භාවිත කිරීමට හේතුව වී ඇත්තේ "නැව් නවත්වන ස්ථානය" වූ බැවිනි. මෙම ස්ථානයෙහි 1978-79 වර්ෂවල දී ජෝන් කාස්වෙල් මහතා විසින් සිදුකර ඇති කැණීම් අනුව ක්‍රිස්තු වර්ෂ 10-12 සියවස්වලට අයත් මැටි බඳුන් කොටස් හඳුනා ගෙන ඇත. එම කැණීම් සිදුකළ ස්ථානය මෙම ගවේෂණයෙන් හඳුනා ගැනීමට නො හැකි වූ අතර, අවට ප්‍රදේශය නිරීක්ෂණය කරන ලදී. එහි දී කළු සහ රතු, කළු මැටි බඳුන් කැබලි බහුලව විසිරි තිබෙනු දැකිය හැකි විය. ඒ අතර සෙරමික් කැබලි ද විය. මෙම මැටි බඳුන් කැබලිති විසිරීම විශාල භූමි ප්‍රදේශයක් පුරා දැකගත හැකි අතර, විසිරීම නැගෙනහිර දිශානුගතව බහුලව දැකගත හැකි ය. විවිධ හැඩතල සහ විවිධ ඝනකම්වලින් යුක්ත මැටි බඳුන් කැබැලි දැකිය හැකිවීම විශේෂ ලක්ෂණයකි.

**මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාර්තාගත කළ ස්මාරක**

**තේක්කම අමුණ**




තේක්කම ග්‍රාම නිලධාරි වසමේ තේක්කම ග්‍රාමයේ පිහිටා ඇති මෙම අමුණ මල්වතු ඔය හරස් කර තනන ලද්දකි. අමුණ අනුරාධපුර අවධියට අයත් බව ශේෂව ඇති සාධක අනුව පෙනී යයි. මෙහි දක්නට ලැබෙන සාධක අනුව අනුරාධපුර, පොළොන්නරු සහ ඉන් පසු අවධිවල දී ද වරින්වර ප්‍රතිසංස්කරණය කිරීම්වලට ලක් කර ඇත. මල්වතු ඔය හරස්කර යෝධ ඇළට ජලය ලබා ගැනීම සඳහා මෙම අමුණ ඉදිකර ඇත. කලුගලින් ඉදිකරන ලද මෙම අමුණේ දිග මීටර් 150 ක් පමණ ද පළල මීටර් 4.80 ක් අමුණේ උස මීටර් 4.3 ක් පමණ වේ. කලුගල් වරි 8 ක් යොදා සකසන ලද අමුණේ බටහිර අන්තයෙන් අමුණේ ජලය පිටකිරීම සඳහා පිටවානක්

වශයෙන් භාවිත කරන කවුලු දෙකකි. අමුණ ඉදිකිරීමේ දී අමුණේ ශක්තිය වැඩි කිරීම සඳහා එහි ඇතුල් පසට විශාල ගල් කුට්ටි යොදා ජල පහර වේගයෙන් බැම්මෙහි වැදීම වළක්වා ඇත.

**අකතිමුරිප්පු පත්තිනි දේවාලය**

තේක්කම ග්‍රාම නිලධාරි වසමේ අකතිමුරිප්පු ග්‍රාමයේ අකතිමුරුප්පු සොරොව්ව අසල මෙම ස්ථානය පිහිටා ඇත.





මල්වතු ඔය හරස් කර යෝධ ඇළෙහි වැඩි වතුර පිට කිරීමට තැනූ සොරොව්ව අසල මෙම පැරණි පත්තිනි දේවාලය පිහිටා ඇත. පත්තිනි දේවාලයක් ලෙස ව්‍යවහාරව පැවතුණ ද මෙම ස්ථානයේ සිරිපතුල් ගලක් හා පත්තිනි දේව රූපය ලෙස හඳුන්වන ගල් පුවරුවක අර්ධ උන්නතව නෙලන ලද කාන්තා රුවක උඩුකය කොටසක් දැකිය හැකි ය. තවද මෙම ස්ථානයෙන් වෘත්තාකාර ගල්කණු කොටස් කිහිපයක් සහ පසුකාලීනව සකසන ලද පුල්ලෙයාර් දේව රූපයක් ද වේ. මෙම පත්තිනි දේව රූපය සහ පුල්ලෙයාර් දේව ප්‍රතිමා සඳහා පුද පූජා කිරීම පිණිස සකසන ලද ආසනයක් ද දැකිය හැකි අතර මෙම ස්ථානය වර්තමානයේදී ද වන්දනාවට ලක් වේ.

**පෙරියවේලි නටබුන් දාගැබ**



පන්නවෙඩ්ඩුවාන් ග්‍රාමනිලධාරී වසමේ පෙරියකුංචිකුලම් ග්‍රාමයේ මෙය පිහිටා ඇත. මන්නාරම මාර්ගයේ ගමන් කර කුංචිකුලම් හන්දියෙන් (මාධාග්‍රාම හන්දිය) වමට හැරී කිලෝමීටර් 2 2/1 ක් පමණ ගමන් කිරීමෙන් හමුවන මාලියමෝට කැළය තුළට මීටර් 200 (බටහිර දෙසට) ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.



මාලියමොට-පෙරියවෙලි රක්ෂිතය තුළ මීටර් 12 ක පමණ විශ්කම්භයෙන් යුත් ගොඩැල්ලකි. මෙහි උස මීටර් 03 ක් පමණ වේ. මෙම ගොඩැල්ල මධ්‍යයෙහි දිග හා පළල මීටර් 8 x 5 ක පමණ වූ වලක් මීටර් 5 ක් පමණ ගැඹුරට හාරා ඇත. එම නිසා එහි වූ ගඩොල් විශාල ප්‍රමාණයක් අවට විසිරී ඇත. මෙම ස්ථානයේ දක්නට ඇති සාධක අනුව මෙය අනුරාධපුර අවධියට අයත් දාගැබක නටබුන් ලෙස නිගමනය කළ හැකි ය.

**කල්ලිකුලම් නටබුන්**



පෙරියමුරිප්පු ග්‍රාම නිලධාරි වසමේ ව්‍යාධිතොට්ටම් ග්‍රාමයේ පිහිටි මෙම ස්ථානයට ගමන් කිරීම සඳහා කුංචිකුලම් හන්දියෙන් (මාධාග්‍රාම හන්දිය) වමට හැරී පෙරියමුරුප්පු හන්දියට පැමිණ කල්ලිකුලම් මාර්ගයේ කිලෝමීටර් 2 ක් පමණ ගමන් කිරීමෙන් හමුවන ව්‍යාධිතෝට්ටම් නම් මාර්ගයෙන් දකුණු පසින් මීටර් 8 ක් පමණ ගමන් කිරීමෙන් ළඟාවිය හැකි ය.

කල්ලිකුලම් - පෙරියමුරිප්පු මාර්ගයේ දකුණු පසින් මාර්ගයට ආසන්නව මෙම හුදකලා වූ කණුපාදම් ගල දැකිය හැකි ය. සෙ.මී. 45 x 55 පමණ වූ ගල් කුට්ටිය මධ්‍යයේ විෂ්කම්භය සෙ.මී. 15 ක් වූ වෘත්තාකාර කණු සිදුරකි. එහි ගැඹුර සෙ.මී. 15 කි. මෙම කණු පාදමට සම්බන්ධ හෝ ඒ අවට වෙනත් කිසිදු පුරාවිද්‍යාත්මක අවශේෂයන් දක්නා නොලැබෙන බැවින් මෙය වෙනත් ස්ථානයකින් ගෙන එන ලද්දක් වශයෙන් සැළකිය හැකි ය.

**ඔට්ටම්කුලම් නටබුන්**



පෙරියමුරුප්පු ග්‍රාම නිලධාරි වසමේ පෙරියමුරුප්පු ග්‍රාමයේ පිහිටා ඇත. කුංචිකුලම් හන්දියෙන් (මාධාග්‍රාම හන්දිය) වමට හැරී පෙරියමුරුප්පු හන්දියට පැමිණ කල්ලිකුලම් මාර්ගයේ කිලෝමීටර් 3 ක් පමණ ගමන් කර කල්ලිකුලම් හන්දියෙන් තන්තිරිමලය මාර්ගයේ කිලෝමීටර් 2 ක් පමණ ගමන්කර දකුණු පසට ඔට්ටම්කුලම් වැව පාරේ මීටර් 300 ක් ගමන් කර මාර්ගයේ වම්පසින් වනය තුළට මීටර් 20 ක් පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.



පොළොවෙහි සිටුවන ලද ගල්කණු 25 කින් පමණ සමන්විත නටබුන් ගොඩනැගිල්ලක් ලෙස මෙය හැඳින්විය හැකි ය. මෙම ගල් කණු පොළොව මට්ටමින් ඉහළට සෙ.මී. 45 ක පමණ උසකින් යුක්ත ය. මෙම ගොඩනැගිල්ල කුමන අවශ්‍යතාවයකට භාවිත වූයේ ද යන්න වාස්තුවිද්‍යා ලක්ෂණ අනුව හඳුනාගත නො හැකි ය. ස්ථානය අවට ප්‍රදේශයේ අනුරාධපුර යුගයට අයත් පැරණි උළු කැබලි බහුලව විසිරී ඇත. තවද කළු රතු මැටි බඳුන් කැබලි ද තැන තැන විසිරී තිබෙනු දැකිය හැකි ය.

**කල්යාන තෝට්ටම් පැරණි ජනාවාස භූමිය**

මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කල්යාන තෝට්ටම් ග්‍රාමයේ පිහිටා ඇත. කුංචිකුලම් හන්දියෙන් (මාධාග්‍රාම හන්දිය) වමට හැරී පෙරියමුරුප්පු හන්දියට පැමිණ කල්ලිකුලම් මාර්ගයේ මීටර් 300 ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.



මෙම ස්ථානයේ වර්ග මීටර් 30 ක පමණ ප්‍රදේශයක පැරණි මැටි බඳුන් කැබලි විසිරී ඇත. මෙම මැටි බඳුන් කැබලි අතර කළු සහ රතු මැටි බඳුන් කැබලි, කළු මැටි බඳුන් කැබලි හා රතු කැබලි යන වර්ග තුනම දක්නට ලැබේ. යබොර හා යපස් මෙන් ම තිරිවාන සහ කහඳ ඉතා සුළු වශයෙන් දැකිය හැකි ය. මෙම ප්‍රදේශය අවට අවම වශයෙන් වර්ග කිලෝමීටර් 1ක් පමණ ගවේෂණය කර පර්යේෂණ කැණීමක් කිරීම සහ පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු වේ.

**මන්නාරම බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාර්තාගත කළ ස්මාරක**

**පිල්ලෙයාර් කෝවිල් තාරම මඩම්**

විඩ්තලතිව් උතුර එන් එම් 11 ග්‍රාම නිලධාරි වසමේ විඩ්තලතිව් ග්‍රාමයේ පිහිටා ඇත. මන්නාරම - යාපනය මාර්ගයේ පල්ලෙමඩු හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 1.25 ක් පමණ වෙඩිතලතිව් ගමට ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.



තිරුකේෂ්වරම් කෝවිල වන්දනාව පිණිස ගමන් ගන්නා බැතිමතුන් වෙනුවෙන් ඉදිකරන ලද මෙම මඩම (අම්බලම) වසර 150 ක් පමණ පැරණි වූවකි. හුණු ගල් භාවිතයෙන් ඉදි කරන ලද්දක් වූ මෙම ගොඩනැගිල්ලේ වහලය වර්තමානයේ දක්නට නොමැත. ගොඩනැගිල්ලට පිටතින් ප්‍රාකාරයක් දැකිය හැකි අතර, එම ප්‍රාකාරයෙන් කොටසක් ද විනාශ වී ඇත. මෙම ගොඩනැගිල්ලේ පිවිසුම් දොරටුව නැගෙනහිරට පිහිටා ඇත. වර්තමානයේ මෙම අම්බලමේ ජනෙල් හා උළුවහු ගලවා ඇත. මෙම ගොඩනැගිල්ල සෙ.මී. 60 ක් පමණ උස වේදිකාවක් මත ඉදිකර ඇති අතර, මෙම අම්බලමට අයත් පරිවාර ගොඩනැගිලි කැඩී ගොස් ඇති බව පෙනේ. පුරාණයේ මන්නාරම - යාපනය දක්වා ගමන් මග මෙම ස්ථානය හරහා පැවති බව ජනප්‍රවාදයේ කියැවේ.

**සවරිකුලම් පැරණි ජනාවාස භූමිය**

කෝවිල්කුලම් ග්‍රාම නිලධාරි වසමේ සවරිකුලම් ග්‍රාමයේ මෙය පිහිටා ඇත. මන්නාරම - යාපනය මාර්ගයේ සවරිකුලම් හන්දියෙන් වමට හැරී කලපුව දෙසට මීටර් 500 පමණ (කොම්බුතිව් දෙසට) ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.



මෙම ස්ථානයේ විශාල ප්‍රදේශයක් (අක්කර 5-10) පුරා පැරණි මැටි බඳුන් කැබලි විසිරී ඇත. මෙම මැටි බඳුන් කැබලි අතර කළු සහ රතු මැටි බඳුන් කැබලි, කළු මැටි බඳුන් කැබලි, රතු මැටි බඳුන් කැබලි සහ සිප්පි කටු බහුලව දක්නට ලැබේ. මෙම ස්ථානයට බටහිර දිශාවෙන් කිලෝමීටර් 1 ක් පමණ දුරින් කලපුව පිහිටා ඇති අතර, මීටර් 500 ක් පමණ දුරින් ඒ 32 මාර්ගය පිහිටා ඇත.

**සෙන්ගල්පුට්ටු නටබුන්**



කෝවිල්කුලම් ග්‍රාම නිලධාරි වසමේ සෙන්ගලපුට්ටු ග්‍රාමයේ පිහිටා ඇත. සවරිකුලම් හන්දියෙන් වමට හැරී කලපුව දෙසට මීටර් 1500 පමණ (කොම්බුතිව් දෙසට) ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

මෙම ස්ථානයේ කණුපාදම් ගල් හතරක් දැකිය හැකි ය. කණු පාදමේ සිදුරේ දිග හා පළල සෙ.මී. 11 x සෙ.මී. 11 ක් ද ගැඹුර සෙ.මී. 7 ක් වේ. මෙම ස්ථානය අවට මැටි බඳුන් කැබලි හා ගඩොල් කැබලි ද දැකිය හැකි ය.

**කොම්බතුක්කී තෝට්ටපුට්ටු පැරණි ජනාවාස භූමිය**

කෝවිල්කුලම් කල්ලිආඩි ග්‍රාම නිලධාරි වසම්වල පැතිර පවතින කෝවිල්කුලම් ග්‍රාමයේ පිහිටා ඇත. මන්නාරම - යාපනය මාර්ගයේ කල්ලඅඩි හන්දියෙන් වමට හැරී කොම්බතිව් දෙසට කිලෝමීටර් 3 පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය. මෙම ස්ථානයේ බහුල ලෙස පැරණි මැටි බඳුන් කැබලි විසිරී ඇත. මඳ වශයෙන් පැරණි ගඩොල් කැබලි මෙහි දැකිය හැකි ය. මෙම ස්ථානයට උතුරින් හා බටහිරින් කලපුව පිහිටා ඇත.



**කල්ලිඅඩි වරිච්චිමෝට්ටෙයිකුලම් නටබුන්**

කල්ලිආඩි ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇත. කල්ලිඅඩි හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 1 ක් පමණ ගමන්කර කල්ලිඅඩි ගමෙහි වැව කෙළවරට ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

දකුණු දිශානුගතව වූ වැව් බැම්මේ බටහිර දිශාවේ පිහිටා ඇති මෙම ස්ථානයේ එක් කණු පාදම් ගලක් දැකිය හැකි ය. තවද විශාල ප්‍රදේශයක් පුරා පැරණි මැටි බඳුන් කැබලි විසිරී ඇත. පොළොව මතුපිට මෙන් ම පස් තට්ටුව තුළ ද මැටි බඳුන් කැබලි දක්නා ලැබේ. මේ අතර අනුරාධපුර අවධියට අයත් උළු කැබලි සුළු වශයෙන් විසිරී ඇත.



**අට්ටතීව් පැරණි ජනාවාස භූමිය**



වෙඩිතලතිව් උතුර ග්‍රාම නිලධාරි වසමේ අට්ටතීව් (කුඩලුදූපත) ග්‍රාමයේ පිහිටා ඇත. මන්නාරම සිට යාපනය මාර්ගයේ පල්ලෙමඩු හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 1.25 ක් පමණ වෙඩිතලතිව් දක්වා ගමන් කිරීමෙන් පසු හමුවන හන්දියෙන් වමට පිහිටි අට්ටතීව් මාර්ගයේ මීටර් 500 ගමන්කළ පසු මාර්ගයේ වම් පසින් පළමුව හමුවන ගොඩබිමෙහි වූ මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

කලපුවෙන් වට වූ දූපතක් වන මෙම ස්ථානයේ පැරණි මැටි බඳුන් කැබලි විසිරි ඇත. මෙම මැටි බඳුන් කැබලි අතර කළු සහ රතු මැටි බඳුන් කැබලි, කළු මැටි බඳුන් කැබලි, රතු මැටි බඳුන් කැබලි බහුලව දක්නට ලැබේ.

**සෙන්ගල්පූට්ටි (පාම්බුපිට්ටි) පැරණි ජනාවාස භූමිය**

කෝවිල්කුලම් ග්‍රාම නිලධාරි වසමේ සෙන්ගල්පූට්ටි ග්‍රාමයේ පිහිටා ඇත. මන්නාරම - යාපනය A32 මාර්ගයේ මින්නිඑරින්ජාල් හන්දිය (පාලම) පසුකර මීටර් 50 ක් ඉදිරියට ගමන් කර මාර්ගයෙන් වම්පසට හැරී මීටර් 500 ගමන් කිරීමෙන් (පාම්බුපිට්ටි දෙසට) මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

මෙම ස්ථානයේ පස් තට්ටුව තුළ මතුපිටට පෙනෙන අයුරින් පැරණි මැටි බඳුන් කැබලි විසිරි ඇත. මෙම මැටි බඳුන් කැබලි අතර සිප්පිකටු ද බහුලව දක්නට ලැබේ. කලපුවට මැදිවූ දූපතක් ලෙස හඳුනාගත හැකි ය.



**මුත්තුමාරීඅම්මන් කෝවිලේ පුරාවිද්‍යා නටබුන්**

කල්ලිආඩෙයි ග්‍රාම නිලධාරි වසමේ ඉලුප්පකඩවෙ ග්‍රාමයේ පිහිටා ඇත. මන්නාරම - යාපනය මාර්ගයේ සුට්ටපිඩ්ඩි හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 2 ක් ගමන් කිරීමෙන් පසු හමුවන සුට්ටපිඩ්ඩි කෝවිල් භූමියේ මෙම නටබුන් දැකිය හැකි ය.

මෙම ස්ථානයේ නවීකරණයට ලක්වූ පැරණි කෝවිලක් දැකිය හැකි ය. කෝවිලට ඉදිරියෙන් දකුණු දෙසින් කණු පාදම් ගලකි. එහි කුඩුම්බි සිදුර කඩා දමා ඇත. කෝවිලට මීටර් 6 ක් පමණ පිටුපසින් බටහිර දිශාවෙන් සිරිපතුල් ගලකි. එය පසුකාලීනව වෙනස් කර ඇති අතර සිරිපතුල් දෙකට ඉහළින් මධ්‍යය හාරා ඇත. මෙය පිළිමයක් තැබීම හෝ පහන් තැබීම උදෙසා සකස් කරන්නට ඇතැයි සිතිය හැකි ය. මෙම හැරුම තුළ රැඳෙන ජලය හෝ තෙල් ඉවත් කිරීම සඳහා කාණුවක් සකසා ඇත.





**මූන්ඩාන්පුට්ටි මඩම**

පාලිආරු ග්‍රාම නිලධාරි වසමේ මුන්ඩාන්පුට්ටි ග්‍රාමයේ පිහිටා ඇත. මන්නාරම - යාපනය මාර්ගයේ මුන්ඩාම්පුට්ටි හන්දියෙන් වමට හැරී මීටර් 500 ක් ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟා විය හැකි ය.



පැරණි අම්බලමක් වන මෙහි වර්තමානයේ වහළය ගරා වැටී ඇත. බිත්ති කොටස් පමණක් ඉතිරිව ඇති මෙහි පළ හතරක වහළයක් තිබූ බවට සාධක ඇත. ඊසාන දිශාවට දොරටුව සකසා ඇති මෙම අම්බලමෙහි සිව්පසින්ම පිට ආලින්දයක් තිබී ඇති අතර, එය දැවකණු මත රඳවා වහලය සකසා තිබෙන්නට ඇතැයි සිතිය හැකි ය. සෙ.මී. 145 ක් උසැති දැව කණු එක් පසෙකට 7-8 ක් පමණ තිබෙන්නට ඇත. මෙම දැව කණු සිටුවීමට කණු පාදම් උපයෝගී කර ගෙන තිබෙන අතර වර්තමානයේ මේවා පෙරළී ඇත. දොරටුව ඉතා කුඩා ලෙස සකසා ඇති

අතර, සාමාන්‍ය පුද්ගලයෙකුට හිස ඔසවා ඇතුලුවිය නො හැකි ය. මෙහි දොරටුව සඳහා දර්ශණීය දුව උළුවස්සක් සකසා ඇත. ගඩොලින් සකසන ලද ගොඩනැගිල්ලෙහි අත්තිවාරම සඳහා හුණුගල් භාවිත කර ඇත. කෙසේ වෙතත් මෙම ගොඩනැගිල්ල වසර 100 කට වඩා පැරණි බව ඒ ආශ්‍රිතව ජීවත්වන ජනතාවගේ අදහසයි.

**ඉලුප්පකඩවයි පඩවුතුරෙ මිණුම් කුලුන**

අංක ඉලුප්පකඩවයි 04 ග්‍රාම නිලධාරි වසමේ ඉලුප්පකඩවයි ග්‍රාමයේ පිහිටා ඇත. මන්නාරම - යාපනය මාර්ගයේ ඉලුප්පකඩවයි හන්දියෙන් වමට හැරී පඩෙයිතුරේ මාර්ගයේ මීටර් 400 ක් ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ලඟා විය හැකි ය.



දළ වශයෙන් මීටර් 12-13 ක් පමණ උසින් යුක්ත වූ මෙම කුලුන ඉංග්‍රීසි පාලන සමයේ මිනුම් කටයුතු සඳහා ඉදි කරන ලද්දකි. මෙය චතුරස්‍රාකාර වූ මාලක පහක් පිටතට පෙනෙන ලෙස සිදු කල ඉදිකිරීමකි. මීටර් 2.31 පළලැති පහතම තට්ටුව හුණුගලින් ද අනෙකුත් කොටස පුළුස්සන ලද ගඩොලින් නිර්මාණය කර ඇති අතර, සිමෙන්තියෙන් කපරාරු කර ඇත. එක් හුණුගලක දිග සෙ.මී. 52 ක් ද පළල සෙ.මී. 18 ක් ද වේ. පොළව මතුපිටට සම්බන්ධව ඇති මුල් (මහල) කොටසේ බටහිර නැගෙනහිර දිශානුගතව ආරුක්කු හැඩැති සෙ.මී. 170 උසැති හා සෙ.මී. 78 ක් පළලැති දොරටුවක් නිර්මාණය කර ඇත. මෙම ආරුක්කුවෙන් ඇතුළු වූ පසු කුලුනේ මධ්‍ය ලක්ෂයේ සිට ඉහළ කෙළවර දක්වා විවෘත වන සමචතුරස්‍රාකාර සිදුරක් වන අතර, එය දිග පුළුළින් සෙ.මී. 21 කි. මෙම මිණුම් කුලුනට වට පවුරක් තිබූ බවත් මේ වන විට විනාශව ගොස් ඇති බවත් පවසති.

**නීරවිකුලම් පැරණි වැව අසල නටබුන් ස්ථානය අංක 01**



කීරිසුඩ්ඩාන් ග්‍රාම නිලධාරි වසමේ කීරිසුඩ්ඩාන් ග්‍රාමයේ පිහිටා ඇත. මඩු හන්දියෙන් දකුණට හැරී මඩු හරහා පාලම්පිඩ්ඩි වෙත පැමිණ දකුණට හැරී පාලම්පිඩ්ඩි - ඉලුප්පුකුලම් මාර්ගයේ කිරිසුඩ්ඩාන් හන්දියට පැමිණ කිරිසුඩ්ඩාන් හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 03 ක් පමණ ගමන් කර පාලම අසලින් වමට හැරි වනය තුළට මීටර් 300 ක් ගමන් කිරීමෙන් (දකුණු දෙසට) මෙම ස්ථානයට පැමිණිය හැකි ය.

මෙම ස්ථානයේ ගල් කණු 12 කින් සමන්විත ගොඩනැගිල්ලක් දැකිය හැකි ය. එක් කණුවක දිග හා පළල සෙ.මී. 34 බැගින් ද උස සෙ.මී. 55 ක් පමණ ද වේ. කණු සියල්ලම සම උස මට්ටමක් පෙන්වයි. මෙම ගොඩනැගිල්ලේ දිග හා පළල මීටර් 5.40 x 5.80 ක් පමණ වන අතර, මෙහි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අනුව කුමන කාර්යයක් සඳහා භාවිත වූයේ ද යන්න හඳුනාගත නොහැකි ය. මේ අතර ගඩොල් කැබලි කිහිපයක් ද දැකිය හැකි ය. මේ ආසන්නයෙන් කණු පාදම් ගල් දෙකක් ද දැකිය හැකි අතර එහි දිග හා පළල සෙ.මී. 55 x සෙ.මී. 58 ක් හා කණු සිදුරේ දිග, පළල හා ගැඹුර සෙ.මී. 15 x 15 x 11 පමණ වේ.

**නීරවිකුලම් පැරණි වැව අසල නටබුන් ස්ථානය අංක 02**

කීරිසුඞ්ඩාන් ග්‍රාම නිලධාරි වසමේ කීරිසුඞ්ඩාන් ග්‍රාමයේ පිහිටා ඇත. මැදවච්චිය - මන්නාරම මාර්ගයේ මඩු හන්දියෙන් දකුණට හැරී මඩු හරහා පාලම්පිඞ්ඩි ගමට පැමිණ දකුණට හැරී පාලම්පිඞ්ඩි - ඉලුප්පුකුලම් මාර්ගයේ කිරිසුඞ්ඩාන් හන්දියට පැමිණ කිරිසුඞ්ඩාන් හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 03 ක් ගමන් කර පාලම පසුකර මීටර් 20 ක් පමණ ගමන්කර වමට හැරී වනය තුළට මීටර් 400 ක් ගමන් කිරීමෙන් (නැගෙනහිර දෙසට) මෙම ස්ථානයට ලඟාවිය හැකි ය.





මෙම ස්ථානයේ අනුරාධපුර අවධියට අයත් යැයි සැලකිය හැකි දාගැබක් දැකිය හැකි අතර එහි මධ්‍යය හාරා ඇත. වර්තමානයේ ශේෂිත සාධක අනුව මෙහි උස මීටර් 1.30 ක් පමණ ද විෂ්කම්භය මීටර් 10 ක් පමණ ද වේ. මෙම ස්තූපයේ ගොඩැල්ලට සම්බන්ධ කර එල්ටීටීඊ සංවිධානය විසින් බංකරයක් ඉදිකර ඇති අතර, එය එක් පසෙකින් ස්තූපයට සමාන්තරව සකසා ඇත. ස්තූපයට ආසන්නව සිටුවන ලද ගල් කණුවකි. ඒ අසලම ගල් පුවරුවක් ද දැකිය හැකි ය.



පිළිම ගෙයක් ලෙස අනුමාන කළ හැකි ගොඩනැගිල්ලක් දාගැබට මීටර් 25 ක් පමණ දුරින් දකුණු - ගිණිකොණ දිශාවට වන්නට දැකිය හැකි ය. මෙම ගොඩනැගිල්ලේ දිග හා පළල මීටර් 8 x 5.75 ක් පමණ වන අතර, ගල් කණු 10 ක් සිටුවා ගොඩනැගිල්ල ඉදිකර ඇත. පිළිම ගෘහය මධ්‍යයෙහි විශාල උළුවස්සක් සඳහා සකසන ලද යටලිපතක් ද වේ. ගල් කණුවක උස මීටර් 1.8 ක් දිග හා පළල සෙ.මී. 26 ක් පමණ ද වන කණු හයක් දැකිය හැකි ය.

මෙම අවට භූමියේ ගඩොල් කැබලි, ගල් පුවරුවක්, ගල් කණු කොටස් හා හොඳින් කැටයම් කර ඇති කොරවක් ගලක් දක්නට ලැබේ. කොරවක් ගල උසින් සෙ.මී 67 ක් හා පළලින් සෙ.මී. 105 ක් පමණ වේ.

**පාලම්පිඩ්ඩි පුල්ලෙයාර් කෝවිල් නටබුන්**

පාලම්පිඩ්ඩි ග්‍රාම නිලධාරි වසමේ පාලම්පිඩ්ඩි ග්‍රාමයේ පිහිටා ඇත. මඩු හන්දියෙන් දකුණට හැරී මඩු හරහා පාලම්පිඩ්ඩි ගමට පැමිණ වෙලට යන මාර්ගයේ ගමන් කිරීමෙන් මාර්ගයේ වම් පසින් පිහිටි මෙම ස්ථානයට ළඟාවිය හැකි ය. මෙම ස්ථානයේ වසර 100 ක් පමණ පැරණි කෝවිලක් දැකිය හැකි ය.

මෙහි අනුරාධපුර අවධියට අයත් ලක්ෂණ සහිත සිරිපතුල් ගල් දෙකකි. මෙම සිරිපතුල් ගල් මෙම ස්ථානයට පිටතින් ගෙන එන ලද ඒවා බව සැලකිය හැකි ය. මෙම සිරිපතුල් ගල් දෙක දිගු පුළුලින් පිළිවෙළින් සෙ.මී. 65x69 සහ සෙ.මී. 52x57 ප්‍රමාණයේ වේ. මෙහි වූ සිරිපතුල් ගල් වලින් එකක් මෙම කෝවිලේ ගර්භ ගෘහයේ ද අනෙක කෝවිලේ නව අන්තරාලයේ ද තබා ඇත. පැරණි ඉදිකිරීම් ලෙස ගර්භ ගෘහය, මණ්ඩපය හා අන්තරාලය පැහැදිලිව හඳුනාගත හැකි අතර, අවධි කිහිපයක දී නිර්මාණය කරන ලද කෝවිලේ නව ඉදිකිරීමක් ලෙස අන්තරාලයක් එකතු කර ඇත.




**පාලම්පිඩ්ඩි මුත්තුමාරි අම්මාන් කෝවිල**

පාලම්පිඩ්ඩි ග්‍රාම නිලධාරි වසමේ පාලම්පිඩ්ඩි ග්‍රාමයේ පිහිටා ඇත. මඩු හන්දියෙන් දකුණට හැරී මඩු හරහා පාලම්පිඩ්ඩි ගමට පැමිණ කෝවිල මාර්ගයේ මීටර් 250 ක් පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

මෙම ස්ථානයේ මෑතක දී ඉදිකරන ලද කෝවිල දැකිය හැකි අතර, එම කෝවිල් භූමිය තුළ සිරිපතුල් ගල් තුනක් දැකිය හැකි ය. මෙම සිරිපතුල් ප්‍රමාණයෙන් හා හැඩයෙන් විෂමතා දක්වන අතර, ඒවා පිළිවෙළින් දිගින් හා පළලින් සෙ.මී. 75 x 80, සෙ.මී. 53 x 51, සෙ.මී. 37 x 43 ක් පමණ වේ. මෙම සිරිපතුල් ගල් මෙම ස්ථානයට පිටතින් ගෙන එන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. තවද මෙම ස්ථානයේ වසර 100 කට වඩා පැරණි කෝවිලක් තිබූ බවට ගම්වාසීන්

පවසන අතර, මෙහි නව කෝවිල ඉදිකිරීමට පෙර යම් ඉදිකිරීමකට අයත් ගඩොල් බැම්මක් දැකිය හැකි ය.




කෝවිලට පැමිණෙන මාර්ගයේ කෝවිලට මීටර් 50 ක් පමණ දුරින් මාර්ගයේ වම්පසින් කුඩා කෝවිලක් ඉදිකර ඇති අතර, එහි දිග හා පළල සෙ.මී 98 හා සෙ.මී. 90 ක් වන සිරිපතුල් ගලක් වේ. මෙම සිරිපතුලේ අෂ්ටමංගල ලක්ෂණ දක්නා ලැබෙන අතර සිරිපතුල බෙහෙවින් ගෙවී ගොස් ඇත. සිරිපතුල විලුඹ පිහිටි අන්තයේ මෑතක දී කොටසක් ඉවත් කර ඇත. මෙම සිරිපතුල වව්නියාව ප්‍රදේශයෙන් ගෙන එන ලදැයි ප්‍රදේශවාසීන් පවසයි.

**මඩු දේවස්ථානය**

අංක 37 මඩු ග්‍රාම නිලධාරි වසමේ මඩු පල්ලිය ග්‍රාමයේ පිහිටා ඇත.





ක්‍රි.ව. 1670 දී පමණ මඩු මැණියන් වෙනුවෙන් ඉදිකළ පල්ලිය මාන්තෙයි හන්දියේ ඉදිකර පැවති අතර, ලන්දේසීන්ගේ බලපෑම මත මඩු මාතාවගේ ප්‍රතිමාව එම පල්ලියෙන් ඉවත් කර ගැනීමට කතෝලිකයන් පියවර ගෙන ඇත. මෙකල මෙම ප්‍රතිමාව ජපමාල මාතාව ලෙස හඳුන්වන ලදී. විවිධ ගම් දනව්වල මෙම ප්‍රතිමාව ආරක්ෂා කිරීමේ කටයුතුවල යෙදුණු භක්තිකයන් අවසානයේ මරදමඩු නම් ස්ථානයේ කුඩා දේවස්ථානයක් තනා ප්‍රතිමාවට වන්දනාමාන කිරීම ආරම්භ කරන ලදී.

මෙම ස්ථානයේ 1872 වර්ෂයේ අගෝස්තු 08 වන දින දේවස්ථානයේ ඉදිකිරීම් වෙනුවෙන් මුල්ගල තබන ලද බව වාර්තා වෙයි. වර්තමානයේ වරින්වර ප්‍රතිසංස්කරණයට ලක්කර ඇති මෙම දේවස්ථානයේ මුල්ම ඉදිකිරීම්වලට අයත් ගොඩනැගිලි අංග ද හඳුනාගත හැකි ය.



වසර 100 කට වඩා පැරණි ළිඳක් පල්ලියට නැගෙනහිර දෙසින් මීටර් 250 ක් පමණ දුරින් පිහිටා ඇත. හුණු බදාමයෙන් සහ පැරණි ඉංජිනේරු ගඩොලින් ගොඩනගන ලද මෙහි වට බැම්මෙහි පළල සෙ.මී. 40 ක් පමණ ද විෂ්කම්භය මීටර් 3.90 ක් පමණ ද වේ.

**මුල්ලිකුලම් නටබුන් දාගැබ**



අංක 42 ඉරනෛඉලෙප්පෙයිකුලම් ග්‍රාම නිලධාරි වසමේ මුල්ලිකුලම් ග්‍රාමයේ පිහිටා ඇත. පුවරසම්කුලම් හන්දියෙන් මල්ලාවී මාර්ගයේ හැරී ගමන්කර ඉරනෛඉලෙප්පෙයිකුලම් හන්දියට පැමිණ වමට හැරී (මුල්ලිකුලම් - පාලම්පිඩ්ඩි මාර්ගය) මුල්ලිකුලම් වැව පසුකර කිලෝමීටර් 2 ක් පමණ ගමන් කිරීමෙන් හමුවන ඇළ හා ආර පසුකර වෙල්යාය ආරම්භයේ දී හමුවන වෙළ මධ්‍යයෙන් මීටර් 500 ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.



මෙම ස්ථානයේ නටබුන් වූ දාගැබ් ගොඩැල්ලකි. එහි විෂ්කම්භය මීටර් 12 ක් පමණ ද උස මීටර් 2.5 ක් පමණ ද වේ. මෙම දාගැබෙහි මධ්‍ය කොටස අනවසරයෙන් කැණීම් කර ඇත. අනවසර කැණීම මීටර් 4.5 ක් පමණ දිගට හා මීටර් 2 ක් පමණ ගැඹුරට සිදුකර ඇත. අවට ප්‍රදේශයේ පැරණි මැටි බඳුන් කැබලි සහ පාත්‍රයක කොටසක් ලෙස අනුමාන කළ හැකි කොටසක් දැකිය හැකි ය.

**පොක්කරවන්නි නටබුන්**

අංක 42 ඉරනෛඉලෙප්පෙයිකුලම් ග්‍රාම නිලධාරි වසමේ මුල්ලිකුලම් ග්‍රාමයේ පිහිටා ඇත. පුවරසම්කුලම් හන්දියෙන් මල්ලාවී මාර්ගයේ හැරී ගමන්කර ඉරනෛඉලෙප්පෙයිකුලම් හන්දියට පැමිණ වමට හැරී (මුල්ලිකුලම් - පාලම්පිඩ්ඩි මාර්ගය) මුල්ලිකුලම් පාසල අසල සිට කිලෝමීටර් 2 ක් පමණ ගමන් කර තලයන්කුලම් වැව මාර්ගයේ ගමන් කර මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

විශාල ගල්තලාවක් මත විසිරුණු නටබුන් වූ ගොඩනැගිලි කිහිපයක් විසිරී ඇත. මේ අතර දාගැබ පැහැදිලි ව හඳුනාගත හැකි ය. එහි විෂ්කම්භය මීටර් 15 ක් පමණ ද උස මීටර් 3 ක් පමණ වන අතර, දාගැබෙහි මධ්‍ය ප්‍රදේශය අනවසරයෙන් කැණීම් කර ඇත.



පිළිම ගෙය ලෙස හඳුනාගත හැකි ගොඩැල්ල සහිත භූමිය පිහිටි පොළොවට වඩා මීටර් 2 ක් පමණ උසින් යුක්තය. මෙම ගොඩැල්ල දිග පුළුලින් මීටර් 15 xමීටර් 15 පමණ ප්‍රමාණයක් ගනී. මෙම ගොඩැල්ල මධ්‍යය ප්‍රදේශයත් අනවසර කැණීමකට බඳුන්ව ඇත. මෙම නටබුන් ගොඩැල්ල මත පිළිම පාදමක් සහ පසින් යට වූ පිළිමයක බඳ කොටසක් දැකිය හැකි ය. මෙම පිළිමය අනුරාධපුර අවධියට අයත් වූවක් ලෙස නිගමනය කළ හැකි අතර, පසින් යට නොවූ කොටස මීටර් 1 පමණ පිටතට දර්ශනය වේ. මෙම ගොඩැල්ල තුළ ගඩොල් දැකිය හැකි ය.

මෙම භූමිය තුළ තැන තැන විසිරුණු නටබුන් වූ ගොඩැලි කිහිපයක් සහ පොකුණු කිහිපයක් ද දැකිය හැකි ය. එමෙන් ම දිග හා පළල මීටර් 12.4 x 8.4 ප්‍රමාණයකින් යුක්ත කණුපාදම් මත ඉදිකරන ලද විශාල ගොඩනැගිල්ලක අවශේෂ වේ.



**ශිවන් කෝවිල් නටබුන්**

අංක 42 ඉරනෙඉලෙප්පෙයිකුලම් ග්‍රාම නිලධාරි වසමේ ඉරනෙඉලෙප්පෙයිකුලම් ග්‍රාමයේ පිහිටා ඇත. පුවරසම්කුලම් හන්දියෙන් දකුණට හැරී ඉරනෙඉලෙප්පෙයිකුලම් හන්දිය අසල මාර්ගයේ වම් පසින් පිහිටි මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.




මෙම ස්ථානයේ අලුතින් ඉදිකරන ලද කෝවිලක් වන අතර කෝවිලට දකුණු දිශාවෙන් පැරණි ගල් කණු හා ගඩොල් තැන තැන දැකිය හැකි ය. ගලවා ඉවත් කරන ලද ගොඩනැගිල්ලක අවශේෂ ලෙස හඳුනාගත හැකි මෙම නටබුන් මෙම ස්ථානයේ තිබූ වසර 200 ක් පමණ පැරණි කෝවිලෙන් ගලවා ඉවත් කරන ලද ඒවා බව ප්‍රදේශවාසීන් පවසයි. අනුරාධපුර අවධියට අයත් ගල් කටු ලක්ෂණ සහිත මෙම ගල්කණු පැරණි කෝවිලකට අයත් අවශේෂ ලෙස සැලකිය හැකි ය. ගල්කණු කොටස් 08 ක් පමණ දැකිය හැකි මෙම ස්ථානයේ පෙරළා දමා ඇති දිග ම කණුවේ දිග, පළල, උස පිළිවෙළින් සෙ.මී. 230 x 27 x 25 පමණ වේ. මෙහි දක්නා ලැබෙන ගඩොලක දිග, පළල, උස පිළිවෙළින් සෙ.මී. 22 x 19 x 6 පමණ වේ. මෙම ස්ථානයේ තිබෙන ළිඳෙහි පඩිය සඳහා ද ගල් කණු කොටසක් භාවිත කර ඇත.

**සෙක්කඩිකුලම් නටබුන් දාගැබ**



අංක 42 ඉරනෙඉලෙප්පෙයිකුලම් ග්‍රාම නිලධාරි වසමේ උළුඳපොලම් ග්‍රාමයේ පිහිටා ඇත. පුවරසම්කුලම් හන්දියෙන් දකුණට හැරී ඉරනෙඉලෙප්පෙයිකුලම් හන්දිය පසුකර මණ්කණ්ඩි හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 01 ක් ගමන්කර හමුවන සෙක්කඩිකුලම් වැව් පිටවානෙන් මීටර් 750 ක් පමණ ගමන් කළ විට මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

වනය මධ්‍යයේ හුදකලා වූ කුඩා දාගැබක් වන මෙහි මධ්‍යය හාරා ඇත. දාගැබ මීටර් 12-15 පමණ ප්‍රමාණයක විෂ්කම්භයකින් යුක්ත වන අතර උස මීටර් 1.5 ක් පමණ වේ. ප්‍රමාණ කිහිපයක ගඩොල් දැකිය හැකි මෙම දාගැබෙහි, මෝල්ඩින් ගඩොල් ද දක්නා ලැබේ.

**විලාතිකුලම් වැව අසල ආසනය**



අංක 43 විලාතිකුලම් ග්‍රාම නිලධාරි වසමේ විලාතිකුලම් ග්‍රාමයේ පිහිටා ඇත. පුවරසම්කුලම් හන්දියෙන් දකුණට හැරී ඉරනෙඉලෙප්පෙයිකුලම් හන්දිය පසුකර විලාතිකුලම් හන්දියෙන් දකුණට හැරී මීටර් 700 ක් ගමන්කර වැව් බැම්ම දිගේ මීටර් 500 ක් පමණ ගමන්කර පිටවාන අසලට පැමින වැ බැම්මේ දකුණු පසින් පිහිටි මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

විශාල ප්‍රමාණයේ මල් ආසනයක් වන මෙහි දිග සෙ.මී 270 ක් ද පළල සෙ.මී. 98 ක් ද උස සෙ.මී. 22 ක් පමණ ද වේ. මෙය පිටතින් ගෙනඑන ලද්දක් බව ප්‍රදේශවාසීන් පවසන අතර, ආසනයේ සිව් පසින් ම බොරදම් සහිත ය. මෙය මල් ආසනයක් විය හැකි ය.

**කොල්ලම්කුලම් (පුදයල්පුට්ටි) නටබුන්**

අංක 43 විලාතිකුලම් ග්‍රාම නිලධාරි වසමේ කොල්ලම්කුලම් ග්‍රාමයේ පිහිටා ඇත. පුවරසම්කුලම් හන්දියෙන් දකුණට හැරී ඉරනෙඉලෙප්පෙයිකුලම් හන්දිය පසුකර විලාතිකුලම් හන්දියෙන් දකුණට හැරී කොල්ලම්කුලම් මාර්ගයේ කිලෝමීටර් 2.5 ක් ගමන්කර මාර්ගයේ දකුණු පසින් පිහිටි මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

මෙම ස්ථානයේ පැරණි ගොඩනැගිල්ලක නටබුන් විසිරී ඇත. මෙම ගොඩනැගිල්ල කණුපාදම් මත ඉදිකර ඇත. මෙහි ගොඩැල්ලට මීටර් 2 ක් පමණ නැගෙනහිරින් පිළිම පාදමකි. මෙම නටබුන් ගොඩැල්ලට පිටුපසින් දාගැබක් ලෙස අනුමාන හැකි ගොඩැල්ලකි. මෙහි විෂ්කම්භය මීටර් 5 ක් පමණ වන අතර, මීටර් 2 ක් පමණ විෂ්කම්භයකින් යුක්ත මෙහි මධ්‍යයෙහි අනවසර කැණීමක් සිදුකර ඇත. මෙම ගොඩැල්ල සෙ.මී. 50 ක පමණ උසින් යුතු වේ.





## මරදමඩු (පුදයල්පිට්ටි) නටබුන්

කාකියන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ මරදමඩු ග්‍රාමයේ පිහිටා ඇත. තාණ්ඩිකුලම් හන්දියෙන් වමට හැරි කල්මඩු මාර්ගයේ පැමිණ සින්නඅරිසකුලම් හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 2ක් පමණ වනය තුළට ගමන් කිරීමෙන් පුදයල්පිට්ටි ලෙස හඳුන්වන මෙම ස්ථානයට ළඟාවිය හැකි ය. මෙම ස්ථානයේ දාගැබක නටබුන් දක්නා ලැබෙන අතර, මෙහි විෂ්කම්භය මීටර් 16 ක් පමණ ද උස මීටර් 4 ක් පමණ ද වේ. මෙහි මධ්‍යය අවස්ථා කිහිපයක දී අනවසර කැණීම්වලට බඳුන් වී ඇති අතර ප්‍රමාණ කිහිපයකට අයත් ගඩොල් හා මෝල්ඩින් ගඩොල් දැකගත හැකි ය. දාගැබට වයඹ දෙසින් මීටර් 5 ක් පමණ දුරින් කණු පාදම් ගලක් දැකිය හැකි ය.




දාගැබ් ගොඩැල්ලට නිරිත දෙසින් මීටර් 20 ක් පමණ දුරින් ගල්කණු භාවිතයෙන් ගොඩනගන ලද ගොඩනැගිල්ලක නටබුන් දැකිය හැකි ය. මෙහි සිටුවන ලද ගල් කණු 2 ක් ද පෙරලුණු ගල්කණු කොටස් 8 ක් පමණ ද දැකිය හැකි ය. එක් ගල්කණුවක් සෙ.මී. 220 x 23 x 23 ප්‍රමාණයේ වේ. ගල් කණු දෙක අතර පරතරය මීටර් 3.3 ක් පමණ වේ. මෙම ගොඩැල්ලේ විෂ්කම්භය මීටර් 8 ක් පමණ වේ. මෙහි මධ්‍ය අනවසර කැණීමකට ලක්ව ඇති අතර එහි විෂ්කම්භය මීටර් 4 ක් පමණ ද ගැඹුර මීටර් 3 ක් පමණ ද වේ. මෙම භූමිය අවට ගඩොල් හා පැරණි උළු දක්නා ලැබේ.

## සින්නවලයන්කට්ටු නටබුන්



පුවරසම්කුලම් ග්‍රාම නිලධාරි වසමේ වලයන්කට්ටු ග්‍රාමයේ පිහිටා ඇත. පුවරසම්කුලම් හන්දියෙන් වමට හැරී තුණුක්කායි මාර්ගයේ සින්නවලයන්කට්ටු ගමට පැමිණ මාර්ගයෙන් වමට හැරී වනය තුලට මීටර් 100 ක් පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

මෙම ස්ථානයේ කණුපාදම් 03 ක් පමණක් දැකිය හැකි ය. ගොඩනැගිල්ල කුමක්ද යන්න හඳුනාගත නො හැකි අතර තවත් කණුපාදම් පසින් යටවී හෝ අස්ථානගත වී තිබෙන්නට හැකි බව අනුමාන කළ හැකි ය. මෙහි දිග මීටර් 2.6 ක් ද පළල මීටර් 2.3 ක් පමණ ද වේ. අවට සුළු වශයෙන් ගඩොල් දැකිය හැකි ය.

**උමා කෝවිල් නටබුන්**



මළුවරායන් කට්ටේ අඩම්පන් ග්‍රාම නිලධාරි වසමේ මල්වතුඔය උමාකෝවිල ග්‍රාමයේ පිහිටා ඇත. වව්නියාව - මන්නාරම මාර්ගයේ කට්ටේඅඩම්පන් පාලම අසලින් වමට හැරී ඔයට සමාන්තරව කි.මී. 2.5 ක් පමණ ගමන්කර මාර්ගයේ දකුණු පසින් පිහිටි පාලම මාර්ගයේ කි.මී. 1.5 ක් පමණ ගමන්කර මාර්ගයෙන් දකුණු පසින් වනය තුළ පිහිටි මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

මල්වතුඔය නිම්න ප්‍රදේශයක් ලෙස මෙම භූමිය හැඳින්විය හැකි ය. මෙහි මදක් උස් වූ ස්ථානයක ගඩොල් විසිරී තිබෙනු දැකිය හැකි ය. අවට ප්‍රදේශයේ බහුලව මැටි බඳුන් අවශේෂ දක්නා ලැබේ. මේ අතරට රතු මැටි බඳුන් කැබලි, කළු හා රතු මැටි බඳුන් කැබලි ද වේ. කොත් කැරැල්ලක සහ කෙණ්ඩියක කොටස් පැහැදිලිව නිරීක්ෂණය විය. උළු කොටස් ද මේ අතර වේ. මල්වතු ඔයෙහි ජලය වැඩිවන විට යටවන භූමි ප්‍රදේශයක් වන මෙම භූමියේ සාධක රොන්මඩවලින් වැසී පවතී.

**මල්වතුඔය කල්කුආරි ගල්කොරි සාධක**



මළුවරායන් කට්ටේ අඩම්පන් ග්‍රාම නිලධාරි වසමේ කල්කුආරි ග්‍රාමයේ පිහිටා ඇත. කට්ටේඅඩම්පන් පාලම අසලින් වමට හැරී කි.මී. 2.5 ක් පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය. මල්වතුඔය මධ්‍යයේ වූ ගල් පර්වත දෙකක ගල්කොරි ලක්ෂණ දැකිය හැකි ය. මෙහි දක්නට ලැබෙන ගල්කටු ලක්ෂණ අනුව පොළොන්නරු අවධියට අයත් වූවක් සේ සැලකිය හැකි ය.

**සින්නපන්ඩිවිරිච්චාන් නටබුන්**

අංක 37 මඩු ග්‍රාම නිලධාරි වසමේ සින්නපන්ඩිවිරිච්චාන් ග්‍රාමයේ පිහිටා ඇත. මඩු හන්දියෙන් දකුණට හැරී මඩු මාර්ගයේ ගමන්කර සින්නපන්ඩිවිරිච්චාන් හන්දියෙන් දකුණට හැරී කි.මී. 2 ක්

පමණ ගමන්කර වමට හැරී පල්ලිය මාර්ගයේ මීටර් 100 ක් පමණ ගමන් කළ විට හමුවන තුන්මංසලෙහි දකුණු පසින් වූ මාර්ගයට මුහුණලා ඇති මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.



මෙම ස්ථානය වර්තමානයේ වලව්වත්ත ලෙස හඳුන්වයි. මෙම වත්තෙහි අන්තයේ පෙරලා දමන ලද රළු ගල් කණු 02 කි. මේවා දිගින් මීටර් 2.5 ක් හා මීටර් 3.04 පමණ වේ. මෙම භූමිය අභ්‍යන්තරයෙන් මැටි රූප බහුලව හමුවන බව නිවැසියන් පවසන අතර, එසේ හමුවූ මැටි රූප කොටස් ද මෙම භූමියේ තිබුණි.

**පෙරියපන්ඩිච්චිරිච්චාන් නටබුන්**


පෙරියපන්ඩිච්චිරිච්චාන් නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ පෙරියපන්ඩිච්චිරිච්චාන් ග්‍රාමයේ පිහිටා ඇත. පිරිවනාතකුලම් හන්දියෙන් දකුණට හැරී පෙරියතම්පනේ හරහා පන්ඩිච්චිරිච්චාන් රෝහල අසලින් වමට හැරී හමුවන තුන්මංසලින් මැද පිහිටි මාර්ගයේ කුඹුරු සහිත භූමිය තුළ මීටර් 200 ක් පමණ ගමන්කළවිට මාර්ගයේ වම්පසින් පිහිටි කුඹුරු මධ්‍යයේ පිහිටි මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.



ගොඩනැගිලි කණු පාදම් ගල් 04 දැකිය හැකි ය. ඉන් එකක් කඩා දමා ඇති අතර, ස්ථානය බැකෝ දමා හාරා ඇත. මේ හේතුවෙන් කණුපාදම්වල මුල් පිහිටීම වෙනස් වී ඇති බවක් පෙනේ. අවට භූමියේ මැටි බඳුන් කැබලි ද දැකිය හැකි ය. මෙම ස්ථානයට මීටර් 13 ක් පමණ උතුරින් මීටර් 13 ක විෂ්කම්භයකින් යුත් ගඩොල් ගොඩැල්ල දාගැබ් ගොඩැල්ලක් විය හැකි ය.







Archaeological Sites in Mannar District
Mannar District
N
W
E
S
Legend
Archaeological_Sites
Road
0 3 6 12 18 24
Kilometers
Department of Archaeology
Sri Lanka
GIS Unit - 2017

# මුලතිව් දිස්ත්‍රික්කය

## වෙල්ලියාවිල්ලු වන්නෙරිකුලම් නටබුන් ගොඩැල්ල

මෙම ස්ථානය තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෙන්නියම්කුලම් ග්‍රාම නිලධාරි වසමෙහි වන්නෙරිකුලම් ගමෙහි පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියෙන් වමට හැරී මල්ලාවී පසුකර තුනුක්කායි හරහා අක්කරායන්කුලම් මාර්ගයේ කිලෝමීටර් 10.5 ක් පැමිණ වමට හැරි තෙන්නියන්කුලම් මාර්ගයේ කිලෝමීටර් 9 ගමන් කර ඩෝසර් ට්‍රැක් හන්දියෙන් දකුණට හැරී කිලෝමීටර් 1.5 ක් පමණ ගමන් කර වනය තුළට මීටර් 800 ගමන්කර හමුවන තුන්මංසලෙන් දකුණට හැරී වනය තුළට ගමන්කිරීමෙන් පසු හමුවන වයි හන්දියේ මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත (විල්ලුවේ සිට මීටර් 50 ක් දුරින්).

මෙම ගොඩැල්ලේ දැනට ශේෂිත සාධක සෙ.මී. 70 පමණ උසින් ද, මී. 11.5 ක පමණ විශ්කම්භයකින් ද යුක්ත වේ. මෙම නටබුන් ගොඩැල්ලේ වාස්තුවිද්‍යාත්මක ස්වභාවය හා උපයෝගීතාවය නිශ්චිතව හඳුනාගැනීම අසීරු වේ. නමුත් ගොඩැල්ල පුරා විසිරී ඇති ගඩොලුවල ස්වභාවය අනුව අනුරාධපුර අවධිය නියෝජනය කරන බව පිළිගත හැකි ය. දැනට ඉතිරිව ඇති සාධක අනුව පැරණි ස්ථූප ගොඩැල්ලක අවශේෂ විය හැකි බවට ද අනුමාන කළ හැකි වේ.



**මුතියංකට්ටුව පුහුණු පාසල අංක 02 ස්ථානයේ නටබුන්**

උතුරු පලාතට අයත් මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුතියංකට්ටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියෙන් වමට හැරී මුලතිව් මාර්ගයේ ඔඩ්ඩුසුඩාන් ගල් කොරිය හන්දියෙන් වමට ඇති මුතියංකට්ටුව වැව මාර්ගයේ කිලෝමීටර් 6 ක් ගමන් කර මුතියංකට්ටුව ගොවිපල මධ්‍යයෙන් කිලෝමීටර් 3.5 ක් පමණ ගමන් කිරීමෙන් මාර්ගයේ වම්පසින් පිහිටි මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

අනුරාධපුර අවධියට අයත් කණුපාදම් ගල් 08 කින් සමන්විත ගොඩනැගිල්ලක් ලෙස හැඳින්විය හැකි ය. කණුපාදම් ගල්වලට ආසන්නව තවත් පෙරලුණු ගල් කුට්ටියක් දැකිය හැකි අතර, මෙය කණුපාදම් ගලක් ලෙස හඳුනා ගැනීම අපහසුය. ගොඩනැගිල්ල දිග පළලින් මීටර් 5.7 ක් හා 3.5 ක් පමණ වේ. මෙම ස්ථානය හා අවට ප්‍රදේශයේ පැරණි මැටි බඳුන් කොටස්, උළු කැබලි හා පැරණි ගඩොල් කැබලි තැන තැන විසිරී ඇත.



**මුතියංකට්ටුව පුහුණු පාසල අංක 01 ස්ථානයේ නටබුන්**
**(මුතියංකට්ටුව වැව් තාවුල්ලේ නටබුන්)**

ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අයත් මුතියංකට්ටුව ග්‍රාම නිලධාරි වසමෙහි මුතියංකට්ටුව වැව තුළ පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියෙන් වමට හැරී මුලතිව් මාර්ගයේ ඔඩ්ඩුසුඩාන් ගල් කොරිය හන්දියෙන් වමට ඇති මුතියංකට්ටුව වැව මාර්ගයේ කිලෝමීටර් 6 ක් ගමන් කර මුතියංකට්ටුව ගොවිපල මධ්‍යයෙන් කිලෝමීටර් 2 ක් පමණ ගමන්

කර පුහුණු පාසල මධ්‍යයෙන් වැව් ඉවුර දක්වා මීටර් 500 ක් පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ලඟාවිය හැකි ය.

මුතියංකට්ටුව වැවට බටහිරින් වැව් තාවුල තුළ පිහිටි මෙම පුරාවිද්‍යාත්මක ස්ථානය අක්කර 2 ක පමණ භූමියක් පුරා විසිරී ඇත. මෙහි වූ පුරාවස්තු අතර පැරණි දාගැබක්, පිළිම ගෙයක් හා තවත් ගල්කණු සහිත ගොඩනැගිලි 03 ක අවශේෂ දැකිය හැකි ය. මෙම ස්ථානයේ දක්නා ලැබෙන නටබුන් අනුරාධපුර අවධියට අයත් බවට හඳුනාගත හැකි ය.

**1. පැරණි දාගැබ**

විෂ්කම්භය මීටර් 10 ක් පමණ වූ මෙම දාගැබ් ගොඩැල්ල මීටර් 2 ක පමණ උසකින් යුක්ත ය. දාගැබේ මලුවේ ඊසාන දිශාවෙන් ගඩොල් ඇතුරුමක ලක්ෂණ දැකිය හැකි අතර දාගැබට අයත් ගඩොල් හා මෝල්ඩින් ගල් අවට පවතී. උතුරු සහ ඊසාන දිශාවන්හි දාගැබේ පේෂාවළලු කොටස් දැකිය හැකි ය.

**2. නටබුන් ගොඩැල්ල අංක 01**

ස්මාරක අංක 01 ට දකුණින් මෙම නටබුන් ගොඩැල්ල පිහිටා ඇත. මීටර් 1 ක් පමණ උසින් වූ ගල්කණු 03 කින් යුත් නටබුන් ගොඩැල්ලකි.

**3. පිළිම ගෙය**

දාගැබේ සිට දකුණින් මීටර් 50 ක් පමණ දුරින් මෙම පිළිමගෙය පිහිටා ඇත. ගොඩනැගිල්ල අනවසර කැණීමට ලක්ව ඇත. මීටර් 1.3 පමණ උස් වූ මෙම ගොඩනැගිල්ල දිගින් මීටර් 10 ක් හා පළලින් මීටර් 6.5 ක් පමණ වේ. ගොඩනැගිල්ලට අයත් බැම් කොටස් හා පැරණි ගඩොල් හා උළු අවට විසිර පවතී. මෙහි වූ පිළිමයක කොටසක් ද ස්ථානයේ දැකිය හැකි අතර එම පිළිම කොටසේ දිග සෙ.මී. 60 ක් පමණ ද පළළ සෙ.මි. 45 ක් පමණ ඝනකම සෙ.මී. 30 ක් පමණ වේ. හුණුගල් පාෂාණයෙන් නෙලා ඇති මෙහි සිවුරු රැලි මනාව පිළිබිඹු කර ඇත.

**4. නටබුන් ගොඩැල්ල අංක 02**

ස්මාරක අංක 03 පිළිමගෙයට දකුණින් මීටර් 20 ක් පමණ දුරින් මෙම නටබුන් ගොඩැල්ල පිහිටා ඇත. මෙහි සෙ.මී 80 ක් පමණ උසැති ගල්කණු 03 ක් වේ.

**5. නටබුන් ගොඩැල්ල අංක 03**

ස්මාරක අංක 02 ගොඩැල්ලට දකුණින් මීටර් 10 ක් පමණ දුරින් මෙම ගොඩැල්ල පිහිටා ඇත. සෙ.මී. 80 ක් පමණ උසින් යුත් සිටුවන ලද ගල්කණු 11 ක් පමණ දැකිය හැකි ය.







**පනන්කාමම් නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නට්ටල්කණ්ඩාල් ග්‍රාම නිලධාරි වසමේ පනන්කාමම් ග්‍රාමයේ පෞද්ගලික ඉඩමෙහි මෙම නටබුන් පිහිටා ඇත. වව්නියාව - යාපනය මාර්ගයේ ඕමන්තෙයි හන්දියෙන් වමට හැරී කුංචිකුලම් හරහා මල්ලාවී මාර්ගයේ පනන්කාමම් හන්දියට ආසන්නව මෙම ස්ථානය දැකිය හැකි ය.

පනන්කාමම් හන්දියේ මාර්ගයේ වම්පසින් කණු පාදම් ගලක් දැකිය හැකි අතර, මෙය ද්විතීය සන්දර්භයට අයත් වූවකි. මෙම හන්දියේ සිට මීටර් 50 ක් පමණ වව්නියා දෙසට මාර්ගයේ වම්පසින්ම පිහිටි ඉඩමක පෞරාණික වැදගත්කමකින් යුත් නටබුන් පවතී.

මෙම ස්ථානයේ සිරිපතුල් ගලක්, යටලිපතක් හා ගල්කණු කොටස් දැකිය හැකි අතර, මෙම ස්ථානයේ ම තිබුණු නටබුන් ද ද්විතීය සංදර්භයට අයත් නටබුන් ද යන්න නිගමනය කළ නො හැකි ය. සිරිපතුල් ගල දිගින් සෙ.මී. 78 ක් ද පළලින් සෙ.මී. 77 ක් වේ. සිරිපතුලේ කොටසක් කැඩී ගොස් ඇත. යටලිපත දිගින් මීටර් 1.03 ක් පමණ ද පළලින් සෙ.මී. 45 ක් පමණ ද වන අතර, එහි කොටසක් කැඩී ගොස් ඇත. පැරණි ගඩොල් කොටස් ද සුළු වශයෙන් දැකිය හැකි ය. මෙම නටබුන් අනුරාධපුර අවධියට අයත් විය හැකි බවට අනුමාන කළ හැකි ය.





### පනන්කාමම් ශිවන් කෝවිල් නටබුන්

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නට්ටල්කණ්ඩාල් ග්‍රාම නිලධාරි වසමේ පනන්කාමම් ග්‍රාමයේ පෞද්ගලික ඉඩමෙහි මෙම ස්ථානය පිහිටා ඇත. වව්නියාව - යාපනය මාර්ගයේ ඕමන්තෙයි හන්දියෙන් වමට හැරි කුංචිකුලම් හරහා මල්ලාවී මාර්ගයේ පනන්කාමම් හන්දියෙන් වමට හැරී ගමන් කළවිට මාර්ගයේ වම් පසින් පිහිටි මෙම ස්ථානය දැකිය හැකි ය.



පෞරාණික කෝවිල වන මෙහි වර්තමානයේ සිදුකරන නවීකරණ කටයුතු හේතුවෙන් පෞරාණික ලක්ෂණ විනාශ වී ඇති බව පෙනේ. ගර්භ ගෘහයට ඇතුලුවන ස්ථානයේ වූ ශෛලමය ගව මූර්තිය හා ගර්භගෘහයට ඇතුලුවන උඩෙලිපතට ඉහලින් වූ විසිතුරු ගල්

කැටයම් පැරණි නිර්මාණ අංගයන් ලෙස හඳුනාගත හැකි ය. කෝවිල භූමිය අවට ගල් කණු කොටස්, කැටයම් කළ ගල් කැබලි විසිරී ඇත. වර්තමානයේ දක්නට ලැබෙන මෙම ලක්ෂණ අනුව කුමන අවධියකට අයත් නිර්මාණයක් ද යන්න නිර්ණය කළ නො හැකි අතර, ජනප්‍රවාදය අනුව මෙම කෝවිල වසර 150 කට වඩා ඈතට දිවයන බව කියවේ.



**නාගතම්බ්‍රාන් කෝවිලේ ඇති නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාලිනගර් ග්‍රාම නිලධාරි වසමේ කොල්ලවලාම්කුලම් ග්‍රාමයේ පෞද්ගලික ඉඩමෙහි මෙම ස්ථානය පිහිටා ඇත. මාන්කුලම් - මල්ලාවී මාර්ගයේ ඔට්ටරොත්තකුලම් හන්දියෙන් වමට පිහිටි පාලිනගර් මාර්ගයේ කිලෝමීටර් 2 ක් ගමන්කර වමට පිහිටි නාගතාම්බ්‍රාම් කෝවිල මාර්ගයේ ගමන් කළවිට මෙම ස්ථානයට ළඟා විය හැකි ය.



අනුරාධපුර අවධියට අයත් බෞද්ධ ස්මාරකයක් ලෙස හඳුනාගත හැකි මෙම ස්ථානයේ දක්නට ලැබෙන දාගැබේ විශ්කම්භය මීටර් 10.5 ක් පමණ වේ. උස සෙ.මී. 50 කි. මෙහි ගඩොල් ප්‍රමාණ කිහිපයකින් දක්නා ලැබේ. තවද මෝල්ඩින් ගඩොල් ද ඒ අතර වේ. මෙම භූමිය තුළ කඩා දමන ලද ගල්කණුවක් දැකිය හැකි අතර එහි දිග සෙ.මී. 80 පළල සෙ.මී. 18 ක් පමණ වේ.

වර්තමානයේ වන්දනා කිරීම සඳහා දේවාලයක් ඉදිකර ඇත. මෙම දේවාලයට අයත් තවත් කුඩා දේවාලයක් ද නටබුන් දාගැබ මත ඉදිකර ඇත.

දාගැබට දකුණු දෙසින් ගල් කණු 06 කින් සමන්විත නටබුන් ගොඩැල්ලකි. මෙම ගොඩනැගිල්ල කුමන කාර්යයක් සඳහා භාවිත වූයේද යන්න හඳුනාගත නො හැකි ය. විශාල ගල් කණු 01 ක් සහ කුඩා ගල් කණු 05 යුක්ත වන මෙම ගොඩනැගිල්ලට අයත් ගල් කණු සියල්ලෙහි ම උඩ කොටස් කඩා ගෙනගොස් ඇත. මෙම ස්ථානයෙහි පොළොවේ විශාල ගඩොල් ඇතුරුමක් දර්ශනය වේ. මෙම ඉඩමෙහි අන්තයේ ගලවා පෙරලා දමන ලද කණුපාදම් ගලක් ද වේ. මෙහි කොටසක් කඩා ඇත.

**සෙල්වපුරම් පුල්ලෙයාර් කෝවිල් නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සෙල්වපුරම් MUL 10 නිලධාරි වසමේ සෙල්වපුරම් ග්‍රාමයේ පෞද්ගලික ඉඩමෙහි මෙම ස්ථානය පිහිටා ඇත.



මෙම ස්ථානයේ වර්තමානයේ කෝවිලක් දැකිය හැකි ය. එය 1962 වර්ෂයේ ඉදිකරන ලද්දක් වන අතර, එම ඉදිකිරීමට පෙර සිට ම මෙම නටබුන් තිබූ බව ප්‍රදේශවාසීන් පවසයි. කණුපාදම් තුනක් දැකිය හැකි ය. මින් එකක් ප්‍රමාණයෙන් විශාල වන අතර හැඩයෙන් අනෙක් 02 ට වෙනස් ය. ගල් කණුවක කොටසක් ද දැකිය හැකි අතර එය දිගින් සෙ.මී. 55 ක් පමණ වේ. භූමිය පුරා පැරණි මැටි බඳුන් කොටස් විසිරි ඇත.



**ත්‍යාගරාජාගේ ඉඩමෙහි නටබුන්, සෙල්වපුරම්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සෙල්වපුරම් MUL 10 නිලධාරි වසමේ සෙල්වපුරම් ග්‍රාමයේ පෞද්ගලික ඉඩමෙහි මෙම ස්ථානය පිහිටා ඇත.

මෙම ස්ථානයේ බහුලව උළු, මැටි බඳුන් කොටස් හා ගඩොල් විසිරී ඇත. මෙම මැටි බඳුන් කොටස් අතර කළු සහ රතු මැටි බඳුන් (Black & Red wear) කැබලි මෙන් ම කළු මැටි බඳුන් (Black wear) කැබලි, රතු මැටි බඳුන් (Red wear) කැබලි ද සාමාන්‍ය ප්‍රමාණයක් දැකිය හැකි ය. කණුපාදම් 05 ක් ඉඩමේ කොනකට ගොඩගසා ඇති අතර, ඉඩම වගා කිරීම සඳහා භාවිත කර ඇත. භූමියේ සෑම ස්ථානයක ම පැරණි උළු, ගඩොල් හා මැටි බඳුන් කොටස් එකතු කර ගොඩගසා ඇත. දක්නට ලැබෙන ගඩොලක දිග, පළල හා උස සෙ.මී 20 x 21 x 6 ක් පමණ වේ. මෙම ඉඩමට දකුණු දෙසින් වූ අනෙක් ඉඩමෙහි ද මෙවැනි විසිරීමක් දැකිය හැකි ය. අනුරාධපුර අවධියට අයත් නටබුන් දැකිය හැකි මෙම ස්ථානයේ වගා කිරීමට භූමිය සැකසීම හේතුවෙන් කුමන වර්ගයකට අයත් වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ සහිත ගොඩනැගිලි තිබුණේ ද යන්න හඳුනාගත නො හැකි ය.





**කල්ඉරිප්පු නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන්නිවිලාන්කුලම් නිලධාරි වසමේ කල්ඉරුප්පු ග්‍රාමයේ රජයේ රක්ෂිතය තුළ මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ මණ්නර්කුලම් හන්දියෙන් (217km කණුව අසලින්) වමට හැරී කිලෝමීටර් 6 ක් පමණ ගමන්කළ විට හමුවන කල්ඉරුප්පු කෝවිලට මීටර් 150 ක් පමණ මෙපිටින් මාර්ගයේ වම්පසින් හමුවන ගල්තලාව දිගේ වනය තුළට ගමන් කළ පසු මෙම ස්ථානය දැකගත හැකි ය.

මෙම ස්ථානයේ විශාල ප්‍රමාණයේ ඇඹරුම් ගලක් දැකිය හැකි ය. මෙය සෙ.මී. 77 විශ්කම්භයක් සහිත වෘත්තය මධ්‍යයේ සෙ.මී 26 විශ්කම්භයෙන් සහ සෙ.මී. 30 ගැඹුරකින් යුක්ත සිදුරකි. මෙම සිදුරට නැගෙනහිර දෙසින් ඒ අසලම විශ්කම්භය සෙ.මී 10 ක් හා ගැඹුර සෙ.මී. 0.5 ක් වන තවත් වෘත්තයකි. මෙම වෘත්ත දෙක යාකරන කාණුවක් දැකිය හැකි අතර එය දිගින් සෙ.මී. 10 ක් පමණ ද ගැඹුර සෙ.මී. 1 ක් පමණ ද වේ. මෙම කාණුවට ප්‍රතිවිරුද්ධව කාණුවක් ද දෙපසින් තවත් කාණු දෙකක් ද දක්නා ලැබේ.

මෙම ස්ථානය පසුකර ගල්තලාව මතින් ගිණිකොන දෙසට ඉදිරියට මීටර් 20 ක් පමණ ගමන් කරන විට ගල්කටු පහරින් සිදුරු වූ කටු ලක්ෂණ 14 ක් සහිත ගල්කොරිය දැකිය හැකි ය. මෙම ගල් කටු පහර අනුරාධපුර අවධියට අයත් ලක්ෂණ දරණ අතර, මෙම ස්ථානය හා අවට ප්‍රදේශය වර්තමානයේ ගල්කොරියක් ලෙස පවත්වාගෙන ගොස් ඇත. මෙම ස්ථානයට ඇතුළුවන ස්ථානයේ ගල්තලාවට වම්පසින් මීටර් 10 ක් පමණ දුරින් තවත් ගල් කොරියක් දැකිය හැකි ය. මෙම ස්ථානයේ දැකිය හැකි ගල්කොරි ලක්ෂණත් අනුරාධපුර අවධියට අයත් බව නිගමනය කළ හැකි ය.

මෙම ස්ථානයට පැමිණීමේ දී පසුකර ආ කල්ඉරුප්පුකෝවිල් භූමියේ ළිං පඩිය බැඳීම සඳහා පැරණි ගඩොල් භාවිත කර ඇති අතර මේවා වෙනත් ස්ථානයකින් ගෙන ආ බව ප්‍රදේශවාසීන් පවසයි.





**ප්‍රාග් ඓතිහාසික සාධක - පරංගියන් ආරු**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ට අයත් නට්ටන්කණ්ඩාල් නිලධාරි වසමේ පරංගියන්ආරු ග්‍රාමයේ රජයේ රක්ෂිතය තුළ මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ ඕමන්තෙයි හන්දියෙන් වමට හැරි කුංචිකුලම් හරහා මල්ලාවී මාර්ගයේ කිලෝමීටර් 25 ක් ගමන්කර හමුවන පනන්කාමම් හන්දියෙන් වමට හැරී මඩු මාර්ගයේ කිලෝමීටර 1 ක් පමණ ගමන් කර නැවත වමට පිහිටි තීත්තකර මාර්ගයේ කිලෝමීටර් 1 ක් පමණ ගමන් කර වම්පසින් හමුවන අඩිපාර දිගේ මීටර් 20 ක් පමණ ගමන් කර මෙම ස්ථානයට ළඟා විය හැකි ය.

මෙම ස්ථානයෙන් කහඳ (රතු) කැබලි, තිරුවානා පතුරු, ක්ෂුද්‍ර ශිලා මෙවලම් සහ ශිලාමෙවලමක කොටසක් හඳුනා ගන්නා ලදී. මෙම ස්ථානයට අවට වර්ග අඩි 600 පමණ ප්‍රදේශයක මතුපිට මෙම සාධක දැකිය හැකි ය. උක්ත අවශේෂ පුරාණ ජනාවාස සාධක ලෙස හඳුනාගත හැකි අතර, මෙම ස්ථානයට මීටර් 50 පමණ දුරින් පරංගියන් ආරුව බැස යයි.



**මුන්ඩිමුරුප්පු සෙන්ගල්පුට්ටි නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නට්ටන්කණ්ඩාල් ග්‍රාම නිලධාරි වසමේ මුන්ඩිමුරුප්පු සෙන්ගල්පුට්ටි ග්‍රාමයේ රජයේ රක්ෂිතය තුළ මෙම ස්ථාන පිහිටා ඇත. වව්නියා - මන්නාරම මාර්ගයේ පුවරසම්කුලම් හන්දියෙන් දකුණට හැරී කි.මී. 35 ක් පමණ ගමන් කර මුණ්ඩිමුරුප්පුකුලම් හන්දිය පසුකර නට්ටන්කණ්ඩාල් දෙසට කි.මී. 2 ක් පමණ ගමන්කර එලමදුරකුලම් ගම්මානය අසලින් මෙම ස්ථානය හමුවේ.

**දාගැබ**

අනුරාධපුර අවධියේ ඉදිකරන ලද්දක් ලෙස හඳුනාගත හැකි මෙම නටබුන් වූ දාගැබ විෂ්කම්භයෙන් මීටර් 17 ක් පමණ හා උසින් මීටර් 3 ක් පමණ වේ. නිදන් සොරුන්ගේ ග්‍රහණයට ලක්වූ මෙම දාගැබෙහි මධ්‍යය මීටර් 3.5 ක් ගැඹුරට විශ්කම්භය මීටර් 9.3 ක් පමණ වන විශාල ප්‍රමාණයේ අනවසර කැණීමක් දැකිය හැකි ය. මෙම දාගැබ ඉදිකිරීම සඳහා ගඩොල් වර්ග කිහිපයක් භාවිත කර ඇති අතර, විශාල ප්‍රමාණයෙන් සකසන ලද ගඩොල් පොළොව මට්ටම යොදා ඇති බවක් හඳුනාගත හැකි ය. එය දිග පළලින් සෙ.මී. 50 x 31.8 ක් වේ. මේ අතර මෝල්ඩින් ගල් දක්නා ලැබේ.

**ගොඩනැගිල්ල අංක 01**


දාගැබට ඊසාන දිශාවෙන් ගල්කණුවලින් ඉදිකරන ලද නටබුන් වූ ගොඩනැගිල්ලක් දැකිය හැකි ය සෘජුකෝණාස්‍රාකාර ගොඩනැගිල්ලක් වන මෙහි දිග හා පළල මීටර් 10.6 x 6.6 ක් පමණ වේ. මෙම ගොඩනැගිල්ල ඉදිකිරිමට සිටුවන ලද ගල් කණු 10 ක් දැකිය හැකි අතර, ඒ ආසන්නයෙන් කැඩී ගිය කණු කැබලි කිහිපයක් ද වේ.

**ගොඩනැගිල්ල අංක 02**

අංක 01 ගොඩනැගිල්ලට මීටර් 10 ක් පමණ දුරින් නටබුන් ගොඩනැගිල්ලක සාධක දක්නා ලැබෙන අතර මෙය පිටමාලයක් සහිත ගල්කණු යොදා ඉදිකරන ලද ගොඩනැගිල්ලක් ලෙස හඳුනාගත හැකි ය. පිට මාලය සඳහා ගඩොල් පවුරක් ද ඉදිකර තිබී ඇති බව සාධක අනුව අනුමාන කළ හැකි ය. මෙය දිගින් මීටර් 6.8 ක් හා පළලින් මීටර් 6.5 ක් පමණ වන ගොඩනැගිල්ලකි. ගල් කණු 8 ක් භාවිතයෙන් ඉදිකරන ලද මෙහි අභ්‍යන්තරය ගෘහය සඳහා ගල් කණු 4 ක් යොදා ඇති අතර ඉන් පිටතින් ගල් කණු 4 ක් යොදා පිට මාලය සකසා ඇති බව පෙනේ.

මෙම ගොඩනැගිල්ලට පිටුපසින් මීටර් 5 ක් පමණ දුරින් පෙරලුණු ගඩොල් බැම්මක අවශේෂ ද දක්නා ලැබේ. මෙම බැම්ම මීටර් 1 ක් පමණ පළලින් මීටර් 5 ක් පමණ දුරට විහිදී ගොස් ඇති බව පෙනේ.

දාගැබට බටහිර දෙසින් මීටර් 10 ක් පමණ දුරින් ගඩොල්වලින් බඳින ලද බැම්මක අවශේෂ දැකිය හැකි අතර මෙම බැම්ම වට බැම්මක් ලෙස තැනින් තැන දර්ශනය වේ. බැම්ම එක් ස්ථානයක මීටර් 3.5 ක් දිගින් දර්ශනය වේ. මෙම බැම්මට පිටුපසින් දළ බැස්මක් දැකිය හැකි ය. මෙය පොකුණ සැකසීමට භාවිත කරන ලදැයි විශ්වාස කළ හැකි ය. මෙම පොකුණේ වර්තමානයේ දී දිය සිඳී ඇත. මෙහි විශ්කම්භය දළ වශයෙන් මීටර් 34 ක් පමණ ද ගැඹුර මීටර් 2 ක් පමණ ද වේ.





**පරංගිආරු කීරිසුඩ්ඩාන් නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිරිසුඩ්ඩාන්, පරංගිආරු ග්‍රාමයේ රජයේ රක්ෂිතය තුළ මෙම ස්ථාන පිහිටා ඇත. වව්නියා - මන්නාරම මාර්ගයේ පුවරසම්කුලම් හන්දියෙන් දකුණට නට්ටන්කණ්ඩාල් හන්දියට පැමිණ වමට හැරී සරාටිකුලම් ගමට යන මාර්ගයේ කිලෝමීටර් 4 ක් පමණ ගමන් කර හමුවන කිරිසුඩ්ඩාන් මාර්ගයේ කිලෝමීටර් 5 ක් ගොස් වමට හැරී නට්ටන්කණ්ඩාල් දෙසට කිලෝමීටර් 4 ගමන්කර හමුවන ආරුව අසලින් වමට හැරී මීටර් 600 ක් පමණ වනය තුළට ගමන් කළ යුතුය.

**දාගැබ**

අනුරාධපුර අවධියට අයත් දාගැබක නටබුන් දැකිය හැකි අතර, මෙය විශ්කම්භයෙන් මීටර් 11 ක් ද උසින් මීටර් 1 ක් පමණ ද වේ. ගඩොල් අතර මෝල්ඩින් ගඩොල් ද දැකිය හැකි ය.



**නටබුන් ගොඩැල්ල අංක 1**

දාගැබට බටහිරි මිටර් 13 ක් පමණ දුරින් නටබුන් ගොඩැල්ලකි. මෙය මීටර් 7X7 ක් පමණ දිගු පුළුලින් යුත් ගොඩැල්ලක් වන අතර මෙහි මධ්‍යයෙහි අනවසර කැණීමකි. එය මීටර් 5 ක් දිගින් මීටර් 4.8 ක් පළලින් හා මීටර් 1.2 ක් පමණ ගැඹුරට කැණීම් කර ඇත. මෙම ස්ථානයේ නටබුන් අවශේෂ ලෙස උළු, ගඩොල් දැකිය හැකි ය.

**නටබුන් ගොඩැල්ල අංක 2**

දාගැබට නිරිත දෙසින් සිටුවන ලද ගල් කණු කොටස් දෙකක් සහිත ගොඩැල්ලක් දැකිය හැකි ය. මෙම ස්ථානය ද අනවසරයෙන් කැණීම් කර ඇති අතර, මෙහි ගඩොල් කොටස් දැකිය හැකි ය. මෙම භූමියේ තවත් ස්ථානයක ගල් කණු කොටස් හා ගඩොල් බැම්මක අවශේෂ දක්නා ලැබේ.

දාගැබට වයඹ දෙසින් මීටර් 25 ක් පමණ දුරින් ඇඹරුම් ගලක් හෝ කණු පාදමක් ලෙස අනුමාන කළ හැකි සැකසූ ගලකි. මෙහි දිග හා පළල සෙ.මී. 86 x 84 ක් වන ශෛලමය ගල් කුට්ටිය මධ්‍යයෙහි සිදුර, සෙ.මී. 26 ක විශ්කම්භයෙන් හා සෙ.මී. 35 ක ගැඹුරින් යුක්ත ය. මෙම සිදුරේ සිට සෙ.මී. 12 ක් පමණ දුරින් තවත් කුඩා වෘත්තයක් සකසා ඇති අතර එය සෙ.මී. 16 ක විශ්කම්භයෙන් හා සෙ.මී. 0.5 ක ගැඹුරින් යුක්ත ය.



**වෙට්ටුනීරාවි නටබුන් දාගැබ**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සරාටිකුලම් අංක 15 ග්‍රාම නිලධාරි වසම සරාටිකුලම් ග්‍රාමයේ රජයේ රක්ෂිතය තුළ මෙම ස්ථාන පිහිටා ඇත. වව්නියා - මන්නාරම මාර්ගයේ පුවරසම්කුලම් හන්දියෙන් දකුණට නට්ටන්කණ්ඩාල් හන්දියට පැමිණ වමට හැරී සරාටිකුලම් ගමට යන මාර්ගයේ කිලෝමීටර් 7 ක් පමණ ගමන් කර හමුවන පෙරියමඩු මාර්ගයේ කිලෝමීටර් 1 ක් පමණ ගියපසු මාර්ගයේ වම්පසින් මෙම ස්ථානය දැකිය හැකි ය.



විශ්කම්භය මීටර් 8 ක් පමණ වන මෙම දාගැබෙහි උස සෙ.මී. 50 ක් පමණ වේ. මෙම දාගැබ මධ්‍යයෙහි විශාල ප්‍රමාණයේ වෘක්ෂ 03 ක් වැඩී ඇත. මෙම දාගැබේ මධ්‍යය කැණීම් කර ඇති අතර, එහි විශ්කම්භය මීටර් 3 ක් පමණ ද ගැඹුර සෙ.මී. 50 ක් පමණ ද වේ. මෙම ස්ථානයට කාලතුවක්කු පතුරොමක් පතිත වී ඇති බව පෙනෙන්නට ඇති අතර, එයින් මෙම දාගැබට හානි වී ඇත. අවට ගඩොල් කැබලි, පැරණි මැටි බඳුන් කොටස් හා උළු කැබලි විසිරී ඇත.

**කෙරිඩමඩු නටබුන් ගොඩනැගිල්ල**

පුදුකුඩුරිප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මන්නකණ්ඩාල් ග්‍රාම නිලධාරි වසමේ කෙරිඩමඩු ග්‍රාමයේ පෞද්ගලික ඉඩමේ  මෙම ස්ථාන පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියෙන් වමට හැරි මුලතිව් මාර්ගයේ ඔඩ්ඩුසුඩාන් හන්දියෙන් පුදුකුඩුඉරිප්පු මාර්ගයේ මණ්නකණ්ඩාල් හන්දියෙන් වමට පිහිටි මාර්ගයේ මීටර් 500 ක පමණ ගමන් කර මාර්ගයෙන් දකුණු දෙසට මීටර් 200 ක් පමණ ගමන් කළ යුතු වේ.

අනුරාධපුර අවධියට අයත් නටබුන් ගොඩනැගිල්ලක සාධක සහ හුණු ගලින් නිමවන ලද කවන්ධ බෝධිසත්ව ප්‍රතිමාවක් දැකිය හැකි ය. තවද මෙම ස්ථානයෙන් ගෙනයන ලද විශාල ප්‍රමාණයේ මල් ආසනයක් මන්නකණ්ඩාල් හන්දියේ කෝවිල භූමියේ තබා ඇත.

මෙම නටබුන් ගොඩනැගිල්ලේ අවශේෂ ලෙස සිටුවන ලද ගල්කණු 05 ක් දැකිය හැකි ය. මෙම ස්ථානයේ ගොඩනැගිල්ලේ භාවිත වූ  ප්‍රමාණ කිහිපයක අයත් ගඩොල්, අවට විසිරුණු උළු හා පැරණි මැටි බඳුන් කොටස් දක්නා ලැබේ. ගොඩනැගිල්ලේ මධ්‍යය හාරා ඇත. මෙම නටබුන් අවශේෂ අතර පිළිම කොටස් ලෙස අනුමාන කළ හැකි අවශේෂ ද විය. කවන්ධ බෝසත් ප්‍රතිමා කොටස සෙ.මී 69 පමණ උසින් හා සෙ.මී. 16 පමණ පළලින් යුක්ත වූවකි. මෙය ක්‍රිස්තු වර්ෂ 8-10 සියවස් අතර කාලයට අයත් නිර්මාණයක් ලෙස සඳහන් කළ හැකි ය. මෙම ස්ථානයේ සෙ.මී. 140 ක් පමණ උසැති කවන්ධ හිටි බුදු පිළිමයක් දැකිය හැකි ය. මෙය අනුරාධපුර අවධියට අයත් වූවක් ලෙස සැලකිය හැකි ය. මෙම ප්‍රතිමා 02 ක මේ වන විට කච්චිලමඩු නම් ස්ථානයේ (ඔඩ්ඩුසුඩාන් - පුදුකුඩුරිප්පු මාර්ගයේ වම්පසින් කච්චිලමඩු හන්දිය අසල) තැන්පත් කර ඇත.

ඉහත නටබුන් ගොඩැල්ලට නැගෙනහිර දෙසින් මීටර් 25 ක් පමණ දුරින් පොකුණක් දැකිය හැකි අතර වර්තමානයේ මෙහි දිය සිඳී ගොස් ඇත. පොකුණ වටා බැම්මක් තිබූ බව ප්‍රදේශවාසීන් පවසයි. මෙහි විෂ්කම්භය මීටර් 20 ක් හා ගැඹුර සෙ.මී. 50 කි. නටබුන් ගොඩැල්ලට පසු පසින් මීටර් 8 ක් පමණ දිගට විහිදී යන ගඩොල් බැම්මක් දර්ශනය වේ. මෙම ස්ථාන අවට ප්‍රදේශවල තැන තැන ගඩොල් ඉදිකිරීම් දක්නට ලැබෙන අතර, මෙම ඉදිකිරීම් මෑත කාලීනව මෙම ස්ථානයේ තිබූ පෞරාණික ගොඩනැගිලිවලින් ලබාගත් ගඩොල් උපයෝගී කර සිදුකරන ලද නවීන ඉදිකිරීම් ලෙස හඳුනාගත හැකි ය.

මන්නකණ්ඩාල් හන්දියේ ඇති කෝවිල් භූමියේ ඇති මල් ආසනය අනුරාධපුර අවධියට අයත් වූවකි. මෙය සෙ.මී. 124 ක විශ්කම්භයකින් හා සෙ.මී. 22.5 ක ඝනකමකින් යුතුවේ.







**නයාරු නටබුන් දාගැබ**

මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිරිඉබ්බන්වැව ග්‍රාම නිලධාරි වසමේ කිරිඉබ්බන්වැව ග්‍රාමයේ රජයේ රක්ෂිතය තුළ මෙම ස්ථාන පිහිටා ඇත. මුලතිව් - කෝකිලායි මාර්ගයේ කිලෝමීටර් 16 ක් පමණ ගමන්කර නයාරු පාලම පසුකර මීටර් 500 ක් පමණ ඉදිරියට ගොස් මාර්ගයේ දකුණු පසට මීටර් 100 ක් පමණ ගමන් කිරීමෙන් ඩෝසර් කරනලද මෙම ස්ථානය හමුවේ.

මෙම ස්ථානයේ අනුරාධපුර අවධියට අයත් නටබුන් වූ දාගැබක අවශේෂ දැකිය හැකි අතර, මෙය මුළුමනින් ම ඩෝසර් කර ඇත. පොළොව මට්ටම දක්වා ඩෝසර් කරන ලද දාගැබේ විශ්කම්භය ආසන්න වශයෙන් මීටර් 10 ක් පමණ විය හැකි බව අනුමාන කළ හැකි වේ. මෙම ස්ථානයේ දැකිය හැකි ගඩොල් ප්‍රමාණය අනුව තරමක් විශාල ප්‍රමාණයේ දාගැබක් ලෙස අනුමාන කළ හැකි ය. ගඩොල් වර්ග කිහිපයක් භාවිතයෙන් ඉදිකරන ලද්දක් වන මෙහි දිග, පළල හා උස 33 x 15 x 6 හා 24 x 23 x 6 හා 25 x 16.5 x 6 වන ප්‍රමාණ 03 ක ගඩොල් නිරීක්ෂණය විය. මෙම ස්ථානයේ අනුරාධපුර අවධියට අයත් උළු කැබලි හා පැරණි මැටි බඳුන් කොටස් දක්නා ලදී.





**මුලතිව් පොදු වෙළඳපොළ**

මුලතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුලතිව් ග්‍රාම නිලධාරි වසමෙහි මුලතිව් නගරයේ පිහිටා ඇත. මුලතිව් නගරයට ගොස් නගර මධ්‍යයෙන් බස් නැවතුම්පළ මාර්ගයේ අන්තයට ගමන්කර වමට හැරී මීටර් 500 ගමන්කළ විට මුලතිව් වෙළඳපොළ හමුවේ.

තරමක් හොඳින් ආරක්ෂා වී පවතින පොදු වෙළඳපොළෙහි පියස්ස ගැලවී ඇත. කුරුසයක හැඩය ගන්නා මෙම ගොඩනැගිල්ල දිගින් මීටර් 24.9 ක් ද පළලින් මීටර් 24.9 ක් වේ. කොරල් ගල් ආධාරයෙන් ඉදිකරන ලද කණු 28 ක් තිබූ බවට සාධක දැකිය හැකි අතර කණු 03 කැඩී ගොස් ඇත. මෙම වෙළඳපොළෙහි කොටසක් දැනට භාවිතයට ගන්නා අතර, ඒ අසලම නව වෙළඳපොළ ඉදිකර ඇත. මෙහි කණු වර්ග දෙකක් භාවිත කර ඇත. කණුවක උස මීටර් 2.27 ක් පමණ වේ. මෙම ගොඩනැගිල්ලේ පියස්ස සඳහා සිංහල උළු සෙවිලි (1940 දී පමණ) කර තිබුණු බව වෙළඳුන් පවසයි.





**කොම්බුඅච්චුකුලම් නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මුන්ඩිමුරුප්පු ග්‍රාම නිලධාරි වසමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මර්ගයේ ඕමන්තේ හන්දියෙන් වමට හැරි කිලෝමීටර් 12 ක් පමණ ගමන් කර මුණ්ඩිමුරුප්පු හන්දියට පැමිණ දකුණට වූ කොම්බුඅච්චුකුලම් මාර්ගයේ කිලෝමීටර් 2 ක් පමණ ගමන්කළ විට හමුවන සියඹලාගස මුල හා මාර්ගයේ මධ්‍යයේ, මාර්ගයේ දකුණු පසින් මෙම නටබුන් දැකිය හැකි ය.

මෙම ස්ථානයේ මාර්ගයේ මධ්‍යයේ ගඩොල් ඇතුරුමක් දැකිය හැකි ය. මෙය මාර්ගයේ වර්ග මීටර් 1 පමණ ප්‍රදේශයක් පාරේ මතුව ඇත. මෙම ස්ථානයට මීටර් 6 ක් දුරින් පමණ උතුරු දිශාවෙන් ගලවා දමා ඇති කණුපාදම් ගල් දෙකකි. මෙම ගල් ඇතුරුමට මීටර් 10 ක් පමණ උතුරින් තවත් කණුපාදමක් දැකිය හැකි ය. ගල් ඇතුරුමට මීටර් 15 ක් පමණ ඊසාන දිශාවෙන් තවත් කණුපාදම් ගලකි. මෙම කණුපාදම් 04 විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත ය. අවට ප්‍රදේශයේ සුළු වශයෙන් පැරණි මැටි බඳුන් කොටස් හා යබොර කැබලි ද දක්නා ලැබේ.





**පාලෙප්පාන් (සාත්‍යානාදන්ගේ ඉඩමේ) නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන්නිවිලාන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ ඕමන්තේ හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 12 ක් පමණ ගමන් කර මුණ්ඩිමුරුප්පු හන්දියට පැමිණ දකුණට වූ කොම්බුඅච්චුකුලම් මාර්ගයේ කිලෝමීටර් 5 ක් පමණ ගමන්කළ විට පාලෙප්පානී ග්‍රාමයේ මාර්ගයේ දකුණු පසින් වූ ඉඩමේ මෙම නටබුන් සහිත ස්ථාන දැකිය හැකි ය.

මෙම නටබුන් සහිත ස්ථානය අවට වගා කිරීම් හේතුවෙන් පුරාවස්තු විනාශයක් සිදු වී ඇත. මෙම ස්ථානයේ දැනට දැකිය හැකි නටබුන් අතරට සිටුවන ලද ගල්කණුවක්, ගලවා ඇති ගල් කණු දෙකක් හා කණුපාදමක් හඳුනාගත හැකි ය. භූමිය පුරා පැරණි ගඩොල් හා පැරණි මැටි බඳුන් කොටස් විසිරී ඇත.

මෙම ස්ථානයට මීටර් 75 ක් පමණ දුරින් කපන ලද ඇළකි. මෙම ඇළෙහි හා අවට ප්‍රදේශයේ පැරණි මැටි බඳුන් කොටස් විසිරී ඇත. මෙහි වූ මැටි බඳුන් කැබලි අතර රතු, කළු, කළු හා රතු යන වර්ග තුන ම හඳුනාගත හැකි ය. මෙහි කපා ඇති ඇළෙහි වේල්ලේ දිග මීටර් 50 ක් පමණ විය. එම වේල්ලෙහි බහුලව පැරණි මැටි බඳුන් කොටස් විසිරි ඇත. මෙහි දක්නට ලැබෙන රතු හා කළු මැටි බඳුන් කොටස් අනුව මෙම ස්ථානය ක්‍රිස්තු වර්ෂ 3 වන සියවසට වඩා පැරණි බව නිගමනය කළ හැකි ය.

ඉහත ඇළ මාර්ගයට නැගෙනහිරින් මීටර් 10 ක් පමණ දුරින් විශාල ගල්කුට්ටියකි. එහි මධ්‍යයෙන් වෘත්තාකාර සිදුරක් ද වේ. මෙම ගල් කුට්ටිය සෙ.මි. 90 ක් දිගින් හා සෙ.මී. 80 ක පළලින් ද සෙ.මී. 55 ක උසකින් ද යුක්ත ය. මෙහි සිදුරේ විශ්කම්භය සෙ.මී. 26 ක් ද ගැඹුර සෙ.මී. 27 ක් ද වේ. පෙරකී ඉඩමේ සිට මෙය කෝවිලකට ගෙනයාමට ගෙන ආ බව ගම්වාසීන් පවසන අතර මෙය ඇඹරුම් කාර්යයකට භාවිත කරන්නට ඇතැයි සිතිය හැකි ය.





**පෙරියතෙහිලම්කුලම් නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන්නිවිලාන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ පාලෙප්පානි ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ ඕමන්තේ හන්දියෙන් වමට හැරි කිලෝමීටර් 12 ක් පමණ ගමන් කර මුණ්ඩිමුරුප්පු හන්දියට පැමිණ දකුණට වූ කොම්බුඅච්චුකුලම් මාර්ගයේ කිලෝමීටර් 5.5 ක් පමණ ගමන්කළ විට පාලෙප්පානී ප්‍රජා ශාලාවට ඉදිරිපසින් දකුණින් ඇති මාර්ගයේ පුච්තෙවර්තවසි මහතාගේ ඉඩමේ අන්තයේ මෙම නටබුන් දැකිය හැකි ය.

ගල්කණු 08 කින් යුත් නටබුන් ගොඩනැගිල්ලක් දක්නා ලැබෙන අතර, මෙහි ගල්කණු 4 ක් පෙරළී ඇත. උසම ගල්කණුව පොළොව මට්ටමේ සිට සෙ.මී. 65 ක් පමණ වේ. හොඳින් සකසන ලද ගල්කණු වන මේවා ප්‍රමාණයන් කිහිපයකින් යුක්ත ය. මෙම ගොඩනැගිල්ල දිගින් හා පළලින් මීටර් 4.2 x 2.8 පමණ වේ. මෙහි අවට ප්‍රදේශයේ පැරණි ගඩොල් කොටස් දැකිය හැකි ය. මෙම ගොඩනැගිල්ලට මීටර් 4.5 ක් පමණ නිරිත දිශාවෙන් සිටුවන ලද ගල් කණුවක් වන අතර, එහි පොළොවේ සිට උස සෙ.මී. 45 ක් පමණ වේ.

**පෙරියකුලම් කැළේ නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන්නිවිලාන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ පෙරියකුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ ඕමන්තේ හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 12 ක් පමණ ගමන් කර මුණ්ඩිමුරුප්පු හන්දියට පැමිණ දකුණට වූ කොම්බුඅච්චුකුලම් මාර්ගයේ කිලෝමීටර් 5.5 ක් පමණ ගමන්කළ විට පාලෙප්පානී

ග්‍රාමය මධ්‍යයෙන් වමට පිහිටි පෙරියකුලම් මාර්ගයේ වනය තුළට පිවිස බටහිර දෙසට කි.මී. 2 ක් පමණ ගමන් කළ යුතුය.

රජයේ රක්ෂිතය මධ්‍යයේ පැරණි ගඩොල් විසිරී ඇති ප්‍රදේශයකි. මීටර් 10x10 පමණ ප්‍රදේශයක් පුරා මෙම සාධක විසිරි ඇත. එල්ටීටීඊ කඳවුරක් ඉදිකර තිබූ ස්ථානයක් වන බැවින් භූමියේ මතුපිට තිබූ සාධක බොහොමයක් විනාශ වී ඇත. කණුපාදම් කොටසක් පමණක් දැකිය හැකි ය.





**වන්නිවිලාන්කුලම් නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන්නිවිලාන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ වන්නිවිලාන්කුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියෙන් වමට හැරි තුණුක්කායි මාර්ගයේ මුණ්ඩිමුරුප්පු හන්දියට පැමිණ වමට වූ මාර්ගයේ මීටර් 250 ක් පමණ ගමන්කළ විට මාර්ගය මත හා මාර්ගයේ වම්පසින් මෙම නටබුන් දැකිය හැකි ය.

මෙම ස්ථානයේ පැරණි ගඩොල් බහුලව දැකිය හැකි ය. මෙහි ගඩොල් බැම්මක අවශේෂ ද වේ. ගඩොල් ඇතුරුමක් ලෙස හඳුනාගත හැකි මෙහි මාර්ගය හා මාර්ගයේ වම්පස ප්‍රදේශය දක්වා ගඩොල් විහිදී ඇති බව පෙනේ. ගඩොලක ප්‍රමාණය සෙ.මී. 22 x 20 x 6 පමණ වේ.





**පුවරසම්කුලම් භද්‍රකාලි කෝවිල් නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුවරසම්කුලම් ග්‍රාම නිලධාරි වසමේ පුවරසම්කුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියට පැමිණ වමට හැරී තුණුක්කායි මාර්ගයේ තුණුක්කායි හන්දියෙන් වමට හැරී ඔඩ්ඩම්කුලම් දෙසට (කළුපාලම පසුකර) ගමන්කර විනයාගපුරම් හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 1 ක් ගමන්කළ විට මාර්ගයේ වම්පසින් වූ කුඹුර මධ්‍යයේ පිහිටි කෝවිල් භූමියේ මෙම නටබුන් දැකිය හැකි ය.

කෝවිල අසල පිහිටි මෙම අත්තාණි කණුවෙහි එක් පසෙක ගැරඩියා, කපුටා, බල්ලා හා වටාපත යන රූප කොටා ඇත. මෙම රූප මගින් දනවන්නේ මෙම ප්‍රදේශය සංඝසතු දේපළක් බවත්, මේවා කිසියම් අයෙකු අනිසි ලෙස පරිහරණය කළහොත් ඊලඟ ආත්මයේ ගැරඩියා, බල්ලා හෝ කපුටන් වී උපදින බවත් ය. මෙම ස්ථානය අවට සුළු වශයෙන් උළු දැකිය හැකි ය. අත්තාණි කණුවට දකුණු පසින් වූ භූමියේ පැරණි ගඩොල් දක්නා ලැබෙන අතර, අවට කුඹුරුවලින් මැටිපහන් හමුවී ඇති බව ගම්වාසීන් පවසයි.







**කරුන්පුලියන්කුලම් නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරුන්පුලියන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ කරුන්පුලියන්කුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියට පැමිණ වමට හැරී තුණුක්කායි මාර්ගයේ තුණුක්කායි හන්දියෙන් වමට හැරී ඔඩ්ඩම්කුලම් දෙසට (කළුපාලම පසුකර) ගමන්කර විනයාගපුරම් හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 2 ක් ගමන්කළ විට මාර්ගයේ දකුණට හැරී මීටර් 20 ක් ගමන්කර මාර්ගයේ වම්පසින් වූ අංක LD4 නිවසේ මෙම නටබුන් දැකිය හැකි ය.

පෞද්ගලික ඉඩමක අන්තයේ දැකිය හැකි මෙම පෞරාණික වස්තුව ඇඹරුම් ගලක් ලෙස අනුමාන කෙරේ. උතුරු පළාතේ දී පමණක් මෙය දැකිය හැකි ය. මෙහි දිග හා පළල සෙ.මී. 80 × 80 ක් පමණ වේ. මෙහි මධ්‍යයේ සිදුරක් දක්නා ලැබෙන අතර එහි විශ්කම්භය සෙ.මී. 23 ක් පමණ ද ගැඹුර සෙ.මී. 23 ක් ද වේ. මෙම ගලෙහි එක් අන්තයක විශ්කම්භය සෙ.මී. 10 හා ගැඹුර සෙ.මී. 1.5 ක් වන කුඩා සිදුරක් ද වේ. මෙම ඉඩමෙහි අතීතයේ පටන් මෙම ගල තිබුණු බව නිවැසියන් පවසයි.



**කරුන්පුලියන්කුලම් පුල්ලෙයාර් කෝවිලේ නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරුන්පුලියන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ කරුන්පුලියන්කුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියට පැමිණ වමට හැරී තුණුක්කායි මාර්ගයේ තුණුක්කායි හන්දියෙන් වමට හැරී ඔඩ්ඩම්කුලම් දෙසට (කළුපාලම පසුකර) ගමන්කර විනයාගපුරම් හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 3 ක් ගමන් කළ විට කරුන්පුලියන් වැවට (මාර්ගයේ වම්පසින්) වම්පසින් මෙම කෝවිල පිහිටා ඇත.





මෙම කෝවිල් භූමියේ කොරවක් ගලක්, ගල් කණු කොටස් දෙකක් හා කණුපාදම් ගලක් දැකිය හැකි ය. මෙම කොරවක් ගල මත දේවරූපයක් තබා වන්දනාමාන කරනු ලැබේ. ගල්කණු කොටසේ දිග සෙ.මී 88 ක් පමණ වේ. මෙම කොරවක් ගල තිබෙන ස්ථානයට වයඹ දිශාවෙන් මීටර් 40 ක් පමණ දුරින් කණුපාදම් ගලක් දැකිය හැකි අතර, එහි සිදුර බදාමයෙන් වසා ඇත.



**පාණ්ඩියන්කුලම් ශිවන් කෝවිල් භූමියේ නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාණ්ඩියන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ කරුන්පුලියන්කුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියට පැමිණ වමට හැරී තුණුක්කායි මාර්ගයේ තුණුක්කායි හන්දියෙන් වමට හැරි ඔඩ්ඩම්කුලම් දෙසට (කළුපාලම පසුකර) ගමන්කර විනයාගපුරම් හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 4 ගමන්කළ විට කරුන්පුලියන් වැව පසුකර ඉදිරියට ගමන් කිරීමේ දී මාර්ගයේ වම්පසින් මෙම කෝවිල පිහිටා ඇත.

මෙම ස්ථානයේ කෝවිල වසර 30 කට පමණ පෙර ඉදිකරන ලද්දක් වන අතර, එම කෝවිල පිහිටි ස්ථානයේ සිට මීටර් 100 ක පමණ වට ප්‍රමාණයකට යටත්ව පෞරාණික ගොඩනැගිලි හා ඒවාට අයත් අවශේෂ දක්නා ලැබේ. අනුරාධපුර යුගය නියෝජනය කරනු ලබන සාධක සහිත මෙම ස්ථානය මෙම ප්‍රදේශයෙන් හමුවූ පුරාවිද්‍යා වැදගත්කමක් සහිත ස්ථානයන් අතරින් ප්‍රමුඛස්ථානයක් දරයි.

කෝවිලට ගිණිකොන දෙසින් මීටර් 10 ක් පමණ දුරින් ගඩොලුමය මද උස් ගොඩැල්ලක් දැකිය හැකි ය. එම ස්ථානයට අවට ප්‍රදේශයේ ද ගඩොල් කොටස් බහුලව විසිරී ඇත. ඒ ආසන්නයෙන්ම යුපගලක් දැකිය හැකි ය. එය කැඩීගොස් ඇති අතර, ඉතිරිව ඇති කොටසේ දිග සෙ.මී. 110 ක් ද විශ්කම්භය සෙ.මී 22 ක් ද වේ. මේ අසල තවත් කැඩීගිය ගල්කණු කොටස් කිහිපයක් ද වේ. මෙම ගොඩැල්ල අවට පැරණි උළු කැබලි ද දැකිය හැකි ය.

මේ භූමියෙන් දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ලෙස හැඳින්විය හැක්කේ මැටි භාවිතයෙන් කරන ලද නිර්මාණයි. ඒ අතරට ටෙරාකොටා රූප, විශාල මැටි භාජන කොටස්, උළු, වඩිම්බු උළු, නෙලුම්මල් රටා ආදීය හැඳින්විය හැකි ය.

කෝවිලට උතුරු දිශාවෙන් ඒ අසලම විශාල ආසනයකි. එය මධ්‍යයෙන් කඩා එක් කොටසක් ඉවත් කර ඇති අතර, එම ස්ථානය පොළොන්නරු අවධියේ භාවිත වූ කටු ලක්ෂණ දැකිය හැකි

ය. ඉතිරිව ඇති කොටස දිග මී. 1.75 ක් ද පළල මී. 1.40 ක් ද වේ. ආසනය වටා බොරදම් රටා නිර්මාණය කර ඇත.

කෝවිලට බටහිර දෙසින් ඒ අසල ම සිරිපතුල් ගලක්, පාදෝවනයක් සහ මුරගල් දෙකකි. දිගින් සෙ.මී. 55 ක් හා පළලින් සෙ.මී. 60 ක් වූ සිරිපතුල් ගල ඇඹරුම් ගලක් ලෙස භාවිත කර ඇති බවක් දර්ශනය වේ. පාදෝවනය සෙ.මී. 70 ක් දිගින් හා සෙ.මී. 55 ක් පළලින් යුතුය. මුරගල් දෙකෙහිම කැටයම් හඳුනාගැනීම තරමක් අපහසුය. පුන්කලස කැටයම ලෙස අනුමාන කළ හැකි ය. මෙම කැටයම් සහිත මුරගල් අනුරාධපුර අවධියේ මුල භාගයට අයත් යැයි කාලනිර්ණය කර ඇත. එක් මුරගලක් දෙකට කැඩී ඇත. මුරගලක සෙ.මී. 70 ක් ද පළල සෙ.මී. 29 ක් ද වේ.

කෝවිලට නිරිත දිශාවෙන් මීටර් 50 ක් පමණ දුරින් පිහිටි ඉඩමක ගඩොල් බහුලව විසුරුණු ස්ථානයකි. එහි ගඩොල් බැම්මක සාධක හා කණු පාදමක් දැකිය හැකි ය. කෝවිලට දකුණු දිශාවෙන් මීටර් 40 ක් පමණ දුරින් ගඩොල් හා උළු බහුලව ඇති ගොඩැල්ලකි. ඒ මත නව නිවසක් ඉදිකර ඇත. මෙහි ගඩොල් විසිරීම වෘත්තාකාරය. කෝවිලට නිරිත දිශාවෙන් මීටර් 100 ක් පමණ දුරින් වූ ඉඩමක ගල්කණු ආධාරයෙන් ඉදිකරන ලද ගොඩනැගිල්ලකි. මෙම ගොඩනැගිල්ල කුමන කාර්යයකට භාවිත වූ ගොඩනැගිල්ලක් ද යන්න හඳුනාගැනීම අපහසුය. ඒ අවට ගඩොල් හා උළු ද විසිරී ඇත. මෙම ගොඩනැගිල්ල දිගින් මීටර් 11 ක් හා පළලින් මීටර් 7 ක් පමණ ය. දැනට මෙහි සිටුවන ලද ගල්කණු කෙටි 19 ක් වේ.

මෙම ගොඩනැගිල්ලට නිරිත දෙසින් මීටර් 15 ක් පමණ දුරින් කණුපාදම් ගල් දෙකක් දැකිය හැකි ය. මේවා ප්‍රමාණයෙන් සෙ.මී 50 x 45 පමණ වේ. මධ්‍යයේ සිදුර සෙ.මී. 15 x 15 ක් ද ගැඹුර සෙ.මී. 12 ක් ද වේ. මෙම ගොඩනැගිල්ලට මීටර් 50 ක් පමණ දුරින් බටහිර දෙසින් වූ නිවස ඉදිරියේ ගල් කණුවක් දක්නා ලැබේ. එය උසින් සෙ.මී. 170 ක් ද දිග හා පළල සෙ.මී 20 x 30 ක් ද වේ. සමස්තයක් ලෙස ගත්කල කෝවිලත් අයත්ව අක්කර 150 ක පමණ භූමි ප්‍රදේශයක් පුරා ගල් කණු කොටස්, ගඩොල්, උළු හා පැරණි මැටි බඳුන් කොටස් විසිරී තිබේ.

කෝවිලට ඊසාන දෙසින් මීටර් 75 ක් පමණ දුරින් පිහිටි පොකුණකි. මෙය මීටර් 20 ක පමණ විශ්කම්භයකින් පහත් බිමක් ලෙස වර්තමානයේ දර්ශනය වේ. ගම්වාසීන් පවසන අන්දමට මෙම පොකුණ පසින් යටවී ඇති බවත්, මෙයට බැසීමට ශෛලමය පියගැට තිබූ බවත් පවසයි. මෙම ස්ථානය අවට පැරණි මැටි බඳුන් කොටස් විසිරී ඇත. මෙම පහත් බිමේ වර්ෂාව හේතුවෙන් ජලය එක්රැස් වන කොටසේ විශ්කම්භය මීටර් 10 ක් පමණ ද ගැඹුර මීටර් 1.5 ක් පමණ ද වේ. ගල්කණු ගොඩනැගිල්ලට මීටර් 50 ක් පමණ ගිණිකොණ දෙසින් ඇඹරුම් ගලක් ලෙස අනුමාන කළ හැකි නිවැරදිව හඳුනා නොගත් පෞරාණික වස්තුවකි. මෙය දිගින් සෙ.මී 58 ක් හා පළලින් සෙ.මී. 52 ක් පමණ වන අතර මධ්‍යයේ වූ සිදුරේ විෂ්කම්භය සෙ.මී. 25 කි.





















**පාණ්ඩියන්කුලම් එන්. රවිද්‍රන්ගේ ඉඩමේ නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාණ්ඩියන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ පාණ්ඩියන්කුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියට පැමිණ වමට හැරී තුණුක්කායි මාර්ගයේ තුණුක්කායි හන්දියෙන් වමට හැරී ඔඩ්ඩම්කුලම් දෙසට (කළුපාලම පසුකර) ගමන්කර විනයාගපුරම් හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 4.5 ක් ගමන්කළ විට කරුන්පුලියන් වැව පසුකර ඉදිරියට ගමන් කිරීමේ දී මාර්ගයේ වම්පසින් අංක 338 ඉඩමේ මෙම නටබුන් දැකිය හැකි ය.

පුද්ගල සන්තක ඉඩමෙහි එක් අන්තයක මෙම නටබුන් දැකිය හැකි ය. කණුපාදම් ගල් 03 ක් මෙහි දක්නට ලැබෙන අතර, මෙම ඉඩමේ වෙනත් ස්ථානයක තිබී පෙරලා එක්තැනට දමා ඇති බව නිරීක්ෂණය වෙයි. මෙම කණුපාදම් ගල් ප්‍රමාණයෙන් සෙ.මී 50 x 40 x 40 හා 70 x 40 x 40 ක් වන අතර සිදුරේ ප්‍රමාණය සෙ.මී 15 x 15 x 12 ක් පමණ වේ. මෙම ඉඩමේ තැනින් තැන වළං කැබලි දැකිය හැකි අතර, මේ කළු, රතු, කළු හා රතු යන වර්ග 03 ට අයත් වේ. කළු හා රතු මැටි බඳුන් කොටස් හමුවීම අනුව මෙම ස්ථානය ක්‍රිස්තු වර්ෂ 3 වන සියවසට වඩා පැරණි බවට නිගමනය කළ හැකි ය. යබොර ද සුළු වශයෙන් මෙම භූමියෙහි දක්නට ලැබේ.







**සරාටිකුලම් නිලමේහන්ගේ ඉඩමේ නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නට්ටන්කණ්ඩාල් ග්‍රාම නිලධාරි වසමේ සරාටිකුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. වව්නියා - මන්නාරම මාර්ගයේ පුවරසම්කුලම් හන්දියෙන් දකුණට නට්ටන්කණ්ඩාල් හන්දියට පැමිණ වමට හැරී සරාටිකුලම් ගමට යන මාර්ගයේ කිලෝමීටර් 5 ක් පමණ ගමන් කර සරාටිකුලම් ග්‍රාමයේ අංක 26 නිවසට අයත් ඉඩමෙහි මෙය දැකිය හැකි ය.

පෞද්ගලික ඉඩමක දක්නා ලැබෙන මෙය කුමන අවශ්‍යතාවයක් සපුරා ගැනීම සඳහා භාවිත කරන ලද්දක්දැයි හඳුනාගත නො හැකි ය. මෙය පිටතින් ගෙන ආ බව නිවැසියන් පවසන අතර, ගෙනඑන ලද ස්ථානය ඔවුන් නොදනී. මෙම ගලෙහි එක් කොනක අනුරාධපුර අවධියට අයත් ගල්කටු පහර කිහිපයක සිදුරු දැකිය හැකි ය. මෙම ගලෙහි විශ්කම්භය සෙ.මී. 92 ක් පමණද උස සෙ.මී. 45 ක් පමණ ද වේ. සිදුරේ විෂ්කම්භය සෙ.මී. 25 ක් ද ගැඹුර සෙ.මී. 25 ක් ද වේ.



**විනයාගපුරම් නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විනයාගපුරම් ග්‍රාම නිලධාරි වසමේ විනයාගපුරම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියට පැමිණ වමට හැරී තුණුක්කායි මාර්ගයේ තුණුක්කායි හන්දියෙන් වමට හැරී ඔඩ්ඩම්කුලම් දෙසට (කළුපාලම පසුකර) ගමන්කර විනයාගපුරම් හන්දියෙන් දකුණට හැරී කිලෝමීටර් 2 ක් ගමන්කර ගමෙහි අන්තයෙන් වමට පිහිටි මාර්ගයේ මීටර් 100 ක් පමණ ගමන්කර ආපසු වමට හැරී මීටර් 100 ක් ගමන් කර දකුණට හැරී කිලෝමීටර් 1 ක් ගමන් කළ විට මාර්ගයේ වම්පසින් වූ ස්වභාවික ගල්තලාව මත මෙම නටබුන් දැකිය හැකි ය.

ස්වභාවික ගල්තලාව මත උතුරු දිශානුගතව පිහිටා ඇති කණු සිදුරු පේළි දෙකකි. මෙහි සිදුරු 10 ක් දැකිය හැකි අතර, එක් සිදුරක් පමණක් අනෙක් සිදුරුවලට වඩා ප්‍රමාණයෙන් කුඩා ය. සිදුරක දිග, පළල හා ගැඹුර සෙ.මී. 16 x 16 x 9 ක් ප්‍රමාණයෙන් යුක්ත ය. මෙම ගල්තලාව බොහෝ සෙයින් ඛාදනය වී ඇත.

උක්ත ස්ථානයට මීටර් 50 ක් දකුණු දිශාවෙන් මීටර් 10 ක පමණ විශ්කම්භයකින් යුක්ත ගඩොල් ගොඩැල්ලකි. මෙහි මධ්‍යය හාරා ඇත. ඒ අවට ගඩොල් කැබලි විසිරී ඇත. ඒ අසල ම මීටර් 10 ක් පමණ දුරින් ඊසාන දිශාවෙන් සකසන ලද ගලකි. එය පාදෝවනා ගලක් විය හැකි ය. එහි කොටසක් පසින් යටවී ඇත. එය සෙ.මී. 75 ක් දිගින් සෙ.මී. 50 ක පළලින් යුක්ත වන අතර සෙ.මී. 5 ක පමණ ගැඹුරට ගල මතුපිට හාරා ඇත.







**විනයාගපුරම් කුඹුරේ නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුදුකුඩුරිප්පු ග්‍රාම නිලධාරි වසමේ පාණ්ඩියන්කුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත.

ඒ - 9 මාර්ගයේ මාන්කුලම් හන්දියට පැමිණ වමට හැරී තුණුක්කායි මාර්ගයේ තුණුක්කායි හන්දියෙන් වමට හැරි ඔඩ්ඩම්කුලම් දෙසට (කළුපාලම පසුකර) ගමන්කර විනයාගපුරම් හන්දියෙන් දකුණට හැරී ඇළවේලි මාර්ගයේ කිලෝමීටර් 1 ක් ගමන්කර දකුණුපසට ඇති මාර්ගයේ (වෙල මැදින්) කෝවිල පසුකර මීටර් 500 ක් පමණ ගමන් කළ විට කුඹුරු මධ්‍යයේ ඇති ගොඩබිමෙහි මෙම නටබුන් දැකිය හැකි ය.

කුඹුර මධ්‍යයේ දූපතක් ලෙස දර්ශනය වන ස්ථානයකි. මෙම ස්ථානය වගා කිරීම අපහසු බැවින් අතහැර දමා ඇත. එහි පැහැදිලිව හඳුනාගත හැකි ගොඩැල්ලක් හා ගොඩනැගිල්ලකට අයත් කණුපාදම් සහිත ස්ථානයක් වේ.

මෙම ගොඩැල්ල මීටර් 10 ක පමණ විශ්කම්භයකින් හා මීටර් 1 ක පමණ උසකින් යුක්ත වන අතර, තැනින් තැන පැරණි ගඩොල් කොටස් දැකිය හැකි ය.

උක්ත ගොඩැල්ලට ඊසාන දෙසින් මීටර් 10 ක් පමණ දුරින් කණුපාදම් ගල් 04 ක් දැකිය හැකි ය. ඉන් 03 ක පිහිටීමේ වෙනසක් දක්නට නො ලැබෙන අතර, එකක් පමණක් ගලවා ඉවත් කර ඇත. කණුපාදම දිග හා පළල සෙ.මී. 55 x 45 ක් ද සිදුරේ දිග, පළල හා ගැඹුර සෙ.මී. 18 x 18 x 15 ක් වේ. මේ අවට ද ගඩොල් විසිරී ඇත.





**සරාටිකුලම් ප්‍රාග් ඓතිහාසික ස්ථානය**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නට්ටන්කණ්ඩාල් ග්‍රාම නිලධාරි වසමේ සරාටිකුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. වව්නියා - මන්නාරම මාර්ගයේ පුවරසම්කුලම් හන්දියෙන් දකුණට නට්ටන්කණ්ඩාල් හන්දියට පැමිණ වමට හැරී සරාටිකුලම් ගමට යන මාර්ගයේ කිලෝමීටර් 3.5 ක් පමණ ගමන් කර මාර්ගයේ වම් පසින් වූ භූමියේ මෙම සාධක දැකිය හැකි ය.

මෙම ස්ථානයේ ප්‍රාග් ඓතිහාසික සාධක දක්නා ලැබේ. ඒ අතර කහඳ (රතු, කහ, දුඹුරු, සුදු ආදී විවිධ වර්ණ) කැබලි, තිරුවානා වර්ග (Clear quartz, Milky quartz), ක්ෂුද්‍ර ශිලා මෙවලම්, වටකුරු ගල්, ඇඹරුම් ගල් හා ශිලාමෙවලම් තැනීමෙන් පසු ඉවත් වන කොටස් හඳුනා ගන්නා ලදී. මෙම ස්ථානයෙන් ලැබෙන ශිලාමෙවලම් අදින් අවුරුදු 40000-4000 අතර කාලයට අයත් වේ.





**කිඩාපෙඩිත්තකුලම් නටබුන්**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුන්ඩිමුරුප්පු ග්‍රාම නිලධාරි වසමේ කිඩාපෙඩිත්තකුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ මාන්කුලම් හන්දියෙන් වමට හැරි තුණුක්කායි - මල්ලාවී මාර්ගයේ ගමන්කර අම්බල්පුරම් හන්දියෙන් වමට හැරී වව්නිකුලම් වැව් බැම්ම මතින් වව්නිකුලම් - පනන්ගාමම් මාර්ගයේ ගමන්කර කිඩාපෙඩිත්තකුලම් ගමට පැමිණ කිඩාපෙඩිත්තකුලම් වැවට යන මාර්ගයේ මීටර් 500 ක් පමණ ගමන් කර වැවට නිරිත දෙසින් වනය තුළ ස්ථානය දැකිය හැකි ය.

මෙම ස්ථානයේ අනුරාධපුර අවධියට අයත් හිඳි බුද්ධ ප්‍රතිමාවක ශිර්ෂයක්, දෙවුර සහිත පපුව කොටස හා පාද කොටසක් දැකිය හැකි ය. ශිර්ෂයෙහි උස සෙ.මී 33 ක් ද පළල සෙ.මී. 25 ක් ද වේ. හිරිගල් භාවිතයෙන් මෙම ප්‍රතිමාව සකසා ඇති අතර, මෙම ස්ථානයේ තිබුණු පෞරාණික වස්තූන් ගමට ගෙනගොස් ඇත. අවට ගඩොල් කැබලි දක්නා ලැබේ.





**කිඩාපෙඩිත්තකුලම් පැරණි ජනාවාස සාධක**

මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුන්ඩිමුරුප්පු ග්‍රාම නිලධාරි වසමේ කිඩාපෙඩිත්තකුලම් ගමෙහි මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. මල්ලාවී මාර්ගයේ ගමන්කර අම්බල්පුරම් හන්දියෙන් වමට හැරී වව්නිකුලම් වැව් බැම්ම මතින් වව්නිකුලම් - පනන්ගාමම් මාර්ගයේ ගමන්කර කිඩාපෙඩිත්තකුලම් ගමට පැමිණ කිඩාපෙඩිත්තකුලම් වැවට යන මාර්ගයේ මීටර් 100 ක් පමණ ගමන් කර මාර්ගය දෙපස මෙම ස්ථානය දැකිය හැකි ය.

මෙම ස්ථානය මාර්ගයේ දෙපස මීටර් 100 ක පමණ භූමි ප්‍රදේශයක් පුරා පැරණි මැටි බඳුන් කොටස් හා යබොර විසිරී ඇත. මේ අතර රතු මැටි බඳුන් කැබලි බහුලව ද කළු හා රතු බඳුන් කැබලි සුළු ප්‍රමාණයක් ද දැකිය හැකි ය. ඒ අනුව මෙම ස්ථානය ක්‍රිස්තු වර්ෂ 3 සියවසට වඩා පැරණි අවධියකට අයත් විය හැකිය. මැටි බඳුන් කොටස් අතර අතර පාත්තර ගැටි, වෙනත් විශාල ප්‍රමාණයේ මැටි බඳුන් කොටස් හඳුනාගන්නා ලදී.





## වව්නියාව දිස්ත්‍රික්කය

**හූඔය රක්ෂිතයේ නටබුන්**

වව්නියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවරන්තුලාව සි 209 ඊ ග්‍රාම නිලධාරි වසමේ හූඔය, අවරන්තුලාව, යුනිට් 02 යන ස්ථානයෙහි මෙම නටබුන් ස්ථානය පිහිටා ඇත. මැදවච්චිය - මන්නාරම මාර්ගයේ නෙරියකුලම් කුරුස හන්දියෙන් දකුණට හැරී (වව්නියාව උලුක්කුලම මාර්ගය) කි.මී. 10 කණුව අසලින් වමට හැරී බොරලු මාර්ගයේ මීටර් 500 ක් ගමන් කර හමුවන ඇළ අසලින් වමට හැරී කි.මී. 3.5 ක් ගමන්කළ විට හමුවන යුනිට් 02 වෙල්යාය පසුකර හූ ඔයෙන් එතෙර වී නැගෙනහිර දෙසට මීටර් 300 පමණ ගමන් කළ විට මෙම ස්ථානයට ලඟාවිය හැකි ය.

වර්තමානයේ නිදන් සොරුන්ගේ ග්‍රහණයට ලක්ව විනාශ වී දැනට ඉතිරිව ඇති අවශේෂ අනුව ස්වභාවික ගල් කුට්ටි හා රළු ලෙස සැකසූ ගල් කුට්ටි භාවිතයෙන් සකසා තිබූ බැම්මක හෝ කුඩා අමුණක අවශේෂ සහිත ස්ථානයක් ලෙස අනුමාන කළ හැකි ය. ස්ථානයේ වූ ස්වභාවික පිහිටීම උපයෝගී කර තනා ඇති මෙම බැම්මට භාවිත කරන ලද ගල් අතර අනුරාධපුර යුගයට අයත් ගල්කටු පහර ලක්ෂණ සහිත සෙ.මී. 65, 50, 63 ක හා සෙ.මී. 95, 34, 38 ක විශාලත්වයන්ගෙන් යුත් විවිධ ප්‍රමාණයේ ගල් කුට්ටි ඇත. මෙම ස්ථානයට මීටර් 40 ක් පමණ බටහිරින් ගල් කුට්ටියක් මත අනුරාධපුර අවධියට අයත් ගල්කටු පහර ලක්ෂණ සහිත සිදුරු 07 ක් දැකිය හැකි ය.







**මගලමොටෙයි නටබුන්**

වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාරාජීඉළුප්පායි ග්‍රාම නිලධාරි වසමෙහි මගලමොටෙයි ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ - 34 මුලතිව් මාර්ගයේ ඔඩ්ඩුසූඩාන් හන්දියෙන් දකුණුට පිහිටි නැදුන්කේනි මාර්ගයේ කි.මී. 08 ක් ගමන්කර දකුණු දෙසින් පිහිටි මගලමොටෙයි මාර්ගයේ මීටර් 500 ක් ගමන්කර දකුණු දෙසට වූ අඩිපාර දිගේ මීටර් 20 ක් ගමන් කළ විට මෙම ගල් තලාවට ලඟාවිය හැකි ය.

ස්ථානයට ඇතුල් වූ පසු ගල්තලාව මත මඳ දුරක් ගමන් කළ විට කේතුකාවාටයක් දැකිය හැකි ය. මෙය සෙ.මී. 14 විශ්කම්භයකින් හා සෙ.මී. 14 ක ගැඹුරකින් යුක්ත ය. මේ අවට සමාන්‍ය ගල් කන්දක් දැකිය හැකි අතර, එය පසුකර ඉදිරියට මීටර් 20 ක් පමණ ගමන් කළ විට නටබුන් ගොඩැල්ලක් දැකිය හැකි ය. මෙම ගොඩැල්ලේ දිගු පුළුලින් මීටර් 25 x 25 ක වපසරියකින් යුක්තය. ස්ථානය අවට පැරණි ගඩොල්, උළු හා පැරණි මැටි බඳුන් කොටස් දැකිය හැකි ය. ගඩොලක දිග, පළල හා ඝනකම පිළිවෙලින් සෙ.මී 23, 12 හා 5 ක් වේ. මෙම ගොඩැල්ල දකුණු අන්තයේ පෙරළන ලද කණුපාදම් ගල් 05 ක් හා පොළොවේ සිටුවන ලද කණු පාදම් ගලක් දැකිය හැකි ය. මෙම ගොඩැල්ලේ ගිණිකොණ අන්තයේ සිටුවන ලද තවත් කණුපාදම් ගලකි. කණුපාදම් ගලක විශ්කම්භය සෙ.මී 47 ක් පමණ ද කණු සිදුරේ දිග, පළළ හා ගැඹුර පිළිවෙලින් සෙ.මී 17 x 17 හා 17 ක් වේ.





**මන්නර්කුලම් නටබුන්**

වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 225/බී, මන්නර්කුලම් ග්‍රාම නිලධාරි වසමෙහි මන්නර්කුලම් ගමෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මන්නර්කුලම් හන්දියෙන් (කි.මී. 217 කණුව අසල) ගමන් කළ විට මෙම ස්ථානයට ලඟාවිය හැකි ය.

සිටුවන ලද ගල්කණුවලින් යුක්ත ගොඩනැගිල්ලක අවශේෂ මෙම ස්ථානයේ දැකිය හැකි ය. මෙම ගොඩනැගිල්ලේ දිග මීටර් 4.3 ක් හා පළල මීටර් 3.05 ක් පමණ වේ. මෙහි සිටුවන ලද කණු 17 ක් හා පෙරළුණු කණු 01 ක් දැකිය හැකි ය. මේ අවට භූමියේ පැරණි ගඩොල් හා උළු විසිරී ඇති අතර, කලකට පෙර මෙම ස්ථානය හාරා විනාශ කර ඇත. මෙම ස්ථානයේ පෙරළුණු ටැම් ලිපියක් දැකිය හැකි ය. ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස්වලට අයත් මෙහි ඉරි ගසා අකුරු කොටා ඇත.

**පල්ලවිලාන්කුලම් නටබුන්**

වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 225/බී, මන්නර්කුලම් ග්‍රාම නිලධාරි වසමෙහි පල්ලවිලාන්කුලම් ගමෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ මන්නර්කුලම් හන්දියෙන් (කි.මී. 217 කණුව අසල) වමට හැරී කිලෝමීටර් 3.5 ක් පමණ ගමන්කර මන්නර්කුලම් පාසල පසුකර පල්ලවිලාන්කුලම් වැව අසලින් වෑ බැම්ම මතින් මීටර් 500 ක් පමණ ගමන්කර 1 ඇළ අසලින් ඇළ දිගේ දකුණට හැරී මීටර් 100 ක් පමණ ගමන් කර වමට හැරී වනය තුළට මීටර් 50 ක් ගමන් කළ විට මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

සිටුවන ලද ගල්කණුවලින් 07 කින් යුක්ත වූ ගොඩනැගිල්ලක අවශේෂ මෙම ස්ථානයේ දැකිය හැකි ය. මෙම ගොඩනැගිල්ලේ දිග මීටර් 6.2 ක් හා පළල මීටර් 4 ක් පමණ වේ. මේ අතර කැඩී ගිය ගල්කණු කොටස් ද වේ. ගොඩනැගිල්ලේ මධ්‍යයෙන් හාරා ඇති අතර එහි දිග, පළල හා ගැඹුර මීටර් 2, 1.7 හා මීටර් 3 ක් වේ. මේ අවට භූමියේ උළු හා පැරණි මැටි බඳුන් කොටස් බහුලව විසිරී ඇති අතර, දක්නට ලැබෙන සාධක අනුව අනුරාධපුර අවධියට අයත් ගොඩනැගිල්ලක් සේ අනුමාන කළ හැකි ය. ගල් කණු කොටස් අතර පැත්තක් ඔප දමන ලද ආසනයක කොටසක් ද වේ. කළු, රතු, කළු හා රතු යන වර්ගයන් අයත් මැටි බඳුන් කොටස් හඳුනාගත හැකි අතර, යබොර කොටස් ද ඒ අතර විය. කළු හා රතු මැටි බඳුන් කොටස් හමුවීමෙන් පෙනී යන්නේ මෙම ස්ථානය ක්‍රි.ව. 3 සියවසට වඩා පැරණි බවයි.

**නාගතාලි නටබුන්**

වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුන්ජිකුලාම් ග්‍රාම නිලධාරි වසමෙහි නාගතාලි ග්‍රාමයේ මෙම ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ ඕමන්තේ හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 12 ක් පමණ ගමන් කර මුණ්ඩිමුරුප්පු හන්දියට පැමිණ දකුණට වූ කොම්බුඅච්චුකුලම් මාර්ගයේ කිලෝමීටර් 4 ක් පමණ ගමන්කළ විට පාලෙප්පානී ග්‍රාමය හමුවන අතර පාලෙප්පානී ගමෙහි අංක 01 නිවස අසලින් වමට හැරී වනය තුළට (කරත්ත පාර දිගේ) කිලෝමීටර් 8 ක් පමණ ගමන්කර හමුවන තුන්මං හංදියෙන් වමට හැරී මීටර් 100 ක් ගමන් කළ විට මාර්ගය මත හා මාර්ගයේ දකුණු පසින් පිහිටි මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.



මෙම ස්ථානයේ නටබුන් ගොඩැල්ලක් දැකිය හැකි ය. එහි විශ්කම්භය මීටර් 6 ක් ද උස සෙ.මී. 75 ක් ද පමණ වේ. ඉදිකිරීම් කටයුතු සඳහා භාවිත කරනලද විවිධ ප්‍රමාණයෙන් යුක්ත වන ගඩොල් දක්නට ලැබුණු අතර ගඩොලක දිග, පළල හා උස සෙ.මී. 20 x 20 x 7 ක් වේ. මෙය දාගැබ් ගොඩැල්ලක් ලෙස අනුමාන කළ හැකි ය.

**කනගරායන්කුලම් අයියනාර් කෝවිලේ නටබුන්**

වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කනගරායන්කුලම් ග්‍රාම නිලධාරි වසමෙහි කනගරායන්කුලම් ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ - 9 මාර්ගයේ කනගරායන්කුලම් නගරය මධ්‍යයෙන් වමට පිහිටි පාසල් පාර - ආලන්කුලම් මාර්ගයේ මීටර් 300 ගමන්කර කනකරායන්කුලම් වැවේ බැම්ම අසල පිහිටි අයියනාර් කෝවිල් භූමියේ මෙම නටබුන් දැකිය හැකි ය.

මෙම ස්ථානයේ නැගෙනහිරට මුහුණලා පිහිටි සෘජුකෝණාස්‍රාකාර ගොඩනැගිල්ලකි. මෙය පිළිම ගෙයක් විය හැකි ය. ගොඩනැගිල්ලේ දිග මීටර් 7.65 ක් හා පළල මීටර් 5.10 ක් වේ. සිටුවන ලද

ගල් කණු අතර සම්පූර්ණ ප්‍රමාණය යැයි සිතිය හැකි ගල්කණු දෙකක් හා ඉහළ කොටසක් කැඩී ගිය ගල්කණු 10 කි. සම්පූර්ණ උස සහිත ගල්කණුවක උස මීටර් 2.25 ක් වන අතර ඝනකම සෙ.මී. 30 x 25 ක් වේ. ගොඩනැගිල්ලේ දොරටුව දෙපස සිටුවන ලද මුරගල් දෙකකි. මේවා පසින් යටවී ඇති අතර, සුළු කොටසක් දර්ශනය වේ. මේ අවට ප්‍රදේශයේ ගඩොල් හා අනුරාධපුර අවධිය නියෝජනය කරනු ලබන උළු බහුලව දැකිය හැකි අතර, උළුවහු පාදමක (යටලිපතක) කොටසක් හා ගල් කණුවල කැඩීගිය කොටස් ද මේ අතර වේ.



**පෙරියතම්පනේ නටබුන්**

සෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පෙරියතම්පනේ 207 ඒ ග්‍රාම නිලධාරි වසමෙහි පෙරියතම්පනේ ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. වව්නියාව - මන්නාරම මාර්ගයේ පිරමනායන්කුලම් හන්දියෙන් දකුණට හැරී කි.මී. 2 ක් පමණ ගමන් කර මාර්ගයේ වම් පසින් පිහිටි පුල්ලෙයාර් කෝවිල අසල මෙම ජනාවාස සාධක දැකිය හැකි ය.

පෙරියතම්පෙන් වැවට බටහිර දෙසින් (මාර්ගයේ වම්පසින්) මද උස් භූමි ප්‍රදේශයක මීටර් 100 ක පමණ වපසරියක් පුරා පැරණි මැටි බඳුන් කොටස් හා යබොර දැකිය හැකි ය. මේ අතර රක්ත වර්ණ මැටි බඳුන් බහුලව කාල රක්ත වර්ණ මැටි බඳුන් සුළු වශයෙන් ද වේ. ඒ අනුව මෙම ස්ථානය ක්‍රි.ව. 3 සියවසට වඩා පැරණි බවට නිගමනය කළ හැකි ය. මෙම ස්ථානයට පිටුපසින් පුල්ලෙයාර් කෝවිල පිහිටා ඇත. බැකෝ යන්ත්‍ර හා බෝම්බ නිෂ්ක්‍රීය යන්ත්‍ර භාවිතයෙන් මෙම ස්ථානයේ භූමි ස්වභාවය බොහෝ සේ විනාශ වී ඇත.

උක්ත ස්ථානයට මීටර් 50 ක් පමණ බටහිර දෙසින් පිහිටි ඉඩමේ පැරණි ගඩොල් හා උළු දක්නට ඇත. මෙම ස්ථානයේ මෑතක දී ගොවිතැන් කටයුතු සඳහා සිදුකරන ලද ක්‍රියාකාරකම් හේතුවෙන් පෞරාණික ගොඩනැගිලි නටබුන් හඳුනාගත නො හැකි අයුරින් විනාශ වී ඇත. නමුත් විශාල ප්‍රදේශයක් පුරා පැරණි ගඩොල් හා පැරණි උළු කොටස් විසිරි ඇත.





**පුලියාඩිමුරුප්පු නටබුන්**

සෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පෙරියතම්පනේ 207 ඒ ග්‍රාම නිලධාරි වසමෙහි පුලියාඩිමුරුප්පු ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. වව්නියාව - මන්නාරම මාර්ගයේ පිරමනායන්කුලම් හන්දියෙන් දකුණට හැරී ගමන් කර පෙරියතම්පනේ ගමෙන් දකුණට පිහිටි පුලියාඩිමුරුප්පු මාර්ගයේ කි.මී. 8 ක් පමණ ගමන්කළවිට මාර්ගයේ වම් පසින් පිහිටි මෙම ස්ථානය දැකිය හැකි ය.

බෝම්බ නිශ්ක්‍රිය කිරීමේ දී බැකෝ යන්ත්‍ර උපයෝගි කර ස්ථානය මුලුමනින්ම විනාශ කර ඇත. මෙම ස්ථානයේ ගඩොල් භාවිතයෙන් කරන ලද යම් ඉදිකිරීමක අවශේෂ දැකිය හැකි අතර, ස්ථානය ඇසින් දුටුවෙක් ප්‍රකාශ කරන ලද්දේ මෙම ස්ථානයේ ගඩොලින් තනන ලද චතුරස්‍රාකාර වලක් තිබූ අතර බැකෝ යන්ත්‍ර මගින් එම ස්ථානය පසින් වසා දැමූ බවයි. ඉතිරිව ඇති පැරණි ගඩොල් අතර වර්ග 2 කට අයත් ගඩොල් දැකිය හැකි ය.





**තම්පනේ කුරුසකෝවිල් නටබුන්**

සෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පෙරියතම්පනේ ග්‍රාම නිලධාරි වසමෙහි තම්පනේ කුරුසකෝවිල් ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. වව්නියාව - මන්නාරම මාර්ගයේ පිරමනායන්කුලම් හන්දියෙන් දකුණට හැරී කි.මී. 4 ක් ගමන් කර පෙරියතම්පනේ ගම්මානයට යන මාර්ගයේ වම්පසින් පිහිටි කුඹුරු ඉඩම් මධ්‍යයෙන් මීටර් 500 ක් ගමන් කළ විට මෙම ස්ථානය ලඟාවිය හැකි ය.

මෙම ස්ථානයේ අනුරාධපුර අවධියට අයත් බවට විශ්වාස කළ හැකි පැරණි ගොඩනැගිල්ලකට අයත් නටබුන් ලෙස සිටුවන ලද ගල්කණු 03 ක් හඳුනාගත හැකි ය. මෙම ස්ථානයේ පෙරළුණු ගල් කණු කොටස් ද වේ. බැකෝ යන්ත්‍ර මගින් ස්ථානය හාරා විනාශ කර ඇත.

උක්ත ගොඩනැගිල්ලට උතුරු දිශාවෙන් මීටර් 12 ක් පමණ දුරින් ගල් පුවරුවක් ද මැතක දී තනන ලද ලිඳක් ද හා ඒ ආසන්නයෙන් ම වම්පසින් වූ මීටර් 1.5 ක් පමණ දිගින් යුක්ත ගල්කණු කොටසක් ද වේ. මෙම ගල් පුවරුව දිගු පුළුළින් සෙ.මී 130 x 85 ප්‍රමාණයේ වේ. භූමිය අවට ප්‍රදේශයේ පැරණි ගඩොල්, උළු හා මැටි බඳුන් කොටස් බහුලව විසිරී ඇත.






**පම්පෙමඩු නටබුන්**

වව්නියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පම්පෙමඩු 218 ඒ ග්‍රාම නිලධාරි වසමෙහි පම්පෙමඩු ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. වව්නියාව - මන්නාරම මාර්ගයේ කි.මී. 9 කණුව අසලින් දකුණට හැරී පම්පෙමඩු මාර්ගයේ කි.මී. 2 ක් ගමන්කළවිට හමුවන මාර්ගයේ දකුණු පසින් මෙම ස්ථානය දැකිය හැකි ය.

මෙම ස්ථානයේ සිටුවන ලද ගල් කණු 20 කින් යුත් ගොඩනැගිල්ලක නටබුන් සහ හිඳි බුද්ධ ප්‍රතිමාවක කොටස් 2 ක් දැකගත හැකි ය. මෙහි දක්නට ලැබෙන ගල් කණුවක ප්‍රමාණය සෙ.මී. 23 x 23 හා උස සෙ.මී. 58 ක් ද වේ. කණු සියල්ල සම උසක් දරයි. ගොඩනැගිල්ලේ දිග හා පළල මී. 3.45 x 4.65 ක් පමණ වන අතර ගල්කණු පෙළකට 3, 4 හා 5 ක් ලෙස අක්‍රමවත් පිහිටීමක් පෙන්වයි. සමාධි ඉරියව්ව දක්වන බුද්ධ ප්‍රතිමාව ඉන ආසන්නයෙන් දෙකට කැඩී ඇති අතර ඉනෙන් ඉහළ කොටස සෙ.මී 35 ක් උසින් හා දෙවුර අතර පළල සෙ.මී. 34 ක් වේ. ඉණෙන් පහළ කොටස සෙ.මී. 42 ක උසින් හා දෙදන අතර පළල සෙ.මී. 69 ක් වේ. දක්නට ලැබෙන සාධක අනුව මෙම ස්ථානය අනුරාධපුර අවධියට අයත් ස්ථානයක් ලෙස හඳුනාගත හැකි ය. වර්තමානයේ මෙම ස්ථානයේ හින්දු භක්තිකයන් විසින් වන්දනා කටයුතු සිදුකරයි.




**පෙරියකට්ටු නටබුන්**

වව්නියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පම්පෙමඩු 218 ඒ ග්‍රාම නිලධාරි වසමෙහි පම්පෙමඩු ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. වව්නියාව - මන්නාරම මාර්ගයේ කි.මී. 9 කණුව අසලින් දකුණට හැරී (පම්පෙමඩු හන්දිය) කි.මී. 3 ක් ගමන්කළවිට හමුවන මාර්ගයේ වම් පසින් පෙරියකට්ටු පුල්ලෙයාර් කෝවිල් භූමියෙහි සහ අවට ඉඩම්වල මෙම ස්ථානය දැකිය හැකි ය.

මෙම ස්ථානයේ දාගැබ් ගොඩැල්ලක් ලෙස හඳුනාගත හැකි ස්ථානයක් වේ. මෙම ප්‍රදේශයේ සාමාන්‍යයෙන් දක්නට ලැබෙන දාගැබ්වලට වඩා ප්‍රමාණයෙන් තරමක් විශාලවූ මෙහි විශ්කම්භය මීටර් 20 ක් පමණ ද උස මීටර් 1 ක් පමණ ද වේ. දාගැබ් ගොඩැල්ලේ උතුරු අන්තයෙන් මලුවට වතුර බැසීමට සකසන ලද ශෛලමය ජල පිහිල්ලක් දැකිය හැකි ය.

උක්ත ස්ථානයට නැගෙනහිර දෙසින් වූ ඉඩමෙහි ගල්කණු හා ගඩොල් කොටස් බහුලව විසිරී ඇත. මෙම ස්ථානයේ වර්තමානයේ නිවසක් ඉදිකර ඇති අතර, වගා කටයුතු කිරීම සඳහා අවට පරිසරය හෙළිකර යන්ත්‍ර භාවිතයෙන් ඉඩම සකස් කර තිබෙන බැවින් ස්ථානයට බලවත් ලෙස හානී වී, නටබුන් ගොඩනැගිලි හඳුනාගත නො හැකි ලෙස විකෘති වී ඇති බව පෙනේ.

දාගැබ් ගොඩැල්ලට උතුරින් වූ ඉඩමේ හා ඊට උතුරින් වූ කෝවිල දක්වා මීටර් 100 ක පමණ ප්‍රදේශයක් පුරා නටබුන් විසිරී ඇත. මෙම ස්ථානය අවට ප්‍රදේශයේ පැරණි මැටි බඳුන් කොටස් විසිරි ඇත.

දාගැබ් ගොඩැල්ලට උතුරින් ආසන්නයේම පිහිටි ඉඩමේ පිළිම පාදමක් හා ශෛලමය ජල පීල්ලක්, ගඩොල්, ගල් කණු කොටස් දැකිය හැකි ය. මෙම පිළිම පාදමේ විශ්කම්භය සෙ.මී. 85 ක් ද ඝනකම සෙ.මී. 15 ක් ද වන අතර පිළිමය සවිකිරීමට සැකසූ සිදුරේ පළල සෙ.මී. 35 ක් ද වේ. ජල පීල්ල දිගින් සෙ.මී. 85 ක් ද පළල සෙ.මී. 42 ක් ද වන අතර ජලය ගලා යාමට සැකසූ කාණුවේ දිග හා පළල සෙ.මී 85 හා සෙ.මී. 20 ක් වේ.

මෙම දාගැබට උතුරින් හා නැගෙනහිරින් වූ ඉඩම්වල නටබුන් විසිරී ඇති, අතර මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එම නටබුන් ගොඩනැගිලි හඳුනාගත නො හැකි ය. මෙම ස්ථානයන්හි විවිධ ප්‍රමාණයේ ගඩොල් දක්නට ලැබෙන අතර, ගඩොලක සාමාන්‍ය ප්‍රමාණය සෙ.මී. 29 x 20 x 5 ක් වේ.

උතුරින් පිහිටි ඉඩම හා කෝවිල් ඉඩම වෙන්වන මාර්ගයකි. එම මාර්ගයේ පොළොවෙහි සිටුවන ලද හඳුනා නොගත් ගලින් කරනලද නිර්මාණයකි. එහි මධ්‍යයෙහි වෘත්තාකාර කැපුමක් හා එහි මධ්‍යයේ සිදුරක් සහිතය. මෙය කුමන කාර්යයක් සඳහා භාවිත වූයේය යන්න පැහැදිලි නොමැති මුත්, මෙහි විශ්කම්භය සෙ.මී. 100 ක් ද මධ්‍යයෙහි වූ විශාල කැපුමේ විශ්කම්භය සෙ.මී. 75 ක් ද මධ්‍යයේ කුඩා සිදුරෙහි විශ්කම්භය සෙ.මී. 25 ක් ද වේ.

කෝවිල් භූමියේ සිටුවා ඇති ගල්කණු තුනකි. මෙම ගල්කණු රළු ලෙස සකසා ඇත. මේ අවට භූමියේ යටලිපතක්, සිරිපතුලක් ලෙස අනුමාන කළ හැකි ගල් පුවරුවක්, කණුපාදම් ගල්, ජල පීල්ලක් හා ගඩොල් කොටස් දැකිය හැකි ය. මෙහි ගල්කණු සහිත ගොඩනැගිල්ල කුමක්ද යන්න හඳුනාගැනීම අපහසුය. යටලිපතෙහි දිග සෙ.මී. 212 ක් ද පළල සෙ.මී. 90 ක් ද වේ. මෙහි එක් අන්තයක චතුරස්‍රාකාර සිදුරු 2 ක් බැගින් දෙපසෙහි සිදුරු 4 කි. සිරිපතුලක් ලෙස අනුමාන කරන ගල් පුවරුවේ දිග සෙ.මී. 84 ක් ද පළල සෙ.මී 77 ක් ද වේ. අලුතින් ඉදිකරන ලද මෙහි වූ කෝවිලේ පියගැට සඳහා ගල්කණුවක් භාවිත කර ඇත.








**කොම්පාවිත්තිකුලම් නටබුන්**

වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පෙරියමඩු ග්‍රාම නිලධාරි වසමෙහි කොම්පාවිත්තිකුලම් ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ ඕමන්තේ හන්දිය පසුකර කි.මී. 2.5 ක් පමණ ගමන්කර කොම්පාවිත්තිකුලම් වැවට ගමන් කරන මාර්ගයේ වැව අසලට ගොස් වැව් බැම්මට බටහිරින් වනය තුළට මීටර් 100 ක් ගමන්කළ විට මෙම ස්ථානය දැකිය හැකි ය.

මෙම ස්ථානයේ පිළිම ගෙයක් ලෙස හඳුනාගත හැකි ගොඩනැගිල්ලක සාධක දක්නා ලැබේ. මේ අවට වන සාධක ලෙස සිටුවන ලද ගල් කණු, පිළිමයක පාදමක් හා වෘත්තාකාර සිදුරක් සහිත ගල්පුවරුවකි. මෙයට අමතරව මේ අවට බහුල ලෙස පැරණි ගඩොල් හා අනුරාධපුර අවධියට දින නියම කරනු ලබනු උළු බහුලව දැකිය හැකි ය.



මෙම ස්ථානයට මීටර් 10 ක් පමණ උතුරින් තවත් ගොඩනැගිල්ලකට අයත් සිටුවන ලද ගල්කණුවක්, පෙරළුණු ගල් කණුවක් හා කණුපාදම් ගල් 04 ක් දැකිය හැකි ය. මේ අවට පැරණි ගඩොල් විසිරී ඇත. මෙම නටබුන් සහිත ස්ථානය විශාල කටු පඳුරු සහිත බැවින් ළඟාවීමට අපහසුය.

**පාලමොට්ටෙයි නටබුන් දාගැබ (කිලෙව්කුලම්)**

වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාලමොට්ටෙයි 219 ඒ ග්‍රාම නිලධාරි වසමෙහි කිලෙව්කුලම් ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ ඕමන්තේ හන්දිය පසුකර කි.මී. 2.5 ක් පමණ ගමන්කර මාර්ගයේ වම්පසින් පිහිටි නච්චි මර්ගයේ කි.මී. 6 ක් පමණ ගමන්කළ විට හමුවන කිලෙව්කුලම් මාර්ගයේ මීටර් 500 ක් පමණ ගොස් වනය තුළට (දකුණුපසට) කි.මී. 2 ක් පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟාවිය හැකි ය.

මෙම ස්ථානයේ දාගැබක අවශේෂ හඳුනාගත හැකි විය. මෙහි විශ්කම්භය මීටර් 15 ක් පමණ ද උස මීටර් 2 ක් ද වන අතර, මෙහි මධ්‍යයෙහි මීටර් 3 ක පමණ විශ්කම්භය සහිතව මීටර් 2.5 ක් ගැඹුරට නිදන් සොරුන් විසින් හාරා ඇත. හාරන ලද වලෙහි ගඩොල් වරි 15 ක් පමණ හඳුනාගත හැකි විය. ගඩොල් ප්‍රමාණ කිහිපයක් භාවිත කර තනන ලද බව පෙනේ. මෙහි මෝල්ඩින් ගඩොල් දැකිය හැකි ය. ගඩොලක දිග, පළල හා උස සෙ.මී. 20 x 20 x 5 ක් වේ. දාගැබ් ගොඩැල්ලට මීටර් 10 ක් පමණ දුරින් ඊසාන දිශාවෙන් සිටුවා ඇති ගල් කණුවකි. මෙහි දිග, පළල හා පොළොව මට්ටමේ සිට උස සෙ.මී. 20 x 27 x 30 ක් වේ.

දාගැබ් ගොඩැල්ලට මීටර් 50 ක් පමණ දුරින් නැගෙනහිර දිශාවෙන් මඳ උස් භූමියේ සිටුවා ඇති කණු පාදම් ගලක් දැකිය හැකි ය. එහි මධ්‍යයේ සිදුර දිග, පළල හා ගැඹුර සෙ.මී. 13 x 17 x 9 ක් වේ. මෙයට මීටර් 20 ක් පමණ දකුණින් සිටුවා ඇති ගල් කණුවකි. එය පොළව මට්ටමේ සිට සෙ.මී. 30 ක් පමණ උසින් වේ. දාගැබ් ගොඩැල්ලට මීටර් 50 ක් පමණ දුරින් නිරිත දිශාවෙන් සිටුවන ලද කණුවක් ද වේ.

**කිලෙවිකුලම් නටබුන්**

වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාලමොට්ටෙයි 219 ඒ ග්‍රාම නිලධාරි වසමෙහි කිලෙවිකුලම් ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ ඕමන්තේ හන්දිය පසුකර කි.මී. 2.5 ක් පමණ ගමන්කර මාර්ගයේ වම්පසින් පිහිටි නච්චි මාර්ගයේ කි.මී. 6 ක් පමණ ගමන්කළ විට මාර්ගයේ වම්පසින් (මාර්ගය මුහුණලා) හමුවන නාග කෝවිල ඉදිකර ඇති ඉඩම තුළ වූ මෙම ස්ථානය දැකිය හැකි ය.

මෙම ස්ථානයේ වර්තමානයේ දී කෝවිලක් ඉදිකර ඇත. මෙම ස්ථානයේ වූ පැරණි ගල්කණු සහිත ගොඩනැගිල්ල මුලුමනින්ම ඩෝසර් කර ඇත. කෝවිල තැනීම සඳහා මෙම ගල්කණු භාවිත කර ඇත. රළු ලෙස සකසන ලද ගල්කණුවක ප්‍රමාණය දිග, පළල හා උස සෙ.මී. 30 x 29 x 130 ක් වේ. ගල් කණු 08 ක් පමණ පෙරළා ඇති අතර, ඒ අවට භූමියේ ගඩොල්, පැරණි උළු හා පැරණි මැටි බඳුන් කොටස් විසිරි ඇත. අනුරාධපුර අවධියට අයත් ගොඩනැගිලි සාධක මෙහි වන බව හඳුනාගත හැකි ය.





**පරනාට්ටකල් පුල්ලෙයාර් කෝවිලේ නටබුන්**


වව්නියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මරදමඩු 216 ඒ ග්‍රාම නිලධාරි වසමෙහි පරනාට්ටකල් ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ පරනාට්ටකල් හන්දියෙන් වමට හැරී කි.මී. 2 ක් පමණ ගමන්කළවිට පරනාට්ටකල් රජයේ දෙමළ විද්‍යාලය හමුවේ. එම විද්‍යාලයට ඉදිරිපසින් පිහිටි මාර්ගයේ වම්පසින් මෙම කෝවිල පිහිටා ඇත.

මෙම ස්ථානයේ වර්තමානයේ කෝවිලක් ඉදිකර ඇත. ඒ සඳහා මෙම ස්ථානයේ වූ පැරණි ගල්කණු උපයෝගිකර ඒවාට සම්බන්ධ කර මෙම කෝවිල ඉදිකර ඇති බව පෙනේ. මේ හේතුවෙන් මුලින් තිබූ ගොඩනැගිල්ල වෙනස් කරන්නට ඇතැයි සිතිය හැකි ය. කෝවිල දෙපසින් ශෛලමය උළුවහු කඳන් 03 ක් සිටුවා ඇත. මෙම උළුවහු කඳන් මෝල්ඩින් ලෙස සකසා තිබේ. මෙම කෝවිලට ඇතුලුවන ස්ථානය සඳහා මෝල්ඩින් කරන ලද ශෛලමය පුවරුවක් තබා ඇත. මෙය දිගින් සෙ.මී. 80 ක් පළලින් සෙ.මී. 36 ක් වේ. මෙම කෝවිල් ඉඩම තුළ පැරණි මැටි බඳුන් කොටස් බහුලව විසිරි ඇත. දේවාලයට මීටර් 100 ක් පමණ දුරින් ඊසාන දෙසින් (මාර්ගය අසල) සියඹලාගස යට සිටුවන ලද ගල් කණුවක් වේ.

කෝවිල උතුරෙන් (ඉදිරියෙන්) වූ පරනාට්ටකල් රජයේ දෙමළ විද්‍යාල ඉඩම තුළ පැරණි මැටි බඳුන් කොටස් බහුලව විසිරී ඇත. මෙම මැටි බඳුන් කොටස් අතර කළු සහ රක්ත මැටි බඳුන් කොටස්, රක්ත මැටි බඳුන් කොටස් හා කළු මැටි බඳුන් කොටස් දැකගත හැකිවිය. ඒ අනුව මෙම ස්ථානය ක්‍රි.ව. 3 සියවසට වඩා පැරණි බව සිතිය හැකි ය. මේ ආසන්නයෙන්ම විශාල ගල් තලාවකි (පාසලට යාබද ඉඩම). එම ස්ථානයේ අනුරාධපුර අවධියේ කටුපහර ලක්ෂණ සහිත ගල්කොරියක් දැකිය හැකි ය. ඊට උතුරින් ඒ අසලම සෙ.මී. 16 ක විෂ්කම්භයෙන් සහ සෙ.මී. 14 ක ගැඹුරින් යුත් කේතුකාවාට 8 ක් වේ. මෙම ස්ථානවලට ආසන්නව ගල්තලාව මත ස්වභාවිකව ජලය රැස්වන ගල්කෙමක් වන අතර, එහි විශ්කම්භය මීටර් 25 ක් පමණ වේ.







**පරනාට්ටකල් ධනපාලන් ජනනීගේ මියගේ ඉඩමේ නටබුන්**

වව්නියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මරදමඩු 216 ඒ ග්‍රාම නිලධාරි වසමෙහි පරනාට්ටකල් ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ පරනාට්ටකල් හන්දියෙන් වමට හැරී කි.මී. 1.8 ක් පරනාට්ටකල් ගමට යන මාර්ගයේ මීටර් 200 ක් පමණ ගමන්කළවිට මාර්ගයේ වම්පසින් වූ ධනපාලන් ජනනීගේ (216 ඒ, පරන්නාට්ටකල්, මරදමඩු) ඉඩමෙහි මෙම ස්ථානය පිහිටා ඇත.

පුද්ගලික ඉඩමක ළිඳක් හැරීමේ දී බහුල ලෙස පැරණි බඳුන් (කුඩා කළ) කොටස් හමුවී ඇත. ඒ අසලින් ගල්කණු කොටසක් ද හමුවී ඇත. මෙම ස්ථානයෙන් හමුවූ මැටි බඳුන් කොටස් ඕමන්ත පොලීසිය වෙත ගෙන ගොස් ඇත. මෙම මැටි බඳුන් අඩි 15 ක සිට ගැඹුරට යන කලාපයෙන් හමුවූ බව නිවැසියන් පවසයි.







**නච්චි මහාදේවන් මහතාගේ ඉඩමේ නටබුන්**

වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාලමොටයි ග්‍රාම නිලධාරි වසමෙහි නච්ච ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ ඕමන්තේ හන්දිය පසුකර කි.මී. 2.5 ක් පමණ ගමන්කර විට හමුවන නච්චි මාර්ගයේ නච්චි දෙමළ විද්‍යාලය පසුකර මීටර් 50 ක් පමණ ගමන්කළවිට මාර්ගයේ දකුණු පසින් වූ මහාදේවන් මහතාගේ ඉඩමෙහි මෙම නටබුන් දැකගත හැකි ය.

පුද්ගලික ඉඩමක පැරණි ගඩොල් බහුලව විසිරී ඇත. මෙම ස්ථානය බැකෝ යන්ත්‍ර මගින් වගා කිරීමට සකසා ඇති බව පෙනේ. ඉඩමේ එක් අන්තයක කණුපාදම් ගලක් හා ගල් කණු කොටස් කිහිපයක් දක්නට ඇති අතර, පැරණි ගඩොල්, උළු, පැරණි මැටි බඳුන් කොටස් ඉඩම පුරාම දැකගත හැකි ය. මෙම ස්ථානයේ වූ සිරිපතුල් ගලක් ඒ අසල පිහිටි ඉඩමකට ගෙනගොස් ඇත. බොහෝ සෙයින් ගෙවී ගොස් ඇති එය දිගින් සෙ.මී. 65 ක් හා පළලින් සෙ.මී 79 ක් වේ. සිරිපතුලක ප්‍රමාණය දිග සෙ.මී. 60 ක් හා පළල සෙ.මී. 35 ක් පමණ වේ. මෙම නටබුන් අනුරාධපුර අවධියට අයත් ඒවා බව හඳුනාගත හැකි ය. ඊට යාබද ඉඩමෙහි ඇඹරුම් ගලක් හෝ කණුපාදම් ගලක් යැයි අනුමාන කළ හැකි ගලක් දැකිය හැකි ය. මෙය සෙ.මී. 55 ක් උසින් හා සෙ.මී. 80 ක විශ්කම්භයෙන් යුක්ත වේ. මෙහි මධ්‍ය වූ කුඩා සිදුරේ විශ්කම්භය සෙ.මී. 25 ක් ද ගැඹුර සෙ.මී. 25 ක් ද වේ.







**නච්චි කැළයේ නටබුන්**

වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාලමොටයි ග්‍රාම නිලධාරි වසමෙහි නච්ච ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ ඕමන්තේ හන්දිය පසුකර කි.මී. 2.5 ක් පමණ ගමන්කර විට හමුවන නච්චි මාර්ගයේ නච්චි ගම්මානයට පැමිණ වී අලෙවි මණ්ඩලය පසුකර මීටර් 20 ක් පමණ ඉදිරියට ගොස් වමට හැරී අඩිපාර මතින් වනය තුළට කි.මී. 2 ක් පමණ ගමන්කළවිට වනයේ දකුණු පසින් මෙම නටබුන් දැකගත හැකි ය.

වනය මැද්දේ පිහිටා ඇති මෙම ස්ථානයේ සිටුවන ලද ගල්කණු 09 කි. මෙහි වූ එක සමාන උසක් පෙන්වන රළුවට සකසන ලද ගල් කණුවක උස පොළව මට්ටමේ සිට සෙ.මී. 30 ක් පමණ වේ. විවිධ ප්‍රමාණයේ කණු මේ අතර දක්නට ලැබෙන අතර කණුවක සාමාන්‍ය ප්‍රමාණය සෙ.මී. 35 x 37 ක් පමණ වේ. අනුරාධපුර අවධියට අයත් ඉදිකිරීමක් ලෙස විශ්වාස කළ හැකි ය.



**ඌරාකුලම් අලගු තිරුබාගරන්ගේ ඉඩමේ නටබුන්**

වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාලමොටයි ග්‍රාම නිලධාරි වසමෙහි ඌරාකුලම් ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ ඕමන්තේ හන්දිය පසුකර ඉදිරියට ගමන් කළ විට හමුවන නච්චි මාර්ගයේ (වම් පසට) ඌරාකුලම් ගම්මානයට පැමිණි විට මාර්ගයෙහි දකුණු පසින් වූ අලගු තිරුබාගරන්ගේ මහතාගේ ඉඩමෙහි මෙම නටබුන් දැකගත හැකි ය.

ඌරාකුලම් වැව බැම්මට බටහිරින් මීටර් 50 ක් පමණ දුරින් පිහිටි ගලවා දමන ලද ගල් කණු දෙකක් වේ. රළු ලෙස සකසනලද මේවායෙහි ඕවලාකාර ගල් කටු සිදුරු දක්නට ලැබේ. ගල් කණු දෙකෙහි ප්‍රමාණය පිළිවෙලින් සෙ.මී. 200 x 22 x 20 ක් හා 115 x 20 x 24 ක් වෙයි. මේ අසල පවතින ළිඳ වසර 100 ක් පමණ පැරණි වන අතර එය ඉංජිනේරු ගඩොල් භාවිතයෙන් ඉදිකරන ලද්දකි.





**පාලමොට්ටෙයි නටබුන්**

වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාලමොටයි ග්‍රාම නිලධාරි වසමෙහි පිහිටා ඇත.

මෙම ස්ථානයේ අනුරාධපුර යුගයට අයත්යැයි විශ්වාස කළ හැකි සිටුවන ගල්කණු සහිත ගොඩනැගිල්ලක සාධක දැකිය හැකි ය. ගල්කණු කැඩී ගිය කොටස් සිටුවන ලද කණු අසලම පෙරලී ඇත. සිටුවා ඇති රළු ලෙස සැකසූ ගල් කණුවක් පොළොව මට්ටමේ සිට උස මීටර් 170 ක් ද ප්‍රමාණය සෙ.මී 35 x 20 ක් පමණ වේ. ගොඩනැගිල්ලට ඇතුල්වීමේ දොරටුව ලෙස හඳුනාගත හැකි සඳකඩ පහණ, මුරගලක කොටසක් හා පියගැට, ගොඩනැගිල්ලේ නැගෙනහිර පසින් දැකගත හැකි ය. ගොඩනැගිල්ල කුමක්ද යන්න හඳුනාගත නො හැකි මෙහි ගඩොල් කොටස් ගොඩනැගිල්ල අවට විසිරී ඇත. මෙම ස්ථානයට මීටර් 30 ක් පමණ බටහිරින් තවත් සිටුවන ලද ගල් කණු දෙකක් දැකගත හැකි ය. මෙම ස්ථානයට අවට ප්‍රදේශයේ භූමියේ බිම් බෝම්බ ඉවත් කිරීම සිදුකර අවසන්ව නොතිබූ බැවින් අවට ප්‍රදේශය නිරීක්ෂණය සිදු නොකරන ලදී.

උක්ත ස්ථානය ගමන්කරන මාර්ගයේ පිහිටි ඉඩමක ඉලිප්සාකාර සිදුරක් සහිත ගලක් දැකගත හැකි ය. මෙහි උපයෝගීතාව හඳුනාගත නො හැකි අතර, මෙය ද උක්ත ස්ථානයෙන් ගෙන ආ බව ප්‍රදේශවාසීන් පවසයි.  මෙම ගලෙහි ප්‍රමාණය සෙ.මී. 110 x 75 ක් ද ඇතුළත වූ කැපුමේ ප්‍රමාණය සෙ.මී. 72 x 60 ක් ද මධ්‍ය සිදුරේ විශ්කම්භය සෙ.මී. 27 ක් ද ගැඹුර සෙ.මී. 27 ක් ද වේ.



**කොන්දක්කාරකුලම් නටබුන්**

වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මරදමඩු ග්‍රාම නිලධාරි වසමෙහි කොන්දකාරකුලම් ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ ඕමන්තේ හන්දිය පසුකර කි.මී. 2.5 ක් පමණ ගමන්කර විට හමුවන නව්වි මාර්ගයේ කි.මී. 3.5 ක් පමණ ගමන් කර කොන්දකාරකුලම් හන්දියෙන් වමට හැරී කි.මී. 1.5 ක් පමණ ගමන් කළවිට මාර්ගයේ දකුණු පසින් පිහිටි මෙම ස්ථානය දැකගත හැකි ය.

මෙම ස්ථානයේ සිටුවන ලද ගල්කණු 18 කින් යුත් නටබුන් වූ ගොඩනැගිල්ලකි. කණුවල පිහිටීම අනුව ගොඩනැගිල්ල කුමක්ද යන්න වාස්තුවිද්‍යාත්මකව හඳුනා ගැනීම අපහසු ය. මෙහි සියලුම කණු පොළොව මට්ටමේ සිට සෙ.මී. 50 කට ආසන්න උසකින් යුක්තවන අතර, කණු කැඩීම හේතුවෙන් ඉතිරි වූ කොටස් ලෙස පොළොවෙන් මතුපිට ඉතිරිව ඇති කොටස් ලෙස ඒවා දර්ශනය වේ. අනුරාධපුර අවධියට අයත් ගල්කටු ලක්ෂණ සහිත මෙම කණුවලින් ආවරණය වන ගොඩනැගිල්ලේ දිග මීටර් 4.75 ක් ද පළල මීටර් 3.45 ක් පමණ වේ. කණුවක සාමාන්‍ය ප්‍රමාණය සෙ.මී. 28 x 25 ක් පමණ වේ.



**පෙරියමඩු මුත්තුමාරි අම්බාල් කෝවිල් නටබුන්**

වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එන්ට්‍රික්කෙයිදකුලම් අංක 220 සී ග්‍රාම නිලධාරි වසමෙහි පෙරියමඩු ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. ඒ 9 මාර්ගයේ ඕමන්තේ හන්දිය පසුකර පනික්කනීරාවී හන්දියෙන් වමට හැරී කි.මී. 3 ක් පමණ ගමන්කර විට මාර්ගය අවසානයේ මෙම කෝවිල පිහිටා ඇත.

මෙම කෝවිල් භූමියේ එක් අන්තයක සිරිපතුල් ගලක් තබා ඇති අතර, ප්‍රදේශවාසීන් පවසන්නේ අතීතයේ පටන් ම මෙම ස්ථානයේ සිරිපතුල් ගල තිබූ බවයි. මෙය ප්‍රමාණයෙන් සෙ.මී. 80 x 77 ක් වේ. සිරිපතුලක දිග හා පළල සෙ.මී. 70 x 32 ක් වේ.

කෝවිලට මීටර් 500 පමණ මෙපිටින් මාර්ගයේ දකුණු පසින් සිටුවන ලද රළු ලෙස සැකසූ ගල්කණුවක් හා කැඩී ගිය කොටස් 2 ක් දැකගත හැකි ය. කැඩීගිය එක් කොටසක උස, දිග හා පළල සෙ.මී. 91 x 33 x 19 ක් ද වේ.





**කුරිසුඩ්ඩකුලම් නටබුන්**

වව්නියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්නට්ට අංක 86 /207 සී ග්‍රාම නිලධාරි වසමෙහි කුරිසුඩ්ඩකුලම් ග්‍රාමයෙහි මෙම ස්ථානය පිහිටා ඇත. වව්නියාව - මන්නාරම ගමන්කර ගනේෂම්පුර ගමෙහි ප්‍රජා ශාලාව අසලින් දකුණට හැරී කි.මී. 2.5 ක් පමණ ගමන්කළ විට කුරුසුඩ්ඩකුලම් ගම්මානයේ අන්තයට පැමිණ හමුවන මාර්ගයෙන් දකුණට හැරී කි.මී. 1.5 ක් පමණ වනය තුළට ගමන් කළ විට මෙම ස්ථානය හමුවේ.

මෙම ස්ථානයේ විශාල භූමියක් පුරා කණුපාදම් ගල්, ගල්කණු කොටස් හා පැරණි ගඩොල් විසිරි ඇත. දක්නට ලැබෙන සාධක අනුව විශාල ගොඩනැගිල්ලක හෝ ගොඩනැගිලි සංකීර්ණයකට අයත් සාධක ලෙස මෙම නටබුන් හැඳින්විය හැකි ය. භූමියේ ස්ථාන කිහිපයකින් ම හාරා ඇති අතර, එම ස්ථානවලින් ගඩොල් බහුලව හමුවේ. කණුපාදම් ගල් කිහිපයක් ම දක්නට ලැබෙන අතර, එයින් වැඩි කොටසක් ගලවා දමා ඇත. සමහරක් කැඩීමට උත්සාහ දරා ඇත. කණුපාදමක ප්‍රමාණය සෙ.මී. 70 x 60 x 53 ක් ද සිදුරේ ප්‍රමාණය සෙ.මී. 20 x 19 x 12 ක් ද වේ.

උක්ත ස්ථානයට මීටර් 50 ක් ගිනිකොණ දිශාවට වන්නට ගඩොල් හා උළු බහුල මද උස් භූමියකි. සමස්ථයක් ලෙස අනුරාධපුර අවධියට අයත් ස්ථානයක් වන මෙම ස්ථානයේ පැරණි ගඩොල්වලට අමතරව පැරණි මැටි බඳුන් කොටස් අතර රක්ත වර්ණ මැටි බඳුන් කොටස් බහුලව ද, උළු කොටස් හා යබොර කැබලි සුළු වශයෙන් ද අවට ප්‍රදේශයේ විසිරී ඇත.






## සබරගමු පලාත

### අත්තනගොඩ අලුලෙන මූලික ගවේෂණය

කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අත්තනගොඩ ග්‍රාමයේ අත්තනගොඩ අලුලෙන විහාරය පිහිටා ඇත.

කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ මොලගොඩ ඉන්ධන පිරවුම්හල අසලින් දකුණු දෙසට ඇති අතුරු මාර්ගයේ කිලෝමීටර් 3ක් පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට පැමිණිය හැකි ය.

අලුලෙන විහාර භූමියේ සහ ඒ අවට භූමියෙහි පුරාවිද්‍යාත්මක අවශේෂ පරීක්ෂා කර එමගින් ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට අවසාන ඓතිහාසික යුගය දක්වා ඇති ස්මාරක හඳුනා ගැනීම සහ වාර්තාගත කිරීමත් ප්‍රකාශයට පත් නො කළ ස්මාරක ප්‍රකාශයට පත් කිරීමත් මෙම ගවේෂණයේ මූලික අරමුණ වේ.

මෙම ස්ථානය සම්බන්ධව ඓතිහාසිකත්වය සාහිත්‍ය මූලාශ්‍රය, ජනප්‍රවාද සහ පුරාවිද්‍යාත්මක සාධක මගින් ඉදිරිපත් කළ හැකි ය. පූජාවලිය දඹදෙණි යුගයේ 2 වන පරාක්‍රමබාහු රජ සමයේ වාකිරිගල මයුරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍ර හිමියන් විසින් ලියන ලද්දකි. පූජාවලියේ අත්තනගොඩ අලුලෙන හඳුන්වා ඇත්තේ අලුලෙන නමිනි. නිකාය සංග්‍රහය, අස්ගිරි තල්පත, රාජරත්නාකරය සහ මූලබෝධි වංශයේ මෙය මාතුල දනව්වේ  අලුලෙන වශයෙන් ද ජිනකාල මාලය පාලි ග්‍රන්ථයේ "ලංකාදීප මලය දේශ ආලෝක ලෙන" වශයෙන් ද සඳහන් වේ. සාරසංග්‍රහ මනෝරථ පුස්තකයේ පන්සියයක් රහතන් වහන්සේලා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා මාතුල දනව්වේ අලුලෙනට රැස් වීමට පෙර දක්ෂිණ මලය දේශයේ කල්ලනගාම හෙවත් කල්ලගාම ජනපදයේ මන්ඩලාරාමයේ භික්ෂු සම්මේලනයක්  පැවැත්වූ බවත්. ඉන්පසු ආලෝක ලෙනට රැස් වී පොත් ලියූ බවත් සාරසංග්‍රහයේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

ඉහත සඳහන් කල්ලගාම ජනපදයේ මණ්ඩලාරාමය යනු වට්ටාරම වශයෙන් අටුවා පරිධාන කෘතියෙහි (පූර්ව බුද්ධදත්ත නාහිමියන්ගේ) සහ දම්පියා අටුවා ගැටපදයෙහි (මැදඋයන්ගොඩ විමලකීර්ති හිමියන් සංස්කරණය කළ) ද පෙන්වා දී ඇත.

එසේම "මාතුල දනව්ව" අත්තනගොඩ ජනපදය ලෙස හඳුන්වන අතර "මාතුල" යනු අත්තන නම් ගස් වර්ගය සඳහා පාලියෙන් යෙදූ වචනය බවත් මඩිතියවල සිරි සුමංගල හිමිගේ පාලි සිංහල ශබ්ද කෝෂයඃ 405 පිටුවේ සඳහන් වේ. ඒ අනුව "මාතුල දනව්ව" යනු  අත්තනගොඩ ජනපදය බව විද්වතුන්ගේ අදහසයි.

මෙම ව්‍යාපෘතිය යටතේ  අලුලෙන විහාරය කේන්ද්‍ර කර ගනිමින්  එහි සිට කිලෝමීටර් 1ක් පමණ වපසරියක් ආවරණය වන පරිදි ගවේෂණ  කාර්යය සිදු කරන ලදී. ප්‍රාග් ඓතිහාසික අවධිය, අනුරාධපුර අවධිය සහ මහනුවර අවධිය යන කාල පරිච්ජේදයන් කිහිපයක් නියෝජනය

කරන්නා වූ සාධකයන් අලුලෙන විහාරය භූමිය කේන්ද්‍ර කරගත් ප්‍රදේශය තුළින් අනාවරණය වේ.

අලුලෙන කේන්ද්‍ර කර ගනිමින් ප්‍රාග් ඓතිහාසික අවධියෙහි සිට ම ජනාවාසකරණය සිදු වූ බවට 1983 පෙබරවාරි මස හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වූ ආචාර්ය ඩබ්ලිව්. එච්. විජේපාල විසින් සිදු කරන ලද කැණීම් ව්‍යාපෘතිය මගින් ද තහවුරු වී ඇත. විහාර ගෘහය ආසන්නයේ ඊට මදක් පහළින් පිහිටි කටාරම් සහිත ලෙන ආශ්‍රිත ව මෙවැනි ප්‍රාග් ඓතිහාසික අවධිය පිළිබඳ සාධක සපයන්නා වූ ශිලා මෙවලම් කොටස් තිරුවානා පතුරු ආදිය භූමිය මතුපිට විසිරී තිබෙනු දැකගත හැකි ය. මෙහි දුංහේන ගල්තලාව නමින් හඳුන්වනු ලබන ස්ථානයේ ද මෙවැන් සාධකයන් හඳුනා ගැනුණි. මෙම ගල්තලාව මත ස්වභාවික ගල් කෙමියක් ද දක්නට ඇති අතර මෙය ජල අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා භාවිත කරන්නට ඇත. ශිලා මෙවලම් නිෂ්පාදන ක්‍රියාවලිය එක් ස්ථානයක එකදු කාර්යයක් සඳහා වඩාත් උචිත වන බැවින් මෙය ඇතැම්විට මෙවලම් නිෂ්පාදන ස්ථානයක් විය හැකි ය.

අලුලෙන විහාර භූමියට මදක් දුරින් මෙම දුංහේන ගල්තලාව පිහිටා ඇත. මෙම ස්ථාන දෙකෙහි ම මෙවැනි සාධක හමුවීම තුළින් මෙම ප්‍රදේශය මීට වසර 25,000 - 30,000 ට පමණ පෙර සිට ජනාවාසකරණයට බඳුන් වූ ස්ථානයක් බව පැහැදිලි වේ.

ප්‍රධාන ලෙන ලෙස සැලකෙන විහාර ගෘහය සහිත කටාරම් ලෙන සහ ආසන්නයේ වූ තවත් ලෙනක බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් ලිපි දැකගත හැකි විය. බොහෝ සෙයින් හායනයට ලක්වී ඇති පර්වත ලිපියක් ද දක්නට ලැබේ. අක්ෂර කියවීමට පවා නො හැකි පරිදි විනාශ වී ඇත.

මහනුවර සහ ඉංග්‍රීසි පාලන සමය නියෝජනය කරන්නා වූ සාධකයන් ද අලුලෙන විහාර භූමිය හා තදාසන්න කලාපය තුළින් හෙළිදරව් වේ. අත්තනගොඩ පුරාණ විහාරය නම් විහාරස්ථානය මහනුවර වාස්තු විද්‍යාත්මක සහ සිතුවම් මූර්ති සම්ප්‍රදායන් ද නිරූපණය කරන්නා වූ ස්මාරකයකි. වර්තමානයෙහි කරඩුපන වතු අධිකාරි බංගලාව, වේකොලදෙනිය ගලගොඩ ප්‍රදේශයේ පිහිටි පැරණි නිවස ද වසර 700ක් පමණ පැරණි ඉදිකිරීමකි. මේ වන විට විවිධ ප්‍රතිසංස්කරණයන්ට ලක් වී ඇති නමුත් මෙහි පෞරාණික බව තවමත් සුරැකිව ඇත. මෙවැනි ඉදිකිරීම් ලක්ෂණ සහිත වසර 300ක් පමණ පැරණි නිවස ද මෙම ප්‍රදේශය ආශ්‍රිත ව හඳුනා ගැනුණි.

එමෙන් ම මෙම ප්‍රදේශය ආශ්‍රිත ව විවිධ ජන කොටස් ජීවත්ව සිටි බවට අදට ද ශේෂව පවත්නා හින්දු කෝවිල් සහ ද්‍රවිඩ නිවාස සංකීර්ණ තුළින් පැහැදිලි වේ. අතීතයේ සිට ම මෙම ප්‍රදේශය ආශ්‍රිතව ජනාවාස වූ බවට හමු වූ කෝවිල් ආශ්‍රිත පුද පූජා අංගයන්ගෙන් පැහැදිලි වේ.

මේ ආකාරයට අලුලෙන කේන්ද්‍ර කරගත් ප්‍රදේශය තුළින් හඳුනාගන්නා ලද ස්මාරක ප්‍රමාණාත්මක ලෙස පහත සඳහන් කළ හැකි ය.

අලුලෙන පුරාණ විහාරය කේන්ද්‍රකොට ගනිමින් ඊසාන දෙසින් විජයොත්පාය බෝධිය, පැරණි නිවාස තුනක්, ස්වභාවික ගුහා ආවරණය, මාරේ ගල්ලෙන, උමං පොකුණ ද නිරිත දෙසින් ආදාඇළ ස්වභාවික ගුහා ආවරණය, කටාරම් සහිත ලෙන, ලෙන් ලිපිය, වත්තේ කඩේ බෝධිය, දුංහේන ගල් තලාව (ගල් කෙමිය සහිත), ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ස්ථානය, පත්තිනි දේවාලය කරඩුපන වත්ත, ඉදිරිපස පත්තිනි දේවාලය, පැරණි නුග ගස හා ඇසතු ගස යන ස්මාර ද ගිණිකොණ දෙසින් අත්තනගොඩ අම්බලම, පැරණි නා ගස, කැටයම් සහිත ගල (ජයතිලක මහතාගේ කුඹුර), පොකුණුගල, වානගල් ගල් කෙමිය, පැරණි ළිඳ, අත්තනගොඩ පුරාණ විහාරය ආශ්‍රිත ස්මාරක සහ ගල් ඒ දඬු යන ස්මාරක පිහිටා ඇත.

ගවේෂණය සඳහා බඳුන් වූ අලුලෙන හා තදාසන්න ප්‍රදේශයේ ප්‍රාග් ඓතිහාසික යුගය, පූර්ව ඓතිහාසික යුගය අඛණ්ඩව ගලායාමක් සහිත ශාස්ත්‍රීය දහරාවක් ඔස්සේ පෙළ ගැස්විය හැකි ය.

නව ඉදිකිරීම් හේතුවෙන් පුරාවිද්‍යා සාධක විනාශයට යමින් පවතී. ඒ හේතුවෙන් ප්‍රධාන ලෙන තුළ මෑතක නිමවා ඇති සියලු ම අංග ලෙන තුළින් ඉවත් කිරීම සහ සියලු ම සංවර්ධන කාර්යයන් දෙපාර්තමේන්තුවේ අනුමැතිය හා අධීක්ෂණය යටතේ සිදු කිරීමට යෝජනා විය.

**අස්මඩල -ඌරාකන්ද ලෙන් ගවේෂණය**

මෙතෙක් අනාවරණය වී නොමැති පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ වාර්තාකිරීම, ඌරාකන්ද ආශ්‍රිත ලෙන් සංකීර්ණය හා එහි අන්තර්ගතය පිළිබඳ විමර්ෂණාත්මක අධ්‍යයනයක් සිදුකිරීම, ඌරාකන්ද ආශ්‍රිත ව මෙගලිතික සංස්කෘතියක් පැවතියා ද යන්න පර්යේෂණාත්මකව සොයා බැලීම, නූතන මානව ක්‍රියාකාරකම් නිසා විනාශවෙමින් පවතින ලෙන් හඳුනා ගැනීම හා ඒවා ආරක්ෂාකර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මැදිහත්විය යුතු ආකාරය හඳුනා ගැනීම, පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම, ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත්කළයුතු ස්ථාන හඳුනා ගැනීම, ප්‍රාග්ඓතිහාසික ලෙන් හා ප්‍රාග් ඓතිහාසික සංකේත සහිත ලෙන් හඳුනා ගැනීම, ඌරාකන්දෙහි හා තදාසන්නයේ ඇති ප්‍රාථමික ඓතිහාසික ස්ථාන පිළිබඳ විමර්ෂණයට ලක්කිරීම, මෙගලිතික සංස්කෘතික ස්ථාන හා ප්‍රාථමික ඓතිහාසික ස්ථාන අතර ඇති අන්තර් සම්බන්ධතාවය පිළිබඳ විමර්ෂණය කිරීම යන අරමුණින් 2011.09.15 සිට 2011.09.24 දක්වා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්මඩල ග්‍රාම නිලධාරී වසමේ, අස්මඩල ග්‍රාමයේ මෙය පිහිටා ඇත.

මාවනැල්ල සිට අරණායක මාර්ගයේ කිලෝමීටර් 05 ක් පමණ ගමන්කර, උස්සාපිටිය මංසන්දියෙන් දකුණු පසට දිවෙන අස්මඩල මාර්ගයේ කිලෝමීටර් 8 ක් පමණ ගමන්කර, අස්මඩලින් ඌරාකන්ද මාර්ගයේ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ප්‍රවේශ විය හැකි ය.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්මඩල ග්‍රාම නිලධාරී වසමෙහි උඹරාකන්ද පිහිටා ඇත. කෑගල්ල දිස්ත්‍රික්කය, සතරකෝරළය (බෙලිගල්, කිණිගොඩ, ගල්බොඩ හා පරණකුරු) තුන්කෝරළය සහ පාතබුලත්ගම යන ප්‍රදේශවලින් යුක්ත ය. පුරාණ බෙදීම අනුව මායා රටට අයත්ව ඇත්තේ මෙම ප්‍රදේශයයි. අරණායක ප්‍රදේශය පරණකුරු කෝරළයට හා ගල්බොඩ කෝරළයට අයත් වේ.

අරණායක ප්‍රදේශයේ දනට අනාවරණය වී ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට යම් යම් කාලවකවානුවල දී ජනාවාසකරණයට ලක්ව ඇති බව පැහැදිලි ය. අස්මඩල ප්‍රදේශයේ පවත්නා ලෙන් සංකීර්ණයෙහි ඇති ස්වාභාවික ලෙන්වල ප්‍රාග් ඓතිහාසික සාධක දක්නට ලැබෙන අතර ලෙන් සංකීර්ණයේ තිරුවානා, කහඳ වැනි පාෂාණ කැබලි බහුලව දක්නට ලැබේ. තව ද ප්‍රාග් ඓතිහාසික ලෙන් චිත්‍ර ද මෙහි දක්නට ලැබේ.

පූර්ව ඓතිහාසික යුගයේ විශේෂ ලක්ෂණයක් වූයේ මෙගලිතික සුසාන සංස්කෘතියයි. මෙවන් මෙගලිතික සුසානයක් අස්මඩල ලෙන් සංකීර්ණයට ආසන්නව පිහිටා තිබීම විශේෂ ලක්ෂණයකි.

පූර්ව බ්‍රාහ්මී ශිලාලිපි සහිත ලෙන් විශාල ප්‍රමාණයක් හමුවීමෙන් විෂද වනුයේ මෙම යුගයේ උඹරාකන්ද ආශ්‍රිත ලෙන් මානව ජනාවාසකරණය සඳහා ආකර්ෂණීය කලාපයක් වී ඇති බවයි.

උඹරාකන්ද පාමුළ මහනුවර යුගයට අයත් ටැම්පිට විහාරයක් ද දක්නට ලැබේ. ඉහත සඳහන් පුරාවිද්‍යාත්මක සාධක අනුව අනුව උඹරාකන්ද යනු ප්‍රාග් ඓතිහාසික යුගය, පූර්ව ඓතිහාසික යුගය, මුල් ඓතිහාසික යුගය හා ඓතිහාසික යුගයන්වල දී මානව ජනාවාසකරණ කලාපයක් බවට පත්ව තිබූ බවයි.

මෙම ප්‍රදේශයේ පවත්නා ලෙන් මානව ක්‍රියාකරකම් නිසා විනාශවෙමින් පැවතීම (කටාරම් සහිත ලෙනක් දුම්ගෙයක් ලෙස පවත්වාගෙන යාම, ශිලාලිපියක් සහිත ලෙනක් මුළුතැන්ගෙයක් ලෙස පරිහරණය කිරීම) ප්‍රාග් ඓතිහාසික සංකේත සහිත ලෙන් පැවතීම අස්මඩලින් මෙගලිතික සුසානයක් හමුවී තිබීම, වැනි සාධකයන් පදනම් කරගනිමින් කඩිනමින් ගවේෂණය කළ යුතු ස්ථානයක් ලෙස හඳුනා ගෙන 2011 වසර සඳහා ගවේෂණ ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලදී.

ඇස්තමේන්තුගත සම්පූර්ණ මුදල අනුමතව නො තිබීම නිසා උඹරාකන්ද පාමුල ලෙන් පමණක් ගවේෂණය කරන ලදී. මෙම ගවේෂණයේ දී හමු වූ ස්මාරක අතර අස්මඩල අම්බලම, අස්මඩල ටැම්පිට විහාරය, අස්මඩල විහාරයේ ඇති පැරණි බෝධිය, බෝගහකොටුව ඉඩමෙහි ඇති බෝධි ප්‍රාකාරය සහිත බෝධිය, බොඳුරැල්ලහේන වත්තෙහි ඇති ශිලාලිපිය සහිත කටාරම් ලෙන, වත්තේ ගෙදර පැරණි පඩිපෙළ, කුසල්හාමි වාසය කළ කටාරම් සහිත ලෙන, කන්ද පහළ කඩේ දුම්ගෙය සහිත කටාරම් ලෙන, කිතුල්ගහ හේන ලෙන් ලිපිය සහිත කටාරම් ලෙන, පන්සල් තැන්න ඉඩමේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර සහිත ලෙන, ගල්ගොඩ හේන වත්ත කටාරම්

සහිත ලෙන, ලුනුම්දි ඇල්ල ඇළ රක්ෂිතයේ ඇති කටාරම් සහිත ලෙන, මූකලාන වත්ත ස්වාභාවික ලෙන හා මාරාවේ හේන - මහා ශිලා සුසාන ක්ෂේත්‍රය ද වැදගත් වේ.

පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි සහිත ලෙන් 02 ක් ද ප්‍රාග් ඓතිහාසික ලෙන් චිත්‍ර සහිත ගුහාවක් ද කටාරම් සහිත ලෙන් 03 ක් ද ප්‍රාග් ඓතිහාසික සාධක සහිත එනම් ගුරුගල් හා තිරුවානා සංකීර්ණයක් සහිත ස්වාභාවික ලෙනක් ද හමු විය

මෙයට අමතරව ඌරාකන්ද බස්නාහිර බෑවුමෙහි සිදුකරන ලද ක්ෂේත්‍ර ගවේෂණය තුළින් පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්මාරක හා ස්ථාන 10 ක් පමණ හමුවිය. මෙම ස්මාරක හා ස්ථාන සියල්ල පිහිටා ඇත්තේ පෞද්ගලික ඉඩම්වල ය. මෙහි දී හමු වූ ස්මාරක හා ස්ථාන ප්‍රාග් ඓතිහාසික, ප්‍රොටෝ ඓතිහාසික, මුල් ඓතිහාසික හා මෑත ඉතිහාසයට අයත් ඒවා වේ.

ලංකාවේ ප්‍රාග් ඉතිහාසය සම්බන්ධයෙන් විශාල වශයෙන් සාධක අනාවරණය වී ඇත්තේ මෙසොලිතික යුගයෙනි. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ස්වාභාවික ගල්ගුහා සිය වාසස්ථාන ලෙස භාවිත කර ඇත. ගල්ගුහා ආශ්‍රිතව සිදුකර ඇති කැණීම් මගින් මෙය තහවුරු වී ඇත. ඌරාකන්දෙන් හමු වූ එක් ස්වාභාවික ලෙනක අභ්‍යන්තරය පරීක්ෂා කිරීමේ දී දැකගත හැකිවූයේ ගුරුගල් කැබලි හා තිරිවානා කැබලි සංකීර්ණයක් එහි පවතින බවයි. ඒ අනුව මෙය ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ලෙනක් ලෙස නිගමනය කළ හැකි ය. ඌරාකන්දෙන් හමු වූ ලෙන් බොහොමයක් නූතන මානව ක්‍රියාකාරකම්වලට ලක්වූ ඒවා ය. මෙම තත්වය මත ප්‍රාග් ඓතිහාසික සාධක විශාල වශයෙන් විනාශ වන්නට ඇත. ලෙන් ආශ්‍රිත ක්ෂේත්‍ර ගවේෂණය සිදුකිරීමෙන් අනාවරණය වූයේ තැනින් තැන විසිරී ගිය තිරිවාණා, කහඳ හා ගුරු ගල් කැබලි පවතින බවයි. මෙම ලෙන් සංකීර්ණය ප්‍රාග් ඓතිහාසික සාධක සම්බන්ධයෙන් වැදගත් වේ.

ඌරාකන්ද ආශ්‍රිත ප්‍රාග් ඓතිහාසික, පූර්ව ඓතිහාසික, මුල් ඓතිහාසික ජනාවාසකරණය සඳහා හිතකර පාරිසරික තත්වයන් පැවතීම ජනාවාසකරණය සඳහා ගාමක බලවේගයන් සපයන්නට ඇත. මෙසොලිතික යුගයේ මිනිසා ප්‍රධාන වශයෙන් දඩයම, ආහාර රැස්කිරීම ආදී ජීවනෝපාය ක්‍රමයන් අනුගමනය කර ඇත. මෙම ජීවනෝපාය රටාව සඳහා යෝග්‍ය පාරිසරික පසුබිමක් ඌරාකන්ද ආශ්‍රිත ව පැවත ඇත. ඌරාකන්ද ආශ්‍රිතව මූකලන්, ලඳුකැලෑ හා ස්වාභාවිකව ගලන ජලපහරවල් ද ඇත.

පන්සල් වත්ත නමින් ව්‍යවහාර කරනු ලබන පෞද්ගලික ඉඩමෙන් ගල්ගුහාවක් හමුවිය. මෙම ලෙන වාසස්ථානයක් ලෙස එවකට භාවිත නොකරන්නට ඇතැයි මෙම ලෙනෙහි ඉඩ ඉතාමත් සීමිත වීමෙන් හඳුනාගත හැකි ය. ලෙන තුළ පවතින සංකේත සහිත ගල්කුළ නිසා තවදුරටත් ඉඩ සීමිත වී ඇත. ඇතැම් විට මෙම ස්ථානය වත්පිළිවෙත් සිදුකිරීම සඳහා භාවිත කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. ලෙන තුළ පවතින ගලකුළ මතුපිට දක්නට ලැබෙන සංකේත විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කිරීමෙන් ඉතිහාසය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු අනාවරණය කරගත හැකි ය. මිනිස් රූප යැයි අනුමාන කළ හැකි රූප දෙකක් ද මෙම සංකේත අතර පවතී. මේ හැරුණු විට තවත් සංකේත රාශියක් ම මෙම ගල මතුපිට දැකගත

හැකි ය. මෙම රූප සටහන් ඇසුරින් හඳුනාගත හැක්කේ ප්‍රාග් ඓතිහාසික මිනිසාගේ රසඥතාවය හා ඔවුන්ගේ ජීවන අත්දැකීම් බව ද සිතිය හැකි ය. එක් ලෙනක වනගත දර්ශනයක් සීරුම් තාක්ෂණය උපයෝගී කර ගනිමින් නිර්මාණය කර ඇත. පරිසරයේ තමා දුටු ගස්, සතුන්, දියපහර හා විවිධ අභිචාර විධි මෙම කුරුටු සටහන් ඇසුරින් පවතින බව දැකිය හැකි ය. මේවා එක් අයෙකු විසින් නොව කණ්ඩායමක් විසින් යම් යම් අවස්ථාවන්හි දී කළ සිතුවම් විය යුතුය. රැය දහවල අතර වෙනස පිළිබිඹු කිරීමට හෝ දින වකවානු පිළිබඳ යම් අදහසක් ලබා ගැනීමට හෝ රේඛා ලක්ෂණ දිගු කෙටි රේඛා ලෙස නිර්මාණය කර තිබෙනු දැකිය හැකි විය. තමාගේ ආහාරයට සුදුසු සත්ව විශේෂ හා සිය ජීවිතවලට තර්ජනයක් වූ සතුන් වෙන් වෙන්ව නිර්මාණය කර තිබේ. එසේ ම එම සතුන්ගේ රූප ප්‍රමාණයෙන් විශාලව නිර්මාණය කර ඇත.



කුරුටු සටහන



පන්සල් වත්ත නම් ඉඩමෙහි වූ ලෙන

අනුරාධපුරයේ බිල්ලෑව ගල් ගුහාවේ ද බුදුගල්ගේ ද දකුණේ කරඹගල වැනි ප්‍රාග් ඓතිහාසික යුගයට ගැනෙන ස්ථානයන්හි ද මෙබඳු කුරුටු සටහන් දැකිය හැකි ය. මේවා ඇසුරින් අදහස් හුවමාරු කර ගැනීම හෝ තොරතුරු සන්නිවේදනය කරන්නට ඇත. තලගොයින්, ගවයින්, මුවන්, කුඩා සිවුපාවුන් මෙන් ම වලසුන් වැනි සතුන්ගේ හැඩතල ද මෙම සිතුවම් අතරින් හඳුනාගත හැකි ය.


බී.ඩී. නන්දදේව මහතාගේ PRIMITIVE ROCK ART නමැති ග්‍රන්ථය ඇසුරින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ජන ජීවිතය සිතුවමින් කෙසේ ඉදිරිපත් කර තිබේ ද යන්න පැහැදිලි කර ඇත. අස්මඩල ආශ්‍රයෙන් හමුවන ප්‍රාථමික ගුහා චිත්‍ර තෙත් කලාපීය ප්‍රාග් මානව විශේෂයකගේ රූපාක්ෂර භාවිතාව හෝ රසඥතාව විදහාපාන ලද බව නිගමනය කළ හැකි ය. මෙම සිතුවම් අතර රේඛා හැර සිතුවම් කොටස් 15 ක් පමණ හඳුනාගත හැකිවිය. ඇතැම් තැනෙක ගඩා ගෙඩිවල ස්වභාවය යැයි අනුමාන කළ හැකි වටකුරු හෝ වටකුරු හැඩයට ආසන්න හැඩතලවලින් යුත් සිතුවම් ලක්ෂණ ද දැකිය හැකි විය. මේ සියල්ල ඇසුරින් අස්මඩලේ ප්‍රාග් ඓතිහාසික මානවයා දිවයිනේ සෙසු ප්‍රදේශවල ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන තත්වයන්ට සමාන ජීවන තත්වයක් පිළිබිඹු කරන බව විග්‍රහ කළ හැකි ය.

දොරවකින් හමුවන සිතුවම් ලක්ෂණත් තන්තිරිමලය ආශ්‍රිත ව හමුවන සිතුවම් සහිත චිත්‍රත් බැණ්ඩිය ගල්ගේ ආශ්‍රිත එවැනි නිර්මාණත් එක ම කාලයක නිර්මාණය වූ ඒවා බව හඳුනාගත හැක්කේ ඒවායේ සිතුවම් රටා හා භාවිත මෙවලම්වල පවතින ඇති සාම්‍යතාව නිසයි. සමස්ථයක් ලෙස ගත් කළ අස්මඩල ආශ්‍රිත ප්‍රාග් ඓතිහාසික ජනාවාසය වසර ගණනාවක් තිස්සේ අවිච්ඡින්නව සබැඳී තිබූ බව පැහැදිලි ය. ගොදුරු බිම් සොයා සංචාරක දිවිපෙවෙතක් ගතකළ ප්‍රාග් ඓතිහාසික මානවයා ක්‍රමයෙන් ස්ථාවර ජනාවාස ක්‍රමයකට අවතීර්ණ වන බවක් අස්මඩල ආශ්‍රිත මුල් ඓතිහාසික යුගයේ ලෙන් ආශ්‍රයෙන් පිළිබිඹු වේ.



බැණ්ඩිය ගල්ගේ

බොදුරුල්ලහේන වත්තෙහි ලෙන් ලිපියක් සහිත කටාරම් ලෙනක් මුළුතැන් ගෙයක් ලෙස භාවිත කරයි. මේ වන විට මුළුතැන්ගෙය ඉවත්කිරීමට පියවර ගෙන ඇත.


ශිලා ලිපිය

පර්වත ලිපිය සහිත ස්වාභාවික ගුහා ආවරණයක් ද හමු විය. පර්වත ලිපියට ඉහලින් ලෙන් බිත්තියේ කටාරමක් ලෙස ස්වාභාවිකව පිහිටි නිර්මාණයක් හඳුනාගත හැකි අතර එයින් ලිපියට ආරක්ෂාවක් සැලසෙන බව පැහැදිලි ය.

අස්මඩලෙන් සත්ව රුධිරය, අළු, මී පැණි හා මැලියම් විශේෂ භාවිතයෙන් අඳින ලද සිතුවම් හඳුනාගත නො හැකි විය. එසේ ම ඉත්තැකුරු ආදිය භාවිතයෙන් වට සළකුණු යොදා මධ්‍ය කොටස පෙරකී බදාමයෙන් සකස් කළ චිත්‍ර ද පළමු අදියරේ දී හමු නොවූවත් ගවේෂණයේ දෙවන අදියරේ දී එවැනි සිතුවම් හමුවෙතැයි උපකල්පනය කළ හැකි ය.

කටාරම් රහිත ශිලා කෙවණි ආශ්‍රිතව ද ප්‍රාග් ඓතිහාසික ජන ජීවිතයේ සාධක හඳුනාගත හැකි විය. මෙකල ද ශිලා තාක්ෂණය එතරම් තියුණු බවක් නො පෙන්වයි. නමුත් ක්ෂුද්‍ර ශිලා මෙවලම් හඳුනාගත හැකි ය. කහඳ පාෂාණ විශේෂත් පැහැදිලි තිරුවානා පතුරුත් ශිලා කෙවෙණි ආශ්‍රිත ව හා ලෙන් අභ්‍යන්තරයේ ද විසිරී තිබෙනු දැකගත හැකි ය.

මෙම ප්‍රදේශයේ ප්‍රාග් ඓතිහාසික ජනාවාසකරණයේ දී හමුවන එළිමහන් බිම් ප්‍රදේශ, ගොදුරු බිම් ප්‍රදේශ, ප්‍රාග් මානවයාගේ ආරක්ෂාව සපයන ගල්ලෙන් හා ශිලා කෙවණි ආදිය ද ඔවුන්ගේ ආහාර අවශ්‍යතාව සපුරාලන අල වර්ග, පලා වර්ග, ධාන්‍ය වර්ගත් මෙම ප්‍රදේශයේ හොඳින් වර්ධනය වන බව පැහැදිලි ය.

ඌරාකන්දෙහි බස්නාහිර බෑවුමේ සිට කි.මී. 1 ක් පමණ දුරින් පූර්ව ඓතිහාසික යුගයට අයත් මෙගලිතික සුසාන කිහිපයක් හමුව ඇත. පූර්ව ඓතිහාසික යුගය පිළිබඳ ප්‍රබලතම සාක්ෂියක් ලෙස මෙම මෙගලිතික සොහොන් හඳුන්වාදිය හැකි ය. දැනට මෙම ස්ථානයේ තැනින් තැන විසිරුණු පියන්ගල් දෙකක් ද එක් පැතිගලක් ද දැකගත හැකි ය. එක් පියන්ගලක මාළුවෙකුගේ හැඩයට සමාන සංකේතයක් යැයි අනුමාන කළ හැකි සළකුණක් දැකගත හැකි විය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 1960 දශකයේ මෙම ස්ථානයේ කැණීමක් සිදුකර ඇත. එහි දී ශිලා මංජුසාව තුළ තිබී භෂ්මාවශේෂ සහිත මුට්ටියක්, යකඩ කැබලි කිහිපයක් හා අඟුරු කැබලි කිහිපයක් ද හමුවී ඇත.

ඌරාකන්ද පාමුළ ගවේෂණයෙන් හමු වූ පුරාවිද්‍යා ස්මාරක, ස්ථාන හා පුරාවස්තු මගින් අනාවරණය වුයේ ඌරාකන්ද ආශ්‍රිත ප්‍රදේශය ප්‍රාග් ඓතිහාසික, පූර්ව ඓතිහාසික, මුල් ඓතිහාසික හා ඓතිහාසික යුගය දක්වා ජනාවාසකරණය වී ඇති බවයි.

## දකුණු පළාත

### පඩිකෙම්ගල පුරාණ විහාරය හා තදාසන්න ප්‍රදේශය ගවේෂණය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහගල් වැව ග්‍රාම නිළධාරී වසමේ පඩිකෙම්ගල ග්‍රාමයේ මෙම ස්ථානය පිහිටා ඇත. සූරියවැව මීගහජඳුර දක්වා කිලෝමීටර් 7ක් පමණ ගමන් කර මීගහජඳුර මහගල් වැව මාර්ගයේ කිලෝමීටර් 2ක් පමණ ගොස් දකුණු දෙසට ඇති මාර්ගයේ මීටර 600ක් පමණ ගිය විට මෙම ස්ථානය හමු වේ. 2011

වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද මෙම ගවේෂණ ව්‍යාපෘතිය සඳහා රුපියල් 103920.00 ක මුදලක් වෙන් විය. හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සිදු වන සීඝ්‍ර සංවර්ධනයත් සමඟ පුරාවිද්‍යා නටබුන්වල සිදුවන හානිය ඉහළ යමින් පවතින බැවින් මෙම ස්ථානයට ද අධික භූමි පරිභෝජනයත් සමග හානි සිදු විය හැකි බැවින් මෙම ස්ථානය හා අවට නටබුන් ගවේෂණය කර වාර්තා කර තැබීම මෙම ගවේෂණයේ අරමුණයි. අක්කර 100ක පමණ භූමි ප්‍රදේශයක ව්‍යාප්තව ඇති නටබුන් සහිත මෙම ස්ථානය ගවේෂනයෙන් ස්මාරක 33ක් පමණ හඳුනා ගන්නා ලදී.

පඩිකෙම්ගල විහාරයේ ආරම්භය හෝ එයට ලැබූ රාජ්‍ය අනුග්‍රහය පිළිබඳ ව මූලාශ්‍රගත තොරතුරු විරල ය. එහෙත් මෙම විහාරස්ථානය ආශ්‍රිතව හමුවන ගොඩනැගිලිවල නිර්මාණාත්මක ලක්ෂණවලට අනුව රුහුණු මාගම්පුර රාජධානියේ ආරම්භයේ සිට මෙය රාජ්‍ය අනුග්‍රහය යටතේ සංවර්ධනය වී ඇති බවට සාධක හමු වේ. ඒ අනුව භික්ෂු සංඝයාගේ අවශ්‍යතා සඳහා ඉදිකළ පංචාවාසයක ලක්ෂණ මෙහි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ තුළින් පිළිබිඹු වේ.

**වෙහෙර ගොඩැල්ල නටබුන් ස්ථානය**

මල්ආර නමින් හඳුන්වන ජල මාර්ගය හරස් කර ඉදි කළ මහගල් වැව පැරණි වැව් ඉවුරෙහි වෙහෙර ගොඩැල්ල නමින් හඳුන්වන නටබුන් ස්ථානය පිහිටා ඇත. ජල සම්පාදන මණ්ඩලයට අයත් ජල ටැංකියක් ස්ථාපනය කර ඇති මෙම ස්ථානයෙහි ශිලා ස්ථම්භ 5ක් සහිත නටබුන් ගොඩනැගිල්ලක් දැකිය හැකි ය. මෙම ස්ථානයට බටහිර දෙසින් පිහිටි ගල් තලාව මත පිහිටි ස්වභාවික පොකුණක්, ගරා වැටුණු චෛත්‍ය ගොඩැල්ලක්, අනවසර කැණීම්වලට ලක් වූ මධ්‍ය භාරා විනාශ වූ ස්තූප ගොඩැල්ලක්, මහගල්වැව වැව් බැම්මහි බටහිර අන්තයෙහි පිහිටි නටබුන් ගොඩැල්ල යන ස්මාරක දක්නට ලැබේ.

පැරණි උළු, ගඩොල් සහිත අනුරාධපුර මුල් යුගයේ ලක්ෂණ පිළිබිඹු කෙරෙන නටබුන් ගොඩැල්ලකි. මෙම ගොඩනැගිල්ලට නැගෙනහිර දිශාවෙන් දිගින් මීටර් 8. 90ක් ද පළල මීටර් 4.50ක් ද වන ගොඩනැගිල්ලකි. මෙය ටැම්පිට විහාර ගෘහයක් වශයෙන් සැළකිය හැකි ය. මහගල්වැව පිටවාන අසල නිරිත දිශාවෙන් ශිලා ස්ථම්භයට මීටර් 40ක් පමණ දුරින් ද ස්තූප ගොඩැල්ලකි. ගරා වැටී ඇති මෙම ස්තූපය විනාශයට යමින් පවතී. මෙම වෙහෙර ගොඩැල්ල නටබුන් ස්ථානයට ප්‍රවේශ වන පැරණි දකුණු පිවිසුම් මාර්ගය චෛත්‍ය මළු බැම්මට සමාන්තරව දකුණු දිශානුගතව පැරණි ප්‍රාකාර බැම්මට සමාන්තරව විහිදේ.

**මහගල් වැව මෙගලිතික සුසාන භූමිය**

මහගල් වැවට දකුණු දෙසින් මීටර් 50ක් පමණ දුරින් මෙම සුසාන භූමිය පිහිටා ඇත. ගල් පුවරු භාවිතයෙන් ඉදි කරනු ලබන සිස්ට් (cist) වර්ගයේ මෙගලිතික සුසාන සංකීර්ණයක් මෙම ස්ථානයේ දක්නට ලැබේ. කළු, රතු මැටි බඳුන් කැබලි භූමිය මතුපිට විසිරී තිබේ.

**බෝධිඝරය**

පඩිකෙම්ගල විහාර භූමියේ පිහිටි සුවිශේෂී ගොඩනැගිල්ලක් වන බෝධිඝරය 1996 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කරන ලද්දකි. අටපට්ටම් හැඩැති මෙය පිටමාලය හා ඇතුළුමාලය වශයෙන් කොටස් 2කට නිමවා ඇත. වයඹ දිශානුගතව ප්‍රවේශය සහිත මෙහි ගල් කණුවක උස සෙන්ටිමීටර් 203ක් පමණ වේ. අෂ්ටාශ්‍රාකාර පිට මාලයේ සිට සෙන්ටිමීටර් 186ක් දුරින් මධ්‍යයට වන්නට කළු ගලින් කරන ලද ඇතුළත මාලකයකින් සමන්විත ය. ඇතුල් මාලයේ ශිලාමය නිර්මාණ බොරදම් සහිත පාදමක් මත නිර්මාණය කර ඇත. මෙම ශිලා පුවරු මධ්‍යයේ අලංකාර කැටයම් සහිත ය. එහි මධ්‍යයේ වෘත්තාකාරව සකස් කළ කවයක් තුළ හිඳි බුද්ධ ප්‍රතිමාවක් හා ස්ත්‍රී රුවකැයි සැළකිය හැකි නිර්මාණයකි. බෝධිඝරය සංරක්ෂණය කිරීමේ දී විකෘතිව ඇති බව හඳුනා ගත හැකි ය.

**පඩිකෙම්ගල විහාරස්ථානයේ නටබුන් ගොඩනැගිලි**

බෝධිඝරයට බටහිර දෙසින් මීටර් 13ක් පමණ දුරින් කෙටි ගල් කණු 16කින් සමන්විත ගොඩනැගිල්ලකි. වර්තමාන විහාර මළුවට ප්‍රවේශ වන ස්ථානයෙහි ද භාවිතය හඳුනාගත නො හැකි කෙටි ගල් කණු සහිත ගොඩනැගිල්ලකි. එයට උතුරු දෙසින් ද සමචතුරශ්‍රාකාර ගොඩැල්ලකි. නැගෙනහිර දිශානුගතව ප්‍රධාන ප්‍රවේශය සහිත මෙහි පියගැටපෙළක්, සිරිපතුල් ගලක් දක්නට ලැබේ. මෙම ස්මාරකයට නැගෙනහිර දෙසින් ප්‍රතිමා ගෘහයක ලක්ෂණ සහිත නටබුන් ගොඩැල්ලකි. කැණීම් කරමින් පවතින මෙම ගොඩනැගිල්ලේ ප්‍රවේශ දොරටුව බටහිර දිශානුගතව පිහිටා ඇත.

මෙවැනි නටබුන් ගොඩනැගිලි 6ක් පමණ භූමිය පුරා විසිර තිබේ. එමෙන් ම මෙම ස්මාරකයේ පිහිටි ස්වභාවික ගල් කෙමි අතීතයේ භික්ෂූන් ජලය සපයා ගත් ස්ථාන විය හැකි ය. එමෙන් ම රක්ෂිත භූමියේ ගිණිකොණ දිශාවෙන් කුඩා වැවකි.

පඩිකෙම්ගල ආගමික සංකීර්ණය වටා ඉදි කර ඇති ප්‍රාකාර බැම්ම පර්වතයේ බටහිර කොටස සීමා කොටගෙන ජ්‍යාමිතික හැඩතල වලින් යුක්ත ව ඍජුකෝණාශ්‍රාකාරව හැරවුම් සහිත ව ඉදිකර තිබේ. කුඩා කළු ගල් කුට්ටි භාවිතයෙන් මෙම ප්‍රාකාර බැම්ම ඉදි කොට තිබේ. පඩිකෙම්ගල පුරාවිද්‍යා ස්ථානයට මීටර් 700ක් පමණ දුරින් උතුරු දෙසින් පැරණි මහගල්වැව පිහිටා ඇත. පැරණි බැම්මේ කොටසක් මෙහි සුරක්ෂිත ව පවතී. සමස්ථයක් වශයෙන් ගත් කළ පඩිකෙම්ගල පුරාවිද්‍යා ස්ථානය පිළිබඳ ව ලිඛිත සාධක විරල බැවින් එහි ඉතිහාසය ජනප්‍රවාදගත සාධක හා පුරාවිද්‍යාත්මක සාධක පදනම් කොට ගෙන ගොඩනැගිය යුතුව ඇත. විසිරී ඇති පුරාවිද්‍යා ස්මාරක අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ අනුරාධපුරය මුල් යුගයේ ඉදි කිරීම් අතර දක්නට ලැබෙන පබ්බතාරාම සංකීර්ණයක ලක්ෂණ මෙයින් පිළිබිඹු වන බවයි. ඒ අනුව ස්තූපය, බෝධිඝරය, පිළිම ගෙය, උපෝසථඝරය වැනි ඉදිකිරීම් මෙම ස්ථානයෙහි දක්නට ලැබේ. පඩිකෙම්ගල පුරාණ විහාරයට බටහිර හා වයඹ දෙසින් පිහිටි ගොඩනැගිලි ආගමික කටයුතු සඳහා ඉදි කළ ස්මාරක වේ. පූර්ව ඓතිහාසික යුගයේ සිට වර්ධනය වූ ජනාවාස සාධක සහිත පඩිකෙම්ගල මහගල්වැව කේන්ද්‍ර කොට ගත් රුහුණු මාගම්පුර

රාජධානිය යටතේ වරින් වර විවිධ වෙනස්කම්වලට ලක් වෙමින් සංවර්ධනයට පත් වූ බව මෙම ගවේෂණයෙන් හඳුනාගන්නා ලදී.

**ඕලන්ද දේවස්ථානය ගවේෂණය (අම්බලන්ගොඩ)**

අම්බලන්ගොඩ ඕලන්ද ස්තාලය ලෙසින් වර්තමානයේ හැඳින්වෙන ස්ථානය අතීතයේ දී ඕලන්ද දේවස්ථානයක් ලෙසින් පැවති බැව් සඳහන් වේ. මේ කරුණ සනාථ කරගැනීම සඳහා ස්ථානීය කැණීමක් සිදු නොකර මූලාශ්‍ර පරිශීලනය කර විධිමත් වාර්තාවක් සකසන ලෙස පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබාදෙන ලද නියෝගය මත නියෝජ්‍ය අධ්‍යක්ෂ (චංචල හා නිශ්චල දේපල) විසින් උපදෙස් අනුව මෙම ගවේෂණය ක්‍රියාත්මක කරන ලදී.

ගාල්ල දිස්ත්‍රික්කයේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 82 නිරේවත්ත ග්‍රාම නිලධාරී වසමේ මෙය පිහිටා තිබේ.

ගාල්ල සිට අම්බලන්ගොඩ නගරය දෙසට පැරණි කඩවීදිය ඔස්සේ ගමන් කිරීමේ දී පැරණි තානායම  තිබූ ස්ථානයට යාබදව මෙම ස්ථානය පිහිටා ඇත.

අම්බලන්ගොඩ නගරයේ ඉතිහාසය පිළිබඳ විමසීමේ දී එහි ග්‍රාම නාමය නිර්මාණය වීම පිළිබඳ ව විවිධ අදහස් ඇති බව පෙනී යයි. පෘතුගීසීන් විසින් බලන්ගලේ (Balangale) යනුවෙන් ද ඕලන්දයන් විසින් අම්බලන්ගොඩ්ඩේ (Ambalangodde) යනුවෙන් ද ව්‍යවහාර වූ බවට සාධක ඇත. ක්‍රි.ව. 1720 පමණ වන විට අම්බලන්ගොඩ නගරය ක්‍රිස්තු භක්තිකයන්ගෙන් පිරී සිටි බවට ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් ය.

එහි සැළකිය යුතු සංවර්ධනයක් සිදුව තිබෙනුයේ යටත් විජිත අවධියෙන් පසුව ඇති වූ වෙළඳ සමාජය අනුව බව පෙනී යයි. ඕලන්දයන් විසින් වර්ෂ 1640 දී ගාල්ල කොටුව අත්පත් කරගෙන එහි පාලන බලය ස්ථාපිත කර ගැනීමෙන් අනතුරුව අම්බලන්ගොඩ ප්‍රදේශය සඳහා ද සුවිශේෂී වැදගත්කමක් හිමි වූ බව මූලාශ්‍ර අනුව හඳුනාගත හැකි ය.

ක්‍රි. ව. 1645 පමණ වන විට ගාල්ල කමාන්ඩරියේ පාලකයා වූ මට්සුකර් විසින් බතාවියාවේ ලංකාව සඳහා වූ ප්‍රධානියා හට යොමු කරන ලද පාලන වාර්තාවෙහි අම්බලන්ගොඩ පිළිබඳ ව ද සඳහන් කර ඇත. (Reminers,E,1937 : 19) ඒ වන විට ඕලන්දය විසින් අත්පත් කරගනු ලැබූ ප්‍රදේශ සහ එහි පාලන කටයුතු සංවිධානය කරන ලද ආකාරය ද ඔහු මෙහිලා විග්‍රහ කරයි. ඒ අනුව ගාලු කෝරළය ප්‍රදේශය එම කෝරලේ කපිතාන් සහ පිස්කල්වරයා වූ Ptilip Angle එවකට ගාලු කෝරළයේ පාලකයා විය (එම Reminers,E,1937 : 06). එසේ වුව ද අම්බලන්ගොඩ ඇතුළු ආසන්න ප්‍රදේශය මහබද්ද යටතේ වෙනම පාලන සංවිධානයක් ලෙස පැවති බැව් ඔහු වැඩිදුරටත් සඳහන් කර තිබේ.

මෙම පරිපාලන රාමුව අනුව යමින් ක්‍රි. ව. 1750 පමණ වන විට ගාලු කමාන්ඩරිය තුළ මහබද්දේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරනු ලැබ ඇත්තේ ඇඩ්රියන් ඌස්ඩයික්ය. (Brohier, R.L. 1991 : 1974). ඔහුගේ කටයුතු ප්‍රධාන වශයෙන් බෙන්තර, කොස්ගොඩ, අම්බලන්ගොඩ යන ප්‍රදේශවලට යොමු වී තිබිණ. (D.B.U.J.1930 - 31 : 210).

ගොඩනැගිල්ලේ දැක්වෙන ශිලාලේඛනයට අනුව මෙය ක්‍රි.ව. 1750 දී පමණ මහබද්දේ ප්‍රධානියා වශයෙන් කටයුතු කළ ඇඩ්රියන් ඌස්ඩයික් විසින් නිමවා ඇත.

"Built AdriaanOostdyk, Onderkopman, Superintendent of the Galle Korle" (D.B.U. 1930 - 31 : 209) මෙම ගොඩනැගිල්ලේ සඳහන් වන ආකාරයට ඇඩ්රියන් ඌස්ඩයික්ගේ තනතුර "Onderkoopman Superintendent of the Galle Korale" වේ.

ඕලන්ද පාලනාධිකාරය මුළුමනින් ම වෙළඳාම මත පාදක වුවක් විය. ඇඩ්රියන් මෙම ගොඩනැගිල්ල ගොඩනැංවූ පසු ඔහුගේ තනතුර Koopmpm (වෙළෙන්ඳා) දක්වා උසස් වූ බව ද කියැවේ. එසේ ම එම තනතුර දෙවැනි වූයේ කමාන්ඩර්වරයාගේ තනතුරට පමණක් බව ද සැලකේ.

බ්‍රෝහියර් සඳහන් කරන්නේ ඇඩ්රියන් ඌස්ඩයික් කුරුඳු වෙළඳාම සම්බන්ධයෙන් ප්‍රධානියෙකු වශයෙන් කටයුතු කරනු ලැබූ බැවින් ද දිගු කාලයක් පුරා අම්බලන්ගොඩ වාසය කරන ලද බැවින් ද අම්බලන්ගොඩ තානායම ලෙස භාවිත වූ ගොඩනැගිල්ල ඔහුගේ නිල නිවස හා කාර්යාලය ලෙස භාවිත වන්නට ඇති බව ය. එසේ ම මෙහි කුරුඳු ගබඩාවක් තිබෙන්නට ඇති බවට ද අනුමාන කෙරේ.

දේවස්ථානය ලෙස හඳුනාගනු ලැබූ ගොඩනැගිල්ලේ ඓතිහාසිකත්වය පිළිබඳ විමසා බලන විට එය අතීතයේ අවස්ථා කිහිපයක දී විවිධ සංසිද්ධීන්ට බඳුන් වී ඇති අතර, විවිධ උපයෝගීතාවයන් වෙනුවෙන් භාවිත කරන ලද බව පෙනී යයි. ඕලන්ද දේවස්ථානයක් ලෙස මෙන් ම, ඕලන්ද පාසලක් ලෙසත්, අශ්වයන් සඳහා වන ස්තාලයක් ලෙසත් මෙම ස්ථානය එම යුගයේ දී ම භාවිත වූ බවට සැකයක් නැත.

ලුඩොවිසි විසින් ඔහුගේ ග්‍රන්ථයෙහි සඳහන් කරන පරිදි ක්‍රි. ව. 1735 වන විට ද මෙම ස්ථානය කොළඹ හා ගාල්ල අතරතුර විවේක ස්ථානයකි. (Ludovici, 1735 : 39). ඉමාම් ඩී ජෝන් නැමැත්තා මෙම අම්බලන්ගොඩ ඕලන්ද තානායමේ සිටිය දී මරණයට පත් වූ බව ඔහුගේ සුසාන පුවරුවෙහි සඳහන් කර ඇත.

ඕලන්ද අවධියේ දී දෝලාවෙන් ගමන් බිමන් යාම හේතුවෙන් කොළඹ සිට ගාල්ල යන ප්‍රධාන මධ්‍යස්ථාන දෙක අතරතුර ගමනට විශාල කාලයක් වැය වූ බව පෙනී යයි. එබැවින් එම ගමන් මාර්ගයේ විවිධ ස්ථානවල ඔවුන් විසින් ගිමන්හල් (Rusthuysen) නිර්මාණය කරනු ලැබිණි. ගිමන්

නිවා විඩාව සංසිඳුවා ගැනීමට මෙන් ම නවාතැන් ගෙන සිට යාමට අවශ්‍ය ම පරිසරය මෙහි සකසා තිබේ.

අම්බලන්ගොඩ ස්වාභාවික මුහුදු තටාකයත් එහි චමත්කාරජනක දර්ශනයත් හේතුවෙන් මෙම ස්ථානය ඕලන්දයන්ගේ සිත් ඇදගන්නට ඇත. මෙවැනි තවත් එක් ඕලන්ද ගිමන්හලක් බෙන්තර ප්‍රදේශයේ ඉදිකර තිබූ බව මූලාශ්‍රයවලින් හෙළි කරගත හැකි විය.

බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී මෙම ගොඩනැගිල්ල අම්බලන්ගොඩ මහේස්ත්‍රාත් උසාවිය වශයෙන් භාවිත වී ඇති අතර, පශ්චාත් බ්‍රිතාන්‍ය යුගයේ දී අම්බලන්ගොඩ ගම් සභා උසාවිය ලෙස භාවිත වී ඇති බවට මූලාශ්‍රය අනුව හඳුනාගත හැකි ය. (D.B.U. 1930-31 : 208)

ගොඩනැගිල්ලට අදාළ ව පවතින ඓතිහාසිකත්වය අනාවරණය කර ගැනීම හා යම් සංවර්ධන කාර්යයක දී මෙහි පෞරාණිකත්වයට හානි නොවන ආකාරයට කටයුතු කිරීමට අවශ්‍ය යෝජනාවලිය සකස් කරන ලදී.

## වයඹ පළාත

**මිහිඳු මාවත ගවේෂණය**

කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 831 කුරුණෑගල නගරය ග්‍රාම නිළධාරී වසමේ මෙම ගවේෂිත කලාපය පිහිටා ඇත. නාගරික සංවර්ධන අධිකාරිය විසින් මිහිඳු මාවත සංවර්ධනය කිරීම යටතේ මහල් නිවාස, විනෝද කටයුතු, උත්සව ශාලා වැනි ඉදි කිරීම් සිදු කිරීමේ දී එම කලාපයට අයත් පැරණි ගොඩනැගිලිවල පුරාවිද්‍යාත්මක වටිනාකමක් තිබේද යන්න හඳුනා ගැනීම සඳහා මෙම පුරාවිද්‍යා ගවේෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. එහි දී අක්කර 7 ක පමණ භූමි ප්‍රදේශයක ගවේෂණ කටයුතු සිදු විය. ගවේෂණයෙන් හඳුනා ගන්නා ලද ස්මාරක පහත සඳහන් වේ.

**නාගරික සංවර්ධන අධිකාරී කාර්යාලය**

ආයත චතුරශ්‍රකාර ගොඩනැගිල්ලක් වන මෙය දිග පළලින් මීටර් 32 x 15 ප්‍රමාණය ගනී. 20 වන සියවසේ මුල් භාගයට අයත් යැයි සැලකිය හැකි මෙහි ප්‍රධාන ප්‍රවේශ දොරටුවට ඉදිරි පසින් මහනුවර යුගයේ ලක්ෂණ සහිත සඳකඩ පහණකි.

**මාර්ග සංවර්ධන අධිකාරිය**

ආරම්භක අවධියේ දී Public Works Department හෙවත් රජයේ වැඩ දෙපාර්තමේන්තුව සතුව පැවති මෙම ගොඩනැගිල්ල 20 වන සියවසේ මුල් භාගයේ ඉදිකළ ගොඩනැගිල්ලකි. දිග සහ පළලින් මීටර් 53 x 1.8 පමණ වන මෙම ගොඩනැගිල්ල නවීකරණයට ලක්ව ඇත.

**නිවාස සංවර්ධන අධිකාරී කාර්යාලය**

පැරණි ගොඩනැගිල්ලක් වුව ද සම්පූර්ණයෙන් ම නවීකරණයට ලක් වූවකි.

**ප්‍රාදේශීය තැපැල් අධිකාරී කාර්යාලය**

බ්‍රිතාන්‍ය යුගයට අයත් ගෘහ නිර්මාණ ලක්ෂණ තරමක් ශේෂව පැවතිය ද නවීකරණයට ලක් වූ ගොඩනැගිල්ලකි.

**බන්ධනාගාර ගොඩනැගිල්ල**

වර්ෂ 1915 දී ඉදි කරන ලද බව සඳහන් මෙම ගොඩනැගිල්ල නවීකරණයට ලක් වූවකි.

**මූලස්ථාන පොලිස් ස්ථානය**

දෙමහල් ගොඩනැගිල්ලක් වන මෙය වර්ෂ 1915 දී ඉදි කර ඇති අතර පුරාවිද්‍යා වටිනාකමක් දක්නට නො ලැබේ. ගවේෂණයට ලක්කළ ප්‍රදේශයේ පිහිටි ඉහත සඳහන් ගොඩනැගිලි කිසිවක් වසර 100කට වඩා පැරණි නොවන බවත් බොහෝ ගොඩනැගිලි නවීකරණයට ලක්ව ඇති බවත් පැහැදිලි වූ අතර අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා මෙම ගොඩනැගිලි බාධාවක් නොවන බවට යෝජනා කරන ලදී.

**ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගවේෂණය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිළධාරී වසම් 10ක් ආශ්‍රිතව විසිරී ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනා ගැනීම සඳහා මෙම ගවේෂණ ව්‍යාපෘතියේ පළමු අදියර ක්‍රියාත්මක කරන ලදී. 2010 වර්ෂයේ සැප්තැම්බර් මස සිට මාස 3ක කාලයක් ක්‍රියාත්මක වූ මෙම ගවේෂණය තුළින් පහත සඳහන් පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනාගෙන ඇත.

1. කල්ලංචිය ග්‍රාම නිළධාරී වසම (අංක 85)

**නාග පබ්බතාරාම විහාරස්ථානය**

වළගම්බා රජු සැඟව සිටි ස්ථානයක් වශයෙන් ජනප්‍රවාදයේ සඳහන් මෙම ස්ථානය ආශ්‍රිත ව කටාරම් සහිත ලෙන් 6ක් පමණ ඇත. විහාර භූමියේ පළමු මළුවට ප්‍රවේශය සලසන ප්‍රවේශ ද්වාරයේ කැටයම් රහිත සඳකඩ පහණක්, ඒ දෙපස මුරගල් යුගලක් හා ආයත චතුරස්‍රාකාර පාදෝවනයක් දක්නට ලැබේ. තෙවන මළුවට ප්‍රවේශ වීමේ දී විහාර භූමියෙහි ඇති විශාලතම ලෙන දක්නට ලැබෙන අතර මෙහි දකුණු දිශානුගතව පිහිටි කටාරම දිගින් මීටර 34.20 ක් පමණ වේ. මෙහි ලෙන් පියස්සෙහි පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ලිපි දෙකකි. ලෙන් මිදුලෙහි පාදෝවනයක් සහ අත්තානි කණුවක් ද වේ. ලෙනෙහි වයඹ දිශානුගතව පිහිටි ගල් කුළෙහි ඉහළට ප්‍රවේශ වීම සඳහා ගලෙහි කෙටූ පියගැට පෙළකි. එයට බටහිර දිශානුගතව කටාරම් සහිත දෙවන ලෙන පිහිටා ඇති අතර පළමු ලෙනේ සිට මීටර් 40ක් පමණ ගිණිකොණ දෙසින් තෙවන ලෙන ද ඊශාන දිශානුගතව සිව්වන ලෙන ද පිහිටා ඇත. මෙම ලෙන් පදනම් කරගෙන වර්තමානය වන විට භික්ෂු කුටි ඉදි කර ඇත. විහාර භූමියෙන් පරිබාහිරව පිහිටි තවත් එවැනි ම ලෙනකි.

2. පලුකන්දෑව ග්‍රාම නිළධාරී වසම (අංක 55)

**නිරාවිය පැරණි පන්සල් ගොඩැල්ල**

ඔට්ටුක්කුලම ගම්මානයේ පිහිටි අක්කර 2ක් පමණ භූමි භාගයක විසිරී ඇති නටබුන් සහිත මෙම ස්ථානයේ පැරණි ස්තූප ගොඩැල්ලක් සහ එම ස්ථානයට ඊශාන දෙසින් පැරණි මැටි බඳුන් කැබලි, උළු, ගඩොල් සාධක විසිර ඇති ස්ථානයක්, වැසිකිලි ගලක් වැනි පුරාසාධක හමු වේ.

**ගල් තරු කුඹුර**

ආත්තිකුළම ගමේ කුඹුරක පිහිටි මෙම ස්ථානයේ ගල් කණු පිහිටි බැවින් "ගල් තරු කුඹුර" නමින් හැඳින් වේ. ගොඩනැගිල්ලක් පැවති බවට සාධක වශයෙන් සිටුවා ඇති ගල් කණු 10ක් පමණ මෙම ස්ථානය ආශ්‍රිත ව දක්නට ලැබේ.

3. සියඹලෑව ග්‍රාම නිළධාරී වසම (අංක 78)

**කුඩා මැදවච්චිය ශ්‍රී බෝධිමළු විහාරය**

මැදවච්චිය ග්‍රාමයේ පිහිටි මෙම විහාරය ආශ්‍රිත ව පුරාවිද්‍යාත්මක සාධක රැසක් විසිර පවතී. වත්මන් ප්‍රතිමා ගෘහය ඉදිරිපස හතරැස් පීඨිකාවකි. එමෙන් ම ප්‍රතිමා ගෘහය ඉදිරිපසින් පැරණි ගල් කණු යුගලයක් ද පොකුණ අසල යූප ගලක්, මල් ආසනයක් යැයි සැලකිය හැකි කෙළවර කැපී ගිය ශෛලමය පුවරුවක්, ද්විතීයික සන්දර්භයට අයත් සඳකඩ පහණක්, කොරවක්ගල්, ගල් කණු කැබලි 10ක් පමණ විහාර භූමියේ දක්නට ලැබේ.

**මැදවච්චිය වෙහෙරගල පුරා සාධක**

වත්මන් විහාරයට කි. මී 1 1/2 ක් පමණ දුරින් පිහිටි වෙහෙරගල පුරාවිද්‍යා ස්ථානය ආශ්‍රිත ව ශෛලමය ප්‍රාකාර බැම්මක්, ගොඩනැගිලිවලට අයත් ගල් කණු සාධක, ස්තූප ගොඩැල්ලක් පා දෝවනයක් වැනි පුරාවිද්‍යාත්මක සාධක රැසක් දක්නට ලැබේ.

4. වඩුගම ග්‍රාම නිළධාරී වසම

**වෙහෙරයාය**

39 වන සැතපුම් කණුව අසල පිහිටි මෙම ස්ථානය ආශ්‍රිතව ගොඩනැගිලි සාධක සහිත ස්ථාන දෙකක් මධ්‍ය විශ්කම්භය මීටර් 2.5ක් පමණ වූ චෛත්‍ය ගොඩැල්ල සහ සලපතල මළුවට අයත් කළුගල් පුවරු කිහිපයක් සහ තවත් ගොඩනැගිලි සාධක සහිත ස්ථාන දෙකක් මෙම භූමිය පුරා විසිරී තිබෙනු දක්නට ලැබේ.

**දේවගිරිපුර විජේසූරිය නැමැත්තාට අයත් ඉඩමක පිහිටි නටබුන්**

දේවගිරිපුර ගම්මානයේ පෞද්ගලික අයිතිය සතු ඉඩමක චෛත්‍යය ගොඩැල්ලකට අයත් සාධක දක්නට ලැබේ. විශ්කම්භය මීටර් 15ක් පමණ වන මෙයට අයත් බොරදම් ගඩොල් පවා දක්නට ලැබේ.

**දේවගිරිපුර විහාරය**

දේවගිරිපුර ගම්මානයේ පිහිටි මෙම විහාරස්ථානයේ ප්‍රවේශ දොරටුව අසල පැරණි ගොඩනැගිලි සාධක දක්නට ලැබේ.

5. කෝන්වැව ග්‍රාම නිළධාරී වසම (අංක 68)

**කෝන්වැව පුද්ගලික ඉඩම**

කෝන්වැව කොළනියේ අංක 25 දරණ ඉඩමේ පැවති ගල් ඇඳන් ඉසිපතනාරාමයට රැගෙන ගොස් ඇති අතර මෙහි පිහිටි ජල ටැංකියට ආසන්නයෙන් ශෛලමය පුවරුවක්, ටෙරාකොටා මැටි බඳුන් කොටස් සහ සත්ව රූප හමු වේ.

**ඉහළ කෝන් වැව ඉසිපතනාරාමය**

ඉහළ කෝන් වැව ගම්මානයේ පිහිටි මෙම විහාරස්ථානයේ ශෛලමය පුවරුවක්, කණු පාදම් ගලක් වැනි පුරාසාධක දක්නට ලැබේ.

**ඉහළ කෝන් වැව අලියා පෙරළුණුගල**

ඉහළ කෝන්වැව ගම්මානයේ අලියා පෙරළුණු ගල නමින් හඳුන්වන අක්කර 1/2 ක පමණ ප්‍රදේශයක ව්‍යාප්තව ඇති ගල් තලාවක් මත ගලෙහි කපන ලද කාණුවක්, ගල්කටු සිදුරු කිහිපයක් දක්නට ලැබෙන බැවින් පැරණි ගල් කොරියක් එහි පැවති බවට අනුමාන කළ හැකි ය. එමෙන් ම ගල් කෙමියක්, කේතුකාවාට සිදුරු සහිත ස්ථාන දෙකක් ද මෙහි දක්නට ලැබේ.

6. දිවුල්ලැව ග්‍රාම නිළධාරී වසම (අංක 58)

**නිල්ගිරි රජමහා විහාරය**

අරසන් වැව නම් ගමෙහි පිහිටි මෙම ස්ථානය වේළුසුමන යෝධයාට සතුරු සෙනෙවියන් ඝාතනය කිරීම සඳහා උදව් කළ නිල් සාටකයක් පැළඳ සිටි තාපසයෙකු නිසා නිල්ගිරි විහාරය ලෙස මෙය හැඳින්වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. මෙහි පළමු ලෙනෙහි ද්වාරය නැගෙනහිර දෙසට විවෘතව පවතින අතර උතුරු දිශාවෙන් සක්කගල් හා මැටි භාවිත කර බිත්ති බැඳ ඇත. දකුණු දෙසින් පහළ සිට ඉහළට කටාරම් කොටා ඇති මෙහි කටාරම මීටර් 8. 40ක් පමණ දිග ය. පළමු ලෙනට නැගෙනහිර දෙසින් දෙවන ලෙන පිහිටා ඇත. මෙම ලෙන තුළ වත්මන් විහාර ගෙය ඉදිකර ඇති අතර වියනෙහි මහනුවර ශෛලියට අනුව ඇඳි සිතුවම් ශේෂිත ය. නව ඉදිකිරීම් නිසා ලෙනෙහි පුරාවිද්‍යාත්මක අගයට හානි වී ඇත. දෙවන ලෙනට උතුරු දෙසින් ස්මාරක සහිත තවත් ලෙනකි. ලෙන් විවරය නැගෙනහිර දිශාවට මුහුණලා පිහිටි මෙහි අවකාශීය දිග මීටර් 3.50 කි. පසුකාලීනව වරිච්චි ගසා කුටියක් ඉදිකර ඇත. එමෙන් ම ගල් තලාවේ බටහිර දෙසින් ගලෙහි කෙටූ පියගැට පෙළක් ද දක්නට ලැබෙන අතර කණු පාදම් ගල්, ශෛලමය ආසන, සිදුරු සහිත ගල් පුවරු, සඳකඩ පහණක්, විශ්කම්භය සෙ. මී 60 ක් පමණ වන පහනක හැඩය ගන්නා ශෛලමය නිර්මාණයක් ද මෙම විහාර භූමියෙහි දක්නට ලැබේ.

7. මොට්ටපෙත්තෑව ග්‍රාම නිළධාරී වසම (අංක 52)

**මොට්ටපෙත්තෑවේ වෙහෙරගල**

අතීතයේ රන් පෙත්තාගල නමින් හඳුන්වා ඇති ගම්මානයේ පිහිටි මෙම පුරාවිද්‍යා ස්ථානය ආශ්‍රිතව පිහිටි ගල් තලාවෙහි බටහිර දෙසින්, ගලෙහි කෙටූ අලංකාර පියගැට පෙළකි. ගල මුදුනත නැගෙනහිර දෙසින් විදුම් සළකුණු සහිත ස්ථානයක්, ගල මත ස්වභාවික ගල් කෙමියක් සහ වෙහෙරගලට උතුරින් පිහිටි පර්වතයක් ආශ්‍රිතව ගොඩනැගිලි නටබුන් සහිත ස්මාරකයක් ද දක්නට ලැබේ.

8. කුරුන්දන්කුලම ග්‍රාම නිලධාරී වසම (අංක 50)

**මොට්ටාරම්පතාන ආවාසය**

මොට්ටාරම්පතාන නම් ගමෙහි පිහිටි විහාරස්ථාන භූමියෙහි නැගෙනහිර බටහිර දිශානුගතව විහිදුණු ගල් තලාවක් ආශ්‍රිත ව කේතුකාවාටයක්, ගොඩනැගිලි නටබුන් සහ නව විහාර ගෙය ආශ්‍රිතව කණු පාදම් ගල් දෙකක් ද දක්නට ලැබේ.

9. ගනේදිවුල්වැව ග්‍රාම නිළධාරී වසම(අංක 69)

**වෙහෙරගල පුරාවිද්‍යා ස්ථානය**

වෙහෙරගල නම් ගල් පර්වතය ආශ්‍රිතව පර්වතයේ ඊශාන, දකුණු, නැගෙනහිර දිශාවන්ගෙන් එයට ප්‍රවේශවීම සඳහා ගලෙහි කෙටූ පියගැට පෙළක් දක්නට ඇත. මෙය රජයේ රක්ෂිතයක් ආශ්‍රිතව පිහිටා ඇත. ගොඩනැගිලි සාධක සහිත ස්ථාන, පිහිටි ගලේ කෙටූ කණු පාදම් ගල් සහිත ස්ථාන මෙන් ම දාගැබ් ගොඩැල්ලක් ද වේ. දාගැබ් ගොඩැල්ල වටා උළු, ගඩොල්, සක්කගල් විසිරී තිබෙනු දැකිය හැකි ය. දාගැබ් මධ්‍යයේ අනවසර කැණීම්වලට ලක් වී ඇත.

10. පාළුකඩවල ග්‍රාම නිළධාරී වසම

**වෙහෙරගල පාළුකඩවල විහාරය**

ක්‍රි. පූ 3 වන සියවසේ දේවානම්පියතිස්ස රජ සමයට අයත් ස්ථානයක් බව ජනප්‍රවාදයේ සඳහන් වේ. ඉතා විශාල භූමි ප්‍රදේශයක පැරණි නටබුන් ව්‍යාප්ත ව ඇති මේ විහාරය ප්‍රදේශයේ ඇති වැදගත් ම පුරාවිද්‍යා ස්ථානය වශයෙන් සැලකිය හැකි ය. ගල් තලා ආශ්‍රිත ව නටබුන් ව්‍යාප්ත ව ඇති මෙහි ගලෙහි කෙටූ පියගැට පෙළ තුනක්, කණු පාදම් ගල් සහිත ස්ථාන, හේතුකාවාට, ගඩොල්, උළු සහ සිදුරු සහිත  ගල් පුවරු සහිත ස්ථානයක් ඇතුළු ගොඩනැගිලි සාධක සහිත ස්ථාන, ස්වභාවික ගල් කෙමි, ස්තූප ගොඩැල් 3 ක් පමණ ද, ඇඹරුම් සළකුණු සහිත ස්ථාන, පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ශිලාලේඛන හා පුවරු, පා දෝවන, පැරණි ගල් කටු සහිත ස්ථාන, පොකුණු, කටාරම් සහිත ලෙන් 2ක් ආදිය ද දක්නට ලැබේ. එමෙන් ම කැසිකිළි ගල්, බොරදම් සහිත ගඩොල්, ශිලාමය පුවරු ආදිය විහාර භූමියේ තැනින් තැන විසිර තිබේ.

11. බුල්නෑව ග්‍රාම නිළධාරී වසම(අංක 62)

**බිම් පොකුණ පුරාණ විහාරය**

බිම්පොකුණ ගම්මානය ආශ්‍රිත ව පිහිටි මෙම ස්ථානය අතීතයේ දී බිරි පොකුණ නමින් හඳුන්වා ඇත. විහාර මළුවේ සිට මීටර් 9ක් පමණ දුරින් නැගෙනහිර දිශානුගතව ගල් තලාව ආශ්‍රිත ව

ලෙන් විහාරයකි. එතැන් සිට මීටර් 14ක් පමණ වයඹ දිශානුගතව දිගින් මීටර් 15ක් පමණ වන කටාරම් සහිත ලෙනකි. එම ගල් තලාවෙහි "රජක සුමණ" සහ "පරුමක උත රජයෙ" නමින් සඳහන් වන ශිලාලේඛන දෙකකි. ගල් තලාවේ අන්තයේ දීර්ඝ පර්වත ලිපියක් ද වේ. මෙහි ස්තූපයක නටබුන් සහිත ස්ථානයක් සහ ස්තූප ගොඩැල්ලක් ද දක්නට ලැබෙන අතර මීටර් 60ක් පමණ විශ්කම්භයකින් යුතු බිම් පොකුණ වෘත්තාකාර හැඩය ගනී. විහාරස්ථානය පිහිටි කඳු වැටිය ආශ්‍රිත ව කටාරම් සහිත ලෙන් පහක් පමණ ස්ථානගතව ඇත. එමෙන් ම ගල් කණු, බොරදම් කැටයම් සහිත කුලුනු, කණු පාදම් ගල් ආදිය වර්තමාන විහාර භූමිය අවට විසිර තිබෙනු දක්නට ලැබේ.

**නිල්ලග්ගම බෝධිඝරය**

නිල්ලග්ගම ගම්මානයේ පිහිටි මෙම බෝධිඝරය සම්පූර්ණයෙන් ම ගල් පුවරු භාවිතයෙන් සකස් කොට තිබීම සුවිශේෂිත ය. මළු දෙකකින් සමන්විත මෙහි පහත මළුව දිග පළලින් මීටර් 10.20 x 12.70 ක් ද ඇතුළත දිග පළලින් මීටර් 3.95 ක් ද වන සිවුරැස් මණ්ඩපයකින් යුක්ත ය. මෙම මණ්ඩපය වටා පහත මළුවේ සතර දිශාවට ගල් කණු යොදා පියස්සක් පැවති බව අනුමාන කෙරේ. පහත මළුවට ප්‍රවේශ වීම සඳහා ඉදිරිපසින් හා පිටු පසින් අලංකාර ද්වාර මණ්ඩප දෙකකි. පිටත මාලයේ සිනෙස් පැන්නුම් සහිත ගල් පුවරු කිහිපයක් සහ බ්‍රාහ්මී පුවරු ලිපියකි. අලංකාර ගල් කැටයම් සහිත මෙම බෝධිඝරය ශ්‍රී ලංකාවේ ඇති සුවිශේෂ පුරාවිද්‍යා උරුම ස්ථානයකි.

12. අළුත් හේරත්ගම ග්‍රාම නිළධාරී වසම (අංක 51)

**උපතිස්සාරාම පැරණි විහාරය**

අළුත් හේරත්ගම ගම්මානයේ පිහිටා ඇති මෙය වත්මන් විහාර භූමියේ දකුණු දිශානුගතව ස්ථානගත ව පවතී. එක් පෙළට ගල් කණු 4ක් බැගින් සිටුවන ලද ගල් කණු පේළි 3ක් මත දැව රාමුවක් සහ ඒ මත දැව ලෑලි තට්ටුවක් අතුරා ප්‍රතිමා ගෘහයක් ඉදිකර ඇත. ටැම්පිට විහාර ගෘහය දිග පළලින් මීටර් 4. 80 x 3.20 ප්‍රමාණය ගනී. ප්‍රවේශ ද්වාරයක් දකුණු දිශානුගතව යොදා ඇති මෙය ඉදිරි මණ්ඩපය සහ ගර්භ ගෘහයකින් සමන්විත ය. ගර්භ ගෘහයෙහි ඇති ප්‍රධාන බුද්ධ ප්‍රතිමාව වීරාසන ඉරියව්වෙන් යුත් සමාධි බුද්ධ ප්‍රතිමාවක් වන අතර අභය මුද්‍රාව සහිත හිටි බුද්ධ ප්‍රතිමා දෙකක් සහ නාථ හා විෂ්ණු දේව ප්‍රතිමා ද වේ. 19 වන සියවසේ මුල් කාලයට අයත් ටැම්පිට විහාරයක් බව නිර්මාණාත්මක ලක්ෂණවලින් පැහැදිලි වේ.

**පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගවේෂණය**

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රිතව (පුත්තලම නගරය හැර) ග්‍රාම නිලධාරී වසම් 22ක් පුරා ව්‍යාප්ත ව ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනා ගැනීම සහ වාර්තා ගත කිරීමේ අරමුණ ඇතිව පුත්තලම පුරාවිද්‍යා උප කාර්යාලයේ නිළධාරීන් විසින් මෙම ගවේෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

1. නෙළුම්වැව ග්‍රාම නිලධාරී වසම (අංක 615 සී)

**නෙළුම්වැව**

නෙළුම්වැව ගම්මානයේ මී ඔය අතුරු මාර්ගයේ පිහිටා ඇති මෙම වැව කිලෝමීටර් 8ක් පමණ වපසරියකින් යුතු වැවකි.

**තාමරක්කුලම වැව**

තාමරක්කුලම ගම්මානයෙහි පිහිටි මෙම වැව අක්කර 6ක පමණ වපසරියකින් යුක්ත ය. මෙහි වැව් බැම්ම ආශ්‍රිතව පැරණි ගල් කණු ද දක්නට ලැබේ.

**තාමරක්කුලම ආර්.පී. ඩී. ෂෙල්ටන් නැමැත්තාගේ ඉඩමේ ඇති පුරාවිද්‍යා සාධක**

මෙම පෞද්ගලික ඉඩමේ ගඩොල් කපන ස්ථානයක් ආශ්‍රිතව ගඩොල්, මැටි බඳුන් සහ අනුරාධපුර යුගයට අයත් උළු කැබලි හමුවේ. අනවසර කැණීමකට ලක්ව ඇති මෙම ස්ථානයේ පෙර අවස්ථාවක දී පැරණි කාසි හමු වී ඇත. අනුරාධපුර යුගයට අයත් උළු කැබලි, ගඩොල් සහ ගල් කණු දක්නට ලැබේ.

**මේරි හිල්ඩා මියගේ ඉඩමෙන් හමු වූ පුරාවිද්‍යා සාධක**

ගඩොල් කපන ස්ථානයක් වන මෙහි භූමිය අභ්‍යන්තරයෙන් ගුරුලේත්තු, පහන් වැනි මැටි බඳුන් හමුවිය.

**එම්. පද්මශීලී නැමැත්තියට අයත් ඉඩම**

පුබුදුගම ගම්මානයේ පිහිටි මෙම ඉඩමෙහි දකුණු සීමාව ආශ්‍රිතව කණු පාදම් සහ ගඩොල් කැබලි හමු වන අතර පැරණි චෛත්‍යය ගොඩනැගිලි, ගොඩනැගිලි දෙකක් සහ ගොඩනැගිලි සාධක සහිත ස්ථානයක් දක්නට ලැබේ.

**මොරවැව**

වැව් බැම්ම දිගින් මීටර් 650ක් පමණ වන මෙය අක්කර 72 ක ප්‍රදේශයක ව්‍යාප්ත ව පවතින විශාල ප්‍රමාණයේ වැවකි. මෙම වැවට ආසන්නව කුඹල් ගම්මානයක් පැවැති බවට ජනප්‍රවාදයේ සඳහන් වන අතර වැවෙහි සිට මීටර් දෙසීයක් පමණ දුරින් විශාල ප්‍රදේශයක මැටි බඳුන් කැබලි ව්‍යාප්තියක් දක්නට ලැබේ.

**හස්තිපුර ජෝර්ජ් නැමැත්තාට අයත් ඉඩමේ ඇති නටබුන්**

හස්තිපුර ගම්මානයේ පෞද්ගලික ඉඩමක් ආශ්‍රිතව පැරණි ගල්කණු කිහිපයක් දක්නට ලැබෙන අතර එහි ගල්කටු ලක්ෂණ අනුව ඒවා පොළොන්නරු යුගයට අයත් වේ.

**කේ. කල්‍යාණවතී මියගේ ඉඩමේ නටබුන්**

නෙළුවැව ගම්මානයේ අක්කරයක් පමණ භූමි ප්‍රදේශයක ඕවලාකාර ගල් කටු ලක්ෂණ ගල් කණු, ගඩොල් සහ බොරදම් ගඩොල්, මැටි බඳුන් කැබලි ව්‍යාප්ත ව තිබෙනු දක්නට ලැබිණ.

**මී ඔය වම් ඉවුර ප්‍රදේශය**

පුත්තලම ප්‍රදේශයේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන මී ඔය ආශ්‍රිත ව එහි වම් ඉවුරේ ඉවුර කැඩී ගිය ස්ථානයකින් ටෙරාකොටා මැටි නිර්මාණ විශාල ප්‍රමාණයක් හමුවේ. ඒ අනුව ටෙරාකොටාවලින් නිර්මාණය වූ සතුන්ගේ පාද කොටස් යැයි සැලකිය හැකි සිලින්ඩරාකාර කොටස් මේ අතර වේ.

**හස්තිපුර වැව**

හස්තිපුර වන රක්ෂිතය ආශ්‍රිත අක්කර 10ක පමණ වපසරියකින් යුත් අත්හැර දමන ලද වැවකි.

**උත්තර අට්ටවිල්ලුව රක්ෂිතය ආශ්‍රිත පැරණි වැව්**

අට්ටවිල්ලුව රක්ෂිතය ආශ්‍රිතව අත්හරින ලද වැව් 6ක් පමණ දක්නට ලැබෙන අතර වැවකින් වැවකට ජලය සැපයෙන පරිදි සැකසූ වැව් පද්ධතියක් වශයෙන් මෙය සැලකිය හැකි ය.

2. සෙල්ලකන්ද ග්‍රාම නිලධාරී වසම (අංක 615)

**පාඬිගල පුරාවිද්‍යා ස්ථානය**

මානවේරිය ගම්මානයේ පිහිටි මෙම ස්ථානය පඬිරජ නම් ප්‍රාදේශීය පාලකයෙකුගේ මාලිගය පිහිටි ස්ථානයක් බව ජනප්‍රවාදයේ සඳහන් වේ. 2005 වර්ෂයේ දී මෙම ස්ථානයේ කරන ලද ගවේෂණයට අනුව මෙහි පොකුණක්, පියගැටපෙළක්, ගල් ආසනයක් පැවති බව සඳහන් කර ඇතත් මෙම ගවේෂණය සිදු කරන විට ඒවා බෝර දමා විනාශ කොට තිබුණි. වර්තමානය වන විට ගල්කටු ලක්ෂණ සහිත ස්ථානයක් හා ගඩොල් භාවිතයෙන් තැනූ ගොඩනැගිලි සාධක පමණක් දැකිය හැකි ය.

**කල්කණ්ඩුවේළි වැව**

පාඬිගල පුරාවිද්‍යා ස්ථානයට කිලෝමීටර් 3ක් පමණ දුරින් පිහිටි මෙම පැරණි වැව අක්කර 15ක් පමණ විශාල වූවකි. වළං කැබලිති අවටින් හමුවේ.

**නිලන්ත චන්ද්‍රසිරි නැමැත්තාගේ ඉඩම**

කල්කණ්ඩුවේළි වැවට දකුණින් පිහිටි මෙම පෞද්ගලික ඉඩම පුරා පැරැණි ජනාවාසයක් පැවැති බවට සාධක වශයෙන් වළං කැබලිති හමුවේ.

**කුම්බුට්ටා වැව**

අතීතයේ දී කාලි පොකුණ වශයෙන් හඳුන්වා ඇති මෙම ස්ථානයට නුදුරින් කාලි දේවාලයක් පිහිටා ඇත. පසුකාලීනව මෙම පොකුණ විශාල කොට වැවක් තනා ඇති අතර වැව මධ්‍යයේ වළං කැබලිති හමුවේ.

**මානවේරිය මහවැව**

අක්කර 10ක් පමණ විශාල පැරණි වැවකි.

**පිටඇළ-අතපත්තු වත්ත**

පෞද්ගලික ඉඩමක් වන මෙහි අක්කර 2ක පමණ භූමි ප්‍රදේශයක භූමිය මතුපිට වළං කැබලිති හමුවේ. හමුවන වළං කැබලිතිවල ගැටිය, ඝනකම අනුව විශාල ප්‍රමාණයේ බරණී මෙහි පැවති බව කිව හැකි ය. තැනින් තැන චතුරස්‍රාකාර කළුගල් පුවරු දැකිය හැකි අතර වියළි කාලයේ දී වුව ද "පිටඇළ" නමින් හඳුන්වන ඇළ නොසිඳේ. පූර්ව ඓතිහාසික යුගයේ සාධක මෙහි පැවති බව අනුමාන කළ හැකි ය.

**සෙල්ලකන්දල් වැව**

සෙල්ලකන්දල් ගම්මානයේ පිහිටි මෙම වැව අක්කර 30ක පමණ භූමි ප්‍රදේශයක ව්‍යාප්තව පවතී. මෙයට ආසන්නව ටෙරාකොටා මැටි රූප සහිත ස්ථානයක් පවතී.

සිරම්බිඅඩිය ග්‍රාම නිලධාරී වසම

**ග්‍රාමීය ජල පෝෂණාගාරය පිහිටි ඉඩම**

සින්න නාගවිල්ලුව ගම්මානයේ "ආවනම" නම් ස්ථානයේ පිහිටි ග්‍රාමීය ජල පොම්පාගාරය ආශ්‍රිත ඉඩමේ භූමිය මතුපිට මැටි බඳුන් කැබිලිති විශාල ප්‍රමාණයක් හමුවේ. කළු මැටි බඳුන් හා මෝස්තර සහිත මැටි බඳුන් කැබලි ඒ අතර වේ.

**පාවට්ටාමඩු ව්‍යාපාරය**

මෙම ප්‍රදේශයේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන තබ්බෝව, ඉගිනිමිටිය ජලාශ එක්කොට තැනූ මෙම පාවට්ටාමඩු ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පොම්පාගාරය පිහිටි ස්ථානය වටා පුරාවිද්‍යාත්මක සාධක සහිත ස්මාරක විශාල ප්‍රමාණයක් විසිරී පවතී. සංවර්ධන කටයුතු හේතුවෙන් විනාශ වී ඇත.

**හාසික්ගේ ඉඩම**

සින්නනාගවිල්ලුව ගම්මානයේ පෞද්ගලික ඉඩමක් ආශ්‍රිත ව පුරාවිද්‍යාත්මක සාධක රැසක් දක්නට ලැබේ. වගා කටයුතු හේතුවෙන් මුල් සන්දර්භය වෙනස් වී ඇත. බැකෝ යන්ත්‍ර භාවිතයෙන් ශිලා කුලුනු පාවට්ටාමඩු ජලාශයේ ඉවුරේ ගොඩගසා තිබෙනු දක්නට ලැබිණි. ගල් කණුවල ඇති චතුරස්‍රාකාර ගල් කටු ලක්ෂණවලට අනුව පොළොන්නරු යුගයට අයත් ඉදිකිරීම් මෙහි පැවති බව හඳුනාගත හැකි ය. මෙම ස්ථානයට මීටර් 30ක් පමණ දුරින් පිහිටි පෞද්ගලික ඉඩමක පොකුණු 3ක් පමණ තැනින් තැන දක්නට ලැබේ.

**සාහිර් වත්ත**

නෙල්ලුසේන නම් ගම්මානයේ පිහිටි පෞද්ගලික ඉඩමක් ආශ්‍රිත ව චතුරස්‍රාකාර ගල් කටු ලක්ෂණ සහිත ගල්කණු කිහිපයක්, පැරණි වළං කැබලි, පබළු සහ නටබුන් ගොඩැල්ලක් දක්නට ලැබේ.

**ඔලී නැමැත්තාට අයත් ඉඩම**

සිත්ත නාගවිල්ලුව ගම්මානයේ පෞද්ගලික පොල් වගාකළ ඉඩමක බැකෝ යන්ත්‍ර භාවිතයෙන් පස් පෙරළීම හා අනවසර කැණීමෙන් විනාශ වී ගිය පුරාවිද්‍යාත්මක සාධක රැසක් හඳුනාගත හැකි විය. දාගැබ් ගොඩැල්ලක්, පැරණි දිය මාර්ගයක් හා කැබලි වී ගිය ගල් කණු කොටස් දක්නට ලැබිණි.

**රණසිංහ මියගේ ඉඩම**

සිත්ත නාගවිල්ලුව ගම්මානයේ පෞද්ගලික ඉඩමක පැරණි මුරගලක් කැඩී බිඳී ගිය හිටි බුද්ධ ප්‍රතිමාවක කොටස්, ගඩොල් හා වළං කැබලිති දක්නට ලැබේ.

**ටෝනි නැමැත්තාට අයත් ඉඩම**

අක්කර 5ක් පමණ වන වගා භූමියක් ආශ්‍රිත ව භූමිය මතුපිට රතු මැටි බඳුන් හා විසිතුරු මැටි බඳුන් කැබලි හමුවේ. ශෛලමය වෘත්තාකාර පියන් විශේෂයක් සහ පැරණි කාසි ද හමු විය.

**ඩෙන්සිල් නැමැත්තාට අයත් ඉඩම**

අක්කර 8 ක් පමණ වන මෙම පෞද්ගලික ඉඩම ආශ්‍රිත ව පැරණි වළං කැබලිති හා කෙම් කොටස් බහුල ව හමුවේ. බැකෝ කිරීම නිසා පැරැණි ගඩොල්, ගල් කුට්ටි භූමිය මතුපිට හමුවේ. පැරණි උෟරා කැට ළිඳක් පැවති ස්ථානයකි.

**ලංකා අබේනායකට අයත් ඉඩම**

සිත්තනාගවිල්ලුව ගම්මානයේ අක්කර 25ක් පමණ වන ඉඩමක් ආශ්‍රිත ව පැරණි වළං කැබලිති හා ගල් තලාවක් ආශ්‍රිත ව පැරණි නිවසකට අයත් සාධක දක්නට ලැබේ.

**සිරිවිල්ලිය වැව**

අක්කර 25ක් 30ක් පමණ වන වැව් බැම්ම කැඩී ගිය පැරණි වැවකි.

**තිල්අඩිය පැරණි ළිඳ**

ආනපුලුත්තුව ග්‍රාමයේ විෂ්කම්භය මීටර් 8ක් පමණ වූ යටත් විජිත සමයේ ගඩොලින් බැඳ ඉදිකරන ලද ළිඳකි.

**කිරිවැව**

තිල්අඩිය ගම්මානයේ පිහිටි අක්කර 2ක පමණ වපසරියකින් යුත් ඉඩමකි .

**තිල්අඩිය වැව**

ප්‍රතිසංස්කරණ කරන ලද පැරණි වැවකි.

**නින්දෙණිය වැව**

කුඩා ප්‍රමාණයේ ගම් වැවකි.

**ආරච්චිවිල්ලුව වැව**

තිල්අඩිය ගම්මානයේ නයින මරික්කාර් නැමැත්තාට අයත් ඉඩමක පිහිටි කුඩා ප්‍රමාණයේ වැවකි.

**පැරණි ළිඳ**

ආරච්චිවිල්ලුව ගම්මානයේ මරික්කාර් නැමැත්තාට අයත් ඉඩමක බ්‍රිතාන්‍ය යුගයේ ගඩොල් භාවිතයෙන් ඉදිකරන ලද පැරණි ළිඳකි.

3. රත්මල්යාය ග්‍රාම නිලධාරී වසම

**පෙරියකුලම වැව**

පෙරියකුලම ගම්මානයේ පිහිටි මෙම වැව පැරණි කුඩා ගම් වැවකි.

**පාන්කුලම වැව**

පාන්කුලම ගමේ පිහිටි පැරණි කුඩා ගම් වැවකි. අවටින් යබොර කැබලි හමුවේ.

4. කල්අඩිය ග්‍රාම නිලධාරි වසම

**මුනියණ්ඩි ගල්වල**

කල්අඩිය ගම්මානයේ පිහිටි කුවේණිය දිය නෑ පොකුණ මෙය බව ජනප්‍රවාදයේ සඳහන් වේ. මෙයට උතුරු දෙසින් පැරණි පනා බැම්මකි.

**පත්තිනි දේවාලය**

කුවේණි හන්දිය නමින් හඳුන්වන ස්ථානයේ පිහිටි මෙය වසර 100කට වඩා පැරණි දේවාලයකි. වර්තමානය වන විට නවීකරණය කර ඇත.

**දික් වැව**

කල්ලඩිය 6 කණුව නම් ප්‍රදේශයේ පිහිටි අක්කර 10ක් පමණ විශාල ගම් වැවකි.

පොත්තුවිල්ලුව ග්‍රාම නිලධාරී වසම (607 ඩී)

**පොත්තුවිල්ලුව තිස්ස රජමහා විහාරය**

පොත්තුවිල්ලුව ගම්මානයේ පිහිටි මෙම විහාරස්ථානය දුටුගැමුණු රජු විසින් කරවන ලද්දක් බව ජනප්‍රවාදයේ සඳහන් වේ. මෙහි පැවති කුඩා ප්‍රමාණයේ දාගැබ කඩා ඉවත් කර ඇති අතර එයට අයත් ගඩොල්, විහාර භූමියේ ගොඩනගා තිබෙනු දක්නට ලැබිණි. විහාර භූමියේ පැරණි උළු කැබලි හා කැඩී ගිය ගල් කණු කොටස් ද දක්නට ලැබේ. මෙම විහාරස්ථානයට මීටර් 500ක් පමණ දුරින් අක්කර 20ක පමණ වපසරියකින් යුත් පොත්තුවිල්ලුව වැව පිහිටා ඇති අතර එය ද දුටුගැමුණු රජ සමයේ ඉදි කරන ලද්දක් බව ජනප්‍රවාදයේ සඳහන් ය.

5. මධ්‍යම අට්ටවිල්ලුව ග්‍රාම නිලධාරී වසම (607 බී)

**ජයම්පති වැව**

අතීතයේ රත්මල් අගාර වැව නමින් හඳුන්වා ඇති මෙම වැව පසුකාලීනව ප්‍රතිසංස්කරණය කරන ලද්දකි. අක්කර 10ක් පමණ විශාල මෙම වැව අවට පැරණි වළං කැබලි සහ ගඩොල් කොටස් හමුවේ.

**අට්ටවිල්ලුව විද්‍යාලය**

මුල් සන්දර්භය හඳුනා නොගත් පැරණි ජනාවාසයකට අයත් ටෙරාකොටා මැටි රූප සහ මැටි කළ කීපයක් මෙම පාසලෙහි දක්නට ලැබේ.

**තිස්ස නැමැත්තාට අයත් ඉඩමේ ඇති පුරාසාධක**

අට්ටවිල්ලුව ගම්මානයේ පෞද්ගලික ඉඩමක පැරණි මැටි බඳුන් කැබලි රැසක් හමුවේ.

6. සේනකුඩිරුප්පුව ග්‍රාම නිලධාරී වසම (616)

**කුවේණි විල්ලුව**

සේනකුඩිරුප්පුව ගම්මානයේ පිහිටි මෙම වැව මහවිල්ලුව, පෙරියකුලම නමින් ද හැඳින්වේ. කුවේණිය හා විජය රජු දිය නෑ පොකුණ මෙය බව ජනප්‍රවාදයේ සඳහන් ය. තබ්බෝව වැවේ සිට ඇළ මාර්ගයකින් මෙම වැවට ජලය සැපයේ.

**පත්තිනි දේවාලය**

කුවේණිය විසූ සමයට අයත් යැයි සැලකෙන මෙම දේවාලයේ පවතින ඉදිකිරීම් වසර 200ක් පමණ පැරණි ය.

**රදාවිල්ලුව**

සිත්තවිල්ලුව නමින් ද හැඳින්වෙන මෙය රදා කුලයට වෙන්කර තිබූ පැරණි වැවකි.

**ශාන්ත මරියා දේවස්ථානය**

සේනකුඩිරුප්පුව ගම්මානයේ පිහිටි මෙම දේවස්ථානය වර්ෂ 1838 දී බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉදි කරන ලද්දකි. මහනුවර රාජධානියේ රජකළ කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද මෙම දේවස්ථානයට පැමිණි බව ජනප්‍රවාදයේ සඳහන් ය. දිගින් මීටර් 26.80 ක් ද පළලින් මීටර 17ක් ද වන මෙම ගොඩනැගිල්ල නැගෙනහිර දෙසට මුහුණලා ඉදිකර ඇත. ඉදිරිපස කොටසකින්, මධ්‍ය ශාලාවකින් සහ අල්තාරයකින් සමන්විත ය. යටත් විජිත යුගයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලින් සමන්විත මෙම දේවස්ථානයට වඩා පූජක නිල නිවසෙහි පැරණි ලක්ෂණ තවදුරටත් ආරක්ෂා වී පවතී.

**තුලාන් මොහොමඩ් නැමැත්තාට අයත් නිවස**

මෙම පෞද්ගලික නිවස යටත් විජිත යුගයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණවලින් සමන්විත ය. දිග පළලින් මීටර් 17.4 X 10.80 පමණ මෙය උස් වේදිකාවක් මත ඉදිකරවන ලද්දක් වන අතර දෙපල වහල මත සිංහල උළු සෙවිලි කරන ලද්දකි.

7. පුත්තලම නැගෙනහිර ග්‍රාම නිළධාරි වසම (617බී)

**සෙම්බුකුලම වැව**

අක්කර 4ක් පමණ වපසරියකින් යුත් පැරණි වැවකි.

**නෙලුම්කුලම වැව**

නෙලුම්කුලම ගම්මානයේ පිහිටි මෙම වැව අක්කර 10ක් පමණ විශාල වැවකි.

සීතා එළිය වැව<br>සෙව්වන්දළුව වැව } කුඩා ප්‍රමාණයේ පැරණි ගම් වැව් වේ

8. තම්මැන්නාගම ග්‍රාම නිලධාරී වසම (615 බී)

**මධුරගම වැව**

මධුරගම ගම්මානයේ පිහිටි මෙම වැව කුඩා ප්‍රමාණයේ ගම් වැවකි.

**යපස් සහිත ස්ථානය**

මධුරගම සිට සිමෙන්ති ගම දක්වා දිවෙන මාර්ගයේ යපස් කුට්ටි වශයෙන් විසිරී තිබෙනු දක්නට ලැබේ. මෙම ස්ථානය ආශ්‍රිතව පැවති පැරණි වැවකට අයත් සාධක සහ ඊට සම්බන්ධව පැවැති ඇළ මාර්ග දෙකක් ද දක්නට ලැබේ.

9. උත්තර අට්ටවිල්ලුව ග්‍රාම නිලධාරී වසම (607 ඩී)

**සුනිල් ශාන්ත නැමැත්තාට අයත් ඉඩමෙහි පිහිටි පුරාසාධක**

අට්ටවිල්ලුව ගම්මානයේ පිහිටි මෙම පෞද්ගලික ඉඩම අශ්‍රිතව  කැඩී බිඳී ගිය ගල්කණු සාධක රැසක් තැනින් තැන විසිර තිබේ.

10. පාලවිය ග්‍රාම නිලධාරී වසම

කුරුවිකුළම වැව ගම්මානයෙහි පිහිටි මෙම වැව අක්කර 10ක් පමණ වපසරියකින් යුත් ගම් වැවකි.

**මැල්වත්ත වැව**

ගවුස්වත්ත නම් ඉඩමෙහි පිහිටි මෙම වැව පුද්ගලික වැවකි. මෙයට ආසන්නව යටත් විජිත යුගයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණයන්ගෙන් යුත් කඩා බිඳ දමන ලද පැරණි නිවසක් හා එයට අයත් ප්‍රාකාරයක සාධක දක්නට ලැබේ.

**වන්නම් කුලම වැව**

පාලවිය මංසන්ධියට නුදුරුව පිහිටි මෙම වැව අක්කර 20ක් පමණ වපසරියකින් යුත් ගම් වැවකි.

**පාරු ඇළ**

යටත් විජිත පාලන සමයේ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අරමුණින් ග්‍රාවින් හැමිල්ටන් නම් ඉංජිනේරුවරයා විසින් පැරණි ඕලන්ද ඇළ විධිමත් කොට සාදන ලද අතර එය හැමිල්ටන් ඇළ නමින් නම් කරන ලදී. පුත්තලම සිට කැලණි ගං මෝය දක්වා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඉදිකළ මෙහි ආරම්භක ස්ථානය පිහිටා ඇත්තේ පාලවිය නගරයේ කල්පිටිය කලපුව ආශ්‍රිතව ය.

**පාලවිය ගුවන් හමුදා කඳවුර**

දෙවන ලෝක සංග්‍රාම සමයේ දී ඉංජිනේරු පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් මුලින් පවත්වාගෙන යන ලද  පසුව රාජකීය නාවික හමුදාව යටතේ පාලනය වූ මෙම ස්ථානය යුධ කටයුතුවල දී ගුවන් යානා නැව් කරා ගොඩබැස්සවීම සඳහා ඉදිකරන ලද කෙටි ගුවන් පථවලින් සැදුම්ලත් ස්ථානයකි. පසු කාලීනව මෙය ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පාලනයට නතු කරගන්නා ලදී. මෙහි දී ගුවන් යානා නැව් කරා රැගෙන ගොස් ඇත්තේ පුත්තලම ප්‍රදේශයේ ඇතුන් විසිනි. එම යුගයට අයත් පැරණි ඉදිකිරීම් හා ගුවන් පථ මෙම ස්ථානයේ දැක ගත හැකි ය.

**ශ්‍රී දිව්‍ය හෘදය දේවස්ථානය**

පාලවිය නගරයේ පිහිටි වසර 120ක් පමණ පැරණි මෙම දේවස්ථානය ඉංග්‍රීසි පාලන සමයේ දී ඉදි කරන ලද්දකි.

11. මනතිව් ග්‍රාම නිලධාරී වසම (616)

**ශාන්ත අන්තෝනි දේවස්ථානය**

මනතිව් ග්‍රාමයේ පිහිටි වසර 100කට වඩා පැරණි යටත් විජිත වාස්තුවිද්‍යාත්මක ලක්ෂණයන්ගෙන් යුත් මෙම දේවස්ථානය ආලින්දය, මධ්‍ය ශාලාව හා අල්තාරය යන අංගයන්ගෙන් සමන්විත ය. මෙහි පිටත පෙනුම නවීකරණයට ලක් ව ඇති අතර ගොඩනැගිල්ල අභ්‍යන්තරයේ  පැරණි ලක්ෂණ හඳුනා ගත හැකි ය.

**විලුක වැව**

විලුක ගම්මානයේ පිහිටි මෙම වැව අක්කර 25 ක් පමණ වපසරියකින් යුක්ත ය. වැව අවට පැරණි ජනාවාස පැවති බවට සාධක වශයෙන් මැටි බඳුන් කැබලි බහුල ව හමුවේ.

**විලුක බොරළු කන්ද**

විලුක ගම්මානයේ පිහිටි උසම ස්ථානය වන මෙහි පැරණි වළං කැබලි සහ ගඩොල් කොටස් බහුල ව හමුවේ.

**පෙරියඉලංගෙයි වැව**

අක්කර 30 ක පමණ වපසරියකින් යුත් පැරණි වැවකි.

**උඩයාවලි වැව**

මන්නතිව් ග්‍රාමයේ පිහිටි මෙම වැව අක්කර 25 ක පමණ වපසරියකින් යුක්ත ය.

**සෙට්ටිකුලම වැව**

අක්කර 20ක පමණ වපසරියකින් යුත් මෙම වැව සෙට්ටින් විසින් ඉදි කරන ලද්දකි.

**විලුක බොරළු වළ**

විලුක ගම්මානයේ පිහිටි මෙම ස්ථානය මයෝසීන භූ නිර්මාණ අවධියේ සිදු වූ දේශගුණික විපර්යාසවලට අනුව ඉරණමඩු සංයුතිය හා සමාන පාෂාණ සැකසුමක් දක්නට ලැබෙන ස්ථානයකි.

**යුධ පුහුණු මධ්‍යස්ථානය**

දෙවන ලෝක සංග්‍රාම සමයේ දී බෝම්බවලින් ආරක්ෂා වීම සඳහා තැනූ භූගත ඉදිකිරීම් හා කුඩා ගුවන් පථවලින් සමන්විත ස්ථානයක් මන්තිව් ගම්මානය ආශ්‍රිත ව පිහිටා ඇත.

**සිරම්බිඅඩිය ගම්මානය**

කැෆර් ගෝත්‍රිකයන් පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක් ද මෙම ගවේෂණයෙන් සිදු කරන ලදී. පුත්තලම සෙල්ලකන්දල් ගම්මානයේ ජීවත්වන කාපිරි ජනතාව පදනම් කරගෙන ඔවුන්ගේ ආගමනය, ආර්ථික හා සමාජ සංස්කෘතික පසුබිම, භාෂාව, මංජා ගායන ශෛලිය, නර්තනාංග පිළිබඳ ව මෙම අධ්‍යයනය සිදු කර ඇත.

දීර්ඝ ඓතිහාසික සංසිද්ධි සටහන් වී ඇති පුරාවිද්‍යා සාධක සහිත පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පුරා විසිරී ඇති පුරාවිද්‍යා ස්ථාන වාර්තා ගත කර තැබීම මෙම ගවේෂණයෙන් සිදු වූ ප්‍රධාන කාර්යයකි. ඒ අනුව පුරාවිද්‍යා ස්ථාන විශාල ප්‍රමාණයක් හඳුනාගෙන වාර්තා ගත කර අවසන් වාර්තාව ලබා දී ඇත. ඉතා අඩු අවධානයක් යොමුව පැවති මෙම ප්‍රදේශයේ විවිධ යුගවල දී වරින්වර සිදු වූ ඓතිහාසික සිදුවීම් පුරාවිද්‍යා ස්ථාන හා දැඩි සේ බැඳී පැවති බව ද හඳුනා ගන්නා ලදී.

## ඌව පළාත

**දෙමටමල් විහාරය ගවේෂණය**

දෙමටමල් විහාරය ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔක්කම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ, ඔක්කම්පිටිය ගමේ පිහිටි පැරණි විහාර ස්ථානයකි.

වැල්ලවාය - මොණරාගල මාර්ගයේ බුත්තල නගරයෙන් දකුණට ඇති නියදැල්ල - ඔක්කම්පිටිය මාර්ගයේ කිලෝමීටර් 6ක් පමණ ගමන් කිරීමේ දී මෙම ස්ථානයට ළඟා විය හැකි ය. එමෙන් ම වැල්ලවාය - මොණරාගල මාර්ගයේ කුඹුක්කන හන්දියෙන් වූ ඔක්කම්පිටිය මාර්ගයේ කිලෝමීටර් 08ක් ගියවිට දකුණු දෙසට වූ බුත්තල මාර්ගයේ කිලෝමීටරයක් ගමන් කිරීමෙන් ද මෙම ස්ථානයට ළඟා විය හැකි ය.

කුඹුක්කන ඔය වම් ඉවුරේ ස්ථානගත දෙමටමල් විහාරය මීමින්නා කන්ද, උළුගොඩ කන්ද, පෙට්ටියන්ගල යන කඳුවැටිවලින් වට වී ඇත. මෙම කඳුවලින් වට වූ තැනි භූමියේ හෙළගම පාසල් මාර්ගය ද නැගෙනහිරින් බුත්තල - ඔක්කම්පිටිය මාර්ගය ද දකුණු දෙසින් කුඹුරු යායෙන් ද බටහිර දෙසින් බදයාය මාර්ගයෙන් සීමාවන දෙමටමල් වෙහෙර බිම පිහිටා ඇත.

ලිඛිත මූලාශ්‍රය මෙන් ම පුරාවිද්‍යාත්මක සහ ජනප්‍රවාදගත තොරතුරු අනුසාරයෙන් දෙමටමල් විහාර භූමියේ ඓතිහාසිකත්වය පිළිබඳ යම් අවබෝධයක් ලබාගැනීමට පුළුවන. වංසකතාගත තොරතුරුවලට අනුව ක්‍රිස්තුපූර්ව 2 වන ශත වර්ෂයේ අවසන් භාගයේ රුහුණේ පාලකයා වූ කාවන්තිස්ස රජු දෙමටමල් නමින් විහාරයක් කර වූ බවත් සඳහන් වේ. මෙම තොරතුරුවලට අනුව සී. ඩබ්ලිව් නිකලස්ගේ අදහස වන්නේ කාවන්තිස්ස රජු කර වූ දෙමටමල් විහාරයත් ගම්ඨාවාලිය විහාරයත් එක ම ස්ථානයක් බවයි. මෙයට අමතර ව චූල වංශයේ මහා පරාක්‍රමබාහු රජතුමාගේ අවධියේ ඔහුගේ රුහුණේ යුධ ව්‍යාපාරවල දී දෙමටමල් නැමැති ස්ථානයක සටන් කළ බවත් දක්වා ඇත. මෙම ස්ථානය ද දෙමටමල් විහාරය පිහිටි ප්‍රදේශය විය හැකි බව වියතුන්ගේ අදහසයි. ලේඛනගත එම තොරතුරුවලට අමතර ව ජනකථාවලින් පැවතෙන ඉතිහාසයක් ද මෙම ස්ථානය සතුව පවතියි. ඒ අනුව දුටුගැමුණු සද්ධාතිස්ස දෙසොහොයුරන් අතර ගැටුමේ දී තිස්ස කුමරු පරාජය වී දිවි ගලවා ගනු ලැබුයේ මෙම විහාරයේ නායක හිමියන්ගේ රැකවල ලැබීමෙනි. එසේ ම මෙම දෙසොහොයුරන් සමගි කරවන ලද්දේ ද මෙම විහාරයේ වැඩවිසූ හිමියන් විසින් බව සැලකේ.

විහාර භූමියේ ඇති පුරාවස්තු සහ පුරාවිද්‍යා ස්මාරක ලේඛනගත කිරීම, ඡායාරූප ගතකිරීම සහ සැලසුම් ඇඳීම මඟින් ස්මාරක තොරතුරු වාර්තාකිරීම, නිරන්තර සංවර්ධන කාර්යයන්ට ලක්වන භූමියක් බැවින් විහාර භූමියේ ස්මාරකවල ආරක්ෂාව සඳහා නව ඉදිකිරීම් යෝජනාවලියක් සකස් කිරීම, නියමු සැලසුම සකස් කිරීම, පුරාවස්තු සහ ස්මාරකවල හානිකාරක හඳුනා ගැනීම සහ ඒ සඳහා යෝජනාවලිය සම්පාදනය යන අරමුණු ඔස්සේ මෙම ගවේෂණය ක්‍රියාත්මක කරන ලදී. මෙම විහාරස්ථානයේ පූජනීය අංගනය හෙවත් මැදමාලකය තුළ ස්තූපය බෝධිසරය, ප්‍රතිමාඝරය සහ උපෝසථඝරය යන පූජනීය අංග ස්ථානගතව ඇත.

මෙහි පිටත මාලකය හෙවත් පූජනීය අංගනය වටා නේවාසික ආරාම සංකීර්ණය පිහිටා ඇත. ශේෂිත සාධක අනුව ආරාම වශයෙන් සැලකිය හැකි නටබුන් සාධක සහිත ස්ථාන 11 ක් ගවේෂණයේ දී වාර්තාගත කරන ලදී. ඒ අනුව විශාල භූමි ප්‍රදේශයක විහිදුණු ආරාම සංකීර්ණයක් දෙමටමල් විහාරය මූලික කොට ගෙන පැවති බව හඳුනාගත හැකි ය. ආරාම සංකීර්ණයේ නිරිත දිශානුගතව පිහිටි ගොඩනැගිල්ලේ නාගරාජ හා රාජිනී නිරූපිත දුර්ලභ

ගණයේ මුරගලක් දක්නට ලැබේ. ස්ඵටික හුණුගලින් නිර්මිත මෙම නේවාසික සංඝාරාම හා එහි බැම් බොහොමයක් සංරක්ෂණය කරන ලද ඒවා ය. ආරාම භූමිය වටා ජල මාර්ගයක් විහිදී යන අතර මෙය අනුරාධපුර යුගයේ භාවිත පබ්බතාරාම සංකීර්ණයක් වශයෙන් නිර්මාණය වූවක් වියහැකි බවට තොරතුරු මෙම ගවේෂණයෙන් අනාවරණය කර ගත හැකි ය.

ගවේෂණයේ අරමුණුවලට අනුව විහාර භූමිය ක්‍රමවත්ව නඩත්තුකොට පවත්වා ගැනීම, අක්‍රමවත් සංරක්ෂණ ඇති තැන් නැවත සංරක්ෂණය කිරීම, කුණුකසල කළමනාකරණය සම්බන්ධයෙන් සිදුකරන යෝජනා, අනවසර අක්‍රමවත් ඉදිකිරීම් නවතා දැමීම වැනි ක්‍රියාමාර්ග සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී.

ඇතුළු මළුව නැත්හොත් පූජනීය අංගනයේ ඊසාන දිශානුගතව ස්තූපය පිහිටා ඇත. මීටර් 2.30 උස වේදිකාවක් මත ඉදිකර ඇති මෙය සංරක්ෂිත ස්තූපයකි. ඒ වටා ප්‍රාකාර බැම්මකි. ස්තූපය හා ප්‍රාකාර බැම්ම ඇතුළත වැලි මළුවකි. ස්තූපයේ ප්‍රවේශ දොරටුව බටහිර දෙසින් පිහිටන අතර ම ස්තූප මළුව මීටර් 30×30 ප්‍රමාණයේ සම හතරැස් හැඩයකින් යුතුය. පියගැට පෙල දිගින් මීටර් 4.80 කි. පියගැටයක් සෙන්ටිමීටර් 30 කි. සංරක්ෂිත ස්තූපයේ විෂ්කම්භය මීටර් 16.95 ක් වේ. මෙය වටා මල් ආසන 4 කි. ඒවා ගලින් ඉදිකර ඇත. ගඩොලින් සංරක්ෂිත ස්තූපයේ මතුපිට බදාම ආලේප නොකර ගඩොල් නිරාවරණය වන පරිදි සංරක්ෂණය කර තිබේ. ස්තූප ගර්භයේ ස්ථාන කීපයක පිපිරීම් සටහන් හඳුනාගත හැකි අතර ම ගඩොල් මත පැළවෙන ශාක ඉවත්කිරීම තුළින් සංරක්ෂිත ස්තූපයේ ආරක්ෂාව පවත්වාගෙන යාම වැදගත් වේ.

ස්තූපයේ සිට මීටර් 46 ක් දුරින් නිරිත දෙසට වන්නට ප්‍රතිමා ගෘහය පිහිටා ඇත. පැරණි ඉදිකිරීම මත සිදුකළ ප්‍රතිසංස්කරණයක් ලෙස මෙය සැලකිය හැකි ය. ගොඩනැගිල්ලේ දිග මීටර් 21.51 ක් ද පළල මීටර් 15.40 ක් ද වේ. මෙහි ප්‍රවේශ දොරටුව නැගෙනහිර දිශාවට වන්නට පිහිටුවා ඇත. ඇතුළත සිමෙන්ති ඉදිකිරීම් දක්නට ලැබේ. මෙහි දොරටුවේ මකර රූපය සහිත කොටස් දෙකකි. අන්තරාලය සහ ගර්භගෘහය සහිත වූ මෙම විහාරයේ නිර්මාණාත්මක ලක්ෂණ අනුව බොහෝවිට ගන්ධකුටි සම්ප්‍රදායේ විහාරයක් විය හැකි ය. උතුර දෙසින් ද ප්‍රවේශ දොරටුවකි. දෙපස මුරගල් කලාත්මක බවින් අගනා කැටයම් සහිත ය. ක්‍රිස්ටලයින් පාෂාණයෙන් නිර්මාණය කර ඇත. ප්‍රධාන ප්‍රවේශයේ බොහොමයක් කොටස් නව ඉදිකිරීම් වන අතර ඇතුළත බුද්ධ ප්‍රතිමාවක කොටසක් සහ සිතුවම් වේ. විහාර ගෘහයේ සිට වයඹ දිශාවට වන්නට මීටර් 32.50 ක් දුරින් මෙම පිහිටා ඇත. බෝධිඝරයේ ඇතුළත හා පිටත ප්‍රාකාර දෙකකි. පිටත ප්‍රාකාරය දිගින් මීටර් 12.70 ක් ද පළලින් මීටර් 12.40 ක් ද වේ. ප්‍රාකාර බැම්මේ පළල සෙන්ටිමීටර් 85 කි. ඇතුළත ප්‍රාකාරය දිගින් මීටර් 9.60 ක් ද පළල 5.50 ක් ද වේ. මෙහි පිටගැට පෙළ උතුරු දිශානුගතව පිහිටුවා ඇති අතර එහි පළල මීටර් 150 ක් වේ. බෝධිඝරය ආශ්‍රිතව සිදුකරන ලද කැණීම්වලදී මැටි බඳුන් සහ ලෝහ ප්‍රතිමා කීපයක් හමු වී ඇත.

**යුධගනාව ගවේෂණය**

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යුධගනාව ග්‍රාම නිලධාරී වසමේ යුධගනාව ග්‍රාමයේ මෙම ස්ථානය පිහිටා ඇත. උතුරු අක්ෂාංශ 06.77110°N හා නැගෙනහිර දේශාංශ 081.23653°E අතර කලාපය තුළ වේ.

බදුල්ල, වැල්ලවාය පසුකර බුත්තල දක්වා ගමන් කිරීමේ දී හමුවන යුධගනාව හන්දියෙන් වම්පසට ඇති මාර්ගයේ කිලෝමීටර් 2 ක් පමණ ගමන් කිරිමෙන් මෙම ස්ථානයට පිවිසිය හැකි ය.

උතුරින් පුහුල්ගල කඳුවැටියෙන් ද නැගෙනහිර දෙසින් මැණික් ගංගාවෙන් ද දකුණු දෙසින් බුත්තල නගරයෙන් ද බටහිර දිශාවෙන් යුධගනාව වැවෙන් ද මායිම් වු භූමියක යුධගනාව පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ පැරණි බෙදීම් අනුව රුහුණු, මායා, පිහිටි වශයෙන් ත්‍රී සිංහලය බෙදා දක්වා තිබුණි. මේ අතරින් රුහුණු හා පිහිටි රට අතර ඉතාමත් දෘඩි සම්බන්ධයක් තිබු බව ජනප්‍රවාද හා වංස කතාවලින් ලැබුණු තොරතුරු අනුව පැහැදිලි වේ. ඓතිහාසික කරුණු විමසා බැලීමේ දී "විසිදහස් රට" යනුවෙන් හඳුන්වා ඇත්තේ ඌව පළාතයි.

මෙම ප්‍රදේශය ඉහළ ඌව අට දහස් රට යනුවෙන් ද, පහළ ඌව දොළොස්දහස් රට යනුවෙන් ද හඳුන්වා ඇති අතර, එය "වෙල්ලස්ස'' යනුවෙන් ව්‍යවහාර කරනු ලැබීය.

අතීතයේ දී රුහුණු රට හා පිහිටි රට අතර ප්‍රධාන ගමන් මාර්ගය වැටී ඇත්තේ මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල, මැදගම, බිබිල කේන්ද්‍ර කරගෙන බව වංසකතා හා ජනප්‍රවාදයන්හි සඳහන් වේ. ඊට අමතර ව දෙරට අතර ආගමික හා දේශපාලන සබඳතා පැවති බවත්, දුටුගැමුණු, සද්ධාතිස්ස සොහොයුරන්ගේ සටනේ යුධ මධ්‍යස්ථානයක් බවටත් ජනප්‍රවාද හා වංසකතා මුලාශ්‍රයවල සඳහන් වේ.

කාවන්තිස්ස රජුගේ ඇවෑමෙන් හිස් වූ රජකම වෙනුවෙන් දුටුගැමුණු කුමරු හා සද්ධාතිස්ස කුමරු අතර සටනක් මේ ස්ථානයේ දී සිදු වූ බව ජනප්‍රවාද හා මූලාශ්‍රවල දැක්වේ. පළමුවර දුටුගැමුණු රජු පසුබෑමට ලක් වූ අතර දෙවනවර මාගම සිට සේනාව සංවිධානය කර මේ ස්ථානයේ දී ජයග්‍රහණය කර ඇත. එකී ජයග්‍රහණයේ සංකේතයක් ලෙස යුධ අංගනයක්ව පැවති මෙම ස්ථානයේ දාගැබක් ඉදිකරන ලෙස සද්ධාතිස්ස කුමරුට භාරදුන් අතර, ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ද භාරදුන් බව සඳහන් වේ.

මෙම කරුණු අනුව මාගම (රුහුණු රට) සිට පිහිටි රටට ගමන් කරන පැරණි මාර්ගයේ එක් සංධිස්ථානයක් ලෙස "ගුත්තහාල'' හෙවත් බුත්තල ඓතිහාසික ලෙස වැදගත්කමකින් යුක්ත වේ. රුහුණු හා රජරට සම්බන්ධ කළ මෙම මාර්ගය අයත් ප්‍රදේශය එකල ඉතාමත් වැදගත් හා දියුණු ප්‍රදේශ වශයෙන් පැවති බව මෙම කරුණු මගින් පැහැදිලි වේ.

දාගැබ සම්බන්ධව ඇති දෙවන මතය වන්නේ ක්‍රි. ව. 1153 - 1186 අතර කාල වකවානුවේ දී රජකම් කළ මහා පරාක්‍රමබාහු රජුගේ මැණියන් වූ රත්නාවලී බිසවගේ ආදාහන කටයුතු මෙම ස්ථානයේ සිදුකර එයට ගෞරවයක් වශයෙන් මෙම දාගැබ ඉදිකළ බවයි.

මෙහි ඇති විහාරගෘහය ඇතුළත සිතුවම් මහනුවර යුගයේ නිර්මාණාත්මක ලක්ෂණ නිරූපනය කරන අතර ගොඩනැගිලි අවශේෂ, ශිලාලේඛන අනුව අනුරාධපුර යුගයන් නිරූපනය කරයි. සමස්ථයක් වශයෙන් ගත්කළ මෙම ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක දත්ත අනුසාරයෙන් යුධගනාව රජමහා විහාරය අනුරාධපුර යුගය හා මහනුවර යුගය නියෝජනය කරන පුරාවිද්‍යා භූමියක් බව හඳුනාගත හැකි ය.

2011 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ සහ අනුමැතිය ලබාදුන් යුධගනාව ක්ෂේත්‍ර ගවේෂණ කාර්යය 2011.06.13 දින දක්වා දින 4 ක් පුරා සිදු කරන ලදී.

ස්මාරකවල පැවැත්ම හා එහි හානිදායක තත්වය හඳුනාගැනීම, භූමිය ආශ්‍රිතව සිදුවන සීඝ්‍ර සංවර්ධනය නිසා එහි නියමු සැලසුමක් සකස් කිරීම, ස්මාරකයේ දැනට පවතින තත්වය වාර්තා කිරීම, මෙම ස්ථාන ආශ්‍රිත ව ඡායාරූප ගොනුවක් හා සැලසුම් ගොනුවක් සකස් කිරීම යන අරමුණින් ගවේෂණය ක්‍රියාත්මක කරන ලදී.

මෙම භූමිය චූලාංගනිය නටබුන් ආශ්‍රිත භූමිය හා යුධගනාව දාගැබ ආශ්‍රිත භූමිය යනුවෙන් කොටස් දෙකක් වශයෙන් භූමිය වෙන්කොට ක්‍රමානුකූලව වාර්තා කරන ලදී.

**චූලාංගනිය නටබුන්**

පැරණි නටබුන් ගොඩනැගිලි අවශේෂවලින් සමන්විත වන මෙය පසුකාලීනව සංරක්ෂණයට භාජනය වූ ඉදිකිරීම් ඇති විහාර භූමියකි. මෙම ගල්කණු සහිත ගොඩනැගිලි නටබුන් දෙකක් ද පිළිමගෙයි නටබුන් ද, බෝධිඝරයක් හා ස්තූප ගොඩැල්ලක් ද ඇති අතර මේවා ආවරණය වන පරිද්දෙන් වට ප්‍රාකාරයක් නිර්මාණය කර ඇත. මෙය සංරක්ෂණය කරන ලද්දකි.

**පිට ප්‍රාකාරය**

මෙම ප්‍රාකාරය 1992 වර්ෂයේ සංරක්ෂණය කර ඇත. මෙය දකුණුපස දිග මීටර් 40 ක් ද පළල සෙන්ටිමීටර් 40 ක් ද උස සෙන්ටිමීටර් 30 ක් ද වේ. බටහිර දිශාවට වන්නට විවිධ ප්‍රමාණයේ ගල්කණු කොටස් 17 ක් පමණ දක්නට ලැබේ.

බටහිර දිශාවෙන් මෙහි දිග මීටර් 41 ක් වේ. පළල සෙන්ටිමීටර් 40 කි. දකුණු බැම්ම කොටස් කීපයකි. එයට සම්බන්ධකොට පිවිසුම් දොරටුව ඇති අතර එය පළලින් සෙන්ටිමීටර් 90 ක් වේ. බැම්මේ සිට මීටර් 2 ක් ඉදිරියට පන්නා ඇති මෙහි ඇතුළත් ගල් පුවරු කීපයකි. උතුරු බැම්මට වම්පසින් මල් ආසනයක් හා ගල්කණු කැබලි 12 ක් දක්නට ලැබේ.

**ගල්කණු සහිත ගොඩනැගිල්ල**

මෙහි ගල්කණු කොටස් 6 කි. උතුරු ප්‍රාකාර බිමේ සිට මීටර් 6.30 ක් දුරින් දකුණුපසින් පිහිටා ඇත. ගල්කණු කොටසක සාමාන්‍ය උස මීටර් 1 ක් පමණ වේ. දිග හා පළල සෙන්ටිමීටර් 25×25 වේ. ගොඩනැගිල්ලේ දිග මීටර් 4.20 ක් ද පළල මීටර් 2.90 ක් ද වේ.

**ගල්කණු සහිත ගොඩනැගිල්ල**

මෙම නටබුන් ගොඩනැගිල්ලට මීටර් 4 ක් දකුණට වන්නට ඇති ගල්කණු කොටස් 19 කින් සමන්විත වේ. ගොඩනැගිල්ලේ දිග මිටර් 7.20 ක් ද පළල මීටර් 3.40 ක් ද වේ.

**පිළිමගෙය**

නටබුන් ගොඩනැගිල්ලේ සිට මීටර් 40 ක් ගිනිකොණින් ප්‍රතිමා ගෘහය පිහිටා ඇත. මීටර් 6.45 පළලින් මීටර් 6.20 ක් දිගින් ද වු මෙය 1992 වර්ෂයේ සංරක්ෂණය කරන ලද ගොඩනැගිල්ලකි. පිට බැම්මේ පළල සෙ. මී. 80 ක් වේ. උස සෙ. මී. 90 ක් වේ. ඇතුළත මීටර් 2.20 ක් උස ගල්කණු 06 ක් දක්නට ලැබෙන අතර ඒවා සෙ. මී. 15×25 දිග හා පළල වන අතර උසින් සෙ. මී. 80 ක් වේ.

මෙම ප්‍රතිමා ගෘහය තුළ කවන්ධ බුද්ධ ප්‍රතිමාගෘහයක් සහ තවත් ප්‍රතිමා 2 ක් දක්නට ලැබේ. මෙහි ප්‍රවේශ දොරටුව උතුරු දෙසට පිහිටුවා ඇත.

**බෝධිඝරය**

අංක 04 පිළිමගෙයට නැගෙනහිරින් මීටර් 2.5 ක් පමණ දුරින් බෝධිඝරය පිහිටා ඇත. නැගෙනහිර ප්‍රාකාරයට මීටර් 3.5 ක් බටහිරින් නැගෙනහිර බැම්ම පිහිටා ඇත. මෙය චතුරස්‍රාකාර බිත්ති දෙකකින් හා බටහිර පසින් පිහිටි පිවිසුමකින් සමන්විත වේ. පිවිසුම් දොරටුව දෙපස ගල්කණු කොටස් දෙකක් දක්නට ලැබේ. මෙහි ඉදිරිපස ගල්කණු දෙකක්, ගල් පුවරු දෙකක් හා මල් ආසනයක් දක්නට ලැබේ.

**ස්තූපය**

විහාර භූමියේ නැගෙනහිර දෙසින් ස්තූපය දක්නට ලැබේ. ස්තූපයේ පියගැටපෙල සහිත පිවිසුම බටහිර දිශාවෙන් දක්නට ලැබේ. පිවිසුමේ කැටයම් රහිත සඳකඩ පහණකි. එය දිගින් සෙ. මී. 90 ක් ද පළලින් සෙ. මී. 40 ක් ද වේ. පියගැටපෙළ දිගින් මීටර් 1.90 ක් වේ. මෙහි එක් පියගැටයක් සෙ. මී. 25 ක් පළලින් යුක්තයි. උස සෙ. මී. 12 ක් වේ. ස්තූපය වටා ප්‍රාකාරයකින් වට වී ඇත. මෙම ස්තූපයේ විෂ්කම්භය මීටර් 15 ක් පමණ වේ.

**යුධගනාව ස්තූපය**

දැනට ශ්‍රී ලංකාවේ ශේෂව ඇති විශාල ස්තූප අතුරින් එකක් ලෙස යුධගනාව ස්තූපය හැඳින්විය හැකි ය. අනුරාධපුර යුගයට අයත් යැයි සැලකෙන ස්තූපයෙහි පාදම සඳහා කළුගල් මිශ්‍ර මැටි බදාමයක් යොදා ඇත. එසේම මෙහි ගර්භය හුණු මිශ්‍ර බදාමයක් උපයෝගී කරගනිමින් ගඩොලින් බැඳ ඇත. දැනට සංරක්ෂණය කර ඇති හා සංරක්ෂණය කරමින් පවතින මෙම ස්තූපයෙහි හඳුනා ගැනීම සඳහා ඉතිරි කර ඇති කොටසින් මෙහි පැරණි ස්වරූපය නිසි අයුරින්

නිර්ණය කළ හැකි ය. ස්තූපයේ සංරක්ෂණය කර ඇති ගර්භය කොටසේ උස මීටර් 10 කි. මෙහි වට ප්‍රමාණය මීටර් 91.46 කි.

**පිළිමගෙය**

ස්තූපයේ සිට මීටර් 8 ක් බටහිර දිශාවට වන්නට පිළිමගෙය පිහිටයි. මෙහි බිත්ති වරිච්චි සහිත මැටි බිත්ති වේ. එය ඉදිරිපස කොටස පසුකාලීන නිර්මාණයකි. මෙය මහනුවර යුගයේ සිතුවම් හා පිළිම සම්ප්‍රදායට අනුව නිර්මාණය කර ඇත. 18 වන සියවසේ නිර්මාණයකි.

පිළිමගෙය දිගින් මීටර් 10 ක් ද පළල මීටර් 3 ක් ද වේ. මෙහි ඉදිරිපස බිත්ති සහිත කොටස මීටර් 3 ක් දිග ය. විහාරගෙයි ඉදිරිපස බිත්තිය මකර තොරණකින් සමන්විත වෙයි. මකර මුහුණු දෙපස කින්නර රූප දෙකක් වේ. ඊට පහළින් සිංහ රූප දෙකක් ද දෙපස දේවතා රූප දෙකක් ද දක්නට ලැබේ. උළුවහු බිත්ති මල්වලින් අලංකාර කර ඇති අතර ඒ සඳහා රතු, කහ, කළු වර්ණ භාවිතකර ඇත.

**ඇතුළත සිතුවම්**

විහාර ගෘහය තුළ ඇති සිතුවම් මහනුවර යුගය නියෝජනය කරන ඒවා වේ. ඇතුළත බිත්තියේ උළුවස්සට ඉහළින් ඉර හඳ සිතුවම් කර ඇත. ඒ අතර ස්තූප සිතුවමකි. මේ සඳහා කළු වර්ණය හා රේඛා සඳහා රතු හා සුදු වර්ණ භාවිත කර ඇත. පිවිසුම් දොරටුව වම්පස බිත්තියේ ඇතුළත සිතුවම් තීරු දෙකකි. මෙය හිටි හා ඉඳි ඉරියව්වෙන් ඇති බුද්ධ රූප සහ පහළ කොටසින් මුචලින්ද නාග දරණය හා බුද්ධත්වය දක්වන සිතුවම් දෙකකි.

පිවිසුම් දොරටුවට වම්පස බිත්තියේ දකුණුපස කොටස තුළ සිතුවම් තීරු දෙකකි. ඉහල පනේලයේ හිටි ඉරියව්වෙන් ඇති බුද්ධ රූප 7 කි. ඒ සියල්ලට ම අගසව් සිතුවම් හා උවැසි හා රජ රූප ද ගිහි සිතුවම් ද දක්නට ලැබේ. දෙවන තීරුව තුළ හිඳි ඉරියව් බුද්ධ රූප සිතුවම් 3 කි. තෙවන තීරුව තුළ රජ රූප, දේවරූප හා බෝධියක් දක්නට ලැබේ. මේවා දුර්වර්ණ වී ඇත.

බටහිර බිත්තියට යාබද ව දේවරූප දෙකක් හිටි බුද්ධ රූප 2 ක් හා බිත්තිය මධ්‍යයේ හිඳි පිළිමයක් දක්නට ලැබේ. මහනුවර යුගයට අයත් පිළිම ලක්ෂණ පෙන්නුම් කරයි. එහි උදරය කොටස අනවසර කැණීම්කරුවන්ගේ ග්‍රහණයට ලක් වී ඇති අතර එය දැනට සංරක්ෂණය කර ඇත. පිළිමයේ උස මීටර් 2.10 කි. දෙවුර මීටර් 1 කි. දෙදණ මීටර් 1.55 කි. දෙපස ඇති පිළිම උස මීටර් 1.85 ක් ද වන අතර දේවරූප උස මීටර් 2.2 කි.

දකුණු පස බිත්තියේ පනේල තීරු 3 කින් යුක්ත අතර ඉහළ ම තීරුවේ හිටි බුද්ධ රූප 6 ක් සිතුවම් කර ඇත. ඒවායින් එක් සිතුවමක් බදාම ගැලවීම නිසා සම්පූර්ණයෙන් ම විනාශ වී ඇත. මේවායේ ද බෝසත් රූප හා රජ රූප දක්නට ලැබේ. මේ සඳහා කළු, කහ, රතු වර්ණ භාවිත කර ඇත. පහළ ම තීරුවේ ඇති සිතුවම් විනාශ වී ඇත.

ඉදිරිපස දකුණු කොටස තුළ ඉහළ තීරුවේ සිතුවම් අතර හිටි බුද්ධ රූප හා හිඳි බෝධිසත්ව රූප දක්නට ලැබේ. මෙම රූප දෙකක් මධ්‍යයේ බෝධි වෘක්ෂයකි. පහළ කොටසේ ගණදෙවි හා කතරගම දේවරූප දෙකකි. මෙම සිතුවම්වල පසුබිම සඳහා රතු වර්ණය භාවිත කර ඇත.

මෙහි සිවිලිම සඳහා නාරිලතා මල සහිත සිතුවම් ද ලියවැල් මෝස්තර, නෙළුම්මල් මෝස්තර දක්නට ලැබේ. මේවා ද පසුකාලීනව නැවත සිතුවමට නගා ඇත. මේ සඳහා කළු, කහ, රතු යන වර්ණ බහුල ව භාවිත වී ඇත. පිළිමගෙයි පිටත බිත්තියේ ද පැරණි සිතුවම් ඇති අතර දැනට ඒවා විනාශ වෙමින් පවතී. රේඛා පමණක් දුර්වර්ණව දක්නට ලැබේ.

**යුධගනාව වැව**

ඓතිහාසික වෘතාන්ත අනුව යුධගනාව දාගැබ ඉදිකිරීමට අවශ්‍ය ගඩොල් නිශ්පාදනය සඳහා මැටි ලබාගෙන ඇත්තේ මෙම වැවෙන් බව කියැවේ. මහානාග රජු මෙම වැව ඉදිකරවූ බව කියවේ.

ස්ථාන පරීක්ෂා හා ක්ෂේත්‍ර කටයුතු - 2011 ඇස්තමේන්තුවට අනුව බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක පුරා ව්‍යාප්ත වන පරිදි පහත කාර්යයන් ඉටුකරන ලදී.

- ගල් බිඳුම් හා ඛනිජ කැණීම් නිර්දේශ ලබාදීම
- පුරාවිද්‍යා හානි ඇගයුම් නිරීක්ෂණය
- අනවසර කැණීම් හා පුරාවස්තු මංකොල්කෑම් පිළිබඳ පරීක්ෂාවන් හා වාර්තා සම්පාදනය
- පුරාවිද්‍යා ක්ෂේත්‍ර පරීක්ෂණ සහ වාර්තා සම්පාදනය

දිස්ත්‍රික්ක පුරා ව්‍යාප්ත වන පරිදි ස්ථාන පරීක්ෂා කිරීම් 214ක් සිදු කරන ලදී.

- ගල් බිඳුම් හා ඛනිජ කැණීම් නිර්දේශ ලබාදීම - 160
- පුරාවිද්‍යා හානි ඇගයුම් නිරීක්ෂණ - 09
- අනවසර කැණීම් හා පුරාවස්තු මංකොල්ලකෑම් පිළිබඳ පරීක්ෂාකර වාර්තා සැපයීම - 35
- පුරාවිද්‍යා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම - 10ක් සඳහා නිර්දේශ ලබා දී ඇත.

## මධ්‍යම පළාත

**විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගවේෂණය**

**සෝනුත්ත ගල්කරුතැන්න හා හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන ලේඛනගතකිරීමේ ගවේෂණය**

මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි සෝනුත්ත ගල්කරුතැන්න පුරාවිද්‍යා ස්ථානය හා ආශ්‍රිත ප්‍රදේශය ගවේෂණය කර වාර්තාගත කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

විල්ගොමුවක් පිරී තිබුණු බැවින් විල්ගමුව නමින් හැඳින්වෙන මෙම ප්‍රදේශය යක්ෂ ගෝත්‍රිකයන් විසූ ප්‍රදේශයක් බව ජනප්‍රවාද සාධකවලින් හඳුනාගත හැකි ය. අනුරාධපුර යුගයේ දුටුගැමුණු රජුගේ සේනා රුහුණේ සිට පිහිටි රටට ගමන්කළ මාර්ගය මේ ඔස්සේ වැටී පැවති බව සඳහන් ය. ගජබා රජුගේ කපුරු වැඩුඔය ශිලා ලේඛනයට අනුව රජු සරෝග්‍රාම වශයෙන් නම්කොට ඇත්තේ මේ ප්‍රදේශය බවත් සඳහන් ය. එමෙන්ම පොළොන්නරුව රාජ්‍ය සොලීන් ආක්‍රමණය කළ පසුව එය අත්පත් කරගැනීමට ගිය විජයබාහු රජුගේ සේනා ගමන් මගක් වූයේ රණමුරේ හා විල්ගමුව ප්‍රදේශයයි.

**හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන**

**1. සෝනුත්ත රජමහා විහාරය**

අංක 393 ඊ සෝනුත්ත ග්‍රාම නිලධාරී වසමේ, සෝනුත්ත ග්‍රාමයේ පිහිටි මෙම ස්ථානය වලගම්බා රජු දවස සෝනුත්තර රහතන් වහන්සේ වැඩසිටි ස්ථානය වශයෙන් සැලකේ. මෙම ස්ථානයේ නටබුන් ස්තූප ගොඩැල්ලක්, ගල්කණු සහිත නටබුන් ස්ථාන, විහාර භූමියේ විසිරුණු ශිලාමය අවශේෂ, ස්තූප ගොඩැල්ල ආශ්‍රිත කුඹුරෙන් හමු වු ශිලාමය අවශේෂ ආදි වශයෙන් වැදගත් වේ.

**ස්තූප ගොඩැල්ල**

විහාර භූමියේ සිට මීටර් 60ක් පමණ උතුරු දිශාවෙන් පිහිටි කුඹුරු යාය තුළ පිහිටා ඇත. විශ්කම්භය මීටර් 14ක් පමණ වන මෙහි උස මීටර් 2.3කි. එහි මධ්‍ය කොටස අනවසර කැණීමකට ලක්ව ඇත. ගොඩැල්ල අවට අනුරාධපුර යුගයට අයත් උළු, මැටි බඳුන් කැබලි ශේෂව ඇත.

**ගල්කණු ගොඩැල්ල**

විහාර භූමියේ වර්තමාන ධර්ම ශාලාව ඉදිරිපසින් මෙය පිහිටා ඇත. සිව්රැස් හා සඩාශ්‍රාකාර ගල්කණු 6ක් පමණ මෙම ස්ථානයේ දක්නට ලැබේ.

**විසිරුණු ශිලාමය අවශේෂ**

විහාර භූමියේ සංඝ්‍යාර කුළුණ ආශ්‍රිතව සහ හතරේ ඇල නමින් හඳුන්වන ඇල මාර්ගය ආශ්‍රිතව ගල්කණු, ගල්පුවරු හා යන්ත්‍ර ගල් ආදිය දක්නට ලැබේ. විහාර භූමියේ බෝධිය ආසන්නයෙන් ශෛලමය පියගැට පෙළක්, දිගලි වූ ගල්කණු කිහිපයක් දක්නට ලැබේ.

**සෝනුත්ත රජමහා විහාරය ආශ්‍රිත භූමිය**

ස්තූප ගොඩැල්ලේ සිට මීටර් 15.1ක් උතුරු දිශාවෙන් පිහිටි කුඹුරේ මෙම නටබුන් විසිරී තිබේ. ස්තූප ගොඩැල්ලෙන් විතැන් වූ මෙම කොටස් අනාරක්ෂිතව පවතී. මෙහි සංඝාවාසයේ සිට මීටර් 4.88ක් දුරින් යන්ත්‍රගලක්, කණු පාදම් ගල් ද්විත්වයක්, ගල්කණු, ස්තූපයක අවශේෂ ආදිය දක්නට ලැබේ. එමෙන්ම මෙම විහාරයට උතුරු දෙසින් පිහිටි බී. ජී. ගුණදරා නැමැත්තාට අයත් ඉඩමේ ද නටබුන් ගල්කණු, ගඩොල් කැබලි, මැටි බඳුන් අවශේෂ දක්නට ලැබේ.

එමෙන්ම බී. ජී. ජයසිංහ නමැත්තාට අයත් පෞද්ගලික ඉඩම ආශ්‍රිතව පැරණි ගඩොල්, ගල් පුවරු, මැටි බඳුන් කැබලි ආදිය දක්නට ලැබේ.

**2. නාමිනිගම ඔත්ගමුව ගල් තලාව (වන රක්ෂිතය)**

නාමිනිගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මෙම ස්ථානය ප්‍රාකාර බැම්මක නටබුන්, ගොඩනැගිලි නටබුන්, පැරණි පොකුණක්, නටබුන් ස්තූප ගොඩැල්ලක්, ගොඩනැගිලි සාධක ආදිය දක්නට ලැබේ.

**3. වෙහෙරගල රජමහා විහාරය**

අල්වංගුව ග්‍රාම නිලධාරී වසමේ, අල්වංගුව ග්‍රාමයේ පිහිටි මෙම ස්ථානය හෙට්ටිපොල හඳුන්ගමුව දෙකේ ඇල මංසන්ධිය සිට කිලෝමීටර් 2.5ක් පමණ බුද්ධ ජයන්ති මාවතේ ගමන් කළ විට හමු වේ. පිහිටි ගලේ කැපූ පියගැට පෙළක්, පර්වත ලිපියක් ස්තූප ගඩොල්, ස්වභාවික ගල් කෙමි, කටාරම් ලෙන්, සකස් කරන ලද පියගැට පේළි හා චංචල පුරාවස්තු කිහිපයක් මෙම විහාරස්ථානය ආශ්‍රිතව හමු වේ.

**4. වෙහෙරගල අසුවයාය**

අසුවයාය ග්‍රාම නිලධාරී වසමේ, අසුවයාය ග්‍රාමයේ පිහිටි මෙම ස්ථානය හෙට්ටිපොළ හසලක මාර්ගයේ කිලෝමීටර් 8ක් ගමන්කර වම්පසට ඇති මාර්ගයේ කිලෝමීටර් 2ක් පමණ ගමන් කිරීමෙන් හමුවන කඳුගැටයේ පැරණි ස්මාරක සහිත ගල්තලාව ආශ්‍රිතව හමු වේ. පැරණි ස්තූප ගොඩැලි දෙකක්, පැරණි ස්මාරක ගොඩැලි දෙකක්, ගල්කෙමි දෙකක්, පැරණි ගල් බිඳුම් ස්ථානයක් මෙම ස්ථානයෙන් හමුවිය.

**5. කාණිගල ගල්තලාව (පේරකනත්ත)**

පේරකනත්ත ග්‍රාම නිලධාරී වසමේ පේරකනත්ත ග්‍රාමයේ පිහිටි මෙම ස්ථානයට හෙට්ටිපොල සිට කිලෝමීටර් 8ක් දුරින් පිහිටි සෝනුත්ත කනිටු විදුහල අසලින් වම්පසට ඇති අසුවයාය මාර්ගයේ කිලෝමීටර් 1.5ක් පමණ ගමන්කළ විට පේරකනත්ත වසමේ වම්පසින් පිහිටි කාණිගල කඳුවැටිය හමු වේ.

මෙම කඳුගැටය මුදුනේ නටබුන් ස්තූප ගොඩැල්ල පිහිටා ඇත. විෂ්කම්භය මීටර් 2.60ක් පමණ වන මෙය අනවසර කැණීම් මගින් විනාශ වී ඇත. මෙම ගල්තලාවෙහි නටබුන් ගොඩනැගිලි සහිත ස්ථාන 4ක් පමණ දක්නට ලැබේ.

**6. දේවගිරිය රජමහා විහාරස්ථාන භූමිය**

දේවගිරිය ග්‍රාම නිලධාරී වසමේ, දේවගිරිය ග්‍රාමයේ පිහිටි මෙම ස්ථානය හෙට්ටිපොල දේවගිරි මාර්ගයේ ගමන් කර මාරක පාර නමින් හඳුන්වන ස්ථානයේ සිට කිලෝමීටර් 2ක් පමණ ගමන් කර දකුණු පසට ඇති ගල්තලාව මත පිහිටා ඇත.

ගල්තලාව මධ්‍යයට වන්නට ස්තූප ගොඩැල්ලක් සහ එයට ප්‍රවේශ වීම සඳහා පියගැට පෙළක් සහ ඒ වටා ප්‍රතිමා සහ වාහල්කඩ සාධක දක්නට ලැබේ. මෙම ස්ථානයේ නටබුන් ගොඩනැගිලි අවශේෂ සහිත ස්ථාන 4ක් ප්‍රතිමා සහිත නටබුන් ගොඩැල්ලක්, ශෛලමය බැම්මක්, ගල්කණු වැනි නටබුන් සහිත ස්ථානයකි.

**07. ගුරුවෙලයාය (ගඟේයාය) ඇහැරැන්ද රක්ෂිතය**

ගඟේයාය ග්‍රාම නිලධාරී වසමේ, ඇහැරැන්ද ග්‍රාමයේ පිහිටි මෙම ස්ථානය මහවැලි ගඟේ ඉහළ රක්ෂිත ප්‍රදේශයේ පිහිටා ඇත. පැරණි නටබුන් ගොඩැල්ලක්, ගොඩනැගිලි අවශේෂ සහිත ස්ථාන 2ක් හමු විය.

**08. උඩුවෙල්වල හැමතැන්න පූර්වාරාම විහාරස්ථානය**

පෞරාණික ආරාමික සංකීර්ණයක් සහිත මෙහි ගල්කණු, සහ ගඩොල් බැම්මක අවශේෂ දක්නට ලැබේ. එමෙන්ම කේ. ආර්. උපාලි අශෝක නැමැත්තාට අයත් පෞද්ගලික ඉඩමක් ආශ්‍රිතව ද පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ගල්කණු සහ ගල් පුවරු හමු විය. එමෙන්ම කේ. ආර්. කරුණාරත්න නැමැත්තාට අයත් ඉඩමේ පහනක් ද පැරණි අමුණක සාධක ද හමු වේ.

**09. ලේනියවල ලංකාරාමය**

ලේනියවල ලංකාරාම විහාරස්ථානය ආශ්‍රිතව පිහිටි ප්‍රතිමා ගෘහය පිටුපස නටබුන් ගොඩැල්ලක් දක්නට ලැබේ. මධ්‍යය ගොඩැල්ල අනවසර කැණීමකට ලක් වී ඇත. එමෙන්ම පැරණි සිරිපතුල් ගලක්, මල් ආසනයක්, විනාශ වූ පිළිම කොටස්, ආදිය මෙම ස්ථානයේ දක්නට ලැබේ.

**10. රදුන්නේ වැව අංක 81 භූමිය**

විල්ගමුව සිට මාරක හරහා වල්ගම්මන තෙක් ගමන් කර වල්ගම්මන මංසන්දියෙන් වම්පසට ඇති මාර්ගයේ කිලෝමීටර 1 ක් පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට පැමිණිය හැකි ය. පැරණි ශිලා ලිපියක්, නටබුන් ගොඩැල්ලක්, කණු පාදම් හා පර්වත ශිලා ලිපිය මෙම ස්ථානයෙහි දැකගත හැකිය. මේ ආශ්‍රිත රදුන්නේ වැව මුතුකෝවිලගල ගල්තලාවෙහි පැරණි නටබුන් ගොඩැල්ලකි. සරල බොරදම් සහිත මල් ආසනයක්, උළු කැබලි මෙම ගොඩැල්ල මත දක්නට ලැබේ.

**රදුන්නේ වැව අංක 81 භූමිය**

මෙම ස්ථානයේ කඳු පාදම් හා පූර්ව බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියන ලද පර්වත ලිපියක් ඇත.

**11. ගල්කරුතැන්න පුරාවිද්‍යා ස්ථානය**

හෙට්ටිපොල ග්‍රාම නිලධාරී වසමේ, ගල්කරුතැන්න ග්‍රාමයේ මෙම ස්ථානය පිහිටා ඇත. ප්‍රතිමා ගෘහයක නටබුන් හා යබොර මෙම ස්ථානයෙන් හමු වේ. ඩී. එම්. රංජිත් දිසානායක නැමැත්තාට අයත් පෞද්ගලික ඉඩමක් ආශ්‍රිතව මදක් ඇලව ගිය සිට වූ ගල්කණු, දිගලි කළ ගල් පුවරු කොටස් කැඩී ගිය ගල් පුවරු, හුණු ගලින් කළ හිටි පිළිමයක අවශේෂ හමු වේ. ගොඩ උල්පත, දිවුල්ගස්වැව, ගඟ සිරිගම, උණගොල්ල නටබුන්, බත්ගම්පළ නාගොල්ල වැනි ස්ථානවල පිහිටි පෞද්ගලික ඉඩම් ආශ්‍රිතව ද පුරාවිද්‍යාත්මක නටබුන් විසිරී ඇත.

# කැණීම් අංශය

## දකුණු පළාත

**දෙවුන්දර දේවාලයේ මහවත් මඩුව කැණීම**

මාතර දිස්ත්‍රික්කයේ දෙවුන්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි උත්පලවර්ණ ශ්‍රී විෂ්ණු මහා දේවාලය ශ්‍රී ලංකාවේ උපුල්වන් දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වූ දේවාලයක් වශයෙන් ප්‍රචලිත ය. ඓතිහාසික යුගයේ අවස්ථා කිහිපයක දී ශ්‍රී මහා බෝධියේ අංකුර 32 ක් මෙරට පූජනීය ස්ථාන 32 ක රෝපණය කර ඇත. ඉන් එකක් මෙම දෙවුන්දර දේවාලයේ රෝපණය කළ බැව් කියවේ. කෝට්ටේ යුගයේ ලියවුණු සාහිත්‍ය කෘතිවල දැක්වෙන පරිදි පොහොසත්, අංගසම්පූර්ණ විචිත්‍රවත් දෙවොලක් හා ඒ ආශ්‍රිතව පැවති නගරයක් මෙහි විය. පසුව පෘතුගීසීන්ගේ දරුණු ආක්‍රමණයකින් සම්පූර්ණයෙන් විනාශයට පත් විය.

දේවාලයට පිසිසෙන මහවත්මඩුව නැවත පිළිසකර කිරීමට පූර්වයෙන් පැරණි වාස්තු අංග හඳුනා ගැනීම සඳහා මෙම කැණීම සිදු කරන ලදී. මීටර 3×5 සහ මීටරය බැගින් වූ කැණීම් වලවල් 3 ක් යොදමින් පිහිටි පොළොව දක්වා සිදු කළ කැණීම්වල දී පැරණි වළං කැබළි, උළු කැට, යබොර, දැවී ගිය අඟුරු කොටස් හමු වුණි.

මහවත් මඩුව පාදම ඉදිකිරීමට ගල් පතුරු යොදා ඇති අතර එයට ගඩොල් තබා බැඳ බැම්ම ශක්තිමත් කර ඇත. අනතුරුව මීටර් 3½ ක පරතරයක් තබා උස මීටර් 1½ ක පමණ ඇති අටපට්ටම් හැඩයේ ගල් කුළුණු සිටුවා තිබී ඇත. මෙම ගල් කණු දෙක බැගින් පේළි හතරක් වන සේ ශක්තිමත්ව බැඳ ඇත. මහවත් මඩුවේ ගෙබිමට හුණු මිශ්‍ර බදාමයක් යොදා ඇත. මහවත් මඩුව දෙපස ඉදිකිරීම් ව්‍යුහය පිළිබඳව එළඹි නිගමනයන්ට අනුව සංරක්ෂණ සැළසුම් සකස් කරන ලදී.

## උතුරුමැද පළාත

**පේමඩුව පිළිමගෙය කැණීම**

මෙම පිළිමගෙය අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 362 පේමඩුව ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටි සුමංගල විහාරයට අයත් නටබුන් ස්ථානයක් වේ. මෙම ස්ථානය භූගෝලීය වශයෙන් උතුරු අක්ෂාංශ $8^0$ 29. 51 හා නැගෙනහිර දේශාංශ $80^0$ 11. 58 අතර පිහිටා ඇත.

දැයට කිරුළ 2012 සංවර්ධන වැඩපිළිවෙලට සමගාමීව පැරණි ස්මාරක හඳුනාගැනීම, සංරක්ෂණය කොට මහජනයාට ප්‍රදර්ශණය සඳහා ඉදිරිපත් කිරීම සහ ඒවායෙහි නිර්මාණ ලක්ෂණ හා ඉදිකිරීම් අවධි හඳුනාගැනීමේ අරමුණින් මෙම කැණීම් ව්‍යාපෘතිය සිදුකරන ලදී. පේමඩුව බොහෝ ඓතිහාසික ස්ථාන පිහිටි ප්‍රදේශයක වූ බැවින් එම ස්ථානවල ඇති පැරණි ස්මාරක ඉදිකිරීම් ලක්ෂණ අනුව අනුරාධපුර යුගයේ පසු කාලයට අයත් බව (ක්‍රි.ව 10-12 සියවස්) නිගමනය කළ හැකි ය.

මෙම පිළිමගෙය කාර්තු ක්‍රමයට කැණීම් කරන ලදී. ස්මාරකයේ දිග මීටර 10 යි සෙන්ටි මීටර 20 ක් සහ පළල මීටර 06 යි සෙන්ටි මීටර 30 ක් විය. ප්‍රවේශය, අන්තරාලය සහ ගර්භ ගෘහය යන කොටස්වලින් සමන්විත ගෙඩිගේ සම්ප්‍රදායට අයත් පිළිමගෙයක් බව හඳුනා ගැනුණි. එය සනාත කෙරෙන සාධක ලෙස ගඩොල් කැබලි විශාල ප්‍රමාණයක් (කියුබ් 08 ක් පමණ) තිබීම, උළු කැට කැබලි හමු නොවීම, ගෙඩිගේ සම්ප්‍රදායේ ස්මාරක සඳහා පිටත අලංකරණ වශයෙන් කුළුණු හා විමාන යොදා ගන්නා හැඩ ගන්වන ලද ගඩොල් විශාල ප්‍රමාණයක් තිබීම ආදිය හඳුනාගත හැකි වේ.


මෙහිදී ස්මාරකයේ උතුරු හා දකුණු බිත්ති පිළිවෙළින් එම දිශාවන්ට ආනතව තිබීම විශේෂ විය. වහලය සඳහා යොදා තිබූ ගෙඩිගේ සම්ප්‍රදායේ ඉදිකිරීම, ඇතුළට කඩා වැටීම හේතුවෙන් දෙපස වූ දිග බිත්ති පිටතට තල්ලු වීම එයට හේතුව බව හඳුනාගත හැකි විය. ස්මාරකය පිහිටි භූමිය ලිහිල් වැලි සහිත ස්වභාවයක් ගැනීම හේතුවෙන් ස්මාරකයේ අත්තිවාරම සඳහා කළුගල් භාවිතා නොකිරීමෙන් මෙම ස්මාරකයේ ගෙඩිගේ ස්වරූපය කඩිනමින් විනාශ වී යෑමට ලක් වන්නට ඇති බව පැහැදිළි වූ අතර ගර්භ ගෘහයේ ඇතුළත උතුරු දිග කොටසේ ඇති පැරණි බදාම සහිත ගෙබිම රසායන සංරක්ෂණ ක්‍රමවේද භාවිතා කරමින් සංරක්ෂණය කිරීම සුදුසු බවට යෝජනා ඉදිරිපත් විය.




පිළිම ගෙය සහිත ගොඩැල්ල කැණීමට පෙර දිස්වූ ආකාරය




ගරා වැටුණු පාදම කැණීමෙන් පසු




කැණීමෙන් මතුකරගත් ගරාවැටුණු පාදමෙහි බිම් සැලසුම



පිළිමගෙය දකුණු දෙසින් දිස්වන ආකාරය දැක්වෙන සැලසුම




ස්මාරකයේ ඡේදන සැලසුම

## නවෝදාගම නටබුන් ගොඩැල්ල කැණීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 371 නවෝදාගම මධුරසිරි විහාරයට අයත් නටබුන් ගොඩැල්ල භූගෝලීය වශයෙන් උතුරු අක්ෂාංශ $8^0$ 28'18 හා නැගෙනහිර දේශාංශ $80^0$ 15' 39 අතර පිහිටා ඇත.

දැයට කිරුළ 2012 සංවර්ධන වැඩසටහනට සමගාමීව මෙම ස්ථානයේ ඇති පැරණි ස්මාරක නිවැරදිව හඳුනා ගැනීමත් සංරක්ෂණය සඳහා නිරවුල් සැලසුම් සකස් කිරීමත් ජනතාව උදෙසා ප්‍රදර්ශණය සඳහා සුදුසු තත්වයකට ගෙන ඒමත් මෙම නටබුන් ගොඩැල්ල කැණීමේ මූලික අරමුණු අතර විය.

මෙම කැණීම් භූමියෙහි හඳුනාගත හැකි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථාන 03 කි. මෙයින් ප්‍රධාන ස්මාරකය කොටු දැල් සැලැස්මකට අනුව ද සෙසු ස්ථාන දෙක පර්යේෂණ අගල් ක්‍රමය යටතේ ද කැණීම් කරන ලදී.

කැණීම් කටයුතු අනුව කළුගල් බැම්ම මගින් සකස්කරන ලද වෘත්තාකාර නිර්මාණය මධ්‍යයේ ඊට මදක් කුඩාවන ගඩොලින් කරන ලද වෘත්තාකාර ඉදිකිරීමක අවශේෂ අනාවරණය කරගත් අතර ස්මාරකයට දකුණු දෙසින් ස්මාරකයේ  බිම් මට්ටමේ තබන ලද ශිලාමය ආසනයක් ද සොයා ගැණින. ස්මාරකය ඉදිකිරීම් තත්වය සලකා බලන කල ශක්තිමත් ඉදිකිරීමක් ලෙස නිගමනය කිරීමට තරම් සාධක හමු නොවුණි. ස්මාරකය බාහිර ස්වරූපය අනුව එය ස්තූපයක බාහිර ලක්ෂණ පෙන්නුම් කරයි.

ටැම්පිට ගොඩැල්ල ආශ්‍රිතව තොරතුරු ලබාගැනීම සඳහා කැණීම් පරිශ්‍ර දෙකක් සිදුකරන ලද අතර එයින් නැගෙනහිර දෙසට සිදුකරන ලද කැණීම් පරිශ්‍රය තුළින් ස්මාරකයේ වහලයෙන් ගරාවැටුණු උළු තැන්පත්වීම් පිළිබඳ තොරතුරු සොයා ගැනීමට හැකි විය.

මීටර 14 ක් පමණ දිගින් හා පළලින් යුත් ගොඩැල්ල කුමක් ද යන්න අවබෝධකරගැනීම සඳහා සිදුකරන ලද කැණීම් කටයුතු මගින් ගඩොල් ස්මාරකයට අයත් ඉදිකිරීම් පිළිබඳ ආරම්භක සාධක සොයාගත් අතර එම ස්මාරකය කුමක් ද යන්න නිරවුල් ව නිගමනයකට එළඹීමට නොහැකි විය.


විශේෂිත චංචල පුරාවස්තු කිසිවක් කැණීම් මගින් සොයාගත නොහැකි විය. මැටි බඳුන් කොටස් හමු වූයේ ද විරල වශයෙනි.




කැණීමට පෙර ස්මාරකය




කැණීමට පසු  ස්මාරකය




කැණීමෙන් පසු ස්මාරකයේ සැලසුම්




කැණීමට පසු ප්‍රධාන ස්මාරකයේ සැලසුම





ස්මාරකයේ ආසනය ආසන්න කැණීම් පැතිකඩ





ටැම්පිට ගොඩනැගිල්ල කැණීමට පෙර

ටැම්පිට ගොඩනැගිල්ල කැණීම අතරතුර




ටැම්පිට පිළිමගෙය කැණීමට පෙර හා පසු ගොඩනැගිලි සැලසුම

**අනුරාධපුර මයුර හා ගන්ථාකාර පිරිවෙන කැණීම.**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනුරාධපුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර නුවරගම් පළාත ග්‍රාම සේවා වසමට අයත් ව මෙම ස්ථානය පිහිටා ඇත.

නාගරික සංවර්ධන අධිකාරියෙහි ඉල්ලීම පරිදි, නගරය සංවර්ධනය හා යතාවත් කිරීමේ වැඩ පිළිවෙලට සමගාමීව පැරණි අනුරාධපුර නගරයේ පෞරාණික ස්වභාවය රැකෙන ආකාරයට සකස් කිරීම සඳහා මෙම කැණීම සිදුකරන ලදී. 2011 ජුලි මස 18 සිට නොවැම්බර් මාසය දක්වා කාලය තුළ ශ්‍රී මහා බෝධියට පිවිසෙන දකුණු දොරටුව අසල ඇති පැරණි මයුර හා ගන්ථාකාර පිරිවෙන නම් ගොඩනැගිලි සංකීර්ණය කැණීම් කර සංරක්ෂණය කිරීමත් අනතුරුව භූ දර්ශනය යතාවත් කිරීමත් මෙම කැණීම් ව්‍යාපෘතියේ අරමුණ විය. ඒ සඳහා ප්‍රතිපාදන සැපයීම ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයෙන් සිදු වූ අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුහුණු ශ්‍රමයට අමතරව සිවිල් ආරක්ෂක බලකායේ සහය ලබා ගන්නා ලදී.

ශ්‍රී මහා බෝධියට නිරිත දෙසින් මයුර පිරිවෙනට අයත් ගොඩනැගිලිවල නටබුන් දක්නට ලැබෙන අතර මහා වංශයට  අනුව ක්‍රිස්තු වර්ෂ 340 ත් 368 ත් අතර කාලයේ රජ කළ බුද්ධදාස රජු විසින් මයුර පිරිවෙන ගොඩනැංවීමට අනුග්‍රහ දක්වා ඇත. පසු කාලයේදී ධාතුසේන රජු සහ මහානාග රජු අවස්ථා ගණනාවක දී මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත. මයුර පිරිවෙන ගොඩනැගිල්ලට විරුද්ධ දෙසින් තවත් ප්‍රධාන ගොඩනැගිලි නවයක පාදම් සොයා ගන්නා ලදී. මෙම ගොඩනැගිලි සියල්ල එකම සංකීර්ණයකට අයත්ව තිබූ පංචාවාස ගොඩනැගිලි සම්ප්‍රදායට අනුව සකසන ලද්දක් බව ඒවායේ වාස්තු විද්‍යාත්මක අංග ලක්ෂණ අනුව පැහැදිළි විය.

මීටර 30×30 ප්‍රමාණයේ භූමි කොටසක පිහිටි පැරණි මයුර පිරිවෙන සහ එහි නිරිත සහ ගිණිකොණ දෙසින් පිහිටි තවත් උප ගොඩනැගිලි දෙකක අත්තිවාරම් පැහැදිළිව හඳුනා ගැනුණි. මෙම ගොඩනැගිලි පාදා ගැනීමේ දී ලොකු පිකැසය භාවිතා කරන ලදී. සියළුම පස් ස්ථර අවුල් ස්වභාවයකින් පැවති හෙයින් හමුවූ සියළු උළු කැබලි සහ වළං කැබලි වාර්තාකරණයේදී අත්හැර දමන ලදී.

මෙම ස්ථානයේ පැවති  පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් සංචාරක නිවාසය සහ පැරණි පොලිස් ස්ථානය නාගරික සංවර්ධන අධිකාරිය මගින් කඩා ඉවත් කිරීමෙන් අනතුරුව මීටර 180×150 ප්‍රදේශයක් පුරා පැතිර තිබූ පැරණි ගන්ථාකාර පිරිවෙන් සංකීර්ණයට අයත් පංචාවාස සැලසුම් තුනකට අයත් ස්මාරක මතු කර ගැනීමට හැකි විය.  ඒ අතර ශ්‍රී මහා බෝධියට මුහුණලා පිහිටි පංචාවාස සංකීර්ණයේ මීටර 17ක් දිග මීටර 11ක් පළල ප්‍රධාන ගොඩනැගිල්ල උතුරු අක්ෂාංශ 08˚ 20.36 ත් නැගෙනහිර දේශාංශ 80˚ 23. 50 ත් අතර මධ්‍යයේ පිහිටි කිසියම් සළකුණක් සහිත ගල් කණුව ආසන්නයේ මිටර 2×2 ප්‍රමාණයේ පර්යේෂණ වලක් පිහිටි පොළොව දක්වා කැණීම් කරන ලදී. එහිදී ගැඹුර මීටර 3 ක් තිබියදී ගඩොල් බැම්මක් හමු විය. එහි උස මීටර 1.1 කි. එය පසෙකින් වූ වලෙහි දකුණු බිත්තියේ කුඩා ප්‍රමාණයේ මැටි වළඳක් තැම්පත් කර තිබූ අතර එය භූමිය සම්බන්ධ පූජා විදියක් උදෙසා තබන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

අතීතයේ දී මෙම ස්ථානය තෙත සහිත වූ බැවින් බොරළු දමා පුරවා පසුව අඩිතාලම ශක්තිමත් කිරීමට ගඩොල් බිත්ති හරස් අතට බැඳ නැවත බොරළු දමා පුරවා ඒ මත උසැති ගල් කණු සිටුවා මෙම පංචාවාස සංකීර්ණය ගොඩනංවා ඇති බව පෙනේ. මෙම දෙවන ප්‍රධාන පංචාවාස සංකීර්ණයේ ගිණිකොණ දෙස පිහිටි උප ගොඩනැගිල්ල කැණීම් කරගෙන යාමේදී විශාල ප්‍රමාණයේ තැඹිලි පැහැති මුනින් අතට හැරවූ මැටි භාජනයක් හමුවීම වැදගත් විය. භාජනය වටා තිබූ මල් මොස්තරය අලංකාර ලෙස ඔබ්බවා සකස් කර තිබූ අතර මැටි බඳුනේ පත්ල බිඳී ගොස් තිබුණි.


ශ්‍රී මහා බෝධියට පිටතින් ගලින් සකසා ඇති ප්‍රාකාර බැම්ම ආසන්නයේ සේවා ගොඩනැගිල්ලක් ලෙස නම් කළ ස්මාරකයේ නිරිත දෙසින් මීටර් 1 - 2 අතර ගැඹුරේ පිහිටි ගඩොලින් පතුල දක්වා බැඳි හතරැස් කුඩා පොකුණක් හමු විය. මෙම ගොඩනැගිල්ල මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් මෙයට පෙර කැණීම් කර ඇති බවට තොරතුරු වාර්තා විය. තවද මෙම පොකුණේ පතුලේ සෙන්ටිමීටර 40 ක් පමණ පළලින් යුත් මැටි වළඳක් තබා තිබූ අතර වාර්තා කිරීමෙන් පසු වැලි දමා නැවතත් වසා දමන ලදී. ශ්‍රී මහා බෝධිය පිටත ඇති ගල් ප්‍රාකාර බැම්ම අසල වූ දකුණු දොර අසල මීටර 20 ක් පමණ දුරකින් ගඩොලින් බඳින ලද පෙත් මගක සළකුණු වාර්තා වූ අතර ප්‍රමාණවත් කාලයක් නොමැති වූයෙන් කැණීම් නොකර නැවත වසා දමන ලදී.





ගන්ථාකාර පිරිවෙන පිහිටි භූමිය




කැණීමට පසු ස්මාරකය



මයුර පිරිවෙන ප්‍රධාන ගොඩනැගිල්ල කැණීමට පෙර හා පසු ගොඩනැගිල්ලි සැලැස්ම



දෙවන ප්‍රධාන ගොඩනැගිල්ලේ සිට ගිණිකොණ දෙසින් පිහිටි අනු ගොඩනැගිල්ලෙහි පැති පෙනුම දැක්වෙන සැලසුම,



දෙවන ප්‍රධාන ගොඩනැගිල්ලේ සංකේතයක් සහිත ගල් කණුව අසල සිදු කළ කැණීම් වලෙහි හරස්කඩ

**මාණික්කම්පට්ටිය ස්තූපය (මුදවා ගැනීමේ කැණීම)**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් කොළනි අංක 181 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාණික්කම්පට්ටිය ස්තූපය, ජනතාව විසින් අනවසරයෙන් පදිංචිව ඇති හෙයින් ස්තූපය හා එහි අවට සංකීර්ණයට සිදුව ඇති හානිය තක්සේරු කිරීම සහ

කැණීම් කිරීමත් අනතුරුව සංරක්ෂණය සඳහා යොමු කිරීමත් යන අරමුණු ඇතිව මෙම ව්‍යාපෘතිය සිදු කරන ලදී.

කඳුරුවෙළ නගරයේ සිට නැගෙනහිර දෙසට කිලෝ මීටර 4 ක් ගමන්කළ විට මෙම ස්ථානයට ලඟා විය හැකි ය. මහවැලි ගංගාවේ වම් ඉවුරේ විල්ලු සහිත බිමක කෙළවරට වන්නට පිහිටි උස් භූමියක ක්‍රි.ව. 5 වැනි සියවසේ සිට 12 වැනි සියවස දක්වා කාලයට අයත් ස්තූපයක නටබුන් මෙම ස්ථානයේ පවතින බව තහවුරු කරගත්ත ද අනවසර පදිංචිකරුවන් ස්තූපය හරි අඩක් වන සේ කපා දමමින් නිවාස 4 ක් ඉදිකර තිබීමෙන් හා අවට ස්ථානය අධික ජන ඝනත්වයක් සහිත වීමෙන් කැණීම් කටයුතු සිදු කිරීම දුෂ්කර විය. එහෙත් ස්තූපයේ සීමාවන් හඳුනා ගැනීම සිදු කරන ලදී. ස්මාරකය සහ අවට පදිංචිව සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සිදු කරන තෙක් කැණීම් සිදු කළ නොහැකි බැවින් ව්‍යාපෘතිය තාවකාලිකව අවසන් කරන ලදී.





පොළොව මට්ටමේ සිට ඉහළට කැණීම අතරතුර ස්තූපය පෙනෙන ආකාරය සහ ස්තූපයේ අත්තිවාරම බැඳ ඇති ආකාරය

**හඳගල පුරාණ විහාරයට අයත් ස්තූපය කැණීම.**

මෙම ස්ථානය අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. හඳගල පුරාණ විහාරයට අයත් පැරණි ස්තූපය කැණීම් කර සංරක්ෂණය කිරීම සඳහා හඳගල සංවර්ධන කමිටුව විසින් කළ ආරාධනයටත් උතුරු හා නැගෙනහිර පළාතේ පැවති යුධමය වාතාවරණයෙන් අනතුරුව 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තිය උදෙසා නව දාගැබක් ඉදිකිරීමත් අරමුණු කර තිබූ හෙයින් මෙම කැණීම් ව්‍යාපෘතිය සිදු කරන ලදී.

මෙම ස්ථානය පැරණි අනුරාධපුර නගරයේ ඇති ඉදිකිරීම්වලට සමකාලීන බව එහි ඇති සෙල්ලිපි සහිත ලෙන් හා හමුවන අනිකුත් පුරාකෘති මගින් තහවුරු වේ.

මෙය පොළොව මට්ටමේ සිට මීටර දෙසීයක් පමණ උසකින් යුක්ත කඳු වැටියක පිහිටා ඇති අතර හාත්පස අක්කර හත්සීයයකින් පමණ යුත් භූමියකි. මෙහි කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ස්තූප පහක් සහ අනෙකුත් විහාර සංකීර්ණයකට අයත් ගොඩනැගිලි පාදම් කිහිපයක් දක්නට ඇත.

ලලාට ධාතු වංශය සහ සිංහල ධාතු වංශය සඳහන් කරන ආකාරයට මෙම ස්ථානය දෙවන පෑතිස්ස රජුගේ සහෝදර උත්තිය කුමරුන් විසින් ඉදිකරන ලදී. චන්දගිරි විහාරය බව දක්වා ඇත. මෙම ස්ථානයේ ලෙන් තිහකට අධික සංඛ්‍යාවක් ඇති අතර බ්‍රාහ්මී අක්ෂර සහිත ලිපි ද වේ. එක් ලෙනක පස් වන සියවසට අයත් නර්තනයෙන් යුත් ස්ත්‍රී රුවක් ද  පුරුෂ රුවක් ද වේ. ඒ අනුව ක්‍රි.පූ 2 වන සියවසේ සිට අනුරාධපුර යුගයේ අවසන් කාල සීමාව දක්වා භාවිතා වූ වැදගත් ආරාමික ස්ථානයක් බව පෙනේ. මෙහි ඇති එක් ස්තූපයක් අනවසර කැණීම් මගින් විනාශ කර තිබූ බව පැහැදිළි විය.

මෙම කැණීමේදී පොළොව මතු පිට සිට මීටර 32 ක් පමණ ගැඹුරේ දී ස්තූපයේ පාදම හමුවිය. මෙම පාදම සකස් කිරීම සඳහා කුට්ටි වශයෙන් ලබා ගත් කළු ගල් අසුරා ඒ මත පස් දමා සමතලා කොට අනතුරුව පාදම යොදමින් ස්තූපය ගොඩ නගා ඇත. පාදම මට්ටමේ සිට ගඩොල් වරි හතක් පමණක් හඳුනා ගනිමින් වාර්තා කරන ලදී. නිධන් හොරුන් විසින් සිදු කරන ලද අවිධිමත් කැණීම හේතුවෙන් නිසි පරිදි ස්තූපයේ ඉදිකිරීම් ව්‍යුහය වාර්තා කළ නොහැකි විය.


හඳගල ස්තූපයෙහි එක් පැතිකඩක්

## නැගෙනහිර පළාත

**දීඝවාපි ස්ථූප කැණීම**

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දීඝවාපි ග්‍රාමසේවා වසමේ දීඝවාපි පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. මෙය නැගෙනහිර පළාත තුළ ඇති විශාලතම ස්ථූපය මෙන්ම ඓතිහාසික යුගයේ සිට දිවයිනේ තිබූ වන්දනීය ස්ථූප අතර වැදගත් තැනක් ගත් ස්ථූපයකි. ක්‍රි.පු. 2 වන සියවසේ රජ කල සද්ධාතිස්ස රජු විසින් බුදුන් වහන්සේගේ දික් නිය ධාතුව තැන්පත් කොට මෙම ස්ථූපය ඉදිකළ බව මූලාශ්‍රවල සඳහන් වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් 1970 දශකයේ දී ගර්භයේ සුළු කොටසක් සංරක්ෂණය කර තිබූ අතර බටහිර ආයකය සිට පිවිසුම් දොරටුව දක්වා සුළු කොටසක් කැණීම් කොට තහවුරු කර තිබේ. ඉන් පසු 2011 වර්ෂයේ දී ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වය

හා උපදෙස් මත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් දාගැබ සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය කැණීම් කටයුතු ආරම්භ කරන ලදී.

2011 දී උතුර-නැගෙනහිරට අයත් මළුවේ කාර්තුව තුළ සිදුකල කැණීම් මගින් මුල් ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ අවධියට අයත් ගඩොල් බැමි සහ වෙනත් ඉදිකිරීම් අනාවරණය විය. ස්ථූපයේ නැගෙනහිර ආයකය ආශ්‍රිතව දේව රූප, වාමන රූප රාශියක් හමු විය. ක්‍රි.ව.7-8 සියවස්වලට අයත් ශිලාලේඛන 4ක් සළපතල මළුවෙන් අනාවරණය කර ගෙන ඇත.


දීඝවාපි ස්තූපය කැණීමට පෙර


දීඝවාපි ස්තූපය කැණීමට පසු

**ලාහුගල නිලගිරිය ස්තූපය**

අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන රක්ෂිතය ඇතුළත පිහිටි ලාහුගල ග්‍රාමය අසන්නයෙන් ගලා බසින හැඩ ඔයේ සිට කි.මී. 2 ක් පමණ ගිය තැන මෙම පැරණි ස්තූපය පිහිටා ඇත.

නැගෙනහිර පළාත් සංවර්ධනය කිරීමේ වැඩසටහනට සමගාමීව දැනට ශේෂව ඇති පැරණි ස්තූපය ආරක්ෂා කිරීම ජාතික ප්‍රතිපත්තියක් සේ සලකා රජය විසින් ගන්නා ලද තීරණයට අනුව කැණීම් කිරීම 2011 වර්ෂයේ ජුනි මස ආරම්භ කර මාස තුනක කාලයක් ක්‍රියාත්මක කරන ලදී. දීර්ඝ කාලීනව ස්තූපයේ පාදා ගැනීම් කටයුතු සිදු කළ යුතු ව්‍යාපෘතියක් වශයෙන් හඳුනා ගන්නා ලද අතර ස්තූපයේ ඉදිකිරීම් අවධි හඳුනා ගැනීම සඳහා පේසාවළලු, ස්තූප ගර්භය හා ස්තූප මළුවේ කැණීම් කටයුතු අදියරෙන් අදියර සිදුකළ යුතු විය.

කොටු දැල් සැළසුමකට කාර්තු වශයෙන් ස්තූපයේ තිබූ ගඩොල් හා පස් ඉවත් කිරීම සිදු කරන ලද අතර ඒ සඳහා ස්තූපයේ උතුරු දකුණු දිශාවෙන් මීටර 3 ක් පළලින් යුත් අගලක් ද ස්තූපයේ නැගෙනහිර කොටසේ මළුව ආවරණය වන පරිදි අගලක් ද යොදමින් කැණීම් සිදු කරන ලදී. ස්තූප මළුව තුළ සිදු කළ සීමිත කැණීමේ දී මළුව සකස් කර ඇති ආකාරයත් එහි සීමාවන් හඳුනා ගැනීමත් සිදු කළ අතර කැණීම් හා සංරක්ෂණ කාර්යයේ දී මළුවට සිදු විය හැකි හානි වළක්වාලීම සඳහා මළුවේ කැණීම් නවතා දැමිණි.

කැණීමට පෙර ස්තූපයේ සැළසුම් සකස් කිරීම සිදු කළ අතර ස්තූපයේ උස මීටර 21ක් ද එහි විෂ්කම්භය මීටර 60 ක් ද විය. ස්තූපය මතුපිට ඉතා උස්ව වැවෙන අරටු සහිත වීර, හල්මිල්ල, පළු වැනි ශාක වැවී තිබුණු අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 70 දශකයේදී මෙම ස්තූපය එක් කාර්තුවක් පමණක් සංරක්ෂණය කර තිබුණි.



නිලගිරි ස්තූපය කැණීමට පෙර



ස්තූපයේ ඉදි කිරීම් අවදි හඳුනා ගැනීම සඳහා ගර්භය හරහා සිදු කරන ලද කැණීම් අතරතුර.

## වාස්තුවිද්‍යා සංරක්ෂණ අංශය


### මධ්‍යම පළාත

**මහනුවර දිස්ත්‍රික්කය**


**අරත්තන ටැම්පිට විහාරය සංරක්ෂණය**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අරත්තන ටැම්පිට විහාරය ස්ථානගතව ඇත. මෙම විහාරයේ මුල් ඉදිකිරීම් ලක්ෂණ නැවත තහවුරු කිරීමේ අරමුණින් යුතුව සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ටැම්පිට විහාරයේ අක්‍රමවත්ව පිහිටි ගල් ටැම් නිසිලෙස ස්ථානගත කිරීම ප්‍රථමයෙන් සිදු කරන ලදී. ශක්තිමත් ආධාරක යොදා ගනිමින්, ගල් ටැම් නිවැරදි ව ස්ථානගත කර කොන්ක්‍රීට් යොදා සවිමත් කිරීමට පියවර ගන්නා ලදී. මෙම ක්‍රියාවලියත් සමඟ ම විහාර ගොඩනැගිල්ලේ පිහිටීම ද යථා තත්වයට පත් විය.



සංරක්ෂණයට පෙර ගල් ටැම් පිහිටි ආකාරය



විහාරය සංරක්ෂණයෙන් පසු

මීට සමගාමී ව අක්‍රමවත්ව පැවති බැම්, ගඩොල් කුලුණු හා ඉදිරිපස ගල් පඩිපෙළ සැකසීම ද සිදු විය. බැම් සක්ක ගලින් නැවත ගොඩනැගු අතර ගඩොල් කුලුණු ද අළුතින් ම සකස් කරන ලදී.

උළු හා දිරාගිය දැව ඉවත් කරමින් පැරණි හා නව දැව භාවිතයෙන් වහලය සංරක්ෂණය කළ අතර, නව පෙති උළු සෙවිලි කර, පේකඩ යොදා කුමේර බැඳීමෙන් අනතුරුව නව කොත් දෙකක් සවි කර වහලයේ වැඩ නිමකරන ලදී. සිතුවම් සහිත සිවිලිම ශක්තිමත් කර ඉදිරි දැව පඩිපෙළ අළුතින් ම සැකසීමට ක්‍රියා කරන ලද අතර, වරිච්චි බිත්තිවල පිළිසකර කිරීම් කර බිම්ගල් ඇල්ලීමෙන් පසු සංරක්ෂණ කාර්ය නිමාවට පත් කරන ලදී.

**වැලිවිට වේගොල්ල සංඝවාසය සංරක්ෂණය**

මහනුවර දිස්ත්‍රික්කයේ හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව පිහිටි ඉපැරණි සංඝවාසය සංරක්ෂණය කිරීමේ අරමුණින් යුතුව මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රථමයෙන් වහලයේ සංරක්ෂණ කටයුතු පිළිබඳ ව අවධානය යොමු කළ අතර දිරාපත් රීප්ප ඉවත් කර නව දැව භාවිතයෙන් වහල රාමුව සකස් කර සිංහල කොකු උළු සෙවිලි කිරීමෙන් අනතුරුව මුදුන් උළු යොදා කුමේර බැඳීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

වරිච්චි බිත්ති ජලයෙන් හානි වීම වැළැක්වීම සඳහා සක්ක භාවිතයෙන් කයිරු බැම්ම බැඳ ඉදිරි කයිරු බැම්මේ කපරාරුව ඉවත් කර සක්ක ඇතුල් කරමින් කුස්තුර පිරවීම ද සිදු කර ඇත. මැටි බිත්ති මත වැලි, මැටි කපාරාරුව යොදා හුණු කොලපු මැදීම ද සිදු කරන ලදී.

ගෙබිම පිහිටි ගොඩැලි මට්ටම් කර ගොම මැටි ආලේප කිරීමෙන් අනතුරුව සංඝවාසය ඉදිරිපස බිත්තියෙහි පිහිටි ලැටිස් රාමු දෙක පිළිසකර කරමින් සංරක්ෂණ කටයුතු අවසන් කරන ලදී.



සංඝවාසය සංරක්ෂණයෙන් පසු

**ගඩලාදෙණිය දිග්ගෙය මණ්ඩපය සංරක්ෂණය**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව පිහිටි ගඩලාදෙණිය රජමහා විහාරයේ දිග්ගෙය මණ්ඩපය සංරක්ෂණය කිරීමේ අරමුණෙන් යුතුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.


ප්‍රථමයෙන් මණ්ඩපයේ වහල සංරක්ෂණ කටයුතු සිදු කළ අතර, මෙහි දී සියලු ම උළු හා දිරාගිය රීප්ප ඉවත් කර නව දැව භාවිත කරමින් වහල රාමුව නිර්මාණය කර මාළිගා උළු සෙවිලි කළ අතර, කුමේර බැඳීමට ද ක්‍රියා කරන ලදී.


අනතුරුව ගෙබිම බිම්ගල් ඇල්ලීමේ කාර්ය සිදු කළ අතර, කුස්තුර පුරවා ගෙබිම සංරක්ෂණ කටයුතු ද නිම කරන ලදී. දැවයෙන් නිර්මිත දොර ජනෙල්හි දිරාපත් කොටස් ඉවත් කරමින් නව දැවයෙන් පිළිසකර කිරීම් කළ අතර ශිලාමය උළුවස්සක් ද ප්‍රතිසංස්කරණය කරන ලදී. මීට සමගාමී ව සියලු ම බිත්ති පිපිරුම් ප්‍රකෘතිමත් කර අක්‍රමවත්ව පැවති කයිරුව ද කුස්තුර පුරවා පිළිසකර කරමින් සමස්ත සංරක්ෂණ ක්‍රියාවලිය නිම කරන ලදී.

**ගඩලාදෙණිය සිංහාසන ගොඩනැගිල්ල සංරක්ෂණය**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව ගඩලාදෙණිය රජමහා විහාරයේ පිහිටි සිංහාසන ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීමේ අරමුණෙන් යුතුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

සංරක්ෂණ කටයුතු ආරම්භ කරමින් වහලයේ පැවති දිරාගිය පෙති උළු, කුමේර උළු, රීප්ප හා පරාල ඉවත් කර නව දැව භාවිතයෙන් වහල රාමුව සකස් කර පැවති උළු රටා අනුගමනය කරමින් මාලිගා උළු සෙවිලි කරන ලදී. බිත්ති ආශ්‍රිත පිළිසකර කිරීම් කර විහාරයේ ගල් පඩි සැකසීමෙන් අනතුරුව සමස්ත සංරක්ෂණ ක්‍රියාවලිය නිම කරන ලදී.





සිංහාසනය ගොඩනැගිල්ල සංරක්ෂණයෙන් පසු

**ගඩලාදෙණිය රජමහා විහාරයේ අටුව සහිත මුළුතැන්ගෙය සංරක්ෂණය**


මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගඩලාදෙණිය රජමහා විහාර පරිශ්‍රයේ පිහිටි අටුව සහිත ඉපැරණි මුළුතැන්ගෙය සංරක්ෂණය කිරීම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ විය.

ප්‍රථමයෙන් පුරගෙය ඉදිකිරීමෙන් අනතුරුව වහලයේ දිරාගිය උළු රැඳවුම ඉවත් කර නව දැව භාවිතයෙන්, නව උළු ද යොදා ගනිමින් වහලය සෙවිලි කර කුමේර බැඳීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. බිත්ති හා ගෙබිම ආශ්‍රිත කැඩී ගිය ස්ථාන පිළිසකර කිරීමෙන් අනතුරුව නව දැව භාවිතයෙන් වී අටුවේ දිරාගිය කොටස් ද පිළිසකර කරන ලදී.

**දැඩිමුණ්ඩ දේවාලය සංරක්ෂණය**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඩලාදෙණිය රජමහා විහාර පරිශ්‍රය තුළ පිහිටි දැඩිමුණ්ඩ දේවාලය සංරක්ෂණය කිරීමේ අරමුණ පෙරදැරිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

සංරක්ෂණ කටයුතු ආරම්භයේ දී පුරගෙය ඉදි කිරීමෙන් අනතුරුව වහලයේ කැඩී ගිය උළු හා දිරාපත් දැව කොටස් ඉවත් කරන ලදී. නව දැව භාවිතයෙන් උළු රැඳවුම තනා පෙති උළු යොදා ගනිමින් වහලය සෙවිලි කිරීමේ කාර්ය ඉටුකරන ලදී. මේ සඳහා භාවිතයට ගත හැකි තත්වයේ පැවති පැරණි උළු ද යොදා ගැණින. කුමේර බැඳීමට  ද මීට සමගාමී ව සිදු කරමින් වහලයේ වැඩ නිම කරන ලදී. කයිරු ආශ්‍රිත දූර්වල ස්ථාන සකස් කර කුස්තුර පිරවීම ද කළ අතර, බිත්ති ආශ්‍රිත ප්‍රතිසංස්කරණ කටයුතු ද සිදු කරන ලදී.



සංරක්ෂණයේ අවස්ථා කිහිපයක්

**ගඩලාදෙණිය වාහල්කඩ සංරක්ෂණය**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව ගඩලාදෙණිය රජමහා විහාරස්ථානයේ පිහිටා ඇති පැරණි වාහල්කඩ සංරක්ෂණය කිරීම උදෙසා මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

මෙම සංරක්ෂණ ක්‍රියාදාමය මගින් වාහල්කඩ වහලයේ පැවති දිරාගිය රීප්ප කොටස් ඉවත් කළ අතර, නව දැව භාවිත කරමින් තනන ලද රීප්ප යොදා වහල රාමුව නිර්මාණය කරන ලදී. කැඩී

ගිය උළු වෙනුවට නව කොකු උළු භාවිත කරමින් වහලය සෙවිලි කිරීම් කළ අතර, කුමේර බැඳීම ද සිදු කර සංරක්‍ෂණය කාර්යය නිම කරන ලදී.

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

**පොත්ගුල් මාළිගා සංඝවාසය සංරක්ෂණය**

නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත්ව හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි පොත්ගුල් මාළිගා සංඝාවාසය සංරක්‍ෂණය කිරීමේ අරමුණෙන් යුතුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ව්‍යාපෘතිය ආරම්භ කරමින් ප්‍රථමයෙන් පුරගෙය ඉදිකිරීමෙන් අනතුරුව වහලයේ දිරාගිය දැව කොටස් ඉවත් කර නව දැව භාවිත කරමින්, වහල රාමුව නිර්මාණය කරන ලදී. අනතුරුව සිංහල කොකු උළු සෙවිලි කරන ලදී. අනතුරුව මුදුන් උළු යොදා කුමේර බැඳීමට අවශ්‍ය පියවර ද ගන්නා ලදී. බිත්ති හා ගෙබිම දුර්වලව පිපිරීම්වලට ලක්ව පැවති ස්ථාන පිළිසකර කළ අතර, ආවාසයේ පිටුපස පිහිටි දාන ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ ව ද අවධානය යොමු කරන ලදී. මෙහි දී කුස්තුර පුරවා පිළිසකර කිරීම් කර මැද මිදුලේ ඉදිරිපස පිහිටි ගොඩනැගිල්ල ඉවත් කරමින් අවශ්‍ය ස්ථාන කපරාරුව කර සංරක්‍ෂණ ක්‍රියාවලිය නිම කරන ලදී.

**මාතලේ දිස්ත්‍රික්කය**

**මාතලේ ලෙන් විහාරය සංරක්‍ෂණය**

මාතලේ දිස්ත්‍රික්කයට අයත්ව මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි මාතලේ අළු විහාරයේ පහළ ලෙන් විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමේ අරමුණෙන් යුතුව මෙම සංරක්‍ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

සංරක්‍ෂණ ක්‍රියාවලිය ආරම්භ කරමින් පුරගෙය ඉදිකිරීමෙන් අනතුරුව වහලය ගලවා ඉවත් කරන ලදී. වැසි ජලයෙන් හානියට පත් පරාල හා කැඩී ගිය පැරණි උළු කැට වෙනුවට නව දැව යොදා සිංහල කොකු උළු සෙවිලි කර වහලයේ වැඩ නිම කරන ලදී. වැසි දිනයන්හි දී ගල මතින් ඇද හැලෙන ජලය ලෙන තුළට පැමිණීම වැළැක්වීම සඳහා පියස්ස හා ගල අතරට බදාම වැටියක් යෙදීම ද සිදු කර සමස්ත සංරක්‍ෂණ ක්‍රියාවලිය අවසන් කරන ලදී.

## බස්නාහිර පළාත

**ගම්පහ දිස්ත්‍රික්කය**

**කොස්පිල්ලෑව  විහාරයේ ධර්ම ශාලාව සංරක්‍ෂණය**

ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව පිහිටි කොස්පිල්ලෑව  විහාරයේ ඉපැරණි ධර්ම ශාලාව සංරක්‍ෂණය කිරීම සඳහා මෙම සංරක්‍ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රථමයෙන් වහලයේ සංරක්‍ෂණ කටයුතු සිදු කළ අතර දිරා ගිය රීප්ප හා පරාල ඉවත් කර නව දැව භාවිතයෙන් වහල රාමුව තනා කොකු උළු සෙවිලි කරන ලදී. පහත වහලයේ සංරක්‍ෂණ

කටයුතුවල දී ද ඉහත පියවර ම අනුගමනය කරන ලදී. මේ සඳහා පැරණි ආකාරයට ම කැටයම් යෙදූ වඩිම්බු ලෑල්ලක් සවිකළ අතර, කුමේර බැද මැටි කොතක් සවි කිරීමට ද ක්‍රියා කරන ලදී.




වහලයේ සංරක්ෂණ කටයුතු කළ ආකාරය

ධර්ම ශාලාවේ හතරැස් කණු ද පිළිසකර කිරීම් කළ අතර, වට භාගබිත්ති හා එම බිත්ති හරහා තිබූ වෘත්තාකාර කණු ද, පිළිසකර කරමින් සුදු හුණු ආලේප කරන ලදී. දැවයෙන් තනා තිබූ කණුවල දිරාපත් ස්ථාන මූට්ටු යොදා නැවත තැනූ අතර, ගේට්ටු කණු හා ගේට්ටු පියන් ද පැරණි ආකාරයට සුදුසු පරිදි සකස් කරන ලදී. ධර්ම ශාලාවේ පිටුපස පිහිටි පිපිරුම් සහිත කයිරුව සංරක්ෂණය කරමින් සමස්ත සංරක්ෂණ ක්‍රියාවලිය අවසන් කරන ලදී.

**ගනේවත්ත ටැම්පිට විහාරයේ සංරක්ෂණය**

ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉපැරණි ටැම්පිට විහාරය සංරක්ෂණය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

සංරක්ෂණ කටයුතු ආරම්භ කරමින් ප්‍රථමයෙන් පුරගෙය ඉදි කරන ලදී. වහලයේ රීප්ප හා උළු ඉවත් කිරීමත් සමග ම විහාරය තුළ කඩා වැටී තිබූ පිළිම කොටස ඉවත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. අනතුරුව හිඳි පිළිමයේ ඉතිරිව ඇති කොටස් ද දෙපස පිහිටි දේව රූප ද සුදුසු ආකාරයෙන් ශක්තිමත් කිරීම් කර ඇතුළත හා පිටත බිත්ති ශක්තිමත් කිරීමට පියවර ගන්නා ලදී.

අනතුරුව ටැම් මත බාල්ක හා ලෑලි තට්ටුව යෙදවීමට පියවර ගත් අතර, මේ සඳහා නව දැව භාවිත කරන ලදී. පිළිමය සමඟ ගැලවී ගිය බිත්ති සවිමත් කර පිටත බිත්ති සියල්ල ද පිළිසකර කිරීම් කර සිමෙන්ති පඩිපෙල ගලවා ඉවත් කරමින් දැව පියගැට පෙළක් ස්ථානගත කිරීමට ක්‍රියා කරන ලදී. මීට සමගාමී ව වටපිල සංරක්ෂණ කටයුතු සිදු කර වහලය සංරක්ෂණයට අවශ්‍ය පියවර ගන්නා ලදී. නව දැව භාවිත කරමින් මාලිගා උළු සෙවිලි කර ඉදිරි වහලය සඳහා කොකු උළු සෙවිලි කරන ලදී. අනතුරුව නව කාණු පිහිල්ලක් යොදා මැටිකොත් සවි කර කුමේර බැඳීම ද සිදු කරමින් සංරක්ෂණ ක්‍රියාවලිය අවසන් කරන ලදී.

**කහඳව ලෙන් විහාරය සංරක්ෂණය**

ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථානගතව ඇති ඉපැරණි විහාරස්ථානය සංරක්ෂණය කිරීමේ අරමුණින් මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය දියත් කරන ලදී.

විහාර වහලයේ සංරක්ෂණ කටයුතු පිළිබඳ ව ප්‍රමුඛ අවධානය යොමු කළ අතර, ලෙන අසල 3” පමණද අගුව කෙළවර 1” පමණ ද වන අයුරින් 4/3 ඝනකම සහිත කපරාරුව කොන්ක්‍රීට් වහලය මතට යොදන ලදී. අවශ්‍ය උස ප්‍රමාණයන්ගෙන් යුත් කොන්ක්‍රීට් කොට්ට වහලය මතට යෙදූ අතර, කොන්ක්‍රීට් කණු මතට දැව රාමුව යොදා අමානෝ තහඩු සෙවිලි කරන ලදී. ඉදිරිපස පෝටිකෝ කොටසෙහි වහලය පිළිසකර කිරීම සුදුසු අයුරින් කළ අතර, බිත්ති පිළිසකර කිරීම සඳහා අවශ්‍ය සංරක්ෂණ පියවර අනුගමනය කරන ලදී.



සංරක්ෂිත වහලයේ දර්ශනයක්

**බෝගහවත්ත අම්බලම සංරක්ෂණය**

ගම්පහ දිස්ත්‍රික්කයට අයත් වැකේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි කිරිඳිවැල බෝගහවත්ත අම්බලම සංරක්ෂණය කිරීම මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය දියත් කිරීමේ මූලික අරමුණ විය.

සංරක්ෂණ කටයුතු ආරම්භ කරමින් වහලයේ පැවති දිරාගිය දැව කොටස් ඉවත් කර නව දැව භාවිතයෙන් තැනූ වහල රාමුව මත රට උළු සෙවිලි කර කුමේර බැඳීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මීට සමගාමී ව වඩිම්බු ලෑලි ද සවිකරන ලදී. බොල්ව පැවති කෙටි බිත්ති සුදුසු අයුරින් සංරක්ෂණය කළ අතර, ගඩොල් ඇතිරුමට ඉහළින් සිමෙන්ති යොදා මෙහි වටපිල අළුතින් ම සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

## ඌව පළාත

**මොණරාගල දිස්ත්‍රික්කය**

**යටියල්ලාතොට පධානඝරය සංරක්ෂණය**

මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇති අතර එහි මුල් ඉදිකිරීම් ලක්ෂණ තහවුරු කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

සංරක්ෂණ ක්‍රියාවලිය ආරම්භ කරමින් මෙහි මතුපිට විසිරී පැවති ගල් බැම් මත ඇති ගල් හා අත්තිවාරම් ගල් ඉවත් කරමින් අනතුරුව නියමිත ආකාරයෙන් නැවත ස්ථානගත කර බැම් ගොඩනැගීම සිදු කරන ලදී. ගොඩනැගිලි දෙක අතර පිහිටි පාලම් කොටස ද නියමිත ආකාරයෙන් තහවුරු කිරිම් කර පොකුණට අවහිරයක්ව පැවති ගස ඉවත් කරමින් පොකුණ සංරක්ෂණය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ද අනුගමනය කරන ලදී.




සංරක්ෂණ කටයුතු සිදු කළ ආකාරය

**විලැතිගොඩ ආවාසය සංරක්ෂණය**

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව පිහිටි විලැතිගොඩ ආවාසය සංරක්ෂණය කිරීමේ අරමුණින් යුතුව මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය.

සංරක්ෂණ කටයුතු ආරම්භ කරමින් බිත්ති මත වූ පිපිරුම් හා බොල්ව පැවති කපරාරු කොටස් ගලවා ඉවත් කර සුදුසු ආකාරයෙන් පිළිසකර කිරීම් කරන ලදී. අනතුරුව ගෙබිම විනාශයට පත් ස්ථාන ද ප්‍රතිසංස්කරණය කර මීට සමගාමීව ගොඩනැගිල්ලේ පිල කොටසේ හිස්ව පැවති කොටස් බැඳ සියලු කොටස් කපරාරු කරමින් සංරක්ෂණ ක්‍රියාවලිය නිමාවට පත් කරන ලදී.

**පොතුබන්ධන ධර්ම ශාලාව සංරක්ෂණය**


මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම විහාරස්ථානය ස්ථානගතව ඇත. ධර්ම ශාලාවේ විනාශයට පත් අංග ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණින් යුතුව මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

සංරක්ෂණ කටයුතු අරඹමින් ධර්මශාලා වහලයේ පැවති දිරාපත් රීප්ප, බාල්ක, පරාල හා සිංහල උළු ඉවත් කර අවශ්‍යතාව අනුව නව දැව යොදා ගනිමින් වහල රාමුව නිර්මාණය කරන ලදී. අනතුරුව කොකු උළු සෙවිලි කර වහලය පිළිසකර කරමින් කුමේර බැඳීමට ද, පියවර ගන්නා ලදී. අළුතින් බඳින ලද බිත්ති කොටස හා බිත්ති පිපිරුම් කපරාරු කර සුද මැදීමට අවශ්‍ය පියවර ගත් අතර ගෙබිම සංරක්ෂණ කටයුතුවලට සමගාමීව කයිරුව ද පිළිසකර කරමින් සංරක්ෂණ කටයුතු නිම කරන ලදී.

**නාගල ධර්ම ශාලාව සංරක්ෂණය**


මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම ධර්ම ශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රථමයෙන් වහලයේ සංරක්ෂණ කටයුතු ආරම්භ කළ අතර වහලයේ පැවති දිරාපත් දැව රාමුව ඉවත් කර නව දැව යොදමින් වහල රාමුව සකසා වහලය සඳහා සිංහල කොකු උළු සෙවිලි කරන ලදී. ගෙබිම දුර්වල ස්ථාන කපරාරු කර සුද මැදීම කළ අතර කාණු පීලි නියමිත ආකාරයට සැකසීමට අවශ්‍ය පියවර ද ගන්නා ලදී.



සංරක්ෂණයේ අවස්ථා

**යුධගනාව දාගැබ සංරක්ෂණය**



දාගැබ සංරක්ෂණයේ අවස්ථා කිහිපයක්



මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. විනාශයට පත් දාගැබේ මුල් ඉදිකිරීම් ලක්ෂණ නැවත තහවුරු කොට සංරක්ෂණය කිරීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රධාන අවධානය යොමු කරනු ලැබුවේ දාගැබ සංරක්ෂණයේ දී සැලැස්මට අනුව දාගැබේ පිට රවුම සකස් කර ගැනීමට අවශ්‍ය බැමි කොටස් ඉදිකිරීම පිළිබඳ ව යි. මෙහි සෝදා පාලුවට ලක්ව ඇති නැගෙනහිර දිශාවේ බැම්ම දාගැබක ස්වරූපයට බැඳීම සිදු කළ අතර කඩගල් බැම්මක් ආකාරයට මෙහි ඉදිකිරීම් කරන ලදී.

**කොටසර පියංගල ප්‍රාකාර බැම්ම සංරක්ෂණය**

මොණරාගල දිස්ත්‍රික්කයට අයත් වූ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම විහාරස්ථානය පිහිටා ඇත. මෙහි පිහිටි ඉපැරණි දාගැබට අයත් ප්‍රකාර බැම්ම සංරක්ෂණය කිරීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය.

සංරක්ෂණ කටයුතු ආරම්භ කරමින් දාගැබෙහි වූ වල් පැලෑටි ඉවත් කර බැමි කොටස් හි පිහිටි විනාශයට පත් ගඩොල් ඉවත් කර ගන්නා ලදී. ප්‍රාකාර බැම්මේ විනාශයට පත් ගඩොල් හා අස්ථානගතව තිබූ ගඩොල් වෙනුවට 9" X 6" X 4" ප්‍රමාණයේ නව ගඩොල් යොදා ගනිමින් බැම්ම ශක්තිමත් කරලීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

සංරක්ෂණයේ අවස්ථා

**බදුල්ල දිස්ත්‍රික්කය**

**පෝටාව අම්බලම සංරක්ෂණය**

රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පෝටාව අම්බලම සංරක්ෂණය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රථමයෙන් වහල සංරක්ෂණ කටයුතු පිළිබඳ අවධානය යොමු කළ අතර එම කාර්යයෙන් අනතුරුව මෙහි අත්තිවාරම ශක්තිමත් කරලීමට ක්‍රියා කරන ලදී. අවශ්‍ය තැන්හි සුදුසු පරිද්දෙන් බිත්ති කපරාරුව ද සිදු කරමින් හුණු ආලේප කර සංරක්ෂණ කටයුතු නිම කරන ලදී.

**දිඹුලන වෙහෙරගොඩ පිළිමගෙය සංරක්ෂණය**

බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දිඹුලන වෙහෙරගොඩ පුරාණ විහාරස්ථානය පිහිටා ඇත. එම විහාරස්ථානයට අයත් පැරණි පිළිමගෙය සංරක්ෂණය කිරීමේ අරමුණ මුල් කොට ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

මෙහි දී ප්‍රමුඛ අවධානය යොමු කරනු ලැබුවේ වහලය සංරක්ෂණය කිරීමේ කටයුතු පිළිබඳ ව යි. විනාශයට පත් දැව කොටස් ඉවත් කර නව දැව භාවිතයෙන් වහල රාමුව සකස් කර උළු සෙවිලි කරන ලදී. අනතුරුව කුමේර බැද කොත් දෙකක් සවිකර සංරක්ෂණ කටයුතු නිම කරන ලදී.

## දකුණු පළාත

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

**කසාගල ධර්ම ශාලාව සංරක්ෂණය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අගුණකොලපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව පිහිටි කසාගල ධර්ම ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

සංරක්ෂණ කටයුතු අරඹමින් ප්‍රථමයෙන් වහලයේ වැඩ කොටස් ඇරඹූ අතර මෙහි දී දිරාපත් පරාල, යට ලී ඉවත් කර නව දැව කොටස් යොදා සිවිලිම තනා නව උළු සෙවිලි කරන ලදී. කැටයම් සහිත වඩිම්බු ලෑලි සවිකර කුමේර බැඳීමට ද පියවර ගෙන ඇත. මීට සමඟ ාමීව දිරාපත් ජනෙල් රාමු, උළුවහු, ජනෙල් පියන්, ආදිය ද ප්‍රතිසංස්කරණය කරන ලදී. බිම් ගඩොල් අස්ථානගතව පැවති ගෙබිම කොන්ක්‍රීට් භාවිතයෙන් පුරවා අනුකරණ බිම් ගඩොල් සවි කිරීමට ක්‍රියා කරන ලදී. අත්වැටෙහි වූ කොන්ක්‍රීට් බීරළු වෙනුවට දැව බීරළු යෙදූ අතර බිත්ති පිපිරුම් සහිත ස්ථාන කපරාරු කර අත්තිවාරම ශක්තිමත් කරමින් සංරක්ෂණ ක්‍රියාවලිය නිම කරන ලදී.

**ගාල්ල දිස්ත්‍රික්කය**

**කතළුව පූර්වාරාමය විහාරගෙය සංරක්ෂණය**

ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම ඓතිහාසික විහාරස්ථානය පිහිටා ඇත. විහාරයේ වහලය සංරක්ෂණය කිරීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

සංරක්ෂණ කටයුතු ක්‍රියාවට නැංවීමේ දී ප්‍රථමයෙන් වහලයේ පැවති දිරාගිය රීප්ප හා උළු ඉවත් කිරීම සිදු විය. අනතුරුව නව රීප්ප යොදා පැරණි සිංහල උළු වෙනුවට නව කොකු උළු සෙවිලි කළ අතර කුමේර බැඳීම ද සිදු කරන ලදී. වහලයේ දෙකෙළවර නිසි ආකාරයෙන් සැකසීම, කාණු පීලි යෙදීම වැනි කාර්යයන් ද මීට සමඟාමී ව ඉටු කරන ලදී.

**විජයානන්ද පිරිවෙණ ධර්ම ශාලාව සංරක්‍ෂණය**

ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි වැලිවත්ත විජයානන්ද පිරිවෙණේ ධර්ම ශාලාව සංරක්‍ෂණය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රථමයෙන් වහලයේ වැඩ කොටස් ඇරඹූ අතර දිරා ගිය දැව රාමුව ඉවත් කර නව දැව භාවිතයෙන් තනන ලදී. සිංහල උළු වෙනුවට නව කොකු උළු යොදාගත් අතර කැටයමෙන් යුත් නව වඩිම්බු ද සවි කරන ලදී. කැඩී ගිය මැටි කොත් වෙනුවට හැඩය හා ප්‍රමාණයෙන් සමාන නව මැටි කොත් සවි කළ අතර කුමේර බැඳ, සංරක්‍ෂණ ක්‍රියාවලිය අවසන් කරන ලදී.

**ඉමදූව වල්පල ගෞතමාරාම චෛත්‍ය සංරක්ෂණය**

ගාල්ල දිස්ත්‍රික්කයේ ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව පිහිටි වල්පල ගෞතමාරාම චෛත්‍ය සංරක්‍ෂණය කිරීමේ අරමුණින් යුතුව මෙම සංරක්‍ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. චෛත්‍යයේ කපරාරුව විශාල වශයෙන් හානියට ලක්ව පැවතිණි. ගර්භයේ කැඩී ගිය කපරාරු කොටස් ඉවත් කර සුදුසු ආකාරයෙන් නැවත පුරවා සකස් කිරීම, පේසා වළලු හා චෛත්‍යයේ අනෙකුත් විනාශයට පත් ස්ථාන කපරාරු කර සුදු හුණු ආලේප කිරීම යන සංරක්‍ෂණ කාර්යයන් මෙම ව්‍යාපෘතිය මගින් ඉටු කරන ලදී.

## රසායන සංරක්ෂණ අංශය

## බිතුසිතුවම් සංරක්ෂණය

## බස්නාහිර පළාත

**ගම්පහ දිස්ත්‍රික්කය**

**ගනේවත්ත ටැම්පිට විහාරය (බෝධිමළු පුරාණ විහාරය)**

දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෝබුගම්මන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ටැම්පිට විහාරයකි. ගල්කණු 6 ක් සහ කොන්ක්‍රීට් කණු 3 ක් මත (කොන්ක්‍රීට් කණු පසුකාලීන විය හැකි ය) විශාල බාල්ක යොදා ඒ මත ලෑලි අතුරා ප්‍රතිමා ගෘහය ඉදිකර ඇත. ඇතුළු මාලය සහ පිටත මාලය වශයෙන් කොටස් දෙකකි. එහි ඇති මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් සහ මූර්ති මත පසුකාලීනව වර්ණාලේප කර ඇත.

සිතුවම් සහිත බිත්තිවල බහුල වශයෙන් පිපිරීම් දක්නට ලැබුණු අතර වර්ණ ස්ථරයේ සුළු වශයෙන් පතුරු ගිලිහී යාම ද හඳුනාගත හැකි විය. බුදු පිළිමයේ බඳ කොටස සහ ආසනය, පිටුපස බිත්තියේ පහළ කොටසත් සමඟ බිමට කඩා වැටී තිබුණි. එයට හේතුව වූයේ විහාරයේ බිමට අතුරා තිබූ දැව කොටස් දිරාපත් වීමයි. ආධාරක බිත්තියත් බදාමයත් අතර බන්ධනය දුර්වල වීමෙන් බොල් වූ බදාමයේ කොටස් ගිලිහී යමින් පැවතුණි. වේයන් විසින් ද හානි පමුණුවා ඇත.

1999 සහ 2009 වසරවල ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මෙම විහාරයේ සංරක්ෂණ කටයුතු සිදුකර ඇති අතර නැවත 2011 වසර තුළ ද මෙහි සංරක්ෂණ කටයුතු තවදුරටත් සිදුකරන ලදී. මෙම වසර තුළ ප්‍රමුඛ සංරක්ෂණ කටයුත්ත වූයේ බුදු පිළිමයේ කැඩුණු කොටස් පිළිසකර කිරීමයි. ගඩොල් භාවිත කර මැටි බදාම යොදා ප්‍රථමයෙන් පිළිමයට ආධාරකයක් ඉදිකරනු ලැබීය. අනතුරුව පිටුපස කැඩුණු බිත්තිය නැවත සකස් කර තහවුරු කරන ලදී. ආසනය ද මැටි සහ වැලි මිශ්‍ර බදාමයකින් ගඩොල් යොදා බැඳ සමාධි පිළිමයේ කැඩීගිය පහළ කොටස ඒ මත ඔසවා තබන ලදී. පිළිමයේ ඉහළ කොටස සහ පහළ කොටස සම්බන්ධ වන ස්ථාන පුරවනු ලැබූයේ වැලි, මැටි සහ හුණු පොලිවීනයිල් ඇසිටේට් මාධ්‍යයෙන් මිශ්‍ර කර තනන ලද බදාමයකිනි.

දේවරූපවල කැඩීගිය දෙපා කොටස් පිළිසකර කිරීමත්, පිපිරීගිය බිත්ති තහවුරු කිරීමත්, සිතුවම්වල වර්ණ ස්ථරයේ පතුරු ඇලවීමත් මෙහි සිදුකරන ලද සෙසු සංරක්ෂණ කාර්යයන් වේ.

**කළුතර දිස්ත්‍රික්කය**

**පානදුර රන්කොත් විහාරය**

පානදුර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන රන්කොත් විහාරය පානදුර නගර මධ්‍යයේ පිහිටා ඇත. ප්‍රදේශයේ මහජනතාවගේ හා දානපතීන්ගේ අනුග්‍රහයෙන් 1810 වර්ෂයේ දී ඉදිකරන ලද මෙම විහාරය ගල්කන්දේ විහාරය යන නමින් ද අතීතයේ දී හඳුන්වනු ලැබ ඇත. මෙයට

රන්කොත් විහාරය යන නම ව්‍යවහාරයට පැමිණ ඇත්තේ මෙහි චෛත්‍යයෙහි කොතට රන් ආලේප කිරීම හේතුවෙනි.

මෙහි ප්‍රතිමා ගෘහය මාල දෙකකින් සමන්විත වූ විශාල එකකි. ඇතුළු මාලයෙහි ප්‍රධාන සැතපෙන පිළිමයක් ද, දකුණු පසින් සමාධි පිළිමයක් ද, වම්පසින් හිටි බුදු පිළිමයක් ද දක්නට ලැබෙන අතර ඉදිරියෙන් විෂ්ණු දේව ප්‍රතිමාවක් මූර්තිමත් කර ඇත. බිත්තිවල රහතන් වහන්සේලාගේ රූප ද, දැව වියනේ මල් මෝස්තර සහ දිව්‍ය ලෝකය සහ බ්‍රහ්ම ලෝකය ද සිතුවම් කර ඇත. පිටත බිත්තිවල පනේල ක්‍රමයට බුද්ධ චරිතයේ ප්‍රධාන සිදුවීම් සහ ජාතක කථා නිරූපණය වේ. මෙම සිතුවම් සහ මූර්ති මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලිය නියෝජනය කරයි.

සිතුවම් සඳහා ආධාර කරගෙන ඇති බිත්තියේ බදාමය හුණු සහ වැලි මිශ්‍රණයකින් සමන්විත වන අතර අඟල් $^{3}/_{4}$ ක් පමණ ඝනකම වේ. වර්ණ දැරීමේ ස්ථරය ඉතා සියුම් ලෙස හුණු කොළපු මැද ඔපමට්ටම් කර ඇත. රතු, නිල්, කහ හා කළු යන වර්ණ ප්‍රමුඛව භාවිත කර ඇත. මෙම විහාරයේ සිතුවම් සහ මූර්තිවල දක්නට ලැබුණු ප්‍රධාන හායන තත්වයන් වූයේ බදාමය බොල්වීම, ඉරිතැලීම සහ ගිලිහී වැටීම, සිතුවම්වල වර්ණ ස්ථරය පතුරු වශයෙන් ඉවත්ව යාම, කුඩු බවට පත්වීම, සිතුවම් මත ලවණ සහ අපද්‍රව්‍ය තැන්පත්වීම, වර්ණක ස්ථරය අවපැහැවීම සහ ආසන සහ බිත්තිවල කොටස් කැඩීයාමයි. මිනිසුන් විසින් ස්පර්ශ කිරීම සහ සමුද්‍රාසන්නව පිහිටීම නිසා මුහුදු සුළං මගින් රැගෙන එන ලවණ තැන්පත්වීම මෙහි සිතුවම් සහ මූර්තිවලට විශාල බලපෑමක් එල්ල කරයි.

මෙහි සංරක්ෂණ කටයුතු 2010 වර්ෂයේ දී ආරම්භ වූ අතර 2011 වසර තුළ දී ද තවදුරටත් සිදුකරන ලදී. මෙහි දී බොල් වූ ස්ථාන පැරණි බදාමයට සරිලන බදාමයකින් පිරවීම, සිතුවම් මත වූ අපද්‍රව්‍ය ඉවත් කිරීම, සිතුවම්වල පතුරු ගිලීහී යන ස්ථාන පොලිවීනයිල් ඇසිටේට් රසායනිකයෙන් ඇලවීම, වර්ණ ගිලිහී ගිය ස්ථාන වර්ණ මගින් ප්‍රතිජ්කීයකරණය කිරීම සහ අවශ්‍ය ස්ථානවල පැරලොයිඩ් බී 72 ආරක්ෂිත ආලේපය ගැල්වීම යන සංරක්ෂණ කාර්යයන් සිදුකරන ලදී.

**දොඩම්ගොඩ ශ්‍රී සුදර්ශනානාරාමය**

දොඩම්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම විහාරයේ පිළිමගෙය මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියට අයත් සිතුවම් සහ මූර්තිවලින් සමන්විත වූවකි. ඉදිරි මාලය සහ ඇතුළු මාලය වශයෙන් කොටස් දෙකක් දැකිය හැකි ය. ඉදිරි මාලයේ ජාතක කථා ද, දැව වියනේ මල් මෝස්තර ද සිතුවම් කර ඇත. ඉදිරි මාලයෙන් ඇතුළු මාලයට පිවිසෙන දොරටු දෙක දෙපස දොරටුපාල රූප, සිංහ රූප සහ දොරටු දෙක ඉහළින් මකර තොරණ දෙකක් ද මූර්තිමත් කර ඇත.

ඇතුළු මාලයේ සැතපෙන බුද්ධ ප්‍රතිමාවේ වම් පාදයේ ඇඟිලි සමඟ කොටසක් කැඩීගොස් තිබූ අතර ඉදිරිපස සිංහරූපවල ද අතක් සහ පාදයක් ගැලවී විනාශ වී තිබූ හෙයින් පැරණි බදාමයට

සරිලන නව බදාමයකින් එම ස්ථාන පිළිසකර කිරීම මෙම වසර තුළ දී සිදු කරනු ලැබීය. ඊට අමතර ව සිතුවම් සහිත බිත්තිවල බදාම ස්ථරය බොල් වූ ස්ථාන නව බදාමයකින් පුරවා තහවුරු කිරීම, සිතුවම් ස්ථරයේ පතුරු ගිලිහී යන ස්ථාන පොලිවිනයිල් ඇසිටේට් ද්‍රාවණයෙන් අලවා තහවුරු කිරීම යන සංරක්ෂණ කාර්යයන් ද සිදු කරන ලදී.

**කොළඹ දිස්ත්‍රික්කය**

**කෝට්ටේ කෞතුකාගාරයේ පුරාවස්තු සංරක්ෂණය**

කෝට්ටේ ඊ. ඩබ්. පෙරේරා අනුස්මරණ කෞතුකාගාරයේ පුරාවස්තු සංරක්ෂණ ව්‍යාපෘතිය මෙම වසර තුළ ද ක්‍රියාත්මක කරන ලදී. මෙම වසර තුළ පහත සඳහන් කෞතුක භාණ්ඩ සංරක්ෂණයට භාජනය කරනු ලැබී ය.

1. සම් බෑගයක් (සුචි අංක 182)
2. යකඩ දොර අල්ලුවක් (සුචි අංක 45)
3. යකඩ යතුරක් (සුචි අංක 46)
4. යකඩ කඩු මිටක් (සුචි අංක 11)
5. යකඩ කඩු තලයක් (සුචි අංක 07)
6. මැටි කොතක් (සුචි අංක 248)
7. මොස්තර සහිත මැටි භාජන කැබලි (සුචි අංක 249)
8. පිඟානක් (සුචි අංක 105)
9. ටීපෝ කවර 2 ක් (සුචි අංක 127 සහ 124)

සංරක්ෂණය කරන ලද සම් බෑගය මෙරට නිදහස් සටනේ පුරෝගාමියකු වූ ඊ. ඩබ්. පෙරේරා මහතා විසින් භාවිත කරන ලද්දකි. මෙහි පිටත සම් ආවරණය වියළී ඇඹරීමට ලක් වී තිබුණු අතර මතුපිට සුදු පැහැති දිලීර විශේෂයක් ද වර්ධනය වී තිබුණි. ඇතුළත රෙදි ආවරණය ද දිලීර සහ දූහුවිලි බැඳීමෙන් අපවිත්‍රව තිබුණි. කෘමීන් විසින් ඇති කරන ලද සිදුරු ද දක්නට ලැබුණි. යකඩ රාමුව ද මළ බැඳී ඇත.

ප්‍රථමයෙන් බෑගයේ යකඩ රාමුවෙහි තිබූ විබාදන ඵල ස්කැල්පල් බ්ලේඩ් සහ මෘදු බුරුසු භාවිතයෙන් ඉවත් කොට 100% එතිල් ඇල්කොහොල් ද්‍රාවණයකින් තවදුරටත් පිරිසිදු කරනු ලැබී ය. අනතුරුව එය මළ බැඳීම වැළැක්වීම සඳහා 3% පැරලොයිඩ් බී 72 ආරක්ෂිත අලේපනයක් ගල්වන ලදී. සම් ආවරණය සහ රෙදි ආවරණය පිරිසිදු කිරීම සඳහා භාවිත කරන ලද්දේ 1:1 අනුපාතයට සකස් කරගත් එතිල් ඇල්කොහොල් සහ ජලය මිශ්‍රණයකි. එයට තයිමොල් ස්වල්පයක් මිශ්‍ර කරන ලද්දේ දිලීර මර්දනය කිරීම සඳහා ය. පිටත සම් ආවරණය පිරිසිදු කිරීමෙන් අනතුරුව වියැළීමට හැර 1% පැරලොයිඩ් බී 72 ආරක්ෂිත ආලේපනයක් ගල්වන ලදී. කෘමීන් විසින් සිදුරු කිරීමත් දිරා යාමත් නිසා දුර්වලව තිබුණු ඇතුළත රෙදි ආවරණයෙහි හානි වී තිබුණු ස්ථානවල පිටුපසට වෙනත් කපු රෙදි කැබැල්ලක් යෙදීමෙන් ශක්තිමත් කරන ලදී. යකඩ පුරාවස්තුවල විබාදන ඵල ප්‍රථමයෙන් ස්කැල්පල් බ්ලේඩ් සහ මෘදු බුරුසු භාවිතයෙන් හැකිතාක් යාන්ත්‍රිකව ඉවත් කර 100% එතිල් ඇල්කොහොල් භාවිතයෙන් තවදුරටත් පිරිසිදු කරන ලදී. පැය 24 ක් පමණ පවනේ වියැළෙන්නට හැර 3% පැරලොයිඩ් බී 72 ආරක්ෂිත අලේපනයක් ගල්වන ලදී.

මැටි කොත් කැරැල්ලෙහි සහ මැටි භාජනයෙහි කැබලි පිරිසිදු කිරීම සඳහා භාවිත කරන ලද්දේ පිරිසිදු ජලයයි. පවනෙහි වියැළෙන්නට හැරීමෙන් අනතුරුව 50% පැරලොයිඩ් බී 72 ද්‍රාවණයෙන් කැඩුණු කොටස් අලවා තහවුරු කරන ලදී.

මුද්‍රිත මොස්තර සහිත කපු රෙද්දෙන් කළ ටීපෝ කවරය (සුචි අංක 127) කෘමීන් විසින් විශාල වශයෙන් හානි කර ඇත. අධික ලෙස දිරාපත් වී කැබලිවලට ඉරී ගොස් තිබුණු අතර දිලීර පැල්ලම් ද දැකිය හැකි විය. වර්ණක ජල ද්‍රාව්‍ය නොවූයෙන් තෙත් පිරිසිදු කිරීමේ ක්‍රමයෙන් (wet cleaning method) මෙය පිරිසිදු කිරීමට තීරණය කරන ලදී. මේ සඳහා යොදා ගන්නා ලද්දේ මි. ලී. 500 කට ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ($NH_4OH$) මි. ලී. 5 ක් ද, අයන රහිත පිරිසිදු කාරක ස්වල්පයක් ද යොදා සකස් කරගත් ද්‍රාවණයකි. මෙය පෙණ නැගෙන තුරු හොඳින් මිශ්‍ර කරන ලදී.

මෙලෙස සකස් කර ගන්නා ලද ද්‍රාවණයෙන් ටීපෝ කවරය පොඟවන ලදී. එසේ කරන ලද්දේ කුඩා පින්සල් සහ ස්පොන්ජ් කැබලි ආධාරයෙනි. පැල්ලම් ඇති ස්ථාන පින්සලෙන් මෘදු ලෙස පිරිමදිමින් හැකිතාක් දුරට පිරිසිදු කරන ලදී. පැයක් පමණ පෙඟෙන්නට හැර අඩු පීඩනයක් යටතේ සෙමින් ගලායන ජලයෙන් සෝදා හැර පසුව මඳ පවනේ වියළෙන්නට හරින ලදී. දුර්වල තත්වයේ තිබුණු මෙම ටීපෝ කවරයට අමතර ශක්තියක් ලබා දීම සඳහා එහි පැහැයට ගැලපෙන වෙනත් කපු රෙදි කැබැල්ලක් මත තබා මැසීමෙන් සම්බන්ධ කරනු ලැබී ය.

සුචි අංක 124 දරන කළු පැහැති කපු රෙද්දෙන් කරන ලද ටීපෝ කවරෙහි මල් මෝස්තර එම්බ්‍රොයිඩර් කර ඇත. එය ද දිරාපත් වීමෙන් ඉතා දුර්වල තත්වයේ පැවතුණි. එසේ ම කෘමීන් විසින් හානි කර තිබුණු අතර දුහුවිලි සහ දිලීර පැල්ලම් බහුල ව දැකිය හැකි විය. මෙහි දුර්වල තත්වය සහ වර්ණකවල ද්‍රාව්‍ය තත්වය සැලකිල්ලට ගනිමින් මෙය පිරිසිදු කිරීම සඳහා තෝරා ගනු ලැබූයේ වියළි පිරිසිදු කිරීමේ ක්‍රමයයි.

මේ සඳහා භාවිත කරන ලද්දේ 1:1 අනුපාතයට සකස් කරගත් එතිල් ඇල්කොහොල් සහ ජලය මිශ්‍රණයකි. එයට තයිමෝල් ස්වල්පයක් මිශ්‍ර කරන ලද්දේ දිලීර මර්දනය කිරීම සඳහා ය. මෙම ද්‍රාවණයෙහි පොඟවන ලද කපු පුළුන් භාවිතයෙන් මෙය පිරිසිදු කරන ලදී. මෙම ටීපෝ කවරය ද ශක්තිමත් කිරීම සඳහා වෙනත් කපු රෙද්දක් මතට ගෙන 95% පොලිවීනයිල් ඇසිටේට් ද්‍රාවණයකින් අලවා තහවුරු කරන ලදී.

**ප්‍රධාන රසායනාගාරයට ලැබෙන පුරාවස්තු සංරක්ෂණය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ හල්මිල්ලවැටිය ප්‍රදේශයේ සිදු කරන ලද කැණීමකින් හමු වූ කුඩා ලෝකඩ ප්‍රතිමාවක්, කුරුණෑගල ගල්ගමුව ප්‍රදේශයේ ඉඩමකින් හමු වූ රන් ආලේපිත ලෝකඩ හිටි බුද්ධ ප්‍රතිමාවක්, අනුරාධපුර මල්වතු ඔයෙන් හමු වූ ලෝකඩ බෝධිසත්ව ප්‍රතිමාවක් සහ නීලගිරිය ස්තූප කැණීමෙන් හමු වූ ධාතු කරඬුවක් සංරක්ෂණය සඳහා මෙම වසර තුළ ප්‍රධාන රසායනාගාරයට ලැබිණ.

හල්ලමිල්ලවැටිය කැණීමෙන් හමු වූ ලෝකඩ පිළිමය අවි දරා සිටින සෙබළකුගේ යැයි සිතිය හැකි ය. මෙය පස් අංශුවලින් වැසී පැවතුණි. පැටීනාව හොඳින් ආරක්ෂා වී පැවතුණි. ලා කොළ පැහැති සහ රතු පැහැති කුඩු වැනි තඹ විඛාදන ඵල දක්නට ලැබුණි. යාන්ත්‍රික ක්‍රම මගින් පස් අංශු සහ විඛාදන ඵල හැකිතාක් ඉවත් කර 100% එතිල් ඇල්කොහොල් මගින් තවදුරටත් පිරිසිදු කරන ලදී. පැය 24 ක් පමණ වියැළෙන්නට හැර 5% ප්‍රතිශතයට සකස් කරගත් ඉන්ක්‍රාලැක් සහ ටොලුවීන් ද්‍රාවණය ආරක්ෂිත ආලේපය වශයෙන් ගල්වන ලදී.

ගල්ගමුවෙන් හමු වූ රන් ආලේපිත ලෝකඩ බුද්ධ ප්‍රතිමාව කිලෝ ග්‍රෑම් 59 ක් පමණ බර වූ සෙ.මී. 90 ක් පමණ උස වූ හිටි පිළිමයකි. ගල්ගමුව ඓතිහාසික බුදුරුවකන්ද රජමහා විහාරයට අයත් ගොදුරු ගම් 32න් එකක් වූ අංකෙන්දෑව ගමෙහි උක්කු බණ්ඩා මහතාට අයත් ඉඩමෙන් මෙම පිළිමය හමු වී ඇත. මෙහි හිස කඳින් වෙන් වී ඇත. පිළිමය ඇතුළත යකඩ රාමුවක් සහ පිළිස්සුණු පස් දැකගත හැකි විය. මතුපිට රන් ආලේප කර තිබුණු බවට සාධක තැනින් තැන දැකිය හැකි ය. මතුපිට තදින් බැඳී තිබුණු පස් අංශු ඉවත් කරන ලද්දේ ස්කැල්පල් බ්ලේඩ්, දන්ත වෛද්‍ය උපකරණ සහ මෘදු බුරුසු භාවිතයෙනි. තද පස් අංශු 100% එතිල් ඇල්කොහොල්වලින් පොඟවමින් බුරුල් කරගැනීමට සිදුවිය. මෙහි නිෂ්පාදන තාක්ෂණය හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා පරමාණු ශක්ති අධිකාරියේ අනුග්‍රහයෙන් එක්ස් කිරණ (X-Ray) පරීක්ෂණයක් ද සිදු කරන ලදී. එසේම මෙහි රසායනික සංයුතිය හඳුනාගැනීම සඳහා එක්ස් රේ ෆ්ලොරසන්ස් (XRF) පරීක්ෂණයක් ද සිදු කරනු ලැබී ය. මෙහි සංරක්ෂණ කටයුතු තවදුරටත් සිදු කෙරෙමින් පවතී.



ගල්ගමුවෙන් හමු වූ රන් ආලේපිත ලෝකඩ බුද්ධ ප්‍රතිමාව



බුද්ධ ප්‍රතිමාව පිළිමය ඇතුළත යකඩ රාමුව

මල්වතු ඔයෙන් හමු වූ ලෝකඩ බෝධිසත්ව ප්‍රතිමාව පුරාවස්තු ප්‍රදර්ශනයකට ඉදිරිපත් කිරීම සඳහා හදිසි පිරිසිදු කිරීමේ කටයුතුවලට පමණක් භාජනය කරන ලද අතර මෙහි සංරක්ෂණ කටයුතු තවදුරටත් සිදු කළ යුතුව ඇත. මෙම පිළිමයේ ද එක්ස් කිරණ පරීක්ෂණයක් සිදු කරන ලදී.


නීලගිරිය ස්තූප කැණීමෙන් හමු වූ ශෛලමය ධාතු කරඬුවක් වැඩිදුර පර්යේෂණ කටයුතු සඳහා ප්‍රධාන රසායනාගාරය වෙත රැගෙන එනු ලැබී ය. එය පස්වලින් පිරී පැවති අතර ශල්‍ය උපකරණ ආධාරයෙන් තවදුරටත් සියුම් ලෙස කැණීමට ලක් කිරීමේ දී එතුළ වූ මැටි භාජනයක් තුළ ධාතු තැන්පත් කළ රන් ධාතු කරඬු දෙකක් අනාවරණය කර ගැනීමට හැකි විය.



මතුපිට බැඳී තිබුණු පස් අංශු ඉවත් කරමින්



නීලගිරිය ස්තූප කැණීමෙන් හමු වූ ශෛලමය ධාතු කරඬුව රසායනාගාරය තුළ සියුම් කැණීමට ලක්කරමින්



ශෛලමය ධාතු කරඬුව තුළ වූ රන් ධාතු කරඬුවක්

## මධ්‍යම පළාත

### මහනුවර දිස්ත්‍රික්කය

**දෙගල්දොරුව රජමහා විහාරය**

කුණ්ඩසාලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි දෙගල්දොරුව රජමහා විහාරයේ සිතුවම් සහ මූර්ති මත තැන්පත්ව තිබූ පහන් දැළි සහ දූහුවිලි ඉවත් කර පිරිසිදු කරන ලදී. සිතුවම් සහිත බදාමයේ බොල් වූ ස්ථාන පැරණි බදාමයට සරිලන බදාමයක් යෙදීමෙන් තහවුරු කෙරිණ. ලෙන තුළට ජලය කාන්දුවීම වැළැක්වීම සඳහා පිටුපස වූ කාණු පද්ධතිය පිරිසිදු කර ඒ මත වූ වල්පැළෑටි මර්දනය සඳහා ගල්ලෙනට හානියක් නොවන අයුරින් රසායන ද්‍රව්‍ය යොදනු ලැබීය.

**බුළුගහතැන්න රජමහා විහාරය**

බුළුගහතැන්න රජමහා විහාරය උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති ලෙන් විහාරයකි. මෙහි මහනුවර සම්ප්‍රදායේ සිතුවම් සහ මූර්ති දක්නට ලැබේ. ගල්වියනෙහි ඇති සිතුවම්වල වර්ණ ස්ථරය පතුරු වශයෙන් ගිලිහෙමින් පැවති අතර එම සිතුවම් පතුරු අලවා තහවුරු කරනු ලැබීය. සිතුවම මතුපිට පෘෂ්ඨයේ තැන්පත්ව තිබූ පහන් දැළි, දූහුවිලි ඇතුළු අපද්‍රව්‍ය ඉවත්කොට පිරිසිදු කෙරිණ. බදාමයේ බොල් වූ ස්ථාන පැරණි බදාමයට සරිලන බදාමයකින් පුරවා තහවුරු කොට කෘමිනාශක යෙදීමෙන් කෘමි හානි මර්දනය කරන ලදී.

**මුංවතුගොඩ පුරාණ විහාරය**

යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම විහාරස්ථානයේ මූර්ති මහනුවර අවධියට අයත්වන අතර සිතුවම් තරමක් පසුකාලීන සම්ප්‍රදායක් පෙන්නුම් කරයි. මෙහි සිතුවම් හා මූර්තිවල මතුපිට ස්ථරයේ තැන්පත්ව තිබූ දැළි සහ දූහුවිලි ඇතුළු අපද්‍රව්‍ය ඉවත් කිරීම, වර්ණ ස්ථරයේ පතුරු ගිලිහෙමින් පැවති ස්ථාන අලවා තහවුරු කිරීම, බදාමයේ බොල් වූ ස්ථාන සහ මූර්තිවල කැඩී බිඳී ගිය කොටස් පැරණි බදාමයට සරිලන නව බදාමයකින් සකස් කිරීම සහ කෘමිනාශක යෙදීමෙන් කෘමි හානි මර්දනය යන සංරක්ෂණ කාර්යයන් මෙම වසර තුළ දී සිදු කරනු ලැබීය.

**අටබාග නාග ශ්‍රී විහාරය**

ගඟඉහළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨසය තුළ පිහිටි විහාරස්ථානයකි. මහනුවර සම්ප්‍රදායේ සිතුවම් සහ මූර්තිවලින් සමන්විත වේ. ආධාරකය සහ බදාම ස්ථරය අතර සම්බන්ධය බිඳීමෙන් බිත්තිවල බදාමය වර්ණ ස්ථරය සමඟ ගිලිහෙමින් පැවතුණි. එසේ ම සිතුවම්වල වර්ණ ස්ථරය පතුරු වශයෙන් ගිලිහී යාම සහ දූහුවිලි සහ මකුළුදැල් බැඳීමෙන් මතුපිට ස්ථරය අපවිත්‍ර වීමත්, දුර්වර්ණවීමත් දැකිය හැකි විය. වහළයෙන් ජලය කාන්දුවීම හා කෘමිහානි යන හායන තත්වයන් සඳහා ද මෙම වසර තුළ පිළියම් යොදනු ලැබීය.

**මාතලේ දිස්ත්‍රික්කය**

**දඹුල්ල රජමහා විහාරය**

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි දඹුල්ල රජමහා විහාරය ප්‍රධාන ලෙන් පහකින් සමන්විත වේ. දෙව්රජ විහාරය, මහරජ විහාරය, අළුත් මහා විහාරය සහ පස් පිළිම විහාරය වශයෙන් හැඳින්වෙන පළමු ලෙන් හතරෙහි කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයට අයත් බිතුසිතුවම් සහ මූර්ති දක්නට ලැබෙයි. 1915 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලද සිතුවම්වලින් යුතු 05 වන විහාරය හෙවත් අළුත් විහාරයේ සිතුවම් ද මහනුවර සම්ප්‍රදාය නැවත අනුගමනය කිරීමක් බව පැහැදිලි ය.

2011 වසරේ දී මෙම පස්වන ලෙනෙහි සිතුවම් සහ මූර්ති සංරක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. මෙහි සිතුවම් මත අපද්‍රව්‍ය තැන්පත් වී තිබුණි. සිතුවම් සහිත ලෙන් වියන මත සුදු පැහැ දිලීර විශේෂයක් වර්ධනය වෙමින් පැවතුණි. එමෙන් ම මූර්තිවල කැඩී බිඳී ගිය සහ බදාම ස්ථරයේ බොල් වූ ස්ථාන ද දක්නට ලැබුණි. මෙම වසර තුළ දී සිතුවම් මත වර්ධනය වෙමින් පැවති දිලීර යාන්ත්‍රික ක්‍රම මගින් ඉවත් කර තවදුරටත් දිලීර වර්ධනය වීම වැළැක්වීම සඳහා 1% පොලිකර් දිලීර නාශකය යොදනු ලැබීය. ජලය කාන්දුවීම නිසා වියන් සිතුවමට සිදුවන හානි වැළැක්වීමට බාධක යෙදීම ද සිදු කෙරිණ.

**තල්ගහගොඩ පුරාණ ගල්ලෙන් විහාරය**

මෙම විහාරය යටවත්ත ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ තල්ගහගොඩ ග්‍රාමයේ පිහිටා ඇත. ලෙන් විහාර දෙකකින් සමන්විත මෙහි පළමුවන විහාරය පසුකලෙක නවීකරණය කර ඇත. අනිත් විහාරය මහනුවර අවධියේ සිතුවම් සහ මූර්තිවලින් සමන්විත වේ. එහි මැද කොටසේ මකර තොරණ සහිත හිටි පිළිමයකි. ඊට අමතර ව හිටි පිළිම දෙකක්, සමාධි පිළිම දෙකක්, විෂ්ණු සහ සමන් දේව ප්‍රතිමා දෙකක් ද දක්නට ලැබේ. සූවිසි විවරණය, මාර පරාජය හා රහත් රූප සිතුවම් කර ඇත.

සිතුවම් වැසී යන පරිදි වේයන් විසින් හුඹස් බැඳීම, සිතුවම් මත අපද්‍රව්‍ය තැන්පත්වීම, මූර්තිවල ඇතැම් කොටස් කැඩී බිඳී යාම, බදාම ස්ථරය බොල් වීම, පුපුරායාම සහ ආධාරකයෙන් ගිලිහී යාම, සිතුවම්වල වර්ණ ස්ථරය පතුරු වශයෙන් ඉවත්වීම සහ කුඩු බවට පත්වීම යන හායන තත්වයන් හඳුනාගත හැකි විය.

සිතුවම් මත අධික ලෙස තැන්පත් වී තිබූ අපද්‍රව්‍ය යාන්ත්‍රික ක්‍රම මගින් ඉවත් කර පිරිසිදු කරන ලදී. සිතුවම් වැසී යන පරිදි බැඳ තිබුණු වේ හුඹස් සිතුවමට හානියක් නොවන පරිදි ඉවත් කර වේ නාශක යෙදීය. සිතුවම්වල වර්ණ ස්ථරයේ පතුරු ගිලිහෙමින් පැවති ස්ථාන අලවා තහවුරු කරන ලදී.

**අම්බොක්ක පත්තිනි දේවාලයේ මූර්ති සංරක්ෂණය**

ගල් කණු මත දැව යෙදීමෙන් ටැම්පිට ක්‍රමයට ඉදිකර ඇති අම්බොක්ක පත්තිනි දේවාලය පිහිටා ඇත්තේ පල්ලේපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ය. මෙහි මූර්ති මහනුවර

සම්ප්‍රදායට අයත් වේ. මෙහි ඇති පාලඟ කුමාර ප්‍රතිමාව සහ පත්තිනි දේව ප්‍රතිමාවට වේයන්ගෙන් හානි පැමිණී තිබේ. එමෙන් ම මතුපිට පෘෂ්ඨය මත දැළි සහ දූහුවිලි බැඳීමෙන් දුර්වර්ණ වී ඇත. පාලඟ කුමාර ප්‍රතිමාවේ හිස අභ්‍යන්තරය වේයන් විසින් හානි කිරීමෙන් කුහරයක් බවට පත්වී ඇත. මුහුණ ඉදිරිපසින් පුපුරාගොස් තිබිණ.

මූර්තිවල මතුපිට වර්ණ ස්ථරය පිරිසිදු කිරීම සඳහා පිරිසිදු ජලය භාවිත කළ අතර තදින් බැඳී තිබුණු කාබන් ඉවත් කිරීම සඳහා භාවිත කරන ලද්දේ ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයයි. අභ්‍යන්තරය බොල් වූ බදාම ස්ථරය තහවුරු කිරීමට හුඹස් මැටි සහ සිහින් ව අඹරාගත් වැලි පොලිවීනයිල් ඇසිටේට් බන්ධන මාධ්‍යය සමඟ මිශ්‍රකර තනාගත් බදාමයක් භාවිත කරන ලදී. එය සිරින්ජර් මගින් එන්නත් කර බොල් වූ ස්ථාන පුරවන ලදී. කැඩී බිඳී ගිය ස්ථාන ද එම බදාමයෙන් සකසා දිය සායම් මගින් ප්‍රතිඒකීයකරණය කරන ලදී. මේ සඳහා තිත් සහ ඉරි ක්‍රමය භාවිත කෙරිණ.

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

**ළිහිණියාගල රජමහාවිහාරය**

වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි විහාරස්ථානයකි. පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත කටාරම් කොටා සකසන ලද ගල්ලෙනක් පාදක කරගනිමින් මහනුවර අවධියේ දී ඉදිකර ඇති ලෙන් විහාරයකි. ගල්වියන සහ ආධාරක බිත්තිය අතර සම්බන්ධතාවය බිඳී යාමෙන් විවරයක් සැදී තිබුණු අතර එය බදාමයකින් පුරවනු ලැබීය. සිතුවම් ස්ථරයේ පතුරු ගිලිහෙමින් තිබූ ස්ථාන අලවා තහවුරු කරන ලදී. සිතුවම්වල මතුපිට තලයේ බැඳී තිබූ කාබන් සහ දූහුවිලි අංශු ඉවත්කොට පිරිසිදු කරන ලද අතර සිතුවම් ස්ථරයට උරාගෙන තිබූ ලවණ ද ඉවත් කෙරිණ. අවසානයේ කෘමි හානි මර්දනය සඳහා කෘමිනාශක යොදන ලදී.

## දකුණු පළාත

**ගාල්ල දිස්ත්‍රික්කය**

**බෝපේ ශ්වේතබිම්බාරාම පුරාණ විහාරය (පොල්කඳවල පන්සල)**

කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති මෙම විහාරස්ථානයේ ප්‍රතිමා මන්දිරය 1879 වර්ෂයේ දී ඉදිකරන ලද්දකි. මෙහි ඇති රන් ආලේප කරන ලද ශෛලමය බුද්ධ ප්‍රතිමාව සුවිශේෂ නිර්මාණයකි. සියුම් කෙඳි සහිත බුරුසුවලින් සිතුවම් සහ මූර්ති මත තැන්පත්ව තිබූ දැළි, දූහුවිලි, මකුළු දැල් ආදී අපද්‍රව්‍ය ඉවත් කොට පසුව පිරිසිදු ජලයෙන් තවදුරටත් පිරිසිදු කරනු ලැබීය. මූර්තිවල කැඩී බිඳී ගිය කොටස් සකස් කිරීමට භාවිත කරන ලද්දේ වැලි:හුණු:මැටි $2:1:{}^{1}/_{4}$ අනුපාතයට සකස් කරගත් බදාම මිශ්‍රණයකි. සිතුවම් ස්ථරයේ ගිලිහෙමින් පැවති පතුරු ඇලවීම සඳහා 5% කෙමික්‍රිල් ද්‍රාවණය භාවිත කෙරිණ.

**බෝගහගොඩැල්ල සුදර්ශන පරාමානන්ද පුරාණ විහාරය**

මෙම විහාරස්ථානය කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත. මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියේ සිතුවම් සහ ප්‍රතිමාවලින් සමන්විත පිළිමගෙයකින් යුතු වේ. මෙහි සිතුවම් සහ මූර්ති මත තැන්පත්ව තිබූ දැළි, දූහුවිලි, මකුළු දැල් ආදී අපද්‍රව්‍ය ප්‍රථමයෙන්

සියුම් කෙඳි සහිත බුරුසුවලින් ඉවත් කොට ජල ද්‍රාව්‍ය නොවන වර්ණක සහිත ස්ථාන පිරිසිදු ජලයෙන් ද අනිත් ස්ථාන 10% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයකින් ද තවදුරටත් පිරිසිදු කරන ලදී. මූර්තිවල කැඩී බිඳී ගිය ස්ථාන වැලි: හුණු: මැටි 2: 1: $^1/_4$ අනුපාතයට සකස් කරගත් බදාම මිශ්‍රණයකින් නැවත සකසනු ලැබීය. බිත්තිවල ද බදාමය බොල්වී ගිලිහී ගිය ස්ථාන හා පුපුරා ගිය ස්ථාන එම බදාමයෙන් ම පුරවා තහවුරු කරන ලදී.

**කතළුව පූර්වාරාමය**

හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි කතළුව ග්‍රාමසේවා වසමෙහි පිහිටි විහාරස්ථානයකි. මෙහි වර්තමාන ආරම්භය 1840 වර්ෂයේ දී සිදු වී ඇත. මෙහි පිළිමගෙය ඇතුළු ගර්භ දෙකකින් සහ පිට මාලයකින් සමන්විත වේ. එහි පිට මාලයේ ඇතුළු බිත්ති සියල්ලකම සහ ඇතුළු ගර්භයේ බිත්ති සියල්ලකම සිතුවම් දක්නට ලැබේ. 19 වන ශතවර්ෂයේ බිතුසිතුවම්වල වැදගත් සංධිස්ථානයක් පිළිබිඹු කරන සිතුවම් සහිත ස්ථානයකි.

ඇතුළු ගර්භයේ ඇතළු කොටස ප්‍රතිමා මාලයයි. මෙහි අඩි 27 ක් පමණ දිග වූ විශාල සැතපෙන ප්‍රතිමාවක් ද, හිඳි පිළිම, හිටි පිළිම කතරගම දේව රූපයක් සහ විෂ්ණු දේව රූපයක් ද දක්නට ලැබේ. සෑම බුද්ධ ප්‍රතිමාවකම රැස්වළල්ල එක හා සමාන ය. බිත්ති තීරුවලට බෙදා බුදු පුදට මල් අතින් ගත් ශ්‍රාවක රූප සහ හංස පූට්ටුව සිතුවම් කර ඇත. සිවිලිමෙහි සියපත් රටාවකි. ඇතුළු ගර්භයෙහි පිවිසුම් දොරටුවලට ඉහළින් මකර තොරණ දෙකකි. ඇතුළු ගර්භයේ පිටත බිත්තියේ සූවිසි විවරණය, මල්ලියකම්, යක්‍ෂ, මනුෂ්‍ය, වාමන සහ බහිරව රූප සිතුවම් කර ඇත. පිටත ගර්භයේ බෝධිසත්ව ප්‍රතිමාවක් සහ දේවාරධනාව, සක් පිඹින්නන්, නළා පිඹින්නන් සිතුවම් කර ඇත. පිට මාලයේ තීරුවල බුද්ධ චරිතය හා ජාතක කතා දක්වා ඇත. මෙහි පහළ ම තීරුවෙහි සිතුවම් මුළුමනින් ම විනාශ වී ඇත.

මෙහි සිතුවම් හා මූර්ති 2009 සහ 2010 වර්ෂවල දී සංරක්‍ෂණයට භාජනය කරන ලද අතර 2011 වර්ෂයේ දී තවදුරටත් ඉදිරියට ගෙන යන ලදී. සිතුවම් ස්ථරය පිරිසිදු කිරීම, පතුරු ඇලවීම, අවිධිමත් මානව මැදිහත් වීම් ඉවත් කිරීම, සිතුවම් ස්ථරය ප්‍රතිඒකීයකරණය කොට අවශ්‍ය ස්ථාන සඳහා ආරක්ෂිත ආලේපය ගැල්වීම යන සංරක්‍ෂණ කාර්යයන් මෙම වසර තුළ දී සිදු කරනු ලැබී ය.

**මිහිරිපැන්න අරියාකර විහාරය**

හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තල්පේ දකුණ ග්‍රාමසේවා වසමේ පිහිටි මිහිරිපැන්න අරියාකර විහාරය 1798 වර්ෂයේ දී ආරම්භ කර ඇත. මෙහි ප්‍රතිමා ගෘහයේ සිතුවම් සහ මූර්ති මත තැන්පත්ව තිබූ දැලි, දූහුවිලි, මකුළු දැල් ආදී අපද්‍රව්‍ය ප්‍රථමයෙන් සියුම් කෙඳි සහිත බුරුසුවලින් ඉවත් කොට පසුව පිරිසිදු ජලයෙන් තවදුරටත් පිරිසිදු කරනු ලැබී ය. පිරිත් මණ්ඩපයේ සහ ධර්මශාලාවේ සිතුවම් ද මෙම ක්‍රමයෙන් පිරිසිදු කර අවශ්‍ය ස්ථාන සඳහා ආරක්ෂිත ආලේපය ගල්වන ලදී. මූර්තිවල කැඩී බිඳී ගිය කොටස් සකස් කිරීමට භාවිත කරන ලද්දේ වැලි: හුණු: මැටි 2: 1: $^1/_4$ අනුපාතයට සකස් කරගත් බදාම මිශ්‍රණයකි. සිතුවම් ස්ථරයේ ගිලිහෙමින් පැවති පතුරු ඇලවීම සඳහා 5% කෙමික්‍රිල් ද්‍රාවණය භාවිත කෙරිණ.

**නාපිරිත්තාගොඩ රජමහා විහාරය**

හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි අහංගම නැගෙනහිර ග්‍රාමසේවා වසමෙහි මෙම විහාරස්ථානය පිහිටා ඇත. මෙහි ප්‍රතිමා ගෘහය මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියේ සිතුවම් සහ මූර්තිවලින් සමන්විත වේ. මෙහි සිතුවම් සහ මූර්තිවල වර්ණ ස්ථරය මතුපිට දැලි, දූහුවිලි ආදී අපද්‍රව්‍ය තැන්පත් වී තිබුණු අතර එය පිරිසිදු කිරීම සඳහා 10% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයක් භාවිත කරන ලදී. මූර්තිවල සහ බිත්තිවල කැඩී බිඳී ගිය ස්ථාන වැලි: හුණු: මැටි 3: 1: $^{1}/_{4}$ අනුපාතයට සකස් කරගත් බදාම මිශ්‍රණයකින් නැවත සකසන ලදී. කුඩු බවට පත්වෙමින් පැවති වර්ණ ස්ථරය මත 5 % පැරලොයිඩ් බී 72 ආරක්ෂිත ආලේපය ගල්වන ලදී.

**බලපිටිය සුභද්‍රාරාමය**

බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පිහිටා ඇති සුභද්‍රාරාම විහාරස්ථානයේ ප්‍රතිමා ගෘහයේ දක්නට ඇති සිතුවම් සහ මූර්ති මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලිය නියෝජනය කරයි. බිතුසිතුවම් අතර බුද්ධ චරිතයේ විශේෂ අවස්ථා, අන්ධභූත ජාතකය, සඳකිඳුරු ජාතකය ආදී ජාතක කතා, සූවිසි විවරණය සහ දේවරූප ආදිය දක්නට ලැබේ.

මෙහි සිතුවම් සහ මූර්ති මත තැන්පත්ව තිබූ දැලි, දූහුවිලි ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා භාවිත කරන ලද්දේ 10% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයකි. කුඩු බවට පත්වෙමින් පැවති වර්ණ ස්ථරය මත 5 % පැරලොයිඩ් බී 72 ආරක්ෂිත ආලේපය ගල්වන ලදී. මූර්තිවල කැඩී බිඳී ගිය ස්ථාන වැලි: හුණු: මැටි 3: 1: $^{1}/_{4}$ අනුපාතයට සකස් කරගත් බදාම මිශ්‍රණයකින් නැවත සකසා බිත්තිවල ද බදාමය බොල්වී ගිලිහී ගිය ස්ථාන හා පුපුරා ගිය ස්ථාන එම බදාමයෙන් ම පුරවා තහවුරු කරන ලදී.

**කොස්ගොඩ ගනේගොඩැල්ල පුරාණ විහාරය**

බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි විහාරස්ථානයකි. මෙහි ප්‍රතිමා ගෘහයෙහි සිතුවම් සහ මූර්ති මත තැන්පත්ව තිබූ දැලි, දූහුවිලි ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා භාවිත කරන ලද්දේ 10% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයකි. කුඩු බවට පත්වෙමින් පැවති වර්ණ ස්ථරය මත 5 % පැරලොයිඩ් බී 72 ආරක්ෂිත ආලේපය ගල්වන ලදී. මූර්තිවල කැඩී බිඳී ගිය ස්ථාන වැලි: හුණු: මැටි 3: 1: $^{1}/_{4}$ අනුපාතයට සකස් කරගත් බදාම මිශ්‍රණයකින් නැවත සකසා බිත්තිවල ද බදාමය බොල්වී ගිලිහී ගිය ස්ථාන හා පුපුරා ගිය ස්ථාන එම බදාමයෙන් ම පුරවා තහවුරු කරන ලදී.

**අහුංගල්ල කැකිරියාවත්ත සිරිවිජයාරාම පුරාණ විහාරය**

බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි අහුංගල්ල ග්‍රාමසේවා වසමෙහි පිහිටි මෙම විහාරස්ථානය 1692 වර්ෂයේ දී ආරම්භ කර ඇත. අෂ්ඨාකාර හැඩයක් ගන්නා මෙහි ප්‍රතිමා ගෘහය මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියේ සිතුවම් සහ මූර්තිවලින් සමන්විත වේ.

මෙහි සිදු කරන ලද සංරක්‍ෂණ ක්‍රියා අතර ප්‍රථමයෙන් ම සිතුවම් ස්ථරය මතුපිට වූ අපද්‍රව්‍ය පිරිසිදු ජලයෙන් පිරිසිදු කරන ලදී. සිතුවම් සහිත බිත්තිවල පහළ ම කොටස්වල වර්ධනය වී පැවති ඇල්ගී ඉවත් කිරීම සඳහා භාවිත කරන ලද්දේ 1% පැනසයිට් ද්‍රාවණයයි. ප්‍රධාන හිඳි පිළිමය ද පිරිසිදු කර ගැලවී තිබුණු අක්බමරු අලවා තහවුරු කෙරිණ. සිතුවම් ස්ථරයේ වර්ණ ගිලිහී ගිය ස්ථාන වර්ණ මගින් ප්‍රතිඒකීයකරණය කර එම ස්ථානවලට 5 % පැරලොයිඩ් බී 72 ආරක්ෂිත ආලේපය ගල්වන ලදී.

**වල්පල ගෞතමාරාමය**

ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ඉහළ වල්පල ග්‍රාමසේවා වසමෙහි මෙම විහාරස්ථානය පිහිටා ඇත. මෙහි ප්‍රතිමා ගෘහය මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියේ සිතුවම් සහ මූර්තිවලින් සමන්විත වේ.

මෙහි සිතුවම් සහ මූර්ති මත තැන්පත්ව තිබූ දැළි, දූහුවිලි, මකුළු දැල් ආදී අපද්‍රව්‍ය ප්‍රථමයෙන් සියුම් කෙඳි සහිත බුරුසුවලින් ඉවත් කොට 3% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයකින් තවදුරටත් පිරිසිදු කරන ලදී. සිතුවම් ස්ථරයේ ගිලිහෙමින් පැවති පතුරු ඇලවීම සඳහා භාවිත කරන ලද්දේ 5% කෙමික්‍රිල් ද්‍රාවණයකි. සිතුවම් ස්ථරයේ වර්ණ ගිලිහී ගිය ස්ථාන වර්ණ මගින් ප්‍රතිඒකීයකරණය කර එම ස්ථානවලට 5 % පැරලොයිඩ් බී 72 ආරක්ෂිත ආලේපය ගල්වන ලදී.

**බෙන්තර බෝධිමළු විහාරය**

බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පිහිටි මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියේ සිතුවම් සහ මූර්තිවලින් සමන්විත වූ විහාරස්ථානයකි. හදිසි තහවුරු ව්‍යාපෘතිය යටතේ මෙම විහාරයෙහි සිතුවම් ස්ථරය පිරිසිදු ජලය භාවිතයෙන් පිරිසිදු කිරීම, වර්ණ ස්ථරය පතුරු අලවා තහවුරු කිරීම, ආධාරකය දක්වා බදාමයේ වූ ගර්ත සහ ඉරිතැලීම් නව බදාමයකින් පුරවා තහවුරු කිරීම, එම බදාමය භාවිතයෙන් බොරදම් සකස් කිරීම සහ කෘමි මර්දනය සඳහා පයිරිනෙක්ස් රසායනිකය යෙදීම යන සංරක්‍ෂණ කාර්යයන් සිදු කරනු ලැබී ය.

**බෙන්තර ගලපාත විහාරය**

බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පිහිටි මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලියේ සිතුවම් සහ මූර්තිවලින් සමන්විත වූ විහාරස්ථානයකි. හදිසි තහවුරු ව්‍යාපෘතිය යටතේ මෙම විහාරයෙහි සිතුවම් ස්ථරය පිරිසිදු ජලය භාවිතයෙන් පිරිසිදු කිරීම, වර්ණ ස්ථරය පතුරු අලවා තහවුරු කිරීම, ප්‍රධාන බුදු පිළිමයේ ගැලවී තිබුණු අක්බමරු ඇලවීම, එහි ආසනයේ බොරදම් බදාමවලින් යළි සකස් කිරීම, කෘමි සතුන් විසින් ගුල් සාදා තිබුණු දැව බාල්ක පොලිවීනයිල් ඇසිටේට් සහ ලී කුඩු මිශ්‍රණයකින් පිරවීම සහ කෘමි මර්දනය සඳහා පයිරිනෙක්ස් රසායනිකය යෙදීම යන සංරක්‍ෂණ කාර්යයන් සිදු කරනු ලැබී ය.

**පිටිවැල්ල ජයවර්ධනාරාමය**

මෙම විහාරස්ථනයෙහි ඇති ශෛලමය චෛත්‍යයේ මතුපිට කළු පැහැ ඇල්ගී ස්ථරයකින් වැසී තිබුණි. එම ඇල්ගී රසායන ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් කර පිරිසිදු කරන ලදී. ශෛලමය චෛත්‍යය

සහ ඊට යාබද චෛත්‍යය අවට වැඩී තිබුණු වල්පැළෑටි ද රසායන ද්‍රව්‍ය මගින් මර්දනය කරනු ලැබී ය. පිළිමගෙයි සිතුවම් ස්ථරය පිරිසිදු ජලය භාවිතයෙන් පිරිසිදු කිරීම, වර්ණ ස්ථරය පතුරු අලවා තහවුරු කිරීම, ආධාරකය දක්වා බදාමයේ වූ ගර්ථ සහ ඉරිතැලීම් නව බදාමයකින් පුරවා තහවුරු කිරීම ද සිදු කරන ලදී. නව බදාමය සඳහා භාවිත කරන ලද්දේ වැලි: හුණු: මැටි 3: 1: $^{1}/_{4}$ අනුපාතයට සකස් කරගත් මිශ්‍රණයකි. පිළිමවල කැඩී තිබුණු සිවුරු රැළි සකස් කිරීම සඳහා ද භාවිත කරන ලද්දේ එම බදාමයයි.

**මාතර දිස්ත්‍රික්කය**

**කහවිල්ගොඩ පුරාණ විහාරය**

මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පහළ කියාඹුව ග්‍රාමසේවා වසමෙහි පිහිටි විහාරස්ථානයකි. මෙහි ප්‍රතිමා ගෘහයෙහි ඇතුළත බිත්තිවල පැරණි සිතුවම් මත පසුකාලීනව නැවත සිතුවම් ඇඳ ඇත. එක් බිත්තියක මැද වූ සිතුවම් තීරයෙහි  සිතුවම ඇඳීමට පෙර සිත්තරා විසින් සලකුණු කරගන්නා ලද රක්ත වර්ණ රේඛා ශේෂ වී ඇත. එහි සිතුවම සම්පූර්ණයෙන් ම පතුරු ගිලිහී පැවති අතර මකුළුදැල් සහ සත්ව අපද්‍රව්‍ය තැන්පත්ව ඇත.

ඉදිරිපස මකර තොරණෙහි වර්ණ ස්ථරයේ ද බොහෝ කොටස් පතුරු වශයෙන් ගිලිහී ඇත. මකර තොරණ ආශ්‍රිත වම්පස ඉහළ හිඳි දේව මූර්තියේ ද ඇතැම් කොටස් කැඩී තිබුණි. මකුළුදැල් සහ සත්ව අපද්‍රව්‍ය තැන්පත් වී ඇත. පූර්ව සංරක්ෂණයක දී මෙහි මකර තොරණෙහි වර්ණ ස්ථරය පතුරු අලවා අනවශ්‍ය ස්ථානවල ද ආරක්ෂිත ආලේපය ගල්වා තිබුණි.

මේ වනවිට පතුරු ගිලිහෙමින් පැවති ස්ථාන අලවා තහවුරු කර අනවශ්‍ය ස්ථානවල ගල්වා තිබූ ආරක්ෂිත ආලේපය ඉවත් කරන ලදී. මූර්තිවල කැඩී බිඳී ගිය කොටස් ප්‍රතිනිර්මාණය කර මකර තොරණෙහි  වර්ණ ස්ථරය ප්‍රතිඒකීයකරණය කර ආරක්ෂිත ආලේපය ගල්වනු ලැබී ය.

**මාකාවිට පුරාණ විහාරය**

මහනුවර අවධියේ දී ඉදිකරන ලද ප්‍රතිමා ගෘහයක්, ධර්ම ශාලාවක් සහ ආවාස ගෙයක් ද සහිත විහාරස්ථානයකි. ප්‍රතිමා ගෘහය ඇතුළු මාලයකින් සහ පිට මාලයකින් සමන්විත වේ. එහි වැඩ සිටිනුයේ හිඳි පිළිම වහන්සේ නමකි. මෙහි දක්නට ලැබෙන සිතුවම් මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලිය නියෝජනය කරයි. සිතුවම් මගින් බෝසත් සහ බුද්ධ චරිතයේ අවස්ථා පිළිඹිබු කරයි. ඇතුළු මාලයෙහි දොරෙහි සිතුවම් කර ඇති පොල්මල සහිත චිත්‍රය සුවිශේෂ වේ. අසෝරක සහ සිවවටුක යක්ෂ රූප සෙසු චිත්‍රවලට වඩා විශාලව දක්වා ඇත.

මෙහි සිතුවම් සහ මූර්ති මත තැන්පත්ව තිබූ දැළි, දූහුවිලි, මකුළු දැල් ආදී අපද්‍රව්‍ය ප්‍රථමයෙන් සියුම් කෙඳි සහිත බුරුසුවලින් ඉවත් කොට 3% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයකින් තවදුරටත් පිරිසිදු කරන ලදී. සිතුවම් ස්ථරයේ ගිලිහෙමින් පැවති පතුරු ඇලවීම සඳහා භාවිත කරන ලද්දේ 5% කෙමික්‍රිල් ද්‍රාවණයකි. මූර්තිවල කැඩී බිඳී ගිය ස්ථාන වැලි: හුණු: මැටි 2: 1: $^{1}/_{4}$ අනුපාතයට සකස් කරගත් බදාම මිශ්‍රණයකින් නැවත සකසා බිත්තිවල ද බදාමය බොල්වී ගිලිහී

ගිය ස්ථාන හා පුපුරා ගිය ස්ථාන එම බදාමයෙන් ම පුරවා තහවුරු කරන ලදී. වේයන් මර්දනය සඳහා වේ නාශක යොදනු ලැබී ය.

**අතුරලිය ශ්‍රී නිවාසාරාමය**

අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි අතුරලිය ග්‍රාමසේවා වසමෙහි පිහිටි විහාරස්ථානයකි. ප්‍රතිමා ගෘහයෙහි ඇතුළු ගර්භයෙහි සිවිලිම, හිඳි පිළිමය, සැරියුත් මුගලන් පිළිම සහ බිත්ති මත ඇති සියලු ම සිතුවම් අළුතින් ඇඳ වර්ණ ගන්වා ඇත. තව ද විෂ්ණු සහ කතරගම දේවාලවල ද දේව පිළිම සහ සිතුවම් අළුතින් වර්ණ ගන්වා ඇත.

මූර්තිවල කැඩී බිඳී ගිය ස්ථාන වැලි: හුණු: මැටි 2: 1: $^1/_4$ අනුපාතයට සකස් කරගත් බදාම මිශ්‍රණයකින් නැවත සකසන ලදී. අවශ්‍ය ස්ථානවලට 5% පැරලොයිඩ් බී 72 ආරක්ෂිත ආලේපය ගල්වන ලදී.

**වේරගම්පිටිය පුරාණ විහාරය**

මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි උයන්වත්ත ග්‍රාමසේවා වසමෙහි පිහිටි මෙම විහාරස්ථානයෙහි ප්‍රතිමා ගෘහයෙහි මහනුවර සම්ප්‍රදායේ දකුණු පළාත් ශෛලිය නියෝජනය කරන සිතුවම් සහ මූර්ති දැකිය හැකි ය.

මෙහි සිතුවම් සහ මූර්ති මත තැන්පත්ව තිබූ දැළි, දූහුවිලි, මකුළු දැල් ආදී අපද්‍රව්‍ය ප්‍රථමයෙන් සියුම් කෙඳි සහිත බුරුසුවලින් ඉවත් කොට 3% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයකින් තවදුරටත් පිරිසිදු කරන ලදී. සිතුවම් ස්ථරයේ ගිලිහෙමින් පැවති පතුරු අලවා තහවුරු කරන ලදී. මූර්තිවල කැඩී බිඳී ගිය ස්ථාන වැලි: හුණු: මැටි 2: 1: $^1/_4$ අනුපාතයට සකස් කරගත් බදාම මිශ්‍රණයකින් නැවත සකසා බිත්තිවල ද බදාමය බොල්වී ගිලිහී ගිය ස්ථාන හා පුපුරා ගිය ස්ථාන එම බදාමයෙන් ම පුරවා තහවුරු කෙරිණ. මෙහි ආරක්ෂිත ආලේපය වශයෙන් භාවිත කරන ලද්දේ සාම්ප්‍රදායික ආරක්ෂිත ආලේපයක් වූ දොරණ තෙල් ය.

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

**කසාගල රජමහා විහාරය**

අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි කසාගල උඩයාල හීන්නබුන්න ග්‍රාමයෙහි මෙම විහාරස්ථානය පිහිටා ඇත. මහනුවර අවධියේ දකුණු පළාත් ශෛලියේ සිතුවම් සහ මූර්ති සහිත ප්‍රතිමා ගෘහයක් මෙහි ඇත. මෙහි සිතුවම් සඳහා ආධාරක වූ බිත්තිය ගඩොල්, උළු කැබලි සහ මැටි ආධාරයෙන් සාදා ඇති අතර බදාම ස්ථරය මැටි, හුණු සහ වැලි මිශ්‍රණයකි. වර්ණ ලබන ස්ථරය සඳහා හුණු පමණක් භාවිත කර ඇත.

සියුම් කෙඳි සහිත බුරුසුවලින් වර්ණ ස්ථරය මත තැන්පත්ව තිබුණු මකුළු දැල් සහ දූහුවිලි අංශු ඉවත් කර පිරිසිදු ජලය සහ 5% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයකින් තදින් බැඳී තිබුණු කාබන් අංශු ඉවත් කර පිරිසිදු කරනු ලැබී ය. වැලි: හුණු: මැටි 2: 1: $^1/_4$ අනුපාතයට සකස් කරගත් බදාම මිශ්‍රණයකින් බදාම ස්ථරයේ වූ බොල්වීම්, පිපිරීම් සහ බදාමය ඉවත් වීමෙන් ඇති

වූ ගර්ථ පුරවා තහවුරු කරන ලදී. බුදු පිළිමවල සහ මකර තොරණේ මුරරූපවල අවශ්‍ය ස්ථාන සඳහා පමණක් 5 % පැරලොයිඩ් බී 72 ආරක්ෂිත ආලේපය ගල්වන ලදී. මකර තොරණේ වර්ණ ස්ථරයේ වර්ණ ගිලිහීගිය ස්ථාන ප්‍රතිජ්කීයකරණය කොට ඉහත ආරක්ෂිත ආලේපය ගල්වන ලදී.

## වයඹ පළාත

### කුරුණෑගල දිස්ත්‍රික්කය

**කුරුණෑගල වැවෙන් හමු වූ පැරණි දැව ඔරුව සංරක්ෂණය.**

කුරුණෑගල ඓතිහාසික වැව පුනරුත්තාපනය කිරීමේ කටයුතු සිදු කරමින් සිටිය දී 2003 ජූලි මස 20 වන දින අඩි 32 ක් පමණ දිග, අඩි 5 $^{1}/_{2}$ ක් පමණ පළල කුඹුක් ලීයෙන් නිම කරන ලද දැව ඔරුවක් හමු විය. එය වයඹ පළාත් ආණ්ඩුකාර කාර්යාලය පිහිටි කුරුණෑගල පැරණි මාළිගා පරිශ්‍රයේ තැන්පත් කර තිබිණ. වසර 800-900 ක් පමණ පැරණි බවට සැලකිය හැකි මෙම ඔරුව සංරක්ෂණය කර දෙන ලෙස වයඹ පළාත් ආණ්ඩුකාරතුමා විසින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් කළ ඉල්ලීමකට අනුව මෙහි සංරක්ෂණ කටයුතු 2011 වසර තුළ ආරම්භ කෙරිණ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රසායන සංරක්ෂණ අංශය විසින් මෙම ඔරුව පරීක්ෂා කිරීමේ දී එය සිමෙන්ති ටැංකියක බහා තිබිණ. පැති බිත්තියට අඩි 8 ක් දිග, අඩි 15 ක් පළල, මි.මි. 12 ක් පමණ ඝනකමැති වීදුරු තහඩුවක් සවි කර තිබිණ. ඔරුව දිරාපත් වීම වැළැක්වීම සඳහා මෙම ටැංකියට ජලය පුරවා තිබුණු නමුත් වීදුරුව බිඳී යාම නිසා එහි ජලය ඉවත් වීමෙන් දැවය විජලනයට ලක් වී ඇත. එම නිසා දැවය පුපුරා යාමට ලක් වී තිබිණ. එමෙන් ම ඔරුවේ අඩි 2ක් පමණ කොටසක් කැඩී වෙන් වී ඇත. කොළ රොඩු ටැංකිය තුළට වැටීමෙන් ඔරුව අපවිත්‍ර වී තිබිණ. ටැංකියේ සහ ඔරුවේ තැනින් තැන රැඳී තිබුණු අපිරිසිදු ජලය සහ අපද්‍රව්‍ය ඉවත් කොට පාරුව සෝදා පිරිසිදු කරන ලදී. බිඳුණු වීදුරු තහඩුව වෙනුවට අලුතින් තහඩුවක් සවි කොට පාරුව වැසෙන පරිදි ජලයෙන් පුරවනු ලැබීය. එසේ කරන ලද්දේ ඔරුව විජලනයට ලක්වීමෙන් පුපුරා යාම හා පතුරු ගිලිහී යාම වැළැක්වීම සඳහා ය.



ඔරුව පිරිසිදු කිරීමට පෙර



ඔරුව පිරිසිදු කරමින්



ඔරුව පිරිසිදු කරමින්



පිරිසිදු කිරීමෙන් අනතුරුව

**මලගණේ පුරාණ ලෙන් විහාරය**

මලගණේ පුරාණ ලෙන් විහාරය වාරියපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පිහිටා ඇත. මාල දෙකකින් යුතු මෙම විහාරයේ මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් සහ මූර්ති දක්නට ලැබේ. බුද්ධ ප්‍රතිමා, දේව ප්‍රතිමා හා දොරටුපාල රූප මූර්ති වශයෙන් දක්නට ලැබේ. සූවිසි විවරණය, ශ්‍රාවක රූප, දේව රූප සහ මල් මෝස්තර සිතුවම් කර ඇත.

මෙහි සිතුවම් සහිත බිත්තිවල ආධාරකය සහ බදාම ස්ථරය අතර බන්ධනය ලිහිල් වීමෙන් බදාම ස්ථරය බොල් වී ඉදිරියට නෙරා පැවතුණි. එම ස්ථාන නව බදාමයකින් පුරවා තහවුරු කරනු ලැබී ය. සිතුවම්වල වර්ණ ස්ථරයේ පතුරු ගිලිහෙමින් පැවති ස්ථාන අලවා තහවුරු කිරීම සඳහා භාවිත කරන ලද්දේ පොලිවීනයිල් ඇසිටේට් රසායනිකයයි. ප්‍රතිමාවල සහ බිත්තිවල කැඩී බිඳී ගිය කොටස් පැරණි බදාමයට සරිලන නව බදාමයකින් සකස් කරන ලදී. ප්‍රතිමා සහ සිතුවම්වල මතුපිට ස්ථරයේ තැන්පත්ව තිබුණු අපද්‍රව්‍ය ඉවත් කොට පිරිසිදු කිරීම සඳහා ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් භාවිත කරන ලදී. අවසාන වශයෙන් කෘමි හානි මර්දනය සඳහා කෘමිනාශක යොදනු ලැබී ය.

**කොරොස්ස රජමහා විහාරය**

ලෙන් විහාරයක් වූ මෙය රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි කොරොස්ස ග්‍රාමසේවා වසමෙහි පිහිටා ඇත. ඇතුළු මාලයේ ප්‍රධාන සැතපෙන ප්‍රතිමාවක්, හිටි බුද්ධ ප්‍රතිමා හතරක්, දේව ප්‍රතිමා දෙකක් ද, පිටත මාලයෙහි මකර තොරණ, දොරටුපාල රූප දෙකක් සහ සිංහ රූප දෙකක් ද මූර්ති වශයෙන් දක්නට ලැබේ. සිතුවම් වශයෙන් සූවිසි විවරණය, සත් සතිය, රහත් රූප, මාර පරාජය, ජාතක කථා චිත්‍රණය කර ඇත. මෙම නිර්මාණ මහනුවර සම්ප්‍රදායට අයත් වේ.

මෙම විහාරයෙහි සිතුවම් සහ මූර්තිවලට විශාල වශයෙන් වේයන්ගෙන් හානි පැමිණී තිබුණි. වේ දළ සිතුවමට හානියක් නොවන පරිදි ඉවත් කර කෘමිනාශක යෙදීම මෙම වසර තුළ සිදු කරන ලද ප්‍රමුඛ සංරක්ෂණ කාර්යය වේ.

**කණුගල ශ්‍රී පුෂ්පාරාම ටැම්පිට විහාරය**

පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වත්තේගෙදර ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටි මහනුවර අවධියේ ඉදිකරන ලද ටැම්පිට විහාරයකි. ඇතුළත මාලයේ ප්‍රධාන සමාධි පිළිමයක්, දෙපස හිටි බුද්ධ ප්‍රතිමා දෙකක් ද, පිටත මාලයේ මකර තොරණ සහිත දොරටුපාල රූප දෙකක් ද මූර්ති වශයෙන් දැකිය හැකි වන අතර සැරියුත්-මුගලන් රූප, දේව රූප හා නාරිලතාවැල් මෝස්තර සිතුවම් කර ඇත.

පිටත මාලයේ දොරටුව ඉහළින් පැවති මකර තොරණ සම්පූර්ණයෙන් ම ආධාරකයෙන් ගිලිහී බිමට වැටී තිබුණි. එහි කැබලි තෝරා වෙන්කොට පැරණි බදාමයට සරිලන නව බදාමයකින් සියලු ම කොටස් නැවත ආධාරකයට සවි කරන ලදී. පිටත මාලයේ බිත්තිවල විශාල වශයෙන් බදාමය ගිලිහී ගිය ස්ථාන දක්නට ලැබුණු අතර එම ස්ථාන පිරවීම සඳහා ද භාවිත කරන ලද්දේ ඉහත බදාමයයි. අවසාන වශයෙන් කෘමි හානි මර්දනය සඳහා කෘමිනාශක යෙදීය.

**නයින්දනාව පුරාණ රජමහා විහාරය**

නයින්දනාව පුරාණ රජමහා විහාරය පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති ලෙන් විහාරයකි. මාල දෙකකින් යුතු මෙම විහාරයේ දක්නට ඇති සිතුවම් සහ මූර්ති මහනුවර සම්ප්‍රදායට අයත් වේ. බුද්ධ ප්‍රතිමා, දේව ප්‍රතිමා, මකර තොරණ, දොරටුපාල රූප සහ සිංහ රූපවලින් ද මාර පරාජය, සූවිසි විවරණය සිතුවම් සහ මල් මෝස්තරවලින් ද සමන්විත ය. මීට පෙර අවධියකට අයත් යැයි සිතිය හැකි ශෛලමය නයිපෙණ හතක් ද බහිරව ප්‍රතිමාවක් ද මෙම විහාරයෙහි දක්නට ලැබේ.

මෙම ශෛලමය පුරාවස්තු මත බැඳී තිබුණු ඇල්ගී සහ ලයිකන රසායනික ක්‍රම මගින් ඉවත් කරන ලදී. එමෙන් ම විහාරයේ ප්‍රතිමා සහ ආසනවල කැඩී බිඳී ගිය ස්ථාන සකස් කිරීම, සිතුවම් මත වූ අපද්‍රව්‍ය යාන්ත්‍රික ක්‍රම මගින් ඉවත් කිරීම, කෘමිනාශක යෙදීම යන සංරක්ෂණ කාර්යයන් මෙම වසර තුළ දී සිදු කරන ලදී.

**පඬුවස්නුවර කෞතුකාගාරයේ පුරාවස්තු සංරක්ෂණය**

මෙම වසර තුළ පඬුවස්නුවර කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා තිබුණු පහත සඳහන් ශෛලමය පුරාවස්තු සංරක්ෂණයට භාජනය කරන ලදී. බුද්ධ ප්‍රතිමා, බෝධිසත්ව ප්‍රතිමා, මුරගල්, මකර රුව සහිත ජල පිහිළි, කුළුණු හිස්, කැටයම් සහිත කවුළු කොටස්, ටැම් ලිපි, කැසිකිළි ගල්, ජල පෙරණ ආදී ශෛලමය පුරාවස්තු මෙම එකතුවට ඇතුළත් විය. මෙම පුරාවස්තු බොහොමයක් ඇල්ගී බැඳීමෙන් කළු පැහැ ගැන්වී ඇති අතර ලයිකන ද වර්ධනය වී තිබිණ. සියලු ම පුරාවස්තු මත දුහුවිලි බැඳීමෙන් අපවිත්‍රව පැවතිණ.

මෙම පුරාවස්තු පිරිසිදු කිරීම සඳහා භාවිත කරන ලද්දේ කඩදාසි පල්ප ක්‍රමයයි (paper pulp method). පල්පය සාදා ගන්නා ලද්දේ 10% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයට ටිෂූ කැබලි මිශ්‍ර කිරීමෙනි. එම පල්පය පුරාවස්තුව මත අතුරා කොහු බුරුසුවලින් තැලීමෙන් පල්පය

පුරාවස්තුවට හොඳින් කා වැදීමට සලස්වන ලදී. අනතුරුව පොලිතීන් ආවරණයකින් වසා දිනක් පමණ තිබෙන්නට හැරීමෙන් අනතුරුව පල්පය ඉවත් කරන ලදී. ඇල්ගී, ලයිකන සහ දුහුවිලි පල්පයට උරාගෙන තිබිණි. අනතුරුව මෙම ශෛලමය පුරාවස්තු පිරිසිදු ජලයෙන් සෝදා හරිනු ලැබී ය.

#### යාපහුව කෞතුකාගාරයේ පුරාවස්තු සංරක්ෂණය

මෙම කෞතුකාගාරයේ ප්‍රදර්ශනය සඳහා තැන්පත් කර තිබුණු යකඩ ඊතලයක් සහ හෙල්ල තුඩක් සංරක්ෂණය කරනු ලැබීය. මෙහි මතුපිට දක්නට වූ රතු පැහැති යකඩ විඛාදන ඵල සහ පස් අංශු ප්‍රථමයෙන් යාන්ත්‍රික ක්‍රම මගින් ඉවත් කර පසුව 100% එතීල් ඇල්කොහොල් භාවිතයෙන් තවදුරටත් පිරිසිදු කරන ලදී.

#### පුත්තලම කෞතුකාගාරයේ පුරාවස්තු සංරක්ෂණය

කුඩා ලෝකඩ සමාධි බුද්ධ ප්‍රතිමාවක් මෙම වසර තුළ දී සංරක්ෂණය කරන ලදී. ලා කොළ පැහැති කුඩු වැනි තඹ විඛාදන ඵල දක්නට ලැබුණි. යාන්ත්‍රික ක්‍රම මගින් පස් අංශු සහ විඛාදන ඵල හැකිතාක් ඉවත් කර 100% එතීල් ඇල්කොහොල් මගින් තවදුරටත් පිරිසිදු කරන ලදී. පැය 24 ක් පමණ වියළෙන්නට හැර 5% ප්‍රතිශතයට සකස් කරගත් ඉන්ක්‍රාලැක් සහ ටොලුවීන් ද්‍රාවණය ආරක්ෂිත ආලේපය වශයෙන් ගල්වන ලදී.

## උතුරු මැද පළාත

### අනුරාධපුර දිස්ත්‍රික්කය

#### අනුරාධපුර සමාධි පිළිමය සහ ගල් පාළම

ප්‍රදේශයේ පැවති අධික වැසි සහ සුළඟ හේතුකොට අනුරාධපුර සමාධි පිළිමයේ දකුණු උරහිස පිටුපස පෙදෙස, නළල සහ තවත් සුළු ස්ථාන කිහිපයක ඇල්ගී සහ ලයිකන වර්ධනය වී පැවතුණි. අනුරාධපුර ගල් පාළමේ ද ගල් කණු හා හරස් අතට යොදන ලද ගල් පුවරුවල ඇල්ගී හා ලයිකන වර්ධනය වී පැවතුණි.

මෙම ඇල්ගී හා ලයිකන ඉවත් කිරීම සඳහා 3% පැනසයිට් රසායනිකය හා ජලය මිශ්‍රණය යොදා පැය 8 ක කාලයක් තැබීමෙන් පසු පිරිසිදු ජලයෙන් සෝදා හරින ලදී.

#### වෙස්සගිරිය සිතුවම් ලෙන

අනුරාධපුර අවධියට අයත් ලෙස සැලකෙන සිතුවම් සහිත බදාම කොටස් වෙස්සගිරිය ලෙනෙහි ස්ථාන දෙකක දක්නට ලැබේ. වර්ණ සහිත සියුම් බදාම කොටස් කුඩා පතුරු වශයෙන් ගිලිහී යමින් පැවතුණි. මකුළුදැල්, කෘමි කෝෂ සහ දුහුවිලි ආදිය සිතුවම මත බැඳීමෙන් මෙම සිතුවම් දුර්වර්ණ වී ඇත.

වර්ණ සහිත සියුම් බදාම කොටස් දුර්වලව පවතින ස්ථාන අලවා තහවුරු කරනු ලැබී ය. සිතුවම මතුපිට වූ කෘමි කෝෂ හා වෙනත් ආගන්තුක ද්‍රව්‍ය ද ඉවත් කොට පිරිසිදු කර 3% පැරලොයිඩ් බී 72 සහ සයලින් මිශ්‍රණය ආරක්ෂිත අලේපයක් වශයෙන් ගල්වන ලදී.

**අනුරාධපුර විජයබා මාළිගය**

ඇතුළු නුවර විජයබා මාළිගයේ වම්පසින් වන මුරගලෙහි මුහුණෙහි නාසය හරහා සහ පිට රාමුව වටා පිපිරීම් ඇති වී තිබුණි. එම ස්ථාන ශක්තිමත් කිරීම සඳහා යොදා ගනු ලැබූයේ එම වර්ගයේ ම ගල් කුඩු එපිෆික්ස් බන්ධන මාධ්‍යය සමඟ මිශ්‍රකර තනාගත් පිරවුම් ද්‍රව්‍යයකි.

**ඉසුරුමුණිය සිතුවම් සහ මූර්ති**

ඉසුරුමුණිය විහාරයෙහි කුඩා පැරණි ලෙන් විහාරය සහ පහළ විහාරය වශයෙන් ස්ථාන දෙකක මහනුවර සම්ප්‍රදායට සමාන සිතුවම් සහ මූර්ති දක්නට ලැබේ. ඉහළ විහාරයේ දොරටුව දෙපසින් වන සිතුවම් සහිත බදාමයේ දුර්වල වූ ස්ථාන ශක්තිමත් කොට වර්ණ ස්ථරයේ ද පතුරු අලවා තහවුරු කරනු ලැබී ය. පහළ විහාරයේ මූර්තිවල සුළු කැඩුම් බිඳුම් සහිත ස්ථාන ද ප්‍රතිනිර්මාණය කරන ලදී. අවසානයේ කෘමි නාශක යෙදීමෙන් කෘමි හානි මර්දනය සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිණ.

**හඳගල පුරාණ ලෙන් විහාරය**

හඳගල පුරාණ ලෙන් විහාරය කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වේ. අනුරාධපුර යුගයට අයත් යැයි සැලකෙන සිතුවම් කොටස් ශේෂ වී ඇති ගල් ලෙනක් පවතින බැවින් මෙම විහාරය සුවිශේෂත්වයක් උසුලයි.

කටාරම් සහිත ගල් ලෙන් ගණනාවකින් යුතු කඳුවැටියෙහි ගල් පර්වතයක් යට පිහිටි ගල්ලෙනක වියනේ වර්ණ සහිත බදාම කොටස් දෙකක් දක්නට ලැබේ. මෙහි ප්‍රධාන බදාම කොටසේ කෘමි සතුන් විසින් සිදුරු කර ඇත. අනිත් බදාම කොටසෙහි තද කොළ පැහැති ඇල්ගී වර්ධනය වී තිබිණ. බදාම ස්ථර ඇතුළතින් බොල් වී පැවති අතර වර්ණ ස්ථර කුඩා පතුරු වශයෙන් ගිලිහී යමින් පැවතුණි.

කාලාන්තරයක් මුළුල්ලේ තදින් වර්ධනය වී තිබුණු ඇල්ගී ස්ථරය පිරිසිදු ජලයෙන් පෙඟවූ කපු පුළුන් ආධාරයෙන් ඉවත් කිරීමේ දී ඇල්ගී ස්ථරයට වැසී තිබුණු තවත් සිතුවම් කිහිපයක් අනාවරණය කර ගැනීමට මෙම ව්‍යාපෘතිය භාරව කටයුතු කළ සංරක්ෂණ සහකාර ගාමිණී උඩකන්ද මහතා ඇතුළු සංරක්ෂණ කණ්ඩායමට හැකි විය. මෙහි සැරයටියක් වැනි යමක් අතින් දරා සිටින කාන්තා රුවක් ද ඊට යටින් රේඛා සටහන් කිහිපයක් ද ඇත.

බදාම ස්ථරයේ සිදුරු සහ බොල්වීම් සුදුසු බදාමයකින් පිරවීම් කර සවිමත් කිරීමෙන් අනතුරුව වර්ණ ස්ථරයේ කුඩා පතුරු ලෙස ගිලිහී ගිය ස්ථාන ඇලවීම කරන ලදී. අවසානයේ 3% පැරලොයිඩ් බී 72 සහ සයලින් මිශ්‍රණය ආරක්ෂිත අලේපයක් වශයෙන් ගල්වන ලදී.





අනුරාධපුර යුගයට අයත් යැයි සැලකෙන සිතුවම් කොටස්



බදාමය සවිමත් කිරීම සඳහා
රසායන ද්‍රවය එන්නත් කරමින්



අලුතින් මතු කරගත් කාන්තා රුව

**හල්මිල්ලවැටිය ශිලාලේඛනය**

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හල්මිල්ලවැටිය පුරාණ විහාරස්ථානයට ආසන්නව පෞද්ගලික ඉඩමක මෙම ටැම් ලිපිය පිහිටා තිබුණි. එය විහාර භූමිය වෙත රැගෙනවිත් සුදුසු ස්ථානයක සවිකර මහජන ප්‍රදර්ශනය සඳහා තැබීමට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙන ලද නියෝගයක් මත හදිසි සංරක්ෂණ ව්‍යාපෘතියක් වශයෙන් මෙහි සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී.

නිධන් සොරුන්ගේ ග්‍රහණයට හසුවීම නිසා මෙම ශිලා ස්ථම්භය කුළු පහරකින් කැබලි වන්නට ඇතැයි සිතිය හැකි ය. මෙම ලිපිය ඉහළින් කැබලි දෙකකට කැඩී බිම වැටී ඇති අතර මැද ඇතැම් කොටස්වල අඩුවක් ඇත. කැළෑ කපා ගිනි තැබීමෙන් ද මෙම ලිපියට හානි වී ඇති බව පෙනේ.

ප්‍රථමයෙන් ශිලාලේඛනය සවිකිරීම සඳහා සුදුසු ස්ථානයක් සකස් කරන ලදී. අනතුරුව ශිලා ස්ථම්භයේ වැඩී තිබුණු ඇල්ගී සහ ලයිකන ඉවත් කර පිරිසිදු කරනු ලැබී ය. කැඩීගිය කොටස් සම්බන්ධ කරන ලද්දේ  සුදු යකඩ කූරු මගිනි. ඒ සඳහා අවශ්‍ය ස්ථානවල සිදුරු විද ඒ තුළට

සුදු යකඩ කුරු ඇතුළු කරනු ලැබී ය. ඉහළ කොටස් දෙක එපිෆික්ස් භාවිතයෙන් අලවන ලදී. පහළ කොටස සවිමත් අත්තිවාරමක නගා සිටුවන ලදී. ඉහළ කොටස් සහ පහළ කොටස සම්බන්ධ වන ස්ථානයේ වූ අඩු කොටස් ගල් කුඩු සහ එපිෆික්ස් මිශ්‍රණයකින් පුරවන ලදී. ශිලා ලේඛනය ස්ථාපනය කිරීමෙන් අනතුරුව නැවත වරක් පිරිසිදු කර එය වටා ගඩොලින් පාදමක් සාදනු ලැබී ය.

## ඌව පළාත

### බදුල්ල දිස්ත්‍රික්කය

#### දෝව රජමහා විහාරය

බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෝව නම් ග්‍රාමයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. එහි ලෙන් විහාර මන්දිරයක්, බෝධි ප්‍රාකාරයක්, ශෛලමය පියගැට පෙළක් හා ගල්තලාව මත ශෛලමය බුදු පිළිමයක් නිර්මාණය කර ඇත. පිළිමයේ හිස මට්ටමෙන් ඉහළ ගල්තලාව මත කුඩා චෛත්‍යයක් දක්නට ලැබේ.

මෙම පිළිමය ආබද්ධ ගණයට අයත් වූවකි. මෙය උසින් අඩි 45 ක් පමණ ද, උරහිස් පළලින් අඩි 12 ක් පමණ ද වන අතර බඳෙහි පළල අඩි 45 කට වැඩි ය. මෙම පිළිමයේ සිරස, උරහිස් සහ අත් ගලෙන් බේරා නිර්මාණය කර ඇති අතර බඳෙන් පහළ කොටස හුණු, වැලි මිශ්‍ර බදාමයක් සහ කුඩා ගල් කැබලි යොදා සකස් කර තිබේ. මෙහි පාද සිමෙන්ති මිශ්‍ර බදාමයෙන් පසුකාලීනව සකස් කර ඇත. මෙම පිළිමය ගල්තලාව මත සිට අඩි 4 ක් පමණ උසැති ආසනයක් මත නිර්මාණය කර ඇත. පිළිමයේ මුහුණ කොටස හැර අනෙකුත් කොටස් ගල ඛාදනය වීමෙන් රළු ස්වභාවයක් දරයි.

පිළිමයේ සහ ගලෙහි විශාල වශයෙන් ඇල්ගී සහ ලයිකන වර්ධනය වී තිබිණ. මීට අමතර ව වම් අතෙහි වැළමිට අසළින් සහ වම් උරහිස අසළින් අඩි 4 ක් පමණ උසට ශාක දෙකක් වැඩී ඇත. බඳට පහළින් ඇති බදාම ස්ථරය මත අඟලකට වඩා වැඩි ඝනකමකින් යුතුව පෙඳ පාසි බැඳී ඇත. පිළිම අසළින් වසර 100 කට වැඩා පැරණි විශාල සපු ගසක් දක්නට ලැබේ.

ප්‍රථමයෙන් 3% ඇමොනියම් හයිඩ්‍රොක්සයිඩ් සහ පිරිසිදු ජලය භාවිත කර පිළිමයේ මුහුණ, අත් ආදී කොටස්වලත් ගල් තලාව මතත් වැඩී තිබුණු ඇල්ගී ඉවත් කරන ලදී. එහි වූ ලයිකන ඉවත් කිරීම සඳහා භාවිත කරන ලද්දේ පෙනසයිට් ද්‍රාවණයයි. පිළිමයේ වම් අතෙහි උරහිස සහ වැලමිට අසළින් වැඩී තිබුණු ශාක කපා ඉවත් කර නැවත ලියැලීම වැළැක්වීම සඳහා සෝඩියම් ආසනේට් එම ශාක මුල්වලට යොදන ලදී.

### මොණරාගල දිස්ත්‍රික්කය

#### යුදගනාව පුරාණ විහාරය

බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති මෙම විහාරස්ථානයේ ඉතිහාසය ක්‍රි. පූ. දෙවන සියවස දක්වා දිවෙයි. මෙහි ප්‍රතිමා ගෘහය 18 වන සියවසෙහි දී ඉදිකරන ලද්දකි.

ප්‍රතිමා ගෘහයෙහි අත්තිවාරම විශාල කළු ගල් සහ ගඩොල් භාවිතයෙන් නිමවා ඇති අතර ආධාරක බිත්තිය සක්කගල් සහ මැටි වේ. බදාම ස්ථරය සෙ. මී. 10 ක් පමණ ඝනකම වේ. මෙය හුඹස් මැටි, ලාටු වර්ග යොදා සියුම්ව සකස් කර ඇත. වර්ණක ස්ථරය තද රතු, නිල්, කළු, ගුරු සහ කහ යන පැහැයන්ගෙන් සමන්විත වේ.

පළමුව විහාරයේ තිබූ මකුළුදැල්, දූහුවිලි, කෘමි ගෙවල් යනාදිය සියුම් පින්සල් මාර්ගයෙන් ඉවත් කරන ලදී. මූර්තිවල ගැලවී ගිය කොටස් හා බදාම ස්ථරයේ ගැලවී ගිය කොටස් හුඹස් මැටි, සිහින් ව හලාගත් වැලි 2% පොලිවීනයිල් ඇසිටේට් සමඟ  මිශ්‍ර කර පැරණි බදාමයට වඩා ශක්තියෙන් අඩු බදාමයක් සකස් කර එමගින් පිළිසකර කර තහවුරු කරන ලදී. ආධාරකයත් බදාමයත් අතර වූ බොල්වීම් තුළට 2 % පොලිවීනයිල් ඇසිටේට් ද්‍රාවණයක් සිරින්ජර් මගින් එන්නත් කිරීමෙන් තහවුරු කරන ලදී. සිතුවම් ස්ථරයෙහි පතුරු ගිලිහී තිබුණු ස්ථාන ඇලවීම සඳහා ද භාවිත කරන ලද්දේ එම ද්‍රාවණයයි. බදාම ස්ථරයේ පිපිරී ගිය ස්ථාන ඉහත බදාමයෙන් පුරවනු ලැබීය. සිතුවම මත තැන්පත්ව තිබුණු දැළි, දූහුවිලි ආදිය 3% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රවණයෙන් පිරිසිදු කරනු ලැබීය. වෙයන් මර්දනය සඳහා භාවිත කරන ලද්දේ 2% බයිෆ්ලෙක්ස් රසායනිකයයි.

**අමරගිරිය ලෙන් විහාරය (මයුරගිරිය මහා ලෙන් විහාරය)**

මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි විහාරස්ථානයකි. මලගල කඳුවැටියේ මෙම ලෙන් විහාරය පිහිටා ඇත. උතුරු දිශාවට මුහුණලා පිහිටා ඇති මෙම ලෙනෙහි පිවිසුම් දොරටු දෙපස කඩු අතින් ගත් දොරටුපාල රූප දෙකකි. එම දොරටුවට ඉහළින් කිහිඹි මුහුණ රැගත් කුඩා මකර තොරණක් ද, දෙපස ආධාරකවල සිංහ රූප 2 ක් ද ඇත. වම්පස ගල්තලාව මත කුඩා චෛත්‍යයක් නිර්මාණය කර ඇත. දකුණුපස පිරිනිවන් මංචකය විදහා දැක්වෙන විශාල සැතපෙන පිළිමයක් ද, සත්සතිය නිරූපණය වන කොටසක් ද, ඉදිරි ආධාරකයේ කුඩා සමාධි බුද්ධ රූප හා හිටි බුද්ධ ප්‍රතිමා කිහිපයක් ද, දොරටුව සහිත ආධාරකයේ විෂ්ණු හා සමන් දෙවිවරුන්ගේ රූප මූර්තිමත් කර ඇත. වියන් සිතුවම් වශයෙන් ලියවැල් මෝස්තර, සත්ව රූප, මල් මෝස්තර යනාදිය දැක් වේ.

මෙහි පිළිම විශාල සංඛ්‍යාවක් නිධන් සොරුන්ගේ ග්‍රහණයට හසුව විනාශ වී ඇත. ලෙන් වියනේ සිතුවම් මත ආගන්තුක ද්‍රව්‍ය තැන්පත්වීම ද, බදාම ස්ථරයේ බොල්වීම හා ගිලිහී යාම ද දැකිය හැකි ය. මෙහි සංරක්ෂණ කටයුතු 2009 හා 2011 යන වර්ෂවල අදියර කිහිපයක් යටතේ සිදුකරන ලදී. රසායන සංරක්ෂණය පුහුණුවන සේවක මහතුන් විසි දෙනෙකු ගේ සහභාගීත්වයෙන් පුහුණු වැඩමුළුවක් වශයෙන් මෙහි සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී.

නිධන් සොරුන්ගේ ග්‍රහණයට හසුව විනාශ වී ඇති මූර්ති

විනාශ වූ ප්‍රතිමා පිළිසකර කරමින්

මූර්ති සහ සිතුවම්වල මතුපිට ස්ථරය පිරිසිදු කරමින්

**මයුරගිරිය කුඩා ලෙන් විහාරය**

මයුරගිරිය මහ ලෙන් විහාරය අසන්නයේ පිහිටි ලෙන් විහාරයකි. මෙහි සිතුවම් සඳහා ආධාරක වූ බිත්ති සක්කගල් සහ මැටි උපයෝගී කරගෙන ගොඩනගා ඇත. බදාම ස්ථරය හුණු සහ වැලි මිශ්‍රණයකි. වර්ණ දැරීමේ ස්ථරය තුනී හුණු බදාමයකි.

මීට අමතර ව ස්ඵටික හුණුගලින් කරන ලද පිළිම, ග්‍රැනයිට් පාෂාණයෙන් කරන ලද පද්මාසන, මැටියෙන් නිර්මාණය කළ සමාධි පිළිම සහ දේව ප්‍රතිමා ද, මෑත කාලයේ දී සිමෙන්තියෙන් කරන ලද හිටි බුද්ධ ප්‍රතිමා, සමාධි ප්‍රතිමා, දොරටුපාල රූප හා කුඩා මකර තොරණ ආදිය ද දැකිය හැකි ය.

පිවිසුම් දොරටුව දෙපස ඇති දොරටුපාල රූප හා මකර තොරණ ද විහාරයේ ඇතුළත ශෛලමය පිළිමය ද, ආධාරක බිත්තියට සම්බන්ධව පිහිටුවා තිබුණු පිළිම සියල්ල ම ද නිධන් සොරුන් විසින් විනාශ කර ඇත. විහාර ගේ ඇතුළත අඩි 3 ක් 4 ක් ගැඹුරට වළවල් සාරා තිබුණි. ලෙන් වියනේ ඇති මල් මෝස්තර පමණක් විනාශ නොවී ඉතිරිව ඇත.

විහාර ගෙය තුළ එක්රැස් වී තිබුණු පස් හා ගල් අතර වූ පිළිමවල කොටස් තෝරා වෙන් කරන ලදී. මේ අතර වූ ශෛලමය පිළිමයක බඳ කොටස පද්මාසනයක් මත නගා සිටුවා සුදු යකඩ කූරු ආධාරයෙන් සවි කරනු ලැබී ය. නිධන් සොරුන් විසින් ගෙබිම සාරා තිබූ වළවල් ද පුරවා ගෙබිම යළි සකස් කරන ලදී. පස් අතර තිබී හමු වූ පද්මාසන දෙකක් ඒවා මුලින් තිබූ බවට සාධක ඇති ස්ථානවල නැවත ස්ථාපනය කරන ලදී. ආධාරකයේ සහ ලෙන් වියනේ සිතුවම් මත වූ අපද්‍රව්‍ය 2% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණය යොදා ඉවත් කරන ලදී.

**ගැනුල්පොත පුරාණ ලෙන් විහාරය**

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි විහාරස්ථානයකි. කොළවින්න ග්‍රාමයේ පොළොව මට්ටමේ සිට අඩි 200 ක් පමණ උස් වූ කඳු මුදුණක් මත මෙම ලෙන් විහාරය පිහිටා ඇත. මෙහි සිතුවම් සඳහා ආධාරක වූ බිත්ති සක්කගල් සහ මැටි බදාම උපයෝගී කරගෙන ගොඩනංවා ඇත.

ලෙන් විහාරයේ පිවිසුම් දොරටුවෙහි දෙපස දොරටුපාල රූප දෙකක් ද, සිංහ රූප දෙකක් ද දක්නට ඇත. විහාරයෙහි ඇතුළත සැතපෙන පිළිමයක් ද, සමාධි පිළිමයක් ද, දේව රූප දෙකක් ද, හිටි පිළිම දෙකක් ද, විශාල නාග රූපයක් ද දක්නට ලැබේ. සත්සතිය, ඉර හඳ සහ නෙළුම් මල් මොස්තර සිතුවම් කර ඇත.

මෙහි පිළිම නිධන් සොරුන්ගේ ග්‍රහණයට හසුව සම්පූර්ණයෙන් ම විනාශ වී ඇත. සිතුවම් ස්ථරය සමග බදාමය ගිලිහී යාම හා වියන් සිතුවම්වල පතුරු ගිලිහී යාම දක්නට ලැබුණි.

කැබලි වී ගිය පිළිම කොටස් එක්රැස් කර යළි සකස් කිරීම, ආසනවල කැඩී ගිය කොටස් තහවුරු කිරීම, ආධාරකයේ ගිලිහී ගිය බදාම කොටස් නව බදාමයකින් පිරවීම, වේ හානි මර්දනය යන සංරක්ෂණ කාර්යයන් සිදු කරන ලදී. සිතුවම් සහ මූර්ති මත තැන්පත්ව තිබුණු අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා භාවිත කරන ලද්දේ 2% ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රවණයයි.

**කොටියාගල මයිලලෙන විහාරය**

සියඹලාණ්ඩුව ප්‍රදේශීය ලෙකම් කොට්ඨාසයෙහි කොටියාගල ග්‍රාමයට නුදුරින් පිහිටා ඇත. ඝන කැළෑවක් තුළ උස් වූ කඳු යායක පිහිටි කටාරම් සහිත ලෙනකි. ලෙනට ඉදිරියෙන් මැටි ආධාරක බිත්තියක් තිබී ඇති අතර එහි කුඩා කොටසක් අද ද ශේෂව පවතී.

මෙහි ඇති දිගින් අඩි 40 ක් පමණ වන පිරිනිවන් මංචකය දැක්වෙන බුද්ධ ප්‍රතිමාව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සොයා ගන්නා විට නිධන් සොරුන්ගේ ග්‍රහණයට හසුව විනාශ වී

තිබුණි. පිළිමයේ මුහුණු පෙදෙස මුළුමනින් ම වේ හුඹසක් බවට පත්ව තිබිණ. මෙම පිළිමය ගඩොල් සහ මැටි බදාම උපයෝගී කරගෙන නිර්මාණය කර ඇත. බදාම ස්ථර තුනක් පමණ හඳුනාගත හැකි ය. එයට උඩින් තවත් තුනී ස්ථර තුනක් දක්නට ලැබේ. වර්ණක යෙදීමට පෙර බදාම ස්ථරය මතුපිට තුනී රෙද්දක් අලවා තිබූ බවට තැනින් තැන සාධක දක්නට ලැබේ.

පිළිමයේ මුහුණ වසා බැඳ තිබුණු වේ හුඹස් කුඩා උපකරණ භාවිතයෙන් ඉවත් කරන ලද අතර බඳ කොටසේ පොළොවට යට වී තිබුණු විශාල ප්‍රමාණයක් කැණීම් කොට පාදා ගන්නා ලදී. අඩු කොටස් බදාම යොදා පුරවන ලදී. එහි සංරක්ෂණ කටයුතුවලින් 80% ක පමණ ප්‍රමාණයක් මෙම වසර තුළ දී නිම කිරීමට හැකි විය.

මෙහි පිළිමයේ මුහුණට ඉහළින් ලෙන් වියනේ රතු ගුරු වර්ණයෙන් අඳින ලද මල් මෝස්තරයක කොටසක් ශේෂව පවතී. ඊට පහළින් අනවතප්ත විල ලෙස සැලකිය හැකි සිතුවමක් ද, චෛත්‍ය වන්දනාව ද, බෝධි සත්වයකුගේ යැයි සිතිය හැකි රූපයක් ද, අශ්වයකු පිට නැගි මිනිසකුගේ රුවක් ද, කුරුල්ලන්ගේ රූප ද, ඇතුන් සහ නෙළුම් කොළ ද, පහළ කෙළවර ගිනි දළු ද සිතුවම් කර ඇත. පිළිමයට පහළින් ලෙන් වියනේ සුදු පසුබිමෙහි අඳින ලද සිතුවම් කොටසක් ද දැකිය හැකි ය. මෙහි වර්ණ ස්ථරය සේදී යාම, පතුරු ගිලිහී යාම, බදාම ස්ථරය ගිලිහී යාම යන හායන තත්වයන් හඳුනාගත හැකි විය.

බදාම ස්ථරය පොයින්ට් කිරීම, වර්ණ ස්ථරයේ පතුරු ඇලවීම, ආරක්ෂිත ආලේපය ගැල්වීම හා කෘමි නාශක යෙදීම යන සංරක්ෂණ කාර්යයන් මෙම වසර තුළ දී සිදු කරනු ලැබී ය.

## සබරගමුව පළාත

### රත්නපුර දිස්ත්‍රික්කය

#### දාපනේ රජමහා විහාරය

දාපනේ රජමහා විහාරය කොළොන්න ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත. මෙහි ප්‍රතිමා ගෘහය අඩි 20 ක් පමණ දිග, අඩි 15 ක් පමණ පළල, අඩි 10 ක් පමණ උස වූ ටැම්පිට විහාරයකි. මෙහි ඇති සිතුවම් සහ මූර්ති මහනුවර සම්ප්‍රදායට අයත් වේ. මෙම විහාරයේ ඉදිරිපස දොරටුපාල රූප දෙකක් මූර්තිමත් කර ඇති අතර ඉන් ඉහළ මෛත්‍රී බෝධිසත්වයන් දිව්‍ය ලෝකයේ සැප විඳින ආකාරය දැක්වෙන සිතුවමකි. විහාරය ඇතුළත ප්‍රධාන සමාධි පිළිමයක් සහ දෙපස හිටි පිළිම දෙකකි. දකුණුපස බිත්තියේ හිටි පිළිමයට අමතරව විෂ්ණු දේව ප්‍රතිමාවක් ද නිර්මාණය කර ඇත. සිතුවම් තීරු දෙකකි. ඉහළ තීරුවේ රහත් රූප සහ පහළ තීරුවේ දෙවිවරුන්ගේ රූප සිතුවම් කර ඇත.

මෙහි වූ ප්‍රධාන හායන තත්ත්වය වූයේ සිතුවම් ස්ථරය පතුරු වශයෙන් ගිලිහීමයි. දේව ප්‍රතිමාවේ අතක් ගලවා වැටීමට ආසන්න තත්වයේ පැවතුණි. බදාමය බොල්වීම හා බදාම ස්ථරය ගිලිහී වැටීම ද දක්නට ලැබුණි. කෘමි හානි ද පැවතුණි. මෙම හායන තත්ත්වයන් සඳහා ප්‍රතිකර්ම යෙදීම මෙම වසර තුළ දී සිදු කරනු ලැබීය.

**මඩුවන්වල වලව්ව**

කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම වලව්ව ක්‍රි.ව. 1700 දී එනම් දෙවන විමලධර්මසූර්ය රජ සමයේ මඩුවන්වල මෙහොට්ටාල විසින් ප්‍රථමයෙන් ඉදි කරන ලද්දක් ලෙස සැලකේ. පසුව ශ්‍රී වීර පරාක්‍රමබාහු නරේන්ද්‍රසිංහ රජ දවස (ක්‍රි.ව. 1725) මඩුවන්වල විජේසුන්දර ඒකනායක අබේකෝන් මුදියන්සේ විසින් සිංහල උළු සෙවිලි කර ස්ථිර ගොඩනැගිල්ලක් බවට පත්කර ඇත. ක්‍රි.ව. 1905 වනවිට මෙහි කාමර 121 ක් හා මැද මිදුල් 21 ක් තිබුණු බවට වාර්තා වේ. වර්තමානයේ මෙහි කාමර 42 ක් සහ මැද මිදුල් 07 ක් ඉතිරි වී ඇත. ප්‍රධාන ප්‍රවේශ දොරටුව ගල් උළුවස්සකින් යුතුව නිර්මාණය කර ඇත. විසිත්ත කාමරයේ තිබෙන උළුවහු කටුවන කොටුවෙන් රැගෙනවිත් මෙහි සවි කළ බව සැලකේ. ගෙබිම පිඟන් කැබලි මගින් මෝස්තර රටා මැවෙන පරිදි 'මොසැයික්' කලාවෙන් අලංකාර කර ඇත. 1974 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මෙහි සංරක්ෂණ කටයුතු ආරම්භ කර ඇත.

අධිකරණ ශාලාවේ ඉදිරිපස බිත්තියේ උඩ සිට පහළට පිපිරීමක් සහ බදාමය බොල් වී ගිලිහී ගිය ස්ථාන කිහිපයක් දැකිය හැකි ය. කාමරයේ වම්පස පිවිසුම් දොරටුවට ඉහළින් ඇති මල් මෝස්තර මත සහ දකුණුපස පිවිසුම් දොරටුවට ඉහළින් ද හුණු ආලේප කර ඇත. කෑම කාමරයේ බිම මොසැයික් මොස්තර මත සිමෙන්ති හා අපද්‍රව්‍ය තැන්පත්වීම ද දැකිය හැකි විය. සිතුවම් මත වූ හුණු ඉවත් කිරීම, ආධාරකයේ බොල් වී පිපිරී ගිය සහ ගිලිහී ගිය ස්ථාන සකස් කිරීම යන කාර්යයන් සිදු කරන ලදී. මොසැයික් මෝස්තර මත වූ සිමෙන්ති හා අපද්‍රව්‍ය ඉවත් කිරීම ද සිදු කරන ලදී. හුණු ආලේපනය ඉවත් කිරීමේ දී 'කොළොන්න කෝරළය ඔෆිස්' යන වචන මතු විය.

**කෑගල්ල දිස්ත්‍රික්කය**

**ලෙනගල පුරාණ විහාරය**

වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහළ ලෙනගල ග්‍රාමසේවා වසමෙහි පිහිටි ලෙන් විහාරයකි. මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් සහ මූර්තිවලින් සමන්විත වූ ලෙන් විහාරය අඩි 35ක පමණ දිගින් ද අඩි 30 ක පමණ පළලින් ද යුතු ය. මෙහි බිත්තිවල බදාම ස්ථරය බොල් වී ආධාරකයෙන් ගිලිහෙමින් පැවතීම, සිතුවම් ස්ථරය පතුරු වශයෙන් ගිලිහීම, සිතුවම් මත අපද්‍රව්‍ය තැන්පත්වීම, මූර්ති කැඩී බිඳී යාම යන හායන තත්වයන් සඳහා ප්‍රතිකර්ම යෙදීම මෙම වසර තුළ දී සිදු කරන ලදී.

**දෙවනගල රජමහා විහාරයේ බුදු පිළිම සංරක්ෂණය**

මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පිහිටි විහාරස්ථානයකි. මෙහි ප්‍රතිමා ගෘහය ටැම්පිට සම්ප්‍රදායට ඉදි කළ එකකි. එය මහනුවර සම්ප්‍රදායේ සිතුවම්, මූර්ති සහ දැව කැටයම්වලින් සමන්විත වේ. මෙහි පිවිසුමෙහි කැටයම්වලින් සමන්විත දැව දොරටුවකි. ඇතුළත හිඳි බුද්ධ ප්‍රතිමාවක් ද, දෙපස තවත් හිඳි බුද්ධ ප්‍රතිමා දෙකක් සහ හිටි බුද්ධ ප්‍රතිමා දෙකක් ද දක්නට ලැබේ. මීට දශක දෙකකට පමණ ප්‍රථම නිධන් සොරුන් විසින් මෙම බුද්ධ ප්‍රතිමා විනාශ කර ඇති අතර එබැවින් ටැම්පිට විහාරය වන්දනාමාන කිරීමෙන් බැහැර කොට තිබිණි.

අරලිය දැවයෙන් කළ ආකෘතියකට මැටි බදාම යෙදීමෙන් මෙම පිළිම නිර්මාණය කර ඇත. නිධන් සොරුන් පිළිමවල මතුපිට බදාමයට හානිකර තිබුණු බැවින් මෙම දැව ආකෘතිය මතුවී ඇත. දැව පෘෂ්ඨයට මැටි බදාමය හොඳින් සවිවීම සඳහා දැව පෘෂ්ඨය මත රළු නියන් පහරවල් යොදා තිබේ. සිරස්පත් සහ දෙකන් සැකසීම සඳහා යොදාගෙන ඇත්තේ ද අරලිය දැව අරටුවකි. ප්‍රධාන ස්ථර හයක් හඳුනාගත හැකි විය.

| | | |
|---|---|---|
| 1 වන ස්ථරය | - | කොහු, වැලි, මැටි, හුණු |
| 2 වන ස්ථරය | - | කපු පුළුන්, සියුම් වැලි, මැටි, හුණු |
| 3 වන ස්ථරය | - | සියුම් වැලි, මැටි, හුණු |
| 4 වන ස්ථරය | - | හුණු |
| 5 වන ස්ථරය | - | වර්ණ ස්ථරය |
| 6 වන ස්ථරය | - | දොරණ තෙල් |

පිළිමවල ශේෂව තිබුණු සාධක සහ ප්‍රතිමා ප්‍රමාණ මූලධර්ම සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රතිමා ප්‍රතිනිර්මාණය කිරීම සිදු කරන ලදී. මෙහි දී එක් එක් ස්ථරයේ පැරණි බදාම සංයුතියට සරිලන ආකාරයෙන් බදාම සකස් කරන ලදී. බන්ධන මාධ්‍යය ලෙස භාවිත කරන ලද්දේ පොලිවීනයිල් ඇසිටේට් ද්‍රාවණයකි. ගිලිහී ගිය අක්බමරු සහ සිරස්පත් ද නැවත සවි කරනු ලැබී ය. පිළිම ප්‍රතිනිර්මාණයෙන් පසු දිය සායම් උපයෝගී කරගෙන නැවත වර්ණ ගන්වනු ලැබී ය. ආරක්ෂිත ආලේපය වශයෙන් භාවිත කරන ලද්දේ සාම්ප්‍රදායිකව සකස් කරගත් දොරණ තෙල් ආලේපනයකි. මේ ආකාරයට නිධන් සොරුන් විසින් විනාශ කරන ලද බුදු පිළිම පහක් ප්‍රතිනිර්මාණය කරන ලදී.

**සබරගමුව පළාත තුළ ඇති පැරණි විහාරස්ථානවල සිතුවම් වාර්තාගත කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ සබරගමු පළාතේ ස්ථාන දෙකක සිතුවම් ඡායාරූප මධ්‍යයෙන් සහ රේඛා සටහන් මාධ්‍යයෙන් වාර්තාගත කරන ලදී. ඇතැම්විට අවශ්‍ය ස්ථානවල සිතුවම් පිටපත් කිරීම ද සිදු කෙරිණ. මෙම වසර තුළ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨසාය තුළ පිහිටි යකුපල්ල ලෙන හෙවත් පිළිම බැඳි ගල්ගේ සහ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි යටහලෙන රජමහා විහාරයේ සිතුවම් මෙලෙස වාර්තාගත කරන ලදී.

## උතුරු පළාත

**යාපනය දිස්ත්‍රික්කය**

**කඳුරුගොඩ පුරාණ විහාරය (කන්තරොඩෙයි)**

චුන්නාකම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පිහිටි කඳුරුගොඩ පුරාණ විහාරයෙහි රහතන් වහන්සේලාගේ භෂ්මාවශේෂ තැන්පත් කොට ඉදිකරන ලදැයි සැලකෙන කුඩා ශෛලමය ස්තූප 30 ක් පමණ දක්නට ලැබේ. සකස් කරන ලද හුණුගලින් නිර්මාණය කරන ලද මෙම කුඩා චෛත්‍යවල ප්‍රමාණය එකිනෙකට වෙනස් ය. විශාල ම චෛත්‍යය උසින් අඩි 15 ක් පමණ වන අතර කුඩා ම චෛත්‍යය උසින් අඩි 06 ක් පමණ වේ. මෙම චෛත්‍යවල මතුපිට පෘෂ්ඨයේ ඇල්ගී හා ලයිකන් වර්ධනය වී තිබිණි.

පළමුව 10% පෙනසයිට් ද්‍රාවණය චෛත්‍යය මත ආලේප කරනු ලැබීය. ඉන්පසුව පැය 24 ක පමණ කාලයක් ගතවීමෙන් පසු ජලයෙන් සෝදා හරින ලදී. මෙහි දී ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණය ද යොදා ගන්නා ලදී.



චෛත්‍යවල මතුපිට පෘෂ්ඨයේ ඇල්ගී හා ලයිකන් වර්ධනය වී ඇති ආකාරය



ඇල්ගී හා ලයිකන් ඉවත් කරමින්

## අභිලේඛන හා නාණක විද්‍යා අංශය

අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් 2011 වර්ෂයේ ව්‍යාපෘති පහක් ක්‍රියාත්මක කරන ලදී. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

I. ශිලාලේඛන පිටපත් කිරීමේ ව්‍යාපෘතිය.
II. ශිලාලේඛන සුචිගත කිරීමේ ව්‍යාපෘතිය.
III. ශිලාලේඛන පරිවර්තන නාම පුවරු යෙදීමේ ව්‍යාපෘතිය
IV. කාසි සුචිගත කිරීමේ ව්‍යාපාතිය
V. අභිලේඛන සුචිගත කිරීමේ ව්‍යාපෘතිය.

### ශිලාලේඛන පිටපත් කිරීමේ ව්‍යාපෘතිය :-

අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් උක්ත ව්‍යාපෘතිය යටතේ 2011 වර්ෂයේ දී ශිලාලේඛන 25 ක් පිටපත් කර ඇත. ලංකාවේ විවිධ ප්‍රදේශවලින් පිටපත් කර ඇති මේ ශිලාලේඛන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

### බස්නාහිර පළාත

2011 වර්ෂයේ දී බස්නාහිර පළාතෙන් ශිලාලේඛන දෙකක් පිටපත් කර ඇත. ඒ අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 4 -A ග්‍රාමසේවා නිලධාරී වසමේ මාලදෙනිය රජමහා විහාරයෙන් පිටපත් කර ඇති ශිලාලේඛනය ගිරි ලිපියකි. මෙහි අක්ෂර හඳුනාගත නො හැකි ලෙස ගෙවී ගොස් ඇත.

ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිළිකුත්තුව ග්‍රාමසේවා නිලධාරි වසමේ අඹගහවත්ත නැමැති ඉඩමේ අංක 24 දරණ ලෙනේ පිටපත් කළ ලිපිය ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස්වලට අයත් වූවකි. එහි අක්ෂර බ්‍රාහ්මී වන අතර භාෂාව පැරණි සිංහල වේ. ලෙන් ප්‍රදානයක් පිළිබඳ ප්‍රස්තුත ලිපියේ සඳහන් වේ.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2011.06.15 | ගිරි | ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 4-A ග්‍රාමසේවා නිලධාරි වසමේ මාලදෙනිය රජමහා විහාරයේ ගල් තලාවක | - | - | - | අක්ෂර බෙහෙවින් ගෙවී ඇත |
| 2011.06.29 | ලෙන් | ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිළිකුත්තුව ග්‍රාමසේවා නිලධාරි වසමේ අඹගහවත්ත නැමති ඉඩමේ අංක 24 දරණ ලෙනේ | බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස් | 1. පරුමක පුරණ පුත දතශ ච බත - - මිතශ ච ලෙණෙ |

## මධ්‍යම පළාත

2011 වර්ෂයේ දී මධ්‍යම පළාතෙන් එක් ශිලාලේඛනයක් පිටපත් කර ඇත. ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගල්ඔය ග්‍රාමසේවා නිලධාරි වසමේ ගල්ඔය අතු ගංගාවේ පිඟන් සංස්ථාවට යන පාරේ හමුවන පාලම අසළ පැදුරුගල්පොත්ත නම් ස්ථානයෙන් ගිරි ලිපියක් පිටපත් කර තිබේ. පේළි පහකින් සමන්විත මේ ලිපියේ අක්ෂර හා භාෂාව නූතන සිංහල වේ. ක්‍රිස්තු වර්ෂ 14 වන සියවස්වලට අයත් වන ප්‍රස්තුත ලේඛනයේ සිවල්කොළු නම් අධිකාරි කෙනෙකු විසින් සිදු කරන ලද පින්කමක් පිළිබඳ සඳහන් වේ.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2011.07.13 | ගිරි | මහනුවර දිස්ත්‍රික්කයේ දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගල්ඔය ග්‍රාමසේවා නිලධාරි වසමේ ගල්ඔය අතුගංගාවේ පිඟන් සංස්ථාවට යන පාරේ හමුවන පාලම අසළ පැදුරුගල්පොත්ත නම් ස්ථානයේ | නූතන සිංහල | නූතන සිංහල | ක්‍රිස්තු වර්ෂ 14 සියවස | 1. ශකවෂී එක්දාස් දෙ<br>2. සිය එකාසූ අවුරුදු හි<br>3. ළ අව විසෙනිය මෙ පි<br>4. න් කම කළසිවල්කොළු<br>5. ලක්දිවූ අධිකාරවම්හ. |

## වයඹ පළාත

2011 වර්ෂයේ වයඹ පළාතෙන් ටැම් ලිපියක් පිටපත් කර ඇත. ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කළුගල්ල ග්‍රාමසේවා නිලධාරි වසමේ කොතලකෙමියාව රජමහා විහාර භූමියට අයත් කුඹුරේ කෙළවර ඇළ මාර්ගය හා ප්‍රවේශ මාර්ගය ආසන්නයේ තිබී උක්ත ටැම් ලිපිය පිටපත් කර ඇත. පේළි විස්සකින් පමණ සමන්විත මේ ලිපිය ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස්වලට අයත් වූවකි. මෙහි අක්ෂර හා භාෂාව මධ්‍යකාලීන සිංහල වේ. ලේඛනයේ අක්ෂර බෙහෙවින් මැකී ඇති අතර මැද පමණක් අක්ෂර කීපයක් දක්නට ඇත. ටැම් ලිපියේ එක් පැත්තක පමණක් අක්ෂර කොටා තිබේ. එහි ඉහළ කෙළවරේ පුන්කලසක සළකුණක් දක්නට ඇත.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2011.02.22 | ටැම් | කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කළුගල්ල ග්‍රාමසේවා නිලධාරි වසමේ කොතලකෙමියාව රජමහා විහාරයේ විහාර භූමියට අයත් කුඹුරේ කෙළවර ඇළ මාර්ගය හා ප්‍රවේශ මාර්ගය ආසන්නයේ | මධ්‍යකාලීන සිංහල | මධ්‍යකාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස් | එක් පැත්තක පමණක් අක්ෂර ඇති ටැම් ලිපියකි. අක්ෂර බෙහෙවින් මැකී ඇත. ඉහළ කෙළවර පුන්කලසක සලකුණක් ඇත. |

## උතුරු මැද පළාත

2011 වර්ෂයේ දී උතුරු මැද පලාතෙන් ශිලාලේඛන  දාහතරක් පිටපත් කර ඇත. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 8 තුලාන ග්‍රාමසේවා නිලධාරි වසමේ D - 10 මොණරාගල රජමහා විහාරයේ ගල් තලාවෙන් ගිරි ලිපියක් පිටපත් කර ඇත. අක්ෂර පේළි 9කින් සමන්විත අතර උක්ත ලිපිය ක්‍රිස්තු වර්ෂ  4 - 5 සියවස්වලට අයත් වූවෙකි. ශිලාලේඛනයේ අක්ෂර අපර බ්‍රාහ්මීය වන අතර භාෂාව පුරාණ සිංහල වේ. ශිලාලේඛනයේ අක්ෂර බෙහෙවින් ගෙවී ගොස් ඇති බැවින් ලිපියේ අන්තර්ගතය පිළිබඳ ව අර්ථයක් ගැනීම අපහසු ය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ  අංක - 01, බිසෝකොටුව ග්‍රාමසේවා නිලධාරී වසමේ දෙයියන්නේකන්ද පාමුල උතුරු දෙසින් ගිරි ලිපි දෙකක් පිටපත් කර ඇත. මෙකී ලිපි දෙක ම ක්‍රිස්තු වර්ෂ 5 - 7 සියවස්වලට අයත් වේ. ඒවායේ අක්ෂර අපර බ්‍රාහ්මීය වන අතර භාෂාව පුරාණ සිංහල වේ. ඉන් එක ගිරි ලිපියක කිසියම් විහාරයකට කහවනු විසිහයක් පිදීම පිළිබඳ ව සඳහන් වේ.

එමෙන් ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ශිලාලේඛන හතරක් පිටපත් කර ඇත.

ඒ අනුව 367 දෙමටමල්ගම ග්‍රාමසේවා නිලධාරි වසමේ ඌත්තුවෙල්ලිය පුරාවිද්‍යා ස්ථානයෙන් පිටපත් කර ඇති ලෙන් ලිපි තුන ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස්වලට අයත් වූ ඒවා වේ. ඒවායේ භාෂාව බ්‍රාහ්මී වන අතර අක්ෂර පැරණි සිංහල වේ. ප්‍රස්තුත ලෙන් ලිපි තුනෙහි ම සංඝයා වහන්සේලාට ලෙන් ප්‍රදානයන් පිළිබඳ ව සඳහන් වේ.

මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 368, නෙළුම්විල ග්‍රාමසේවා නිලධාරි වසමේ අනුරාධපුරය තන්තිරිමලය ප්‍රධාන පාරේ 14 වැනි කණුව අසළ ඇති කනත්ත ළඟින් වමට හැරී යන විට හමුවන පොකුණු අසළින් ගිරි ලිපියක් පිටපත් කර ඇත. ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසට අයත් මේ ලිපිය පේළි හතරකින් යුක්ත ය. අක්ෂර අපර බ්‍රාහ්මී වන අතර භාෂාව පුරාණ සිංහල වේ. උක්ත ලිපියේ අක්ෂර බොහෝ සෙයින් ගෙවී ගොස් ඇත.

එමෙන් ම පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ශිලාලේඛන හතක් පිටපත් කර ඇත. ඒ අනුව 155, ඇතුමල්පිටිය ග්‍රාමසේවා නිලධාරි වසමේ ලක්ෂ උයන දුම්රිය ස්ථානයට යන නාම පුවරුව අසළින් ටැම් ලිපියක් ද, උක්ත ග්‍රාම නිලධාරි වසමේ පුරාවිද්‍යා සංචාරක නිවාසය පිටුපස කැලයේ තිබී පුවරු ලිපියක් ද පිටපත් කර තිබේ. මේ පුවරු ලිපිය ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස්වලට අයත් වූවකි. අක්ෂර හා භාෂාව මධ්‍යකාලීන සිංහල වේ.

තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පී.එස්. කොලණිය ග්‍රාම සේවා නිලධාරි වසමේ දුඹුටුලුගල පරාක්‍රම සමුද්‍රය අසළ වැව් බැම්ම අසළින් ටැම් ලිපියක් පිටපත් කර ඇත. ක්‍රිස්තු වර්ෂ 12 වන සියවසට අයත් මෙය ගාවුත කණුවකි. ටැඹෙහි පැති තුනක අක්‍ෂර කොටා ඇති අතර එහි අක්‍ෂර හා භාෂාව මධ්‍යකාලීන සිංහල වේ. I වන පැරකුම්බා රජු වැව් සෑදූ බව ද, ඔහු විසින් මෙයට පෙර ඉදිකළ ගාවුත කණුවේ සිට මේ ගාවුත කණුවට ඇති දුර ප්‍රමාණයත් ප්‍රස්තුත ටැම් ලිපියේ සඳහන් ය.

තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 161, ගනන්ගමුව ග්‍රාමසේවා නිලධාරි වසමේ ගනන්ගොල්ල වැව් බැම්මේ අසළින් ටැම් ලිපියක් පිටපත් කර තිබේ. ක්‍රිස්තු වර්ෂ 12 වන සියවසට අයත් උක්ත ලිපියේ අක්‍ෂර හා භාෂාව මධ්‍යකාලීන සිංහල වේ. අක්‍ෂර අපැහැදිලි නමුත් ටැඹෙහි තුන් පැත්තක අක්‍ෂර පේළි දැකිය හැකි ය. මීට ඉහත සඳහන් කළ ටැඹ මෙන් මෙය ද I වන පරාක්‍රමබාහු රජු විසින් ඉදි කරන ලද ගාවුත කණුවකි.

තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 165, අඹන්ගඟ ග්‍රාමසේවා නිලධාරි වසමේ නිර්දේශගම (දොර දහය) වැව් බැම්ම අසළින් ද ටැම් ගාවුත කණුවක් වන ශිලාලේඛනයක් පිටපත් කර ඇත. ටැඹෙහි තුන් පැත්තක අක්‍ෂර දැකිය හැකි ය. ක්‍රිස්තු වර්ෂ 12 වන සියවසට අයත් මෙහි අක්‍ෂර හා භාෂාව මධ්‍යකාලීන සිංහල වේ. I වන පරාක්‍රමබාහු රජු විසින් ඉදි කරන ලද මෙකී ටැම් ලිපියෙහි සඳහන් වනුයේ, ඔහු විසින් රියනින් රියන මෙවැනි ටැඹවල් ඉදි කරන ලද බව හා ඊට අමතර ව කුඹුරු හා වාරි මාර්ග සෑදූ බවත් ය.

තමන්කඩුව ප්‍රාද්ශීය ලේකම් කොට්ඨාසයේ 166, කලහගම ග්‍රාමසේවා නිලධාරී වසමේ ස්වර්ණපාලීගම කලහගල වැව් බැම්ම අසළින් ටැම් - ගාවුත කණුවක් පිටපත් කර ඇත. මේ ලිපිය ද ක්‍රිස්තු වර්ෂ 12 වන සියවසට අයත් වන අතර අක්‍ෂර හා භාෂාව මධ්‍යකාලීන සිංහල වේ. එමෙන් ම කලහගම ග්‍රාමසේවා නිලධාරි වසමේ හු වැව පැරණි සොරොව්ව ඇති වැව් බැම්ම අසළින් ද ටැම් - ගාවුත කණුවක් පිටපත් කර ඇත. මෙකී ශිලාලේඛනය ද ක්‍රිස්තු වර්ෂ 12 වන සියවසට අයත් වන අතර අක්‍ෂර හා භාෂාව මධ්‍යකාලීන සිංහල වේ. ප්‍රස්තුත ලේඛන දෙකෙහි ම පළමුවන පරාක්‍රමබාහු රජු විසින් වැව් ඉදිකර කෙත්වතු සරුසාර කළ බැව් සඳහන් වේ.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්‍ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2011.06.21 | ගිරි | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක - 08 තුලාන ග්‍රාමසේවා නිලධාරි වසමේ D – 10 මොණරගල රජමහා විහාරයේ | අපර බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු වර්ෂ 4 - 5 සියවස් | අක්‍ෂර බෙහෙවින් ගෙවී ගොස් ඇත. |
| 2011.06.23 | ගිරි | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 01 බිසෝකොටුව ග්‍රාම නිලධාරි වසමේ දෙයියන්නේකන්ද පාමුල උතුරු පැත්තේ | අපර බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු වර්ෂ 5 - 7 සියවස් | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2011.06.24 | ගිරි | ඉහත ස්ථානයේ ම | අපර බ්‍රාහ්මී | පූරාණ සිංහල | ක්‍රිස්තු වර්ෂ 5-7 සියවස් | කිසියම් විහාරයකට කහවනු විසිහයක් පිදීම පිළිබඳ ව සඳහන් ය. |
| 2011.09.13 | ලෙන් | අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 367, දෙමටමල්ගම ග්‍රාම සේවා නිලධාරී වසමේ ඌත්තුවෙල්ලිය පුරාවිද්‍යා ස්ථානයේ පළමුවන ලෙනේ | පූර්ව බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 3 ක්‍රිස්තු වර්ෂ 1 සියවස් | භික්ෂූන් වහන්සේලාට ලෙන් ප්‍රදානයක් පිළිබඳ සඳහන් වේ. |
| 2011.09.14 | ලෙන් | ඉහත ස්ථානයේ ම මැද ලෙනේ | පූර්ව බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 3 ක්‍රිස්තු වර්ෂ 1 සියවස් | භික්ෂූන් වහන්සේලාට ලෙන් ප්‍රදානයක් පිළිබඳ සඳහන් ය. |
| 2011.09.15 | ලෙන් | ඉහත ස්ථානයේ ම තුන්වන ලෙනේ | පූර්ව බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු පූර්ව 3 ක්‍රිස්තු වර්ෂ 1 සියවස් | භික්ෂූන් වහන්සේලාට ලෙන් ප්‍රදානයක් පිළිබඳ සඳහන් ය. |
| 2011.09.16 | ගිරි | අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 368, නෙළුම්විල ග්‍රාමසේවා නිලධාරී වසමේ අනුරාධපුරය තන්තිරිමලය ප්‍රධාන පාරේ 14 වන කණුව අසළ ඇති කනත්ත ළඟින් වමට හැරී එන විට හමුවන පොකුණ අසළ ඇති ගිරි ලිපිය | අපර බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු වර්ෂ 4 සියවස් | අක්ෂර බෙහෙවින් ගෙවී ගොස් ඇත. |
| 2011.08.14 | ටැම් | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 155, ඇතුමල්පිටිය ග්‍රාමසේවා නිලධාරී වසමේ ලක්ෂ උයන දුම්රිය ස්ථානයට යන නාම පුවරුව එක අසළ ඇති ලිපිය | මධ්‍යකාලීන සිංහල | මධ්‍යකාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස් | - |
| 2011.08.15 | පුවරු | පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 155, ඇතුමල්පිටිය ග්‍රාමසේවා නිලධාරී වසමේ පුරාවිද්‍යා සංචාරක නිවාසය පිටුපස කැලයේ | මධ්‍යකාලීන සිංහල | මධ්‍යකාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස් | |
| 2011.08.16 | ටැම් (ගාවුත කණුවකි) | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පී.එස්. කොලණිය ග්‍රාමසේවා නිලධාරී වසමේ දුබුටුලුගල පරාක්‍රම සමුද්‍රය අසළ වැව් බැම්මේ. | මධ්‍යකාලීන සිංහල | මධ්‍යකාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 12 සියවස් | පළමුවන පරාක්‍රමබාහු රජු විසින් වැව් සෑදූ බව හා මීට පෙර ඉදිකළ ගව් කණුවේ සිට මේ ගව් කණුවට ඇති දුර ප්‍රමාණ ආදිය සඳහන් ය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2011.10.14 | වැව් ගාවුත කණුවකි | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 161, ගණන්ගමුව ග්‍රාමසේවා නිලධාරි වසමේ ගණන්ගොල්ල වැව් බැම්මේ | මධ්‍යකාලීන සිංහල | මධ්‍යකාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 12 සියවස | පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ඉදිකරන ලද ගාවුත කණුවකි. |
| 2011.10.15 | වැව් ගාවුත කණුවකි | පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 165, අඹන්ගඟ ග්‍රාම සේවා නිලධාරි වසමේ නිර්දේශගම (දොරදහය) වැව් බැම්මේ | මධ්‍යකාලීන සිංහල | මධ්‍යකාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 12 සියවස | පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ඉදිකරන ලද ගාවුත කණුවකි. |
| 2011.10.16 | වැව් ගාවුත කණුවකි | පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 166, කලහගම ග්‍රාමසේවා නිලධාරි වසමේ ස්වර්ණපාලීගම (කලහගල වැව් බැම්මේ) | මධ්‍යකාලීන සිංහල | මධ්‍යකාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 12 වන සියවස | පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ඉදිකරන ලද ගාවුත කණුවකි. රජු විසින් වැව් ඉදිකර කෙත්වතු සරුසාර කළ බැව් සඳහන් වේ |
| 2011.10.17 | වැව් ගාවුත කණුවකි | පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 166,කලහගල ග්‍රාමසේවා නිලධාරි වසමේ හු වැව පැරණි සොරොව්ව අසළ වැව් බැම්මේ | මධ්‍යකාලීන සිංහල | මධ්‍යකාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 12 සියවස් | පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ඉදිකරන ලද ගාවුත කණුවකි. රජු විසින් වැව් ඉදිකර කෙත්වතු සරුසාර කළ බැව් සඳහන් ය. |

**සබරගමු පළාත**

2011 වර්ෂයේ දී සබරගමු පළාතෙන් එක් ශිලාලේඛනයක් පිටපත් කර ඇත. ඒ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බිසෝවෙල ග්‍රාමසේවා නිලධාරි වසමේ බිසෝවෙල රජමහා විහාරයෙන් පිටපත් කළ ලෙන් ලිපිය ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස්වලට අයත් වූවකි. එය එක් අක්ෂර පේළියකින් සමන්විත ය. ලේඛනයේ අක්ෂර පූර්ව බ්‍රාහ්මී වන අතර භාෂාව පැරණි සිංහල වේ.

| **පිටපත් කළ දිනය** | **වර්ගය** | **ස්ථානය** | **අක්ෂර** | **භාෂාව** | **කාලය** | **වෙනත් තොරතුරු** |
|---|---|---|---|---|---|---|
| 2011.07.10 | ලෙන් | කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බිසෝවෙල ග්‍රාමසේවා නිලධාරි වසමේ බිසෝවෙල රජමහා විහාරයේ | පූර්ව බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු පූර්ව 3 ක්‍රිස්තු වර්ෂ 1 සියවස් | 1------පුති තිහක තිශ-ම යනුවෙන් සඳහන් ය. |

**උතුරු පළාත**

2011 වර්ෂයේ දී උතුරු පළාතෙන් ද එක් ශිලාලේඛනයක් පිටපත් කර ඇත. ඒ අනුව මන්නාරම් දිස්ත්‍රික්කයේ නානාට්ටං ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුරුක්කන් ග්‍රාමසේවා නිලධාරි වසමේ මුරුක්කන් රෝහල් භූමියෙන් ප්‍රස්තුත ලිපිය පිටපත් කර තිබේ. මෙය පුවරු ලිපියක් වන අතර අක්ෂර අපර බ්‍රාහ්මී වේ.

ක්‍රිස්තු වර්ෂ 1 - 2 සියවස්වලට අයත් මේ ශිලාලේඛනයේ භාෂාව පුරාණ සිංහල ය. ලේඛනය අක්ෂර පේළි පහකින් සමන්විත වේ. නාග නම් රජ කෙනෙකු විසින් කරවන ලද ස්තූපයකට විලක මත්ස්‍ය බද්ද පූජා කිරීමක් පිළිබඳ උක්ත ලිපියේ සඳහන් ය.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2011.06.27 | පුවරු | මන්නාරම දිස්ත්‍රික්කයේ නානාට්ටං ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුරුක්කන් ග්‍රාමසේවා නිලධාරි වසමේ මුරුක්කන් රෝහල් භූමියේ | අපර බ්‍රාහ්මී | පුරාණ සිංහල | ක්‍රිස්තු වර්ෂ 1-2 සියවස් | නාග නම් රජ කෙනෙකු විසින් කරවන ලද ස්තූපයකට විලක මත්ස්‍ය බද්ද පූජා කිරීමක් පිළිබඳ සඳහන් ය. |

**නැගෙනහිර පළාත**

2011 වර්ෂයේ නැගෙනහිර පලාතේ අම්පාර දිස්ත්‍රික්කයේ ශිලාලේඛන පහක් පිටපත් කර තිබේ. ඒ අනුව අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දීඝවාපි ග්‍රාමසේවා නිලධාරි වසමේ දීඝවාපි පුරාවිද්‍යා වැඩබිමෙන් පුවරු ලිපි දෙකක් පිටපත් කර ඇත. එමෙන් ම ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැරණි ලාහුගල ග්‍රාම සේවා නිලධාරී වසමේ නීලගිරි සෑය කුඩා චෛත්‍යය ගොඩැල්ල අසළින් ගිරි ලිපි දෙකක් ද පන්සල්ගොඩැල්ල ග්‍රාමසේවා නිලධාරී වසමේ කොටවෙහෙර පුරාවිද්‍යා ස්ථානයෙන් ගිරි ලිපි එකක් ද පිටපත් කර ඇත. දීඝවාපී පුරාවිද්‍යා ස්ථානයෙන් පිටපත් කළ පුවරු ලිපි දෙකෙහි ම අක්ෂර හා භාෂාව මධ්‍යකාලීන සිංහල වේ. පුවරු ලිපි දෙක ම ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස්වලට අයත් ය. නීලගිරි සෑය අසළින් පිටපත් කළ ලිපි දෙකෙහි ම අක්ෂර අපර බ්‍රාහ්මීය වන අතර භාෂාව පැරණි සිංහල වේ. ඉන් එක් ලිපියක් ද කිස්තු පූර්ව 1 - ක්‍රිස්තු වර්ෂ 1 සියවස්වලට ද අනෙක ක්‍රිස්තු වර්ෂ 3 සියවසට ද අයත් ය.

ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටවෙහෙර පුරාවිද්‍යා ස්ථානයෙන් පිටපත් කළ ගිරි ලිපිය ක්‍රිස්තු වර්ෂ 3 - 4 සියවස්වලට අයත් වූවකි. එහි අක්ෂර අපර බ්‍රාහ්මී වන අතර භාෂාව පැරණි සිංහල වේ.

| පිටපත් කළ දිනය | වර්ගය | ස්ථානය | අක්ෂර | භාෂාව | කාලය | වෙනත් තොරතුරු |
|---|---|---|---|---|---|---|
| 2011.10.07 | පුවරු | අම්පාර දිස්ත්‍රික්කයේ අඩ්ඩාලච්චේන | මධ්‍යකාලීන සිංහල | මධ්‍යකාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 9-10 | 1. කුඩකොලු<br>2. හිමියන |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දීඝවාපිය ග්‍රාමසේවා නිලධාරි වසමේ දීඝවාපී චෛත්‍ය මළුවේ පුරාවිද්‍යා වැඩබිමේ | | | සියවස් | 3. සළුපහ<br>4. ය |
| 2011.10.09 | පුවරු | ඉහත ස්ථානයේ ම | මධ්‍යකාලීන සිංහල | මධ්‍යකාලීන සිංහල | ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස් | 1. බමණ සො<br>2. න මෙ ------<br>3. ස -----------<br>4. -------------<br>5. -------------- |
| 2011.08.04 | ගිරි | අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැරණි ලාහුගල ග්‍රාමසේවා නිලධරි වසමේ නීලගිරි සෑය කුඩා චෛත්‍යය ගොඩැල්ල අසළ | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු පූර්ව 1 ක්‍රිස්තු වර්ෂ 1 සියවස් | දේවානම්පියතිස්ස මහරජුගේ මුණුබුරු කුටකණ්ණතිස්ස රජුගේ පුත් භාතිකාභය රජුගේ දියණියක වන මහා රාජිනී චූල සීවලී දේවිය විසින් උත්තර සීවලී පර්වත විහාරයට සිදුකරන ලද ප්‍රදානයක් පිළිබඳ සඳහන් වේ. |
| 2011.08.04 | ගිරි | ඉහත ස්ථානයේ ම | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 3 සියවස් | ජෙට්ඨතිස්ස රජුගේ කාලයෙහි අමාත්‍යවරයකු විසින් සිදුකරන ලද ප්‍රදානයක් පිළිබඳ සඳහන් වේ. |
| 2011.08.05 | ගිරි | අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පන්සල් ගොඩැල්ල ග්‍රාමසේවා නිලධාරි වසමේ කොටවෙහෙර පුරාවිද්‍යා ස්ථානයේ ගල්තලාවට නගින පඩිපෙළ වම් පැත්තේ | අපර බ්‍රාහ්මී | පැරණි සිංහල | ක්‍රිස්තු වර්ෂ 3-4 සියවස් | දිගුලක ම විහරහි ස ...පසිල...චටනග මහි බුයම අබකතිස යනුවෙන් සඳහන් වේ. |

**බස්නාහිර පළාත**



මාලදෙණිය රජමහා විහාරයේ ඇති ලිපිය



පිළිකුත්තුව ග්‍රාමසේවා නිලධාරි වසමේ අඹගහවත්ත නැමති ඉඩමේ අංක 24 දරණ ලෙනේ ඇති ලිපිය

**මධ්‍යම පළාත**



ගල්ඔය අතුගංගාවේ පිඟන් සංස්ථාවට යන පාරේ හමුවන පාලම අසළ පැදුරුගල්පොත්ත නම් ස්ථානයේ ඇති ලිපිය

**උතුරු මැද පළාත**



තුලාන ග්‍රාමසේවා නිලධාරි වසමේ D – 10 මොණරගල රජමහා විහාරයේ ඇති ලිපිය



දෙයියන්නේකන්ද පාමුල උතුරු පැත්තේ ඇති ලිපිය




ඌත්තුවල්ලිය පුරාවිද්‍යා ස්ථානයේ පළවන ලෙනේ ඇති ලිපිය



ඉහත ස්ථානයේ ම මැද ලෙනේ ඇති ලිපිය



ඉහත ස්ථානයේ ම තුන්වන ලෙනේ ඇති ලිපිය



තන්තිරිමලය ප්‍රධාන පාරේ 14 වන කණුව අසළ ඇති කනත්ත ළඟින් වමට හැරී එන විට හමුවන පොකුණ අසළ ඇති ගිරි ලිපිය



155, ඇතුමල්පිටිය ග්‍රාමසේවා නිලධාරි වසමේ පුරාවිද්‍යා සංචාරක නිවාසය
පිටුපස කැලයේ ඇති ලිපිය



දුබුටුලුගල පරාක්‍රම සමුද්‍රය අසළ වැව් බැම්මේ ඇති ලිපිය



ගණන්ගොල්ල වැව් බැම්මේ ඇති ලිපිය



නිර්දේශගම (දොරදහය) වැව් බැම්මේ ඇති ලිපිය



ස්වර්ණපාලීගම
(කලහගල වැව් බැම්මේ) ඇති ලිපිය




හූ වැව පැරණි සොරොව්ව අසළ වැව්
බැම්මේ ඇති ලිපිය

**සබරගමුව පළාත**



බිසෝවෙල රජමහා විහාරයේ ඇති ලිපිය

**උතුරු පළාත**



මුරුක්කන් ග්‍රාමසේවා නිලධාරි වසමේ මුරුක්කන් රෝහල් භූමියේ ඇති ලිපිය


**නැගෙනහිර පළාත**




දීඝවාපී චෛත්‍ය මළුවේ පුරාවිද්‍යා වැඩබිමේ ඇති ලිපිය




ඉහත ස්ථානයේ ම ඇති දෙවන ලිපිය



නීලගිරි සෑය කුඩා චෛත්‍යය ගොඩැල්ල අසළ ඇති ලිපිය



ඉහත ස්ථානයේ ම ඇති අනෙක් ලිපිය



කොටවෙහෙර පුරාවිද්‍යා ස්ථානයේ ගල්තලාවට නගින පඩිපෙළ වම් පැත්තේ ඇති ලිපිය

## ශිලාලේඛන සුචිගත කිරීමේ ව්‍යාපෘතිය

ශිලාලේඛන සුචිගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2011 වර්ෂයේ දී අභිලේඛන හා නාණක විද්‍යා අංශය මගින් පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශිලාලේඛන සුචිගත කරන ලදී. එහි දී ශිලාලේඛන 135 ක් සුචිගත කර ඇත. ඒ අනුව ප්‍රස්තුත ශිලාලේඛන පහත සඳහන් ස්ථානවලින් සුචිගත කෙරිණි.

I. පොළොන්නරුව පූජා භූමිය ආශ්‍රිත ප්‍රදේශය
II. පොළොන්නරුව පූජා භූමියෙන් පිටත ප්‍රදේශය
III. පොළොන්නරුව පුරාවිද්‍යා වැඩබිම් කාර්යාලයේ ප්‍රදර්ශනයට තබා ඇති ශිලාලේඛන
IV. පොළොන්නරුව මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් පුරාවිද්‍යා කෞතුකාගාරයේ ඇති ශිලාලේඛන
V. පුරාවිද්‍යා වැඩබිම් කාර්යාල ගබඩාවේ තැන්පත් කර ඇති ශිලාලේඛන

මේ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

I. පොළොන්නරුව පූජා භූමිය ආශ්‍රිත ප්‍රදේශයේ ශිලාලේඛන :-
පොළොන්නරුව පූජා භූමිය ආශ්‍රිත ප්‍රදේශයෙන් ශිලාලේඛන 59 ක් සුචිගත කරන ලදී. මින් ප්‍රකාශයට පත් කර ඇති ලිපි ගණන 30 ක් වන අතර ප්‍රකාශයට පත් කර නොමැති ශිලාලේඛන ගණන 29 කි.

II. පොළොන්නරු පූජා භූමියෙන් පිටත ප්‍රදේශයේ හමුවන ශිලාලේඛන :-
මේ යටතේ ශිලාලේඛන හතරක් සුචිගත කිරීමට හැකි වී ඇත. ඒවා සියල්ල ම පරාක්‍රම සමුද්‍රය වැව් බැම්ම දිගේ හු වැව නම් ස්ථානයට යන තෙක් හමුවන ගව්කණු හතරකි. මේ ගව්කණු නිශ්ශංකමල්ල රජතුමා විසින් සිටුවන ලද ඒවා වන අතර ටැම් ලිපි ගණයට අයත් වේ.

III. පොළොන්නරුව පුරාවිද්‍යා වැඩබිම් කාර්යාලයේ ප්‍රදර්ශනයට තබා ඇති ශිලාලේඛන :-
මේ ස්ථානයේ තිබී ශිලාලේඛන හතරක් සුචිගත කරන ලදී. ශිලාලේඛන හතර ම මධ්‍යකාලීන යුගයට අයත් ය.

IV. මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් පොළොන්නරුව පුරාවිද්‍යා කෞතුකාගාරයේ ඇති ශිලාලේඛන :-
පොළොන්නරුව පුරාවිද්‍යා කෞතුකාගාරයේ තිබී ශිලාලේඛන 46 ක් සුචිගත කරන ලදී. මින් ප්‍රකාශයට පත්ව ඇත්තේ ලිපි දහයකටත් වඩා අඩු ප්‍රමාණයකි.

V. පුරාවිද්‍යා වැඩබිම් කාර්යාලයේ ගබඩාවේ තැම්පත් කර ඇති ශිලාලේඛන :-
පුරාවිද්‍යා වැඩබිම් කාර්යාලයේ ශිලාලේඛන 22ක් පමණ තැම්පත් කර ඇත.
මේ අනුව 2011 වර්ෂයේ දී පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශිලාලේඛන සම්පූර්ණයෙන් ම සුචිගත කර අවසන් කරන ලදී.

## ශිලාලේඛන පරිවර්තන නාම පුවරු යෙදීමේ ව්‍යාපෘතිය : -

උක්ත ව්‍යාපෘතිය යටතේ අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් ප්‍රථමයෙන් දිවයිනේ සියලු ම පලාත් ආවරණය වන පරිදි ශිලාලේඛන 60ක් පරිවර්තන නාමපුවරු යෙදීම සඳහා හඳුනා ගන්නා ලදී. ඊට අමතර ව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත 2011 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහනට සමගාමීව විශේෂිත සෙල්ලිපි 23ක් සඳහා ද පරිවර්තන නාමපුවරු යොදන ලදී. ඒ අනුව 2011 වර්ෂයේ දී අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් පරිවර්තන නාමපුවරු යෙදූ මුළු ශිලාලේඛන ගණන 83කි. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

### පරිවර්තන නාමපුවරු යෙදූ ස්ථාන

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ කොට්ඨාසය | ස්ථානය |
|---|---|---|---|
| බස්නාහිර | ගම්පහ | දිවුලපිටිය | 1.වටිනාපහ පුවරු ලිපිය |
| | ගම්පහ | ගම්පහ | 2.බුළුගහගොඩ පුවරු ලිපිය |
| | ගම්පහ | ගම්පහ | 3.කොරතොට ලෙන් ලිපිය |
| | | | |
| මධ්‍යම | මහනුවර | යටිනුවර | 4. දන්තුරේ රජමහා විහාර ගිරි ලිපිය |
| | මහනුවර | උඩුනුවර | 5. ලංකාතිලක රජමහා විහාර ලිපිය |
| | මහනුවර | හාරිස්පත්තුව | 6. මොලගොඩ රජමහා විහාර ලිපිය |
| | | | |
| දකුණ | හම්බන්තොට | අම්බලන්තොට | 7. ලේරපුත්තාභය රජමහා විහාර ලිපිය |
| | හම්බන්තොට | තංගල්ල | 8. රන්න ගිරි අබා විහාර ගිරි ලිපිය |
| | මාතර | වැලිගම | 9. අග්‍රබෝධි විහාර පුවරු ලිපිය |
| | හම්බන්තොට | තිස්සමහාරාමය | 10. යටාල දාගැබ පුවරු ලිපිය |
| | | | |
| උතුරු පළාත | වව්නියාව | වව්නියාව | 11.මන්නාරම් කච්චේරිය ලිපිය |
| | වව්නියාව | වව්නියාව | 12. මාමඩුව ලිපිය |
| | වව්නියාව | වව්නියාව | 13. මාමඩුව වැව අසළින් හමුවන ලිපිය |
| | වව්නියාව | වව්නියාව | 14. තාඩිකුලම් ලිපිය |
| | | | |
| වයඹ | කුරුණෑගල | මහව | 15. කයිකාවල ගිරි ලිපිය |
| | කුරුණෑගල | රිදීගම | 16. කොරොස්ස ගිරි ලිපිය |
| | කුරුණෑගල | ගනේවත්ත | 17. කහටගස්වල විහාර ගිරි ලිපි |
| | කුරුණෑගල | පොල්පිතිගම | 18. නාගොල්ල විහාර ලෙන් ලිපිය |
| | කුරුණෑගල | කුරුණෑගල | 19. ගිණිකරාව රජමහා විහාර ගිරි ලිපිය |
| | කුරුණෑගල | බමුණාකොටුව | 20. ඇඹලව රත්ගල් විහාර ගිරි ලිපිය |
| | පුත්තලම | නවගත්තේගම | 21. පිච්චන්දියාව ගිරි ලිපිය |
| | පුත්තලම | නවගත්තේගම | 22. එරුනුක්කුලිය ගිරි ලිපිය |
| | පුත්තලම | ආනමඩුව | 23. ඌරියාව අංක 02 ගිරි ලිපිය |
| | පුත්තලම | ආනමඩුව | 24. පරමාකන්ද ගිරි ලිපිය |
| | පුත්තලම | පුත්තලම | 25. අතුරුපොලයාගම ටැම් ලිපිය |
| | පුත්තලම | ආනමඩුව | 26. තෝණිගල ශිලාලිපි 21 |
| | පුත්තලම | ආනමඩුව | 27. තෝණිගල ශිලාලිපිය 1 |

| | | | |
|---|---|---|---|
| | කුරුණෑගල | කුරුණෑගල | 28. අලවල අමුණ ගිරි ලිපිය |
| | කුරුණෑගල | පොල්පිතිගම | 29. කොතලකෙඹියාව ලෙන් ලිපිය |
| | කුරුණෑගල | කුරුණෑගල | 30. හඳමාගම විහාර ලෙන් ලිපිය |
| | | | |
| **උතුරු මැද** | අනුරාධපුර | නාච්චදූව | 31. මහරත්මලේ ලිපිය |
| | අනුරාධපුර | රඹෑව | 32. වේවැල්කැටිය පුවරු ලිපිය |
| | අනුරාධපුර | කැබිතිගොල්ලෑව | 33. හල්මිල්ලවැටිය ලිපිය |
| | අනුරාධපුර | තිරප්පනේ | 34. කොස්සෝ කන්ද ගිරි ලිපිය |
| | අනුරාධපුර | පදවිය | 35. පදවිය වැවේ වානේ ඇති ටැම් ලිපිය |
| | අනුරාධපුර | හොරොව්පතාන | 36. කුළුම්මාකඩ පුවරු ලිපිය |
| | පොළොන්නරුව | කවුඩුල්ල | 37. කහඹිලියාව |
| | අනුරාධපුරය | මධ්‍යම නුවරගම් පළාත | 38. පෙරිමියන්කුලම ගිරි ලිපිය |
| | අනුරාධපුරය | මධ්‍යම නුවරගම් පළාත | 39. ඇතුල්නුවර පුවරු ලිපිය |
| | අනුරාධපුරය | තිරප්පනේ | 40. කොස්සෝ කන්ද ලෙන් ලිපිය |
| | අනුරාධපුරය | ලංකාපුර | 41. මීන්විල ගිරි ලිපිය |
| | අනුරාධපුරය | ලංකාපුර | 42. මීන්විල ගිරි ලිපිය |
| | අනුරාධපුරය | ලංකාපුර | 43. මීන්විල ගිරි ලිපිය |
| | අනුරාධපුරය | මධ්‍යම නුවරගම් පලාත | 44. අභයගිරිය පුවරු ලිපිය |
| | අනුරාධපුරය | මධ්‍යම නුවරගම් පලාත | 45. අභයගිරිය පුවරු ලිපිය |
| | අනුරාධපුරය | මැදවච්චිය | 46. නාගිරිකන්ද ගිරි ලිපිය |
| | අනුරාධපුරය | මධ්‍යම නුවරගම්පලාත | 47. බසවක්කුළම ගිරි ලිපිය |
| | | | |
| **ඌව** | මොනරාගල | මොනරාගල | 48. මයුරගිරිය රජමහා විහාර ලිපිය |
| | බදුල්ල | රිදීමාලියැද්ද | 49. ඔලගංගල ලෙන් ලිපිය |
| | මොනරාගල | බඩල්කුඹුර | 50. කටුගහගල් ගේ ටැම් ලිපිය |
| | | | |
| **සබරගමුව** | කෑගල්ල | මාවනැල්ල | 51. වේරගල දෙහිමඩුව ශිලා ලිපිය |
| | රත්නපුර | රත්නපුර | 52. රත්නපුරය මහා සමන් දේවාලය පුවරු ලිපිය |
| | කෑගල්ල | අරනායක | 53. කෑගල්ල අරණායක මහා සමන් දේවාලය |
| | රත්නපුර | රත්නපුර | 54. ගිලීමලේ ලිපිය |
| | රත්නපුර | කුරුවිට | 55. ශ්‍රී පාද පලාබත්ගල ධර්මරාජගලේ ලිපිය |
| නැගෙනහිර | අම්පාර | දමන | 56. මුවන්ගල රජමහා විහාර ගිරි ලිපිය |
| | අම්පාර | මහඔය | 57. හෙනානිගල ලෙන් ලිපිය |
| | අම්පාර | දමන | 58. ඉලුක්පිටිය ලෙන් ලිපිය |
| | අම්පාර | දමන | 59. ඉලුක්පිටිය ලෙන් ලිපිය |
| | අම්පාර | මාවනැල්ල | 60. මායාදුන්න රජමහාවිහාර ලිපිය |

## දැයට කිරුළ වැඩසටහනට සමගාමීව යොදන ලද නාම පුවරු සහ වෙනත් විශේෂිත නාම පුවරු

| උතුරු මැද | පොලොන්නරුව | තමන්කඩුව | 61. ගල්පොත කතිකාවත ලිපිය |
|---|---|---|---|
| | අනුරාධපුරය | මිහින්තලය | 62. හතරවන මිහිඳු රජුගේ මිහින්තලේ පුවරු ලිපිය 2 |
| | අනුරාධපුරය | මිහින්තලය | 63. හතරවන මිහිඳු රජුගේ මිහින්තලේ පුවරු ලිපිය 2 |
| | අනුරාධපුරය | මිහින්තලය | 64. මිහින්තලේ ගිරි ලිපිය |
| | පොලොන්නරුව | තමන්කඩුව | 65. පොළොන්නරුව ගල්පොත ලිපිය |
| | පොලොන්නරුව | තමන්කඩුව | 66. පොළොන්නරුව හැටදා ගේ ලිපිය |
| | පොලොන්නරුව | තමන්කඩුව | 67.පොළොන්නරුව වේලයික්කාර ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 68. බිල්ලෑවෙගල (බරතනාග ලෙන) අංක 01 ලෙන් ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 69. බිල්ලෑවෙගල (බරතනාග ලෙන ) අංක 02 ලෙන් ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 70. බිල්ලෑවෙගල (බරතනාග ලෙන ) අංක 03 ලෙන් ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 71. බිල්ලෑවෙගල (බරතනාග ලෙන) ගිරි ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 72. බිල්ලෑවෙගල (බරතනාගලෙන) අංක 04 ලෙන් ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 73. බිල්ලෑවෙගල (බරතනාගලෙන) අංක 05 ලෙන් ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 74. බිල්ලෑවෙගල (බරතනාගලෙන) අංක 06 ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 75. බිල්ලෑවෙගල (බරතනාගලෙන) අංක 07 ලෙන් ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 76. බිල්ලෑවෙගල (බරතනාගලෙන) අංක 08 ලෙන් ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 77. බිල්ලෑවෙගල (බරතනාගලෙන) |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 78. තන්තිරිමලේ ගිරි ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 79. තන්තිරිමලේ ටැම් ලිපිය |
| | අනුරාධපුරය | මහවිලච්චිය | 80. තන්තිරිමලේ ලෙන් ලිපිය. |
| | අනුරාධපුරය | මැදවච්චිය | 81. හඳගල විහාර ලෙන් ලිපිය 1 |
| | අනුරාධපුරය | මැදවච්චිය | 82. හඳගල විහාර ලෙන් ලිපිය 2 |
| | අනුරාධපුරය | මැදවච්චිය | 83. හඳගල විහාර ලෙන් ලිපිය 3 |

## කාසි සුචිගත කිරීමේ ව්‍යාපෘතිය :-

2011 වර්ෂයේ දී අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් පොළොන්නරුව පුරාවිද්‍යා කෞතුකාගාරයේ කාසි 602 ක් සුචිගත කරන ලදී. මේ කාසි සියල්ල මධ්‍යකාලීන කාසි වූ අතර ඒ පිළිබඳ විස්තර පහත වේ.

| කාසි වර්ගය | කාලය | ප්‍රමාණය |
|---|---|---|
| 01. තඹ මස්ස කාසිය | | |
| 1 වන විජයබාහු | ක්‍රිස්තු වර්ෂ 1055 - 1111 | 02 |
| 1 වන පරාක්‍රමබාහු | ක්‍රිස්තු වර්ෂ 1153 - 1186 | |
| ලීලාවති රැජින | ක්‍රිස්තු වර්ෂ 1197 - 1200 | 02 |
| | 1209 - 1210 | 195 |
| | 1211 - 1212 | |
| ශ්‍රීමත් සාහස්සමල්ල | ක්‍රිස්තු වර්ෂ 1200 - 1202 | 363 |
| ධර්මාශෝකදේව | ක්‍රිස්තු වර්ෂ 1208 - 1209 | 38 |
| 1 වන භුවනෙකබාහු | ක්‍රිස්තු වර්ෂ 1273 - 1284 | 01 |
| 02. චීන කාසි | | 01 |
| | **එකතුව** | **602** |

## අභිලේඛන සුචිගත කිරීමේ ව්‍යාපෘතිය :-

2011 වර්ෂයේ දී අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් අභිලේඛන (පුස්කොල පොත්) 57 ක් සුචිගත කර ඇත. මේ පුස්කොල පොත් මීරිගම බෝතලේ ශ්‍රී ගෝඨාභය රජමහා විහාරයේ පුස්කොළ පොත් සංචිතයේ තිබී සුචිගත කර තිබේ. සුචිගත කරන ලද පුස්කොල පොත් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අංකය | පොත | කර්තෘ | කාලය | භාෂාව | අක්ෂර |
|---|---|---|---|---|---|
| DA/WP/G/Mi/2011/Gov - 0000 | තඹ සන්නස | අඥාතය | IVපරාක්‍රමබාහු | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov - 0001 | ජාතක පොත් වහන්සේ | ඊ.ඩී.රොමානිස් වෙදමහතා | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0002 | සතිපට්ඨානය | අඥාතය | ක්‍රිස්තු වර්ෂ 1938 | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0003 | සතිපට්ඨාන සූත්‍රය | - | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0004 | - | රේවත යනුවෙන් අත්සන් කර ඇත | 1915.07.13 | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0005 | - | අඥාතය | - | සිංහල - පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0006 | ධම්මචක්කප්පවත්තන සූත්‍රය | - | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov - 0007 | සූර්ය තෙමෙච | අඥාතය | - | සිංහල - පාලි | සිංහල |

| | | | | | |
|---|---|---|---|---|---|
| DA/WP/G/Mi/2011/Gov – 0008 | මහා සතිපට්ඨාන සූත්‍රය | - | බුද්ධ වර්ෂ 2488 | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov- 0009 | කුඳුගොත් සඟිය | අඥාතය | බුද්ධ වර්ෂ 2459ක් වූ ජුනි මස 27. ක්‍රිස්තු වර්ෂ 1915 ශ.1836 යනුවෙන් සඳහන් ය. | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0010 | දම්සක්පැවතුම් සූත්‍රය | අඥාතය | බු.ව 2482 මැයි මස 1වන දින | පාලි | සිංහල බැඳි අකුරු |
| DA/WP/G/Mi/2011/Gov – 0011 | ධම්මසනි ප්‍රකරණය | - | බු.ව 2486 | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0012 | දම්සක්පැවතුම් සූත්‍රය | අඥාතය | - | පාලි | සිංහල බැඳි අකුරු |
| DA/WP/G/Mi/2011/Gov-0013 | දම්සක්පැවතුම් සූත්‍රය ඇතුළත් පොත් කීපයක් | අඥාතය | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0014 | සතිපට්ඨාන සූත්‍රය | - | ශ්‍රී.බු.ව 2482 | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0015 | පාලි නිඝණ්ඩුව | බෝතලේ පහළගම මරතේලිස් සිංඤ්ඤෝ | සක වර්ෂ 1785 | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0016 | සන්න සහිත ධම්මචක්කප්පවත්තන සූත්‍රය | - | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0017 | සතිපට්ඨානය | අඥාතය | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0018 | මිලිඳු ප්‍රශ්නය | අඥාතය | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0019 | බ්‍රහ්මජාල සූත්‍රය | - | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0020 | දම්සක්පැවතුම් සූත්‍රය | - | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0021 | හේතුඵල වාදය : | අඥාතය | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0022 | ධම්මචක්ක සුතතං | අඥාතය | - | පාලි | සිංහල බැඳි අක්ෂර |
| DA/WP/G/Mi/2011/Gov – 0023 | සන්න සහිත දම්සක්පැවතුම් සූත්‍රය | අඥාතය | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0024 | ජාතක කථා පිළිබඳ සඳහන් පොතකි. | අඥාතය | | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0025 | රසවාහිනිය | අඥාතය | | පාලි | සිංහල බැඳි අකුරු |

| | | | | | |
|---|---|---|---|---|---|
| DA/WP/G/Mi/2011/Gov – 0026 | රසවාහිනිය | අඥාතය | | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0027 | ධර්ම ග්‍රන්ථයකි | අඥාතය | | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0028 | බ්‍රහ්මජාල සූත්‍රය | අඥාතය | | පාලි | සිංහල බැඳි අක්‍ෂර |
| DA/WP/G/Mi/2011/Gov – 0029 | ධම්මචක්කපවත්තන සූත්‍රය | අඥාතය | ක්‍රිව 1946 | පාලි | සිංහල බැඳි අක්‍ෂර |
| DA/WP/G/Mi/2011/Gov – 0030 | කාලකාරාම සූත්‍රය | බෝතලේ පහළගම ඒ.ඩී.අගිලිස් | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0031 | සුදර්ශන සූත්‍රය | අඥාතය | ක්‍රි.ව 1823 මැයි | පාලි | සිංහල බැඳි අකුරු |
| DA/WP/G/Mi/2011/Gov – 0032 | බ්‍රහ්මජාල සූත්‍රය | වල්බෝතලේ විහාරාධිපති කැලෑ ගෙදර සුනන්ද ස්ථවිර ස්වාමිපාදයන් | 19 සියවස | පාලි | සිංහල බැඳි අක්‍ෂර |
| DA/WP/G/Mi/2011/Gov – 0033 | දම්සක් පැවතුම් සූත්‍රයේ පදාර්ථය. භික්‍ෂු ප්‍රාතිමෝක්‍ෂයෙහි පදාර්ථය | - | නැත | පාලි හා සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0034 | ධම්මචක්ක සූත්‍රය | - | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0035 | දම්සක් පැවතුම් සූත්‍රය | - | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0036 | සූත්‍ර අඩංගු පොතකි | - | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0037 | සතිපට්ඨාන සූත්‍රය | - | ශත වර්ෂ 1844 | පාලි | සිංහල බැඳි අකුරු |
| DA/WP/G/Mi/2011/Gov – 0038 | - | - | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0039 | බෝසත් චරිතය පිළිබඳ සඳහන් වේ. | - | - | සිංහල | සිංහල බැඳි අකුරු |
| DA/WP/G/Mi/2011/Gov – 0040 | අත් බෙහෙත් වෙද පොතකි | අඥාතයි | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/Gov – 0041 | සතර සතිපට්ඨානය (සන්න සහිත) | - | ශ්‍රී.බු.ව 2494 බිනර මය | පාලි | සිංහල බැඳි අකුරු |
| DA/WP/G/Mi/2011/Gov – 0042 | ධම්මචක්කප්පවත්තන සූත්‍රය | අඥාතයි | - | පාලි | සිංහල බැඳි අකුරු |
| DA/WP/G/Mi/2011/Gov – 0043 | වියරණ සහිත මහා සතිපට්ඨාන සූත්‍රය | අඥාතයි | - | පාලි | සිංහල බැඳි අකුරු |

| | | | | | |
|---|---|---|---|---|---|
| DA/WP/G/Mi/2011/G ov – 0044 | බුද්ධ චරිතය | - | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/G ov – 0045 | අනාගත වංශ දේශනාව | අඥාතයි | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/G ov – 0046 | පඨානප්‍රකරණය | - | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/G ov – 0047 | මහාපට්ඨාණ ප්‍රකරණ | ඊ.ඩී. රෝමානිස් | ක්‍රි.ව 1962.08.27 | පාලි, සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/G ov – 0048 | සධම්ම අලංකාරය | - | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/G ov – 0049 | පට්ඨාන ප්‍රකරණය | අඥාතයි | නුවර යුගය | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/G ov – 0050 | අංගුත්තර සුතතං | අඥාතයි | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/G ov – 0051 | පිරිත් පොත් වහන්සේ | අඥාතයි | 1900 කාලයේ | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/G ov – 0052 | ධර්ම ග්‍රන්ථයකි | අඥාතයි | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/G o v – 0053 | මජ්ජිම නිකාය | - | - | පාලි | සිංහල |
| DA/WP/G/Mi/2011/G ov – 0054 | සධර්ම රත්නාකරය | - | - | පාලි | සිංහල බැඳි අකුරු |
| DA/WP/G/Mi/2011/G ov – 0055 | වෙස්සන්තර ජාතකය | අඥාතයි | - | සිංහල | සිංහල |
| DA/WP/G/Mi/2011/G ov – 0056 | සන්න සහිත දම්සක් පැවතුම් සූත්‍රය | අඥාතයි | - | පාලි සිංහල | සිංහල බැඳි අකුරු |
| DA/WP/G/Mi/2011/G ov – 0057 | සංයුක්ත නිකාය | අඥාතයි | නුවර යුගය | සිංහල | සිංහල |

# නඩත්තු අංශය

## වයඹ පළාත

**දඹදෙණිය පුරාවිද්‍යා ස්ථානය පවත්වාගෙන යාම**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය දෛනිකව පවත්වාගෙන යාම සිදු කරන ස්ථානයකි.

මුරසේවය පවත්වාගෙන යාම සිදු කළ අතර කෞතුකාගාරය පවත්වාගෙන යාමද සිදුකරන ලදී. පෙත්මග සඳහා අත්වැල් සකස් කිරීම පෙත්මගෙහි ගල් නැවත යෙදීම ආදීය මෙහිදී සිදු කරන ලදී. ඒ අනුව පෙත්මග සකස් කිරීමේදී කඳුමුදුනට පහත ප්‍රදේශවල පෙත්මග අඩි 150 ක් දුරට සකස් කරන ලදී. 9'' × 6'' සහ 6'' × 4'' ප්‍රමාණයේ සක්ක ගල් භාවිතා කරමින් මෙම පෙත්මග සකස් කරන ලදී. කාර්යාලය ඉදිරි පිට සිට පඩි බැම්මේ පෙත්මග තෙක් බොරළු අතුරා පෙත්මග සකස් කරන ලදී.

**යාපහුව පුරාවිද්‍යා ස්ථානය පවත්වාගෙන යාම**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම පුරාවිද්‍යා ස්ථානය වාර්ෂිකව නඩත්තු කර පවත්වාගෙන යන පුරාවිද්‍යා ස්ථානයකි. මෙම වැඩබිමට පුරාවිද්‍යා රක්ෂිතය, වැඩබිම් කාර්යාලය, පුරාවිද්‍යා කාර්යාලය ආදී ස්ථාන අයත් වේ. ඒ අනුව 2011 වසරේ පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

- වැඩබිම් කාර්යාලයේ වැහිපිහිලි අලුත් වැඩියා කිරීම.
- සංචාරක නිවාසයේ සෝපාව නැවත කවර යෙදීම.
- පිවිසුම් මාර්ගයේ අලුතින් බෝක්කු දෙකක් යෙදීම.
- කෞතුකාගාර භූමියේ භූමිය පස් පුරවා සකස් කිරීම.
- පැරණි ලෙන් විහාරයේ වහලයේ දිරාපත්ව ඇති කොටස ඉවත් කර නැවත සකස් කිරීම.
- සභාශාලාව ගොඩනැගිල්ල පොයින්ට් කර සකස් කිරීම.
- යාපහුව පුරාවිද්‍යා ස්ථානය දෛනිකව නඩත්තු කර වසර පුරා පවත්වාගෙන යාම.

**පඬුවස්නුවර පුරාවිද්‍යා ස්ථානය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම වැඩබිම වසර පුරා පවත්වාගෙන යන ස්ථානයකි. මෙය මුර සේවය පවත්වාගෙන යන ස්ථානයකි. මෙහි මුර සේවය පවත්වාගෙන යාම, අක්කර 02ක් වූ රක්ෂිතය ස්මාරක සහිත ප්‍රදේශය සුද්ධ පවිත්‍ර කිරීම, බොරළු මාර්ග සඳහා බොරළු යෙදීම ද සිදු කරන ලදී. ප්‍රාකාර බැම්මෙන් ගල් නැවත බැඳ පොයින්ට් කිරීම ද ඉටු කරන ලදී. මේ අනුව පඬුවස්නුවර පුරාවිද්‍යා ස්ථානය නඩත්තු කර පවත්වාගෙන යන ලදී.

**රාජාංගන පුරාවිද්‍යා ස්ථානය සහ 11 කලාපය පවත්වාගෙන යාම.**

- මුර සේවාව පවත්වාගෙන යාම
- කෞතුකාගාරය අලුත්වැඩියා කිරීම.
- නටබුන් ප්‍රදේශයේ ඇති ස්මාරකවල ගැලවී ඇති ගඩොල් බැමි ශක්තිමත් කිරීම.

**බුන්නැහැපොල පැරණි නටබුන් පිළිමගෙය නඩත්තු කිරීම.**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි බුන්නැහැපොල රජමහා විහාරයේ පැරණි නටබුන් ප්‍රතිමා ගෘහයකි. මෙම ප්‍රතිමා ගෘහය වටා සුද්ධ කරන ලදී. බොල් වූ ගඩොල් ඉවත් කර ස්ථානය ප්‍රදර්ශන මට්ටමට පවත්වන ලදී.

**පනාවිටිය අම්බලම ගේට්ටුව යෙදීම.**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ ගවයන් ඇතුළු වීම වළක්වා ගැනීමටත් ස්ථානයේ පෞරාණික බව ආරක්ෂා කිරීමටත් සුදුසු ගේට්ටුවක් යෙදිය යුතුය. ඒ අනුව පැවති ගේට්ටු කණු නැවත තහවුරු කරන ලදී. අනතුරුව අඩි 05ක උස ගේට්ටුවක් යොදා ස්ථානයේ ආරක්ෂාව තහවුරු කරන ලදී.

## වයඹ පළාත

**නාම පුවරු සවිකිරීම.**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් ස්ථාන සඳහා නාම පුවරු යොදන ලදී.

**මාර්ග සංඥා පුවරු**

| | |
|---|---|
| පොත්පිතිගම | - 5 |
| රිදීවෙහෙර | - 1 |
| ගොම්දියගාල පිළිමගෙය | - 1 |
| කබැල්ලාන ලෙන් විහාරය | - 1 |
| මාළිගාතැන්න | - 1 |
| නාගොල්ල | - 1 |
| තෝනිගල | - 5 |
| විළඳගොඩ | - 2 |
| ලබුගල | - 1 |
| යාපහුව | - 2 |
| කටුවන්නාව ආසනඝරය | - 1 |
| දියබැමේ | - 1 |
| තුම්පනේ | - 1 |

**ස්ථානීය නාම පුවරු**

| | |
|---|---|
| පොල්පිතිගම | - 3 |
| රිදීවෙහෙර | - 1 |
| කව්ලාලෙන | - 1 |

| | | |
|---|---|---|
| නාගල | - 1 | |
| යාපහුව | - 1 | |
| **ස්ථානීය පුවරු** | | |
| පඬුවස්නුවර | - 6 | |
| මාළිගා භූමිය | - 2 | |
| චක්‍රවාලය | - 2 | |
| කොටවෙහෙර | - 2 | |
| **පරිවර්තන නාම පුවරු** | - 1 | - තෝනිගල ගිරි ලිපිය සඳහා |
| ඩිජිටල් නාම පුවරු | - 1 | - පුත්තලම කෞතුකාගාරය |

**යාපහුව පුරාවිද්‍යා ස්ථානය පවත්වාගෙන යාම**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යාපහුව පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත.

ප්‍රාග් ඓතිහාසික යුගයේත් පූර්ව හා මධ්‍යශිලා හා ඓතිහාසික යුගවලදීත් යාපහුව හා තදාසන්න ප්‍රදේශය ජනාවාසයක්ව තිබූ බව පුරාවිද්‍යා මතයයි. මෙම ස්ථානයේ දෛනික පවත්වාගෙන යාම වෙනුවෙන් ස්මාරක වටා පිරිසිදු කිරීම, රක්ෂිත පරිශ්‍රය විසි ගසා පවත්වා ගෙනයාම සිදුකරන ලදී.

වැඩබිම් කාර්යාලයේ වහලයේ වැහි පිහිල්ල නැවත යෙදීම, කෞතුකාගාරය පිටුපස පහත්වීම, පස් දමා පුරවා සකස් කිරිම, සංචාරක නිවාසයේ ඇති ආසන වල මෙට්ට සඳහා රෙදි ආවරණ යෙදීම, යාපහුව පැරණි ප්‍රාකාරයෙහි දකුණු දොරටුවේ සිට කෞතුකාගාරය දෙසට මාර්ගයන් ද දකුණු දොරටුව පසුකර විහාරස්ථානයේ දෙසට දිවෙන මාර්ගයෙහි උතුරේ සිට දකුණට ඇති ගමන් මාර්ගයේ ද පැවති අවිධිමත් ජලය ගලා බැස යාමට සුදුසු පරිදි විධිමත් පරිදි ජල පද්ධතිය සකස් කරන ලදී. ලෙන් විහාරයේ කටාරම් සම්බන්ධ වන වහල කොටසේ රීප්ප දිරා ගොස් වහළය පහත් වී රීප්ප දිරා ගොස් ඇති ස්ථාන සඳහා නැවත රීප්ප යොදා වහලය අලුත්වැඩියා කරන ලදී.

නෙල්ලිගහමළුව ගොඩනැගිල්ල ගඩොල් ගැලවී බදාම ඉවත් වීම නිසා බැමි විනාශ වෙමින් තිබූ ස්ථාන සඳහා නැවත ගඩොල් යොදා බැමි සංරක්ෂණය කර පොයින්ට් කිරීමද කරන ලදී. මේ අනුව මෙම ස්ථානය නඩත්තු කිරීමේ කටයුතු නිම කරන ලදී.

**පඬුවස්නුවර පුරාවිද්‍යා වැඩබිම පවත්වාගෙන යාම**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ස්ථානය පිහිටා ඇත.

අක්කර 62ක් පුරා මතුකර ගත් පුරාවිද්‍යා සාධක මෙම ස්ථානය පුරා විසිරී ඇත. මාලිගා සංකීර්ණය වටප්‍රාකාර බැම්ම දිය අගල හඳුනා නොගත් ගොඩනැගිලි, පංචායතන ගොඩනැගිලි, චක්‍රාවාලය, ටැම්පිට විහාරය, බෝධිසරය, දළදා මාළිගා ගොඩනැගිල්ල, නිශ්ශංකමල්ල සෙල්ලිපිය, දෙමළ සෙල් ලිපිය මෙම භූමියේ ප්‍රධාන ස්මාරක ලෙස හැඳින්වේ. මහාවංශයට අනුව ක්‍රි.පූ. 06 වන සියවසේ පඬුවස්දෙව් රජු මෙහි රජ කල බවත් පඬුවස්දෙව් රජුගේ ළමා කාලය මෙහි ගත කළ බවත් කියනු ලැබේ. එහෙත් මෙහි සත්‍යාසත්‍යභාවය පිළිබඳ විවාද සහිතය. ආචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතයට අනුව මෙම භූමියේ ඇති ගඩොල් 12 වන සියවසට අයත් බව ද පැවසේ.

මෙම භූමිය පුරා ඇති ස්මාරක වටා පිරිසිදු කිරීමත් බොරලු මාර්ග සඳහා බොරලු ඇතිරීම සිදු කරනු ලැබීය. අවම සම්පත් යටතේ මෙම ස්ථානයේ වාර්ෂික නඩත්තුව ඉටු කරන ලදී.

**විළඳගොඩ සංවර්ධන ව්‍යාපෘතිය**

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් වේ.

ප්‍රාග් ඓතිහාසික අවධියේ සිට මහනුවර යුගය දක්වා දිවයන මානව ක්‍රියාකාරකම් පිළිබඳ සාධක හෙළිකරගන්නා වූ භූමියක් ලෙස මෙය හඳුනාගෙන ඇත. ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් පරිහරණය කලාසේ සලකන ගල්ලෙන සහ ගල් මෙවලම් නිෂ්පාදන කාර්යය සිදු කිරීමට එළිමහන් ගල්තලාවක් භාවිතා කර ඇති බවට සාධක ද පුරාවිද්‍යා පර්යේෂණ මගින් හමුවී ඇත.

කටාරම් සහිත ලෙන් සහ ලෙන් ආශ්‍රිතව වූ පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් ලිපි සාධකද මෙහි දක්නට ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ පිවිසුම් මාර්ගය බොරළු යෙදීම සිදු කරන ලදී. මෙහිදී මීටර් 03ක් පළලට දෙපස කාණු සිටින පරිදි මාර්ගය සකස් කරන ලදී. මාර්ගය මත පස් පුරවා ඒ මත අඟල් 04ක් පමණ ඝනකමට බොරළු අතුරා තලා පිවිසුම් මාර්ගය සකස් කරන ලදී.

**අරංකැලේ පුරාවිද්‍යා ස්ථානය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම පුරාවිද්‍යා ස්ථානය අයත් වේ.

වනවාසි භික්ෂු ආරාමයක් මෙහි පැවතුන බවට හඳුනා ගෙන ඇති මෙම ස්ථානය පධානඝර, චංකමණඝර, පෙත් මං ජන්තාඝරයක් සහ පොකුණුවලින් ද සමන්විත වේ. මෙම ස්ථානය දෛනික පිරිසිදු කිරීම්, ස්මාරක සහ පෙත්මං පිරිසිදු කර ප්‍රදර්ශන මට්ටමින් පවත්වාගෙන යාම සිදු කරන ලදී.

කොරොස්ස, අලවල, අලවල අමුණ, කහටගස්වල යන ස්ථානවල පරිවර්තන නාම පුවරු සවිකරන ලදී. යෝජිත වැසිකිළි පද්ධතියේ වැඩ අවසන් කිරීම ද සිදු කරන ලදී.

## සබරගමුව

**ප්‍රාදේශීය කාර්යාලය උද්‍යාන අලංකරණය**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සබරගමුව ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය අවට පරිශ්‍රය පිරිසිදු කිරීමත් කාර්යාලීය පිවිසුම් මාර්ගය සකස් කිරීමත් ජල කරාම අලුත්වැඩියා කිරීමත්, නරඹන්නන්ගේ ප්‍රයෝජනය සඳහා ආසන සකස් කිරීමත් මිදුල අවට පරිශ්‍රය සඳහා චිප්ස් ගල් ඇතිරීමත් සිදු කරන ලදී.

ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ ගෘහ භාණ්ඩ අලුත්වැඩියා කළ අතර සෝදන බේසම් සවි කිරීම ආදිය ද ඉටු කර ප්‍රාදේශීය කාර්යාලයේ නඩත්තු කටයුතු නිම කරන ලදී.

**මූදු මහා විහාරය, ගිරාවත්ත සොහොන නඩත්තු**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ 5 කලාපයට අයත් පහත සඳහන් ස්ථාන නඩත්තු කර පවත්වාගෙන යන ලදී.

තිරිවාන කැටිය මූල විහාරයේ පැරණි දෙමහල් නඩත්තු වැඩ ඉටු කරන ලදී. ඒ අනුව ඉහල මාළයේ බිත්ති කඩතොළු අළුත් වැඩියා කිරීම, වහලයේ දිරාපත් දැව අඩුපාඩු යෙදීම කරන ලදී. බාල්කයට මුක්කුවක් යෙදීම, මූල් පරාල කොටසක් යෙදීම, දිරාපත්ව ඇති අඩුපාඩු රීප්ප යෙදීම, ආදිය මේ යටතේ ඉටු කරන ලදී. වහලයේ බිඳී ඇති රට උළු වෙනුවට අලුතින් උළුකැට යොදා අක්‍රමවත් උළු කැට නැවත සකසා කුමේර බඳින ලදී.

2. රත්නපුර කලාප කාර්යාලය ස්ථාපිත කිරීමට නියමිත අන්තඃපුර මාළිගයේ ගබඩා කාමර කොටසට අයත් පිවිසුම් මාර්ගය පිරිසිදු කිරීමත්, ඒ ආශ්‍රිත කොටසෙහි කැළය සුද්ධ කිරීමත් ඉටු කරන ලදී. එම යෝජිත කොටසෙහි තීන්ත ආලේප කිරීම, වැසිකිළි ආශ්‍රිත පදිකය නඩත්තු කිරීම ද මේ යටතේ ඉටු කරන ලදී.

3. පැල්මඩුල්ල ගිරාවත්ත සොහොන් ස්මාරකය වටා සහ බෝධිය වටා වූ කැළය සම්පූර්ණයෙන්ම ඉවත් කර යකඩ වැටෙහි තීන්ත ආලේපය ද කරවන ලදී. මේ අනුව සබරගමුව 5 කලාපය නඩත්තු වැඩ නිම කරන ලදී.

**ගල් ටැම්යාය නඩත්තු කිරීම සහ කුරගල පුරාවිද්‍යා ස්ථානය**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගල්ටැම්යාය පුරාවිද්‍යා ස්ථානයේ කලාප කාර්යාලයේ ජනෙල් සහ දොරවල් සවි කිරීම බිත්ති කපරාදුව කිරීම සහ රක්ෂිතය වටා ඉතිරිව කටු කම්බි වැට ඉදි කිරීම සිදුකරන ලදී.

මෙම කලාපයටම අයත් කුරගල මුරකුටියේ දොර ජනෙල් සවි කිරීම හා අනෙකුත් සුළු නඩත්තු කටයුතු ඉටු කරන ලදී.

**කලාප 06 කාර්යාලය පවත්වාගෙන යාම (මඩුවන්වෙල වලව්ව)**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වඩුවන්වෙල වලව්ව වසර පුරා නඩත්තු කර පවත්වාගෙන යාම සිදු කරන ලදී.

**මඩුවන්වෙල වලව්ව පිවිසුම් මාර්ගය සකස් කිරීම.**

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මඩුවන්වල වලව්වේ පිවිසුම් මාර්ගය බොරළු, සිමෙන්ති, හුණු මිශ්‍රණයෙන් සකස් කරන ලද බදාමය අතුරා තලා සකස් කරන ලදී.

**මීපිටිය ටැම්පිට විහාරය නඩත්තු කිරීම.**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි මී පිටිය ටැම්පිට විහාරය වහලයේ දිරාපත්ව තිබූ දැව ඉවත් කර අලුතින් දව යොදා අලුත්වැඩියා කරන ලදී.

**දැදිගම කොටවෙහෙර නඩත්තු කිරීම.**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි දැදිගම කොට වෙහෙර ආශ්‍රිතව පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

- කොටවෙහෙර මළුවේ මං මාවත් සිමෙන්ති සහ බොරළු මිශ්‍ර පස් දමා තලා සකස් කිරීම
- කොටවෙහෙර ඉදිරිපස පැරණි ගඩොල් පෝරණුව අසල පැති බැම්ම බැඳීමේ කටයුතු ඉටු කිරීම.
- දැදිගම නිල නිවසේ සිවිලිම ගැසීමේ කාර්යය ඉටු කළ අතර දොර ජනෙල් බිත්තිවල තීන්ත ගැල්වීම කරන ලදී. කොටවෙහෙර ඉදිරිපස මල් ආසනය නියමිත සැලැස්මට අනුව ඉදි කරන ලදී.

**බෙලිගල රක්ෂිතය නඩත්තුව**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බෙලිගල රක්ෂිතයේ පිවිසුම් මාර්ගයේ පිය ගැට පෙළ කැඩුණු ස්ථාන පිළිසකර කිරීම සිදු කරන ලදී. පැරණි ගල් පඩි එලෙසම පවත්වා ගනිමින් පිළිසකර කළ යුතු අවස්ථාවලදී පමණක් මෙම කාර්යය ඉටු කරන ලදී.

**සබරගමුව 01 කලාපය පවත්වාගෙන යාම.**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරනායක / මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සබරගමුව 01 කලාපය පහත සඳහන් පරිදි නඩත්තු කර පවත්වාගෙන යන ලදී.

- දෙවනගල ටැම්පිට විහාරය දැව තට්ටුව වේයන්ගෙන් වූ හානි නිසා දිරාපත්ව තිබූ හෙයින් එම කොටස් අලුත්වැඩියා කර හායනයට ලක් වූ කොටස් සකස් කරන ලදී.
- අංවාරම විහාරයේ වහල නඩත්තු කිරීම සහ දැව කණු දිරා ඇති තැන් සැකසීම සිදු කරන ලදී.
- වාකිරිගල රජමහා විහාරයේ ටැම්පිට විහාරයේ දැව කණු, දැව බාල්ක දිරා ඇති කොටස් නැවත පිරවීම කරන ලදී.

මාලියද්ද, දොඩංගලේ, මාවෙල මල්වතු විහාර, පොල් අඹේගොඩ විහාරය, කෙරමිණිය හා අම්බලුගල යන විහාරස්ථානයන්හි දැව ආරක්ෂක යෙදීම ඉටු කරන ලදී.

**දෙවනගල ධර්මශාලාව නඩත්තු කිරීම.**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි දෙවනගල රජමහා විහාරයේ පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී. වහලයේ දිරාපත්වූ පරාල යටලී හා මුදුන් යට ලී රීප්ප ආදිය ඉවත් කර ඒවා සඳහා අලුතින් දැව යොදා වහලය සකස් කරන ලදී. බිඳුණු උළු වෙනුවට අලුතින් උළු යොදන ලදී.

**සබරගමුව 03 කලාපය පවත්වාගෙන යාම.**

සබරගමුව පළාතේ ගලිගමුව හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම කලාපය වසර පුරා පවත්වා ගෙන යන ලදී. මේ යටතේ පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

- දැදිගම කොටවෙහෙර ගර්භය පේසාවළලු වල දෛනික සුද්ධ පවිත්‍ර කිරීම සිදු කරන ලදී. ගනේමුලහේන ලෙන් විහාරය සුද්ධ පවිත්‍ර කිරීම සිදු කරන ලදී.
- මංගෙදර ටැම්පිට විහාරයේ දිරාගිය කුහර සහිත බාල්ක කෙමිෆික්ස් හා ලී කුඩු යොදා පුරවා සකස් කළ අතර වේ නාශක යෙදවීම සිදු කරන ලදී.
- මැණික් කඩවර ටැම්පිට විහාරය සඳහා දැව ආරක්ෂක හා වේ නාශක යෙදීම සිදු කරන ලදී.
- ගනේමුල්ල ලෙන් විහාරය සුද්ධ කිරීම සිදු කරන ලදී.

**කුරගල සහ ගල්ටැම්යාය නඩත්තු කර පවත්වාගෙන යාම.**

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුරගල පුරාවිද්‍යා රක්ෂිතය සහ ගල්ටැම්යාය පුරාවිද්‍යා රක්ෂිතයන්හි නඩත්තු කටයුතු ඉටු කරන ලදී.

කුරගල පුරාවිද්‍යා ස්ථානයේ මුරකුටියේ පෙර වර්ෂයේ ඉටුකර ඉතිරි වූ වැඩ සඳහා ඇස්තමේන්තු ප්‍රකාරව නඩත්තු කටයුතු ඉටුකළ අතර ගල්ටැම්යාය පුරාවිද්‍යා ස්ථානයේ ගොඩනැගිල්ලෙහි බිත්ති කපරාරු කරන ලදී. ඉඩම වටා අඩි 6' - 0 ක් උසට කම්බි කණු 20ක් සිටුවා කටුකම්බි වැටක් සකස් කරන ලදී.

**සබරගමු 05 කලාපය පවත්වාගෙන යාම**

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර, පැල්මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම කලාපය නඩත්තු කර පවත්වාගෙන යන ලදී. මේ යටතේ පැල්මඩුල්ල ඉද්දමල්ගොඩ සොහොන් ස්මාරකය, තිරිවාන කැටිය මූලමහා විහාරයේ ධර්මශාලාව නඩත්තු, ඇහැලේපොල අන්තඃපුර මාලිගයේ යෝජිත ගොඩනැගිලි කොටස සහ භූමිය ආදි ස්ථානවල නඩත්තු කටයුතු සිදුකරන ලදී.

මෙම ස්ථාන අතුරින් ඉද්දමල්ගොඩ සොහොන ගිරාවත්ත ඉඩම තුළ පිහිටියකි. එම ඉඩම තුළ පෞරාණික බෝධි වෘක්ෂය ද පිහිටා ඇත. පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් ලෙස 2001.07.29 දින අංක 11995 යටතේ ගැසට් කර ඇත.

ඉද්දමල්ගොඩ අභයකෝන් අතපත්තු මුදියන්සේ නැමැති ප්‍රභුවරයාගේ සොහොන මෙම ස්ථානයේ ඇතැයි සැලකේ. උසින් අඩි 10ක් පමණ වූ ද 5 ' × 5' ප්‍රමාණයේ චතුරස්‍රාකාර පාදමකින් යුක්ත මෙම ස්මාරකය වටා 15 ' × 15' චතුරස්‍රාකාර සිමෙන්තිවලින් සකස් කරන ලද පාදමක් දක්නට ලැබෙන අතර සතර කොනෙහි සිටුවන ලද අඩි 04ක් පමණ උස ගල් කුළුණු 04කින් ද සමන්විත වේ

මෙම ස්ථානය දිගු කලකින් නඩත්තු නොවූ ස්ථානයකි. එබැවින් මෙම ස්ථානයට මුළුමනින්ම මැදිහත්වීමට සිදු විය. ස්මාරකය පිරිසිදු කිරීමත් වල් බිහි වී තිබූ ස්මාරක පරිශ්‍රය පිරිසිදු කිරීමත් අනෙකුත් ප්‍රධාන නඩත්තු කාර්යයන් ඉටු කිරීමත් මෙහි අරමුණ විය.

මේ අනුව ස්මාරක පරිශ්‍රය තුළ තිබූ සියළුම වල් පැළෑටි ඉවත් කරන ලදී. ස්ථානය වටා තිබූ යකඩ වලට තීන්ත ආලේප කරන ලදී. බෝධි වෘක්ෂය වටා වූ කැලය ඉවත් කර පිරිසිදු කරන ලදී. සොහොන මත ඇති දිය සෙවල ඉවත් කර පිරිසිදු කරන ලදී. මෙම කාර්යය ස්මාරකයේ පාදමේ සිට සිදු කරන ලදී. මේ අනුව ඉද්දමල්ගොඩ සොහොන් ස්මාරකය හා ඒ අවට පරිශ්‍රය නඩත්තු කිරීම සිදු කරන ලදී.

**තිරිවානකැටිය, මූලමහා විහාරයේ පැරණි ධර්මශාලාව නඩත්තුව**

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. 1870 වසරේදී ඉදිකල ස්ථානයක් ලෙස මෙය හඳුනා ගෙන ඇත. ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ රත්නපුර දිස්ත්‍රික්කයට අයත් මුල්ම කේන්ද්‍රීය විහාරස්ථානය ද මෙය වේ.

දෙමහල් ගොඩනැගිල්ලක් වන මෙහි කලාත්මකව නිමකරන ලද ගල්කුළුණු මත දැවමය සොල්දර තට්ටුවක් ලෙසට උඩුමහල නිර්මාණය කර ඇත. මැටි හා ගලින් බිත්ති සකස් කර ඇත. මේ වන විට මෙම ගොඩනැගිල්ල පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් ලෙස ගැසට් කර ඇති අතර පිරිවෙන් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස පරිහරණය වේ.

මෑත කාලීනව නඩත්තු කාර්යයන් කිසිවක් ස්මාරකය ආශ්‍රිතව සිදු කර නොමැති බැවින් මේ සඳහා උපරිම මැදිහත් වීමක් සිදු කිරීමට සිදු විය. උඩුමහලේ බිත්ති කොටස් පලුදුවීම සහ කඩතොළු සෑදීම, වහළයේ දිරාපත් දැව යෙදීම, කුමේර උළු ක්‍රමවත්ව ගොඩනැගීම යන තත්වයන් මෙහිදී දක්නට ලැබුණි. දිරාපත්ව තිබූ දැවමය බාල්කයේ දකුණු කෙලවර ඉවත් කර ඒ වෙනුවට කොටසක් බද්ධ කරන ලදී. තව ද පහත මාලයේ ගල්කුළුණු ආධාරකයට සම්බන්ධ වන ලෙසට උඩු මහලේ, කොස් දැවයෙන් නිර්මාණය කර ස්මාරකයට ගැලපෙන පරිදි යොදන ලදී. යොදන ලද සහ වහලයේ තිබූ සියළුම දැවමය කොටස් සඳහා ආවරණ දැව ආරක්ෂක දියර යොදන ලදී. කැඩී බිඳී ගිය රට උළු වෙනුවට අලුතින් රට උළු යොදා අවිධිමත්ව තිබූ කුමේර සියල්ල බැඳ වහලයේ නඩත්තු කාර්යයන් නිම කරන ලදී. උඩුමහලේ බිත්තිවල සහ බිත්ති මුදුන්

අතර තිබූ කඩතොලු ස්ථාන පිළිසකර කරන ලද අතර ගැලවී ගිය ජනේල පියන් ද සවිකරන ලදී.

**ඇහැලේපොල අන්තඃපුර මාළිගයේ ගබඩා කාමර කොටස් සකස් කිරීම**

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මෙම ස්ථානයට යාබදව ගබඩා කාමර පෙළ කලාප කාර්යාලයක් ලෙස ස්ථාපනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

ඒ සඳහා වූ වැසිකිළි අලුත්වැඩියා කිරීමත්, අඩුපාඩුව තිබූ විදුලි උපාංග සපයා ගැනීමත් සිදුකරන ලදී. මීට අමතරව අන්තඃපුර මාලිගා භූමිය පිරිසිදු කරන ලදී. ස්ථාපිත කරන ලද කලාප කාර්යාලය පින්තාරු කිරීමද ඉටු කරන ලදී.

**සීතාවක ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ උද්‍යානය අලංකරණය කිරීම.**

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ අවිස්සාවේල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි සීතාවක ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය පරිශ්‍රය උද්‍යාන අලංකරණය සිදු කරන ලදී.

කාර්යාල භූමියේ පිටුපසින් ඇති භූමියට වාහන මගින් පිවිසෙන මාර්ගයේ සෝදා පාළුව වළක්වා ලීමට මීටර් 200 ක පමණ දුර මාර්ගය ක්‍රමවත්ව සකසන ලදී.

කාණු පද්ධතිය පිරිසිදු කිරීමත් ජලකරාම අලුත්වැඩියා කිරීමත් සිදු කරන ලදී. උද්‍යාන ආසන සවි කිරීමත් කසල බඳුන් තබා කසල කලමණාකරණය සඳහා අවශ්‍ය කටයුතු කිරීමත් සිදුකරන ලදී. වර්ෂා කාලයට ජලය රැස්වෙන ස්ථාන සඳහා මිටිස් ගල් අතුරා මට්ටම් කරන ලදී. අනවශ්‍ය ගස් කපා කාර්යාල පරිශ්‍රය ක්‍රමවත්ව සකස් කිරීම ද සිදු කරන ලදී. මේ අනුව කාර්යාල භූමියේ උද්‍යාන අලංකරණ කටයුතු ඉටු කරන ලදී.

**මඩුවන්වෙල වලව්වේ පිවිසුම් මාර්ගය සකස් කිරීම**

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ පිවිසුම් මාර්ගය ක්‍රමවත්ව සැකසීම සිදු කරන ලදී. සිමෙන්ති :හුණු :බොරළු 1: 2 :20 අනුව මිශ්‍රකර අඟල් 6 ඝනකමට මාර්ගය මත යොදා තලන යන්ත්‍රයක් මගින් මට්ටම් කර මාර්ගය සකසන ලදී. මාර්ගය දෙපස කාණු යෙදූ අතර කාණු වැසීම සඳහා කොන්ක්‍රීට් ලැලි 33ක් යොදා ගන්නා ලදී. ප්‍රධාන පිවිසුම් මාර්ගයේ අමතරව ඇති මාර්ගය සඳහා ජලය බැස යාමට හියුම් පයිප්පයක් යොදන ලදී. 'වී අටුව' පිහිටි ස්ථානයට යන පෙත් මග අඩි 03 ක පළල අඟල් 03 ක ඝනකමට සිමෙන්ති, හුණු, බොරළු මිශ්‍රණය යොදා සකස් කිරීම කරන ලදී.

**බෙලිගල රක්ෂිතය නඩත්තු කිරීම**

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි බෙලිගල, දළඳ වහන්සේ සහ පාත්‍රා ධාතුව තැන්පත් කර තැබූ ස්ථානයක් ලෙස සඳහන්ය.

මෙහිදී බෙලිගල රක්ෂිතයේ මාර්ගය සකස් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. මාර්ගය ආරම්භයේ සිට අවශ්‍ය ස්ථානයන්හි ගල්පඩි සැකසීමත් මාර්ගය ක්‍රමවත් කිරීමත් මෙහිදී සිදුකරන

ලදී. පැරණි ගල්පඩි එම ස්වරූපයෙන් බඳින ලද අතර නඩත්තු කාර්යය නිම වන විට අඩි 246 ක ප්‍රමාණයක් පිළිසකර කිරීමට හැකි විය.

**බමුණුගම කතරගම දේවාලයේ අලුත්වැඩියා කටයුතු**

කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ස්ථානය පිහිටා ඇත. මෙය කතරගම දෙවියන් උදෙසා පෙර සිටම වෙන්කර ඇති දේවාල ගොඩනැගිල්ලකි.

මෙම ගොඩනැගිල්ලේ දික්ගෙය අඩි 13ක් වූ බටහිර දිසාවේ බැම්ම ද අඩි 06ක් වූ උතුරු දිසාවේ බැම්මේ මුල්ල කොටස් ද පුපුරා ගොස් තිබූ අතර ඒවා 6'' × 9'' සක්ක ගලින් බැඳ කපරාරු කර සුදු මැදීම කරන ලදී. මෙහි වයඹ දිශාවට වූ කොටසේ ද, මේ ආකාරයටම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදී.

දික්ගෙය 6'' ගැඹුරට පස් ඉවත්කර බොරළු දමා තලා ඒ මත ගොම මැටි මිශ්‍රණය ආලේප කර ඇත. කුළුණු 07 ක පලුදු වී ඇති ස්ථාන හුණු වැලි මිශ්‍රණයෙන් පිළිසකර කරන ලදී. වට කණු 08 වැලි කඩදාසියෙන් මැද වාර්නිෂ් ආලේප කිරීම කරන ලදී.

දේවාලය ඇතුළත කාමරයේ සිවිලිම පැරණි බාල්ක මත රැඳ වූ අතර ලෑලි 1 1/4 '' ඝනකම ලෑලි වැද්දීම කොට සීලර් ආලේප කර වාර්නිෂ් ආලේප කිරීම කරන ලදී. දේවාලයේ ඇතුළත බිත්ති කපරාදුව පුපුරා ගැල වී යමින් පැවතුණ අතර මෙම කොටස් නැවත ගලවා කපරාරු කර පිළිසකර කරන ලදී. දේවාලයේ ඉදිරිපස කොටස ආවරණය වන පරිදි බීරළු සකසන ලදී. දේවාලයේ ඉදිරි කොටස බිම්ගල් ඇල්ලීම සිදු කරන ලදී. විදුලි පද්ධතියේ තිබූ අඩුපාඩු පිළිසකර කර යථාවත් කරන ලදී. මේ අනුව මෙම ඓතිහාසික ස්ථානයේ නඩත්තු වැඩ නිම කරන ලදී.

## දකුණු පළාත

**ඉඳුරුගල්ලෙන ප්‍රවේශ මාර්ගය නඩත්තු කිරීම**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම ස්ථානයේ විහාරස්ථානයේ මෙම ගල්ලෙන පිහිටි ස්ථානයට යාමට ඇති පියගැට පෙළ මීට පෙර සංරක්ෂණය කර ඇත. එහෙත් මේ වන විට සිදුව තිබූ හානිය නිසා නැවත එය අලුත්වැඩියා කරන ලදී. මෙහිදී එක් පියගැටයක දිග 05 ' ක්ද උස 1' ක් ද පළල 1' ක්ද වේ. 1:5 මිශ්‍රණයට සිමෙන්ති, වැලි බදාම සහ 8'×9' සක්ක ගල් උපයෝගී කර ගෙන පඩි 50ක් සංරක්ෂණය කරන ලදී.

**දකුණු 01 කලාපය පවත්වාගෙන යාම**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ දකුණු 01 කලාපය බෙන්තර, බලපිටිය, අම්බලන්ගොඩ, හික්කඩුව, ඇල්පිටිය, වැලිපිය, දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට මෙම කලාපය අයත් වේ.

මෙම කලාපයේ ගැසට් කරන ලද ගොඩනැගිලි සහ ස්මාරක වන දේවපතිරාජ ඇමති වරයාගේ යැයි දැනට හඳුන්වනු ලබන සොහොන් බිම යටි කැළය කපා සොහොන සංරක්ෂණය කිරීම,

කලාප කාර්යාලය පිහිටි හික්කඩුව සුමංගල හිමි නිවසෙහි නඩත්තු කටයුතු ඉටු කිරීම මෙම වසරේ ඉටු කරන ලදී.

**බෙන්තර ගලපාත විහාරය**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම පුරාවිද්‍යා ස්ථානයේ පැරණි පිළිමගෙයි දිරාගිය ජනේලය නඩත්තු කිරීම කරන ලදී.

**ද/04 කලාපය පවත්වාගෙන යාම**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන වලස්මුල්ල, බෙලිඅත්ත, තංගල්ල, ඔකේවෙල, වීරකැටිය යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්ට මෙම කලාපය අයත් වේ. මෙම කලාපයේ පහත සඳහන් වැඩ කොටස් ඉටු කරන ලදී.

**කටුවන කොටුව**

දෛනිකව සුද්ධ පවිත්‍ර කර පවත්වාගෙන යාමත්, දිවා රාත්‍රි මුර සේවය පවත්වාගෙන යාමත් සිදු කරන ලදී.

**තංගල්ල රජමහා විහාරය**

2600 සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් හදිසි නඩත්තු කටයුතු සිදු කෙරුණි. දායක සභාවේ අනුග්‍රහයත්, නාවික හමුදාවේ සහයෝගයත්, විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ දායකත්වයත් මේ සඳහා ලැබුණි. ඒ යටතේ පෙත් මග සකස් කිරීම, වැලි ඇතිරීම, චෛත්‍යයේ හුණු ආලේප කිරීම, ප්‍රතිමා ගෘහයේ හුණු ආලේප කිරීම, ප්‍රාකාර බැම්මේ වැවී තිබූ විශාල කැලය කපා ඉවත් කිරීම ආදී කටයුතු ඉටු කරන ලදී.

**නයිගල පුරාවිද්‍යා ස්ථානය**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරු මහානාග යුව රජතුමා විසින් කරවන ලද්දක් බව ජනප්‍රවාදයේ කියවේ. එනම් ක්‍රි.පූ. 307-287 කාලවකවානුවලට අයත් පුරාවිද්‍යාත්මක ස්ථානයකි. මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහයෙන් ඉදිකරන ලද ප්‍රතිමා ගෘහයක් ද මෙහි ඇති බව සඳහන් වේ.

අක්කර 10 ක පමණ භූමියක පුරාවස්තු විසිරී ඇති අතර ඒවායින් ප්‍රතිමා ගෘහය, ටැම්පිට විහාරය, ස්මාරක ගොඩනැගිලි නටබුන්, ස්ථූප ගොඩැලි, පොකුණු, දෙතිස් එල බෝධිය, ප්‍රාකාර බැම්ම, නයි පෙනය, පිටගැට පෙළ, කොරවක් ගල්, මල් ආසන ආදිය පිහිටි ස්ථාන වැදගත් පුරාවස්තු ලෙස හැඳින්විය හැකි ය. මේ සඳහා නඩත්තු කටයුතු ඉටුකිරීම වෙනුවෙන් නාවික හමුදාව සහ දායක සභාව සහයෝගය දෙන ලදී. ස්මාරක ගොඩනැගිලි වටා එලි පෙහෙලි කිරීමත් අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මුල්ගලවා පෙත් මං සැකසීමත් ලඳු කැලය කපා ඉවත් කර ස්මාරක පරිශ්‍රය පිරිසිදු කිරීමත්, ස්ථූප මත තිබූ වල්පැළෑටි ඉවත් කිරීමත් සිදු කරන ලදී. මෙම නඩත්තු කටයුතු දෙපාර්තමේන්තු ශ්‍රමය යොදා ඉටුකරන ලදී.

**බතීගම ගුරුකන්ද විහාරයේ ආධාරක**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය පැරණි බිතු සිතුවම් සහිත විහාර ගෘහයක් සහිත ස්ථානයකි.

මෙහි පැරණි බිතු සිතුවම් සහිත විහාර ගෘහයේ බටහිර දිශාවේ පස සේදීයාම වැළැක්වීම සඳහා ආධාරක බැම්මක් ඉදිකරන ලදී. මෙහි අත්තිවාරමේ දිග අඩි 28 ක් සහ පළල අඩි 03 ක් ද ගැඹුර අඩි 4 ක් ද වන සකස් කළ අතර පතුල 6'' ක් ඝනකමට කොන්ක්‍රීට් යොදා 6'' × 9'' සහිත ගල් භාවිතා කරමින් මෙම ආධාරකය ඉදිකරන ලදී.

**ලේනබටුව අම්බලම නඩත්තු වැඩ**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය ක්‍රි.ව.1890 දී පමණ ඉදි කර ඇති බව සඳහන් වේ.

මෙම අම්බලමෙහි ගෙබිම යොදා තිබූ සිමෙන්ති බදාමය බෙහෙවින් දුර්වලව පැවතුනි. වහලය පැරණි දැව දිරාපත් වීම නිසා ගම්වාසීන් විසින් වහලය ප්‍රතිසංස්කරණය කර ඇත. එහි කුමේර බැඳීම සිදු කරන ලදී. දිරාපත් වූ ජනේලය අලුතින් දැව යොදා නැවත සකස් කිරීම (දි.අ 2 1/2 උස අඩි 03) සිදු කරන ලදී.

උස අඩි 2' - 7'' සහ පළල 3'-0 ක් වූ පලු දෙකකින් යුත් ඉදිරිපස ගේට්ටුව යොදන ලදී. හුණු කපරාරු ගැලවී තිබූ බිත්ති හුණු කපරාරු කර නැවත යොදා ව.අ. 820 හුණු පිරියම් කරන ලදී.

**ද/04 කලාපය පවත්වාගෙන යාම**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන, වලස්මුල්ල, බෙලිඅත්ත, තංගල්ල, ඕකේවෙල, වීරකැටිය, අඟුණකොළපැලැස්ස යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට මෙම කලාපය අයත් වේ.

මේ යටතේ කටුවන කොටුව, කසාගල රජමහා විහාරය නඩත්තු කිරීමට යෝජනා විය. මෙම බලකොටුව ප්‍රාකාර බැම්මකින් සමන්විත වන අතර පියගැට පෙලක් ද බොරදම සහිත තනි ගලින් නිර්මිත කුඩුම්බි ගල් 02 ක්ද, මැද මළුව ලිඳක් ද සහිත ස්ථානයකි. දිවා රාත්‍රි මුර සේවා පවත්වාගෙන යාම ද දෛනිකව පවත්වාගෙන යාම ද සිදුකරනු ලැබීය.

**කසාගල රජමහා විහාරය**

මෙම ස්ථානයේ 2600 සම්බුද්ධත්ව ජයන්ති උත්සවය වෙනුවෙන් හදිසි නඩත්තු කටයුතු ඉටු කරන ලදී. පෙත් මං උදළු ගෑම ඒ මත වැලි ඇතිරීම, තණ වවා ඇති ප්‍රදේශයන්හි තණ කැපීම, සිදුකර අපද්‍රව්‍ය ඉවත් කරන ලදී. චෛත්‍යවල හුණු ගෑම, ප්‍රතිමා ගෘහයේ හුණු ගෑම, ප්‍රාකාර බැම්මේ වල් බිහි වී ඇති කොටස් පිරිසිදු කිරීම, දෙතිස් එල බෝධිය වටා වූ පරිශ්‍රය පිරිසිදු කිරිම සිදු කරන ලදී. මේ සඳහා නාවික හමුදාවේ සහයෝගය, දායක සභාවේ සහයෝගය විශාල වශයෙන් ලැබුණි.

**මාතර ඕලන්ද කොටුව නඩත්තු වැඩ**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් වේ. මෙහි අනුමත ඇස්තමේන්තුවට අනුව පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

1. දෛනිකව සුද්ධ පවිත්‍ර කිරීම යටතේ කොටු බැම්මේ වල් පැලෑටි ඉවත් කිරීම ,කොටු බැම්මේ සිට අඩි 02 ක් පළල බිම් තීරුවක් සුද්ධ කිරීම සහ වසර පුරා පවත්වාගෙන යාම.
2. තණබිම් පවත්වා ගෙන කොටස් කප්පාදු කර පවත්වාගෙන යාම.
3. කොටු දොරටුව තුලින් උස වාහන ගමන් කිරීම වැළැක්වීමට බාධකයන් යෙදීම.

**දකුණ 06 කලාපය පවත්වාගෙන යාම.**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම, ලුණුගම් වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට මෙම කලාපය අයත් වේ.

## උතුරු මැද පළාත

**මාර්ග සංඥා පුවරු යෙදීම.**

උතුරු මැද පළාතේ අනුරාධපුර / පොලොන්නරුව දිස්ත්‍රික්කවලට අයත් ස්ථානවල මාර්ග සංඥා පුවරු යොදන ලදී.

| | ස්ථානය | නාම පුවරු ගණන |
|---|---|---|
| 1. | නාවෙහෙර | - 02 |
| 2. | දිවුල් වැව | - 03 |
| 3. | හල්ලේ පුරාවිද්‍යා ස්ථානය | - 01 |
| 4. | ගලිගමුව පුරාවිද්‍යා ස්ථානය | - 03 |
| 5. | ආඬිගල පුරාවිද්‍යා ස්ථානය | - 02 |
| 6. | කොස්ගග උල්පත | - 01 |
| 7. | හඳපානගල පුරාවිද්‍යා ස්ථානය | - 01 |
| 8. | ශ්‍රී නාග විහාරය | - 01 |
| 9. | ගුම්ය රජමහා විහාරය | - 01 |
| 10. | නලගුරු විහාරය | - 01 |
| 11. | කඳුපාගම පුරාවිද්‍යා ස්ථානය | - 01 |
| 12. | විජයාරාම පුරාවිද්‍යා ස්ථානය | - 01 |
| 13. | පිඩැල් නැම්ය | - 01 |
| 14. | ගල්විල්ල භූමිය | - 03 |

**අභිලේඛන පරිවර්තන පුවරු යෙදීම ඃ-**

උතුරු මැද පළාතේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් පොලොන්නරුවෙහි අභිලේඛන පරිවර්තන ඵලක යොදන ලදී. පොලොන්නරුව පුරාවිද්‍යා රක්ෂිතයේ පහත සඳහන් ස්ථාන සඳහා ගල් විහාර කණිකාවත ගල්පොත ලිපිය, වේලක්කාර

ලිපිය, හැටදාගෙය පුවරු ලිපි ආදිය සඳහා 4' × 3' ප්‍රමාණය ද නිශ්ශංක ප්‍රතිදාන මණ්ඩපය ගිරි ලිපිය, අංක 01 ශිව දේවාල ලිපිය, රංකොත් දාගැබ ටැම් ලිපිය, නිශ්ශංක රාජ සභා මණ්ඩල ගිරි ලිපිය, ලංකා තිලක පිළිමගේ මුරහලේ ලිපිය, කිරිවෙහෙර ලිපිය, උතුරු දොරටුව අසල ලිපිය යන ලිපි සඳහා 14'' × 16'' ප්‍රමාණයේ පුවරු යොදන ලදී.

**පොලොන්නරුව සංචාරක බංගලාව**

උතුරු මැද පළාතේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පොලොන්නරුව සංචාරක බංගලාව අලුත්වැඩියා කරන ලදී. අංක 2, 3, 4 කාමරවල නාන කාමර පිඟන් ගඩොල් අල්ලා වැසිකිළි කට්ටල සවි කරන ලදී. වටපිළ සැකසීමත්, වහලය සහ වැහිපිහිලි පද්ධතිය අලුත්වැඩියා කිරීමත්, තීන්ත ආලේප කිරීමත් සිදු කර පොලොන්නරුව සංචාරක බංගලාව නඩත්තු වැඩ නිම කරන ලදී.

**මානාකන්ද පුරාවිද්‍යා ස්ථානය පවත්වාගෙන යාම**

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් වේ. මේ යටතේ ස්ථානයේ ඇති පැරණි නටබුන් සහිත පොකුණ වටා වූ භූමි පරිශ්‍රය පිරිසිදු කිරීම, දෛනික මුර සේවාවන් පවත්වා ගෙන යාම, රක්ෂිතය දෛනික පිරිසිදු කිරීමේ කටයුතු ඉටුකිරීම කලාප කාර්යාලය සහ ඒ යටතේ වූ යටිතල පහසුකම් පවත්වා ගෙන යාම කාර්යාලය වටා කම්බි වැට ඉදිකිරීම ආදි නඩත්තු කටයුතු මේ යටතේ සිදුකරන ලදී. මීට අමතරව මෙම ස්ථානයේ විශේෂ ව්‍යාපෘතියක් වූ වටදා පොකුණෙහි නැගෙනහිර සිට දකුණට ඇති කොටස සංරක්ෂණය කිරීමත් බොරළු යොදා ඉවුර ශක්තිමත් කිරීමත්, ගල්වරි සකස් කිරීමත් සිදුකරන ලදී.

**03 කලාපය පවත්වාගෙන යාම**

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තන්තිරිමලේ සහ අනුරාධපුර යන ස්ථාන කේන්ද්‍ර කොටගෙන මෙම නඩත්තු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ දක්ඛිණ ථූපයේ පේසා වල ඉතා ඝන තෘණ ශාක ඉවත් කිරීමත් වර්ග අඩි 1200 ක පමණ ක්ෂය වී තිබූ ගඩොල් වෙනුවට අලුතින් ගඩොල් යොදා වැට බැඳ තහවුරු කිරීමත් සිදුකරන ලදී. මීට අමතරව කුජ්ජතිස්ස පුරාවිද්‍යා රක්ෂිතය, විජයබාහු මාළිගය, ගෙඩිගේ දාන ශාලාව, අශෝකාරාමය, බටහිරාරාමය, මාපා මාළිගය, මිරිසවැටිය, වෙස්සගිරිය, රන්මසු උයන යන ස්ථාන පොසොන් උත්සවය වෙනුවෙන් පිරිසිදු කිරීම ද සිදු කරන ලදී. රන්මසු උයනේ තිසා වැව සොරොව්ව ආසන්නයේ සිට දි.අ. 800 ක ප්‍රමාණයේ කම්බි ගසා අනාරක්ෂිතව තිබූ රන්මසු උයනේ සීමාවන් තහවුරු කරන ලදී.

**මානාකන්ද පුරාවිද්‍යා ස්ථානය**

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත්ය. මෙම ස්ථානයේ දෛනික සුද්ධ පවිත්‍ර කිරීම සිදුකල අතර උද්‍යාන මට්ටමින් පවත්වා ගෙන යාම සිදුකරන ලදී. යටිකැලය කැපීමට නියමිත කොටස යටිකැලය කපා පිරිසිදු කිරීමත්, දෛනික මුර සේවය සහ දෛනික නඩත්තු කිරීම් ඉටුකිරීමත් සිදුකරන ලදී.

**උපුල්වෙහෙර පුරාවිද්‍යා ස්ථානය**

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ස්ථානය පිහිටා ඇත. දෛනික සුද්ධ පවිත්‍ර කිරීමත්, ස්මාරක අවට යටිකැලය කැපීමත්, දෛනික මුර සේවය පවත්වා ගෙන යාමත් සිදු කරන ලදී.

## උතුරු පළාත

**උතුර 01 යාපනය කලාපය පවත්වාගෙන යාම**

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ යාපනය නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් වේ. යාපනය කලාපය පවත්වාගෙන යාමත් යාපනය කලාපයේ පිරිසිදු කටයුතු කිරීමත් සිදු කරන ලදී.

**මායිම් කණු සහ පුවරු යෙදීම**

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පහත ස්ථාන සඳහා මායිම් කණු යෙදවීම සහ පුවරු සවි කිරීම සිදු කරන ලදී.

- සිලාවතුර මංසන්ධියෙහි ඩොරික් බංගලාව හා අරිප්පු කොටුව සඳහා දුර දක්වන මාර්ග සංඥා පුවරු යෙදීම.
- ඩොරික් බංගලාව ඉදිරිපිට මාර්ගයේත් අරිප්පු කොටුවට හැරෙන මං සංන්ධියේත් මාර්ග සංඥා පුවරු යෙදීම.
- ඩොරික් බංගලාව සඳහා මායිම් යෙදීමේදී උතුරු දෙසින් මීටර් සියයක් දුරකින් හා දකුණු දෙසින් ඇති සමරු ස්මාරකයේ දකුණු දෙසට වන්නටත් සිලාවතුර-මන්නාරම මාර්ගය දෙසිනුත් මායිම් කණු යොදන ලදී.
- ප්‍රධාන මාර්ගයේ සිට අඩි 30ක් ඇතුල් දෙසට වන්නට මාර්ගය දෙසින් ද මායිම් කණු යොදන ලදී.

## බස්නාහිර පළාත

**කොස්කඳවිල ශ්‍රී සුනන්දාරාම පුරාණ විහාරය**

ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් මෙම විහාරස්ථානයේ කටාරම් කොටන ලද ලෙන් විහාරයකි. මෙහි වහලෙහි වල් ගලවා කුණු ඉවත් කිරීමත් වහලයේ කොන්ක්‍රීට් කොටසත් ගලත් අතර කොටස ඇක්වාගාඩ් ආලේපනය යොදා වැසි වතුර කාන්දු විම වැලැක්වීමත් සිදු කරන ලදී.

**හෙයියන්තුඩුව පුරාණ විහාරය**

ගම්පහ දිස්ත්‍රික්කයට අයත් බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම පුරාවිද්‍යා ස්ථානය මහනුවර යුගයට අයත් දැව පාලමක් සහිත ස්ථානයකි. මෙම විහාරගෙයි ගැලවී තිබූ සිතුවම් සහිත සිවිලිම් ලෑලි සම්පූර්ණයෙන්ම සවි කිරිම. දැව ආරක්ෂක ආලේප කර පලුදු වී තිබූ ලෑලි නැවත යොදා නඩත්තු වැඩ නිම කිරීම සිදුකරන ලදී.

**ඇවරියපල අම්බලම**

මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඇවරියපල අම්බලම නුවර යුගයට අයත් ස්ථානයකි. මෙහි ඉදිරිපස පහළ හරස් අතට යොදා තිබූ දැව කණු බෙහෙවින් දිරා තිබූ බැවින් දිරාපත් වූ කොටස් ඉවත් කර පිළිසකර කරන ලදී. දැව ආරක්ෂක ආලේප කර පෙර තිබූ පරිදිම සකස් කරන ලදී.

**පිළිකුත්තුව රජමහා විහාරයේ පෙත් මං ඉදි කිරීම.**

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පිළිකුත්තුව රජමහා විහාරයේ පුරාවිද්‍යා සංවර්ධන සැලසුමට අනුව පෙත්මං ඉදි කර පඩි බැඳ ආධාරක බැම් තහවුරු කිරීමත් සිදු කරන ලදී.

අක්කර 200ක් පුරා විහිදී ඇති පිළිකුත්තුව රජමහා විහාරය ක්‍රිස්තු පූර්ව යුගයට අයත් සෙල්ලිපි සහිත පුරාවිද්‍යාත්මක ස්ථානයකි. පුරාවිද්‍යාත්මක කැණීම්වලින් මූල ඓතිහාසික යුගයට අයත් පබළු හා කාලරක්ත වර්ණ මැටි භාජන කොටස් හමුවී ඇත. මනොරම් ලෙන, තොප්පිගල, දක්ඛිණ ලෙන, ලෙන් ආවාසය, ගල් පාලම මෙහි ප්‍රධාන ස්මාරකයන්ය.

භූමි පරිශ්‍රයේ ලෙන් 99 ක් දැනට හඳුනා ගෙන ඇති අතර මෙහි ඇති ලෙන් විහාරයත් කුඩා ස්තූපයත් 1747 දී පමණ ඉදිකළ බව ද සඳහන්ය. මෙහි වූ ලෙන් ආවාස වල වහලයන්හි අඩුපාඩු උළු යොදා නැවත සකස් කිරීම හා මැටි යෙදීම බිත්තිවල හුණු ආලේප කිරීම, පොකුණ ශුද්ධ කිරීම ලෙන් වලට යන මාර්ග සුද්ධ කිරීම සිදු කරන ලදී.

**1 වන පෙත්මග සකස් කිරීම**

මහෝරම්‍ය ලෙනේ සිට සෙල්ලිපි ලෙන හරහා දේවාල භූමියට පිවිසෙන මීටර් 600ක් පමණ දුර 3’ -0 පළල පෙත් මග සකස් කර බොරළු දමා නිමවන ලදී. පෙත්මගට අදාලව ඇති පැති බැම්ම තහවුරු කිරීම ද සිදු කරන ලදී. මේ සඳහා මාර්ග සංඥා නාම පුවරු 07 ක් යොදන ලදී.

**2 වන පෙත්මග**

ලෙන් විහාරය අසල සිට තොප්පිගල දැව පාලම, ධර්ම ශාලාව, බෝධිය හා විහාර මළුවට පිවිසීම සඳහා වූ දුර මීටර් 390 ක් විය. පෙත් මගෙහි අවශ්‍ය ස්ථාන සඳහා පියගැට පෙළ සකස් කිරීම, පුවරු සවිකිරීම, අත්වැට සකස් කිරීම, බොරළු ඇතිරීම සිදු කරන ලදී.

**3 වන පෙත්මග**

බෝධිය අසල සිට චීන ළිඳ ලෙන, ගල් ඒ දණ්ඩ හරහා සැකසීමට ඇති මීටර් 80 ක පමණ පෙත්මග සකස් කළ අතර නාම පුවරු 02 ක් යෙදීම ද, බොරළු ඇතිරීම ද සිදු කරන ලදී. පුරාවිද්‍යා ස්මාරක වෙන් කර ගැනීම ආරක්ෂා කර ගැනීම සඳහා පුරාවිද්‍යා මායිම් කණු 110 සිටුවීම කරන ලදී. විහාරයේ ඇති ඉපැරණි දෝලාව සංරක්ෂණය කර ප්‍රදර්ශණ මට්ටමට ගෙන ඒම සිදු කරන ලදී.

සංවර්ධන ව්‍යාපෘති සැලැස්ම යටතේ සකස් කරන ලද පෙත් මං තුන සඳහා අදාළ නාම පුවරු සවිකිරීමත් ගඩොල් කණු 27ක් සකස් කර 9×4 ස්ටේන්ලස් ස්ටීල් නාම පුවරු 27 ක් සවි කිරීමත්

කරන ලදී. 4' × 3' ප්‍රමාණයේ ස්ථානීය හැඳින්වීමේ පුවරුව සහ 16' × 14' ප්‍රධාන ස්මාරක විස්තර පුවරු 6ක් ද සකස් කරන ලදී.

**අඹගස්පිටිය අම්බලම**

ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ස්මාරකය පිහිටා ඇත.

අඩි 10ක් උස අඩි 2×1 ප්‍රමාණයේ ගල්කණු 12ක් මත කැටයම් කරන ලද පේකඩ යොදා ඇත. බාග බිත්ති බැඳ ඇති අතර කැටයම් රහිත විශ්කම්භය අඩි 3' × 6'' ක් වූ අර්ධ කවාකාර සඳකඩ පහණකි. මෙම අම්බලම වසර 300 කට වඩා පැරණි බව කියවෙන අතර නුවර යුගයට අයත් ලක්ෂණ විදහා දක්වයි.

මෙම අම්බලමේ උළු සකස් කිරීම, සිමෙන්ති වැටි දැමීම, නිධන් හොරු විසින් කඩා දමන ලද ගල් කණුවේ චෛත්‍ය හැඩය සහිත ගල් කොටස කෙමිෆික්ස් ගම් යොදා සවිකිරීම සිදු කර නඩත්තු කාර්යයන් නිම කරන ලදී.

**දීපදුත්තාරාමය**

කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ පිහිටි විහාර ගෘහය වසර 100කට වඩා පැරණි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ වලින් සමන්විත වේ. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසින් ආරම්භ කරන ලද ප්‍රථම පන්සල මෙය බව සැලකෙන අතර පෘතුගීසි යුගයෙහි නිර්මාණය වී ඇත.

විහාරගෘහයට ඇතුළු වීමට විශාල දොරටු 03ක් ඇත. විහාරගෙය කොටස් දෙකකට බෙදා එහි වට ආලින්දයක් තනා ඇත. විහාරගෙය මුල් කොටසේ දකුණු පසින් ඇතුළුවීමේ දොරටුවට ඉදිරිපස තබා ඇති මල් ආසනයට මඳක් පිටුපසින් බුද්ධ ප්‍රතිමාවක් තබා ඇත. දෙවන කොටසේ සැතපෙන බුදු පිළිමයක් සහ දේවරූප අඹා ඇත. මෙම සිවිලිම සඳහා නෙළුම් මල් හා ලියවැල් මෝස්තර සිතුවම් කර ඇත. මෙහි සෑම බිත්තියකම සිතුවම් හා මූර්ති දැකගත හැකි ය. මෙම විහාරගෘහයෙහි බිත්ති, වහල සහ සිවිලිම අලුත්වැඩියා කටයුතු සිදුකළ යුතුව තිබුණි.

පුරගෙය ඉදිකිරීමෙන් අනතුරුව වහලෙහි සෙවිලි කර තිබූ පරාල දැව බිමට ගන්නා ලදී. බිත්තිවල වේ හුඹස් ඉවත් කර සිවිලිමෙහි එලා තිබූ ඉටි රෙදි ඉවත් කර පිරිසිදු කරන ලදී. වහලෙහි තිබූ පරාලවලට දැව ආරක්ෂක යෙදූ අතර දිරාපත් වූ පරාල කොටස් සඳහා අලුතින් කොටස් බද්ධ කළ අතර බිත්ති යටලීයේ දිරාපත් වූ 3' - 0 ක කොටසක් සඳහා කයිනොක්කු මූට්ටුව මගින් අලුතින් කොටසක් බද්ධ කරන ලදී. මීට අමතරව දිරාපත් වූ පරාල යෙදිය යුතු තැන් අලුත්වැඩියා කළ අතර අලුතින් පරාල යොදන ලද වහලයේ පැවති අගුව දිගින් අඩු වීම දැව රාමුව හායනයට හේතු වී ඇති බැවින් අගුව දිගු කරන ලදී.

විහාරස්ථානයේ සහයෝගය ද ඇතිව උළු සෙවිලි කළ අතර කුමේර බැඳ වැඩ අවසන් කරන ලදී. වඩිම්බු ලෑලි නැවත යෙදීම ද වැහි පිහිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම ද සිදු කරන ලදී. සියළුම නඩත්තු කටයුතු නිමවීමෙන් පසුව පුරගෙය ඉවත් කර මෙම විහාර ගෘහයෙහි වැඩ අවසන් කරන ලදී.

**කලාප අංක 03 පවත්වාගෙන යාම**

කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම කලාපය අලකේෂ්වර, කොටුබැම්ම යන ඓතිහාසික ස්ථාන නඩත්තු කර පවත්වා ගෙන යන ලදී.

ගම්පොල සිහසුන හෙබවූ තුන්වන වික්‍රමබාහු රජු වෙනුවෙන් කෝට්ටේ පාලන තන්ත්‍රය මෙහෙය වූයේ නිශ්ශංක අලකේෂ්වර අමාත්‍යවරයාය. මොහු විසින් කෝට්ටේ බලකොටුව නිමවා ඒ තුළ ප්‍රාදේශීය රාජ්‍ය පිහිටුවා ගන්නා ලදී. එම රජවාසලේ නටබුන් අතුරින් වර්තමානයේ දැකිය හැකි එක් ඓතිහාසික ස්ථානයක් ලෙස අලකේෂ්වර සොහොන හැඳින්විය හැක. චතුරස්‍රාකාර වේදිකා දෙකක් ලෙස දැකිය හැකි මෙම නටබුන් ස්මාරක අලකේෂ්වර මාළිගය ලෙස ද හඳුන්වයි. 1937- 1938 වර්ෂවලදී රජයට පවරා ගත් මෙම ස්ථානය වාර්ෂිකව නඩත්තු කර පවත්වාගෙන යන ස්ථානයකි.

මෙහි බැමි මත වූ වල් පැළ ගලවා ස්මාරක පරිශ්‍රය පිරිසිදු කිරීමත් අපද්‍රව්‍ය ඉවත් කිරීමත් සිදු කරන ලදී. ඊට අමතරව අවශ්‍ය සියලු යටිතල පහසුකම් සැපයීම ඉටුකර ඇත. ඒ යටතේ ජල පහසුකම් ලබා ගැනීම සහ වැසිකිළියක් ඉදිකිරීම යන කාර්යයන් ඉටුකරන ලදී. පුරාණ කොටුබැම්මෙහි අඩි 100ක් පොයින්ට් කිරීමත් පිරිසිදු කිරීමත් සිදුකරන ලදී.

**කෝට්ටේ කෞතුකාගාරය අලුත්වැඩියාව**

කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත්ය. ක්‍රි.ව. 1412 සිට අඩසියවසක් පුරාවට ක්‍රියාත්මක වූ මෙම රාජධානියේ නටබුන් ස්තූපයක් කෝට්ටේ ප්‍රදේශය පුරා විසිරී පවතී. මේ අතුරින් දැනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම යටතේ ප්‍රාකාර බැම්ම, අලකේෂ්වර නටබුන්, බැද්දගාන නටබුන් සහ ඇතුල් දිය අගල් සහ පිටදිය අගල් යන ප්‍රධාන ස්මාරක හඳුනා ගෙන ඇත.

**පතහවත්ත කලාප අංක 04 පවත්වාගෙන යාම.**

කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය පුරාවිද්‍යා ස්මාරක සහිත ඓතිහාසික ස්ථානයකි. වීදිය බණ්ඩාර නම් ප්‍රාදේශීය පාලකයාගේ මාළිගය පිහිටා තිබූ ස්ථානය ලෙස හඳුනා ගෙන ඇති අතර පසුකාලීනව සංඝාවාසයක් සඳහා භාවිතා කළ බවට වූ නටබුන් ද තවත් පුරාවස්තු කිහිපයක් මෙම ස්ථානයේ වර්තමානයේ දක්නට ඇත.

මෙහි ඇති පුරාවස්තු ලෙස හඳුනා ගෙන ඇති නටබුන් කොටස් එක් තැන්කොට ප්‍රදර්ශන මට්ටමකට ගැනීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ විය. මෙහිදී 18' - 0 × 12' - 0 ප්‍රමාණයේ විවෘත ගොඩනැගිල්ලක් ඇතුළත තනන ලද වේදිකාවක් මත මෙම පුරාවස්තු තැන්පත් කරන ලදී.

**පොකුණුවිට සීමා මාලකය නඩත්තු කිරීම.**

කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානයේ සීමා මාලකයේ නඩත්තු කටයුතු ඉටු කරන ලදී. මෙහි ඉදිරි දොර පියන් හතර කැටයම් යොදා නැවත

යොදන ලදී. බොල් වූ බිත්ති කපරාරු කිරීමට හා පුපුරා ගිය ගෙබිම කඩා ඉවත් කර නැවත ගෙබිම සිමෙන්ති යොදා සකස් කරන ලදී.

සීමා මාලකයේ පහල දකුණු පස වූ පැරණි ජනේල පියන් දෙක අලුතින් සකස් කිරීම හා ඉහල මාලයේ වම් පස වූ ජනේල පියන් දෙක නැවත සකස් කිරීම සිදුකරන ලදී. ජනෙල් සහ දොරවල් සඳහා උපාංග සවිකළ අතර පින්තාරු කිරීම ද කරන ලදී. දොර ජනෙල් සහ උළුවහුවල ආලේප කර ඇති කොළපාට තීන්ත ඉවත් කර වාර්නිෂ් ආලේප කරන ලදී.

වහලයේ කුමේර සකස් කිරිම ද උළුකැට නැවත සකස් කිරිම ද බිත්ති වල හුණු ආලේප කිරීම ද සිදු කළ අතර අත්වැල සඳහා පින්තාරු කිරීම සිදු කර මෙහි නඩත්තු වැඩ නිම කරන ලදී.

## ඌව පළාත

**දඹාන අදිවාසී ජීවමාන වාර්තා මණ්ඩපය ඉදිකිරීම.**

බදුල්ල රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම ස්ථානය 2011 වසරේ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය මගින් ආදිවාසි දඹාන ගම්මානයේ ආදීවාසීන් වෙනුවෙන් ජීවමාන ගම්මානයක් සකස් කිරීම වෙනුවෙන් වූ වැඩසටහනට අනුව මෙය ඉදිකරන ලදී.

වැදි ජනතාව ලංකාවේ ආදිවාසි මානව කොට්ඨාසයකි. ඔවුන් සඳහා යම් මෙහෙයක් ඉටු කිරීම මෙහි අරමුණ වේ. ස්වභාවික අමුද්‍රව්‍ය උපයෝගි කරගෙන මෙම මණ්ඩපය සකස් කර ඇත. මෙම ස්ථානය ආදිවාසීන්ගේ නායකයින් රැස්වන සහ නැටුම් ගැයුම් චාරිත්‍ර පැවැත්වෙන ස්ථානයක් සේ ඉදිරියේ දී භාවිතා කළ හැක.

**ඌව 06 කලාපය පවත්වාගෙන යාම**

බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව මෙම පුරාවිද්‍යා කලාපය පිහිටා ඇත. මෙම කලාපය සඳහා ගලබැද්ද පොකුණ, මයුරගිරිය පුරාවිද්‍යා ස්ථානය, රිටිගහවත්ත පුරාවිද්‍යා ස්ථානය යන වැඩබිම් අයත් වේ. මෙම කලාපයේ කලාප කාර්යාලය සඳහා කොස් දැව භාවිතා කර ජනේල 3ක් සකස් කර අගුල් යොදා සවිකරන ලදී.

**ඌව 03 කලාපය පවත්වාගෙන යාම**

බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මෙම කලාපයට අයත් වේ.

මෙම කලාපයේ පිහිටි අරියවංශාරාමයේ පොහොය ගෙයි වහල අබලන්ව තිබුණි. එබැවින් වහල අලුත්වැඩියා කර නැවත උළු 400 ක් සෙවිල කළ අතර කුමේර බැඳ නඩත්තු කරන ලදී. තවද දෝව රජමහා විහාරයේ අනවසර කැණීම් කරන ලද දාගැබ සංරක්ෂණය කිරීම සහ වැලිමඩ උළුගල රජමහා විහාරයේ වහල නඩත්තු සිදු කිරීම.

**දඹාන ආදිවාසි ජීවමාන සංනිවේදන පියස ප්‍රතිසංස්කරණය කිරීම.**

බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙය අයත් වේ. ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය මෙහෙයවීමෙන් ආදිවාසීන් වෙනුවෙන් ජීවමාන ගම්මානයක් ඉදි කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියකි.

මේ යටතේ සන්නිවේදන පියස සෙවිලි කර තිබූ ඉලුක් දිරායාම නිසා අලුතින් ලිහිනියා කෝටු බැඳ වහල සකසා නැවත ඉලුක් සෙවිලි කරන ලදී. ඉන් අනතුරුව මැටි බිත්ති සහිත ගෙබිම ගොම මිශ්‍රිත මැටි ගා පිළිසකර කරන ලදී. මේ අනුව ආදීවාසි සන්නිවේදන පියස පිළිසකර කර නඩත්තු වැඩ නිමා කරන ලදී.

**මාර්ග සංඥා පුවරු සැකසීම.**

මොණරාගල දිස්ත්‍රික්කයේ මාර්ග සංඥා පුවරු යොදන ලදී. මේ සඳහා භාවිතයට ගන්නා ලද්දේ ගබඩාවේ රක්ෂිතව තිබූ මාර්ග සංඥා පුවරු වන අතර ඒවා අලුත්වැඩියා කර යොදා ගන්නා ලදී.

**මාළිගාවිල පුරා ස්ථානය පවත්වා ගෙන යාම.**

මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාළිගාවිල පුරාවිද්‍යා ස්ථානය යටිතල පහසුකම් වැඩි දියුණු කර පවත්වා ගෙන යාම සිදු කරන ලදී. මේ යටතේ වැසිකිළි කැසිකිළි පහසුකම් සංවර්ධනය කිරීම, පුවරු සැකසීම මාර්ග බාධකවල තීන්ත ආලේප කිරීම, තොරතුරු මධ්‍යස්ථාන ඉදිරිපිට දැල්වැට සකස් කිරීම ආදී නඩත්තු කාර්යයන් ඉටු කරන ලදී.

**කතරගම සංචාරක බංගලාව ගොඩනැගිල්ල අලුත්වැඩියාව**

මොණරාගල දිස්ත්‍රික්කයේ කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් වේ.

මෙහි අවහිරතා සහිත ශාකවල අතු ඉවත් කිරීමත්, බිත්ති විදුලි ලාම්පු යෙදීමත්, තීර රෙදි යෙදීමත්, තොග කාමරවල තිබූ සුළු අලුත්වැඩියා කටයුතුත් සිදු කරන ලදී.

**ඌව 04 කලාපය පවත්වාගෙන යාම**

මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම කලාපයේ බුදුරුවගල පුරාවිද්‍යා ස්ථානය මේ යටතේ නඩත්තු කරන ලදී. මේ අනුව දාගැබ සහිත නටබුන් පරිශ්‍රයේ ප්‍රවේශ මාර්ගය නියමු සැලසුම් ස්ථාවර නියෝගය අනුව ග්‍රැවල් හා සිමෙන්ති මිශ්‍රණයෙන් සකස් කරන ලදී.

**රඹුක්පොත මුදලින්දාරාම විහාරයේ පිළිමගෙයි වහල නඩත්තුව**

බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් වේ. ස්වාභාවික විපත් නිසා හායනයට ලක්ව තිබූ හෙයින් මෙය අලුත්වැඩියා කිරීමට යෝජනා විය. ඒ අනුව පිළිමගෙයි වහළෙහි උළු නැවත විධිමත් ලෙස සෙවිලි කර වහල නඩත්තු කටයුතු ඉටු කරන ලදී.

**කිරි ඔරුව රජමහා විහාරය**

බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් වේ. මෙහි පැරණි බෝධිය සහිත බෝධි බැම්මේ සෝදා පාළුවට ලක්ව ඇති කොටසක් තහවුරු කිරීම මෙම වසරේ සිදු කරන ලදී.

**බුදුගේ කන්ද ලෙන් විහාරයේ වහල නඩත්තුව**

බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් වේ. අධික වර්ෂාව නිසා හානී පැමිණ තිබූ මෙම විහාරයේ වහල අලුත්වැඩියා කරන ලදී.

**කොටසර පියංගල විහාරයේ ආවාසගෙයි නඩත්තුව**

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත්ය. මෙහි ආවාස ගෘහයෙහි වහලෙහි දිරාපත් වූ දැව රාමු සහ රීප්ප ඉවත් කර අලුත් දැව යොදා සකස් කරන ලදී. ගෙබිමෙහි කඩතොළු ස්ථාන සඳහා සිමෙන්ති යෙදීමත් ටෙරාකොටා අතුරා ස්ථාන වලට කුස්තුර පිරවීමත් සිදුකරන ලදී.

**මුතියංගන රජමහා විහාරය**

බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් වේ. ඓතිහාසික මුතියංගණ රජමහා විහාරයේ සලපතල මළුව ගල් යොදා සකස් කරන ලදී.

**බදුල්ල කච්චේරි භූමියේ පිහිටි පැරණි අම්බලම නඩත්තුව**

බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මෙම ස්ථානය අයත් වේ. මෙහි වහල අලුත්වැඩියා කර නඩත්තු කරන ලදී.

**දියතලාව ක්ෂෙත්‍ර නිවාසය පවත්වාගෙන යාම සහ අලුත්වැඩියාව**

බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ස්ථානය පිහිටා ඇත. මෙම ක්ෂෙත්‍ර නිවාසයේ අලුත්වැඩියා කිරීම් සහ වර්ෂය පුරා පවත්වාගෙන යාම ඉටු කරන ලදී.

**ඌව 04 කලාපය පවත්වාගෙන යාම.**

මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මෙම කලාපයේ බුදුරුවගල පුරාවිද්‍යා ස්ථානය මේ යටතේ නඩත්තු කරන ලදී.

**දඹාන ආදිවාසි තිසා හාමිගේ නිවස ප්‍රතිසංස්කරණය කිරීම.**

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ආදිවාසි ජීවමාන ගම්මානයක් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ තිසාහාමිගේ නිවස ප්‍රතිසංස්කරණය කරන ලදී.

අඩක් නිමකරන ලද කාමරයක් සහා තවත් කුටි 02ක් සහිත මෙම නිවස ගරාවැටී අබලන් තත්වයේ තිබුණි. ඉලුක් සෙවිලි කර තිබූ වහලය ද දිරාපත් වී තිබුණි. කොපා සහ තලං යන වර්ගවල දැව කණු යොදා වරිච්චි බිත්ති බැඳ, වහලය සම්පූර්ණයෙන්ම ගලවා ලිහිණියා කෝටු සහ එම පට්ටවලින් බැඳ ඉලුක් සෙවිලි කරන ලදී. ඉන්පසු වරිච්චි බිත්තිය ඔප දැමීම, වටපිල

සැකසීම, ගෙබිම මැටි තලා නැවත මැටි ගෑම මෙම කාර්යය යටතේ සිදුකර මෙම නඩත්තු කටයුතු නිමකරන ලදී.

**නාගදීප සංචාරක නිවාසය නඩත්තු කිරීම සහ පවත්වාගෙන යෑම.**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ස්ථානය පිහිටා ඇත. මෙම ව්‍යාපෘතියේ නඩත්තු කාර්යයන් යටතේ උද්‍යාන අලංකරණ කිරීම පහත සඳහන් කාර්යයන් මගින් ඉටුකරන ලදී.

සංචාරක බංගලාවේ අවට පරිශ්‍රය පිරිසිදු කර, තණකොල කපා පිවිසුම සැකසීමත් මල් පැල සිටුවීමත් සිදුකරන ලදී. සංචාරක නිවාසයේ අභ්‍යන්තර සහ බාහිර නඩත්තු කිරීම යටතේ විදුලි පද්ධතිය යථාවත් කිරීම, මුලුතැන්ගෙයි සේදුම් බේසම සකස් කිරිමත්, ඉදිරිපස ප්‍රධාන දොර අගුලු යෙදීම හා ඒවා අලුත්වැඩියා කිරීමත් සිදුකරන ලදී. මේ අනුව මෙහි තිබූ ප්‍රධාන අඩුපාඩු කිහිපයක් යථාවත් කරමින් නඩත්තු කාර්යය නිම කරන ලදී.

## කෞතුකාගාර අංශය

### උතුරු මැද පළාත

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවැත්වීමට නියමිතව තිබූ 2012 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව තන්තිරිමලය නව කෞතුකාගාරයේ ගොඩනැගිල්ල මෙම වසරේ දී ඉදිකරන ලදී.

### ඌව පළාත

මාළිගාවිල පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයේ කෞතුකාගාර ප්‍රදර්ශන සැලසුම සකස් කිරීම.

### සබරගමු පළාත

දැදිගම පුරාවිද්‍යා කෞතුකාගාරයේ සංරක්ෂණයට භාජනය කිරීමට යෝජිතව තිබූ පුරාවස්තු සංරක්ෂණය කිරීම සහ එම කෞතුකාගාර ප්‍රදර්ශනයෙහි ප්‍රතිසංවිධාන කටයුතු ආරම්භ කිරීම.

පසුගිය වසරෙහි ආරම්භ කරන ලද දැලිවල පුරාණ විහාරස්ථානයේ කෞතුක භාණ්ඩ ලේඛනගත කිරීමේ කාර්යය මේ වසරේ දී අවසන් කිරීම.

මඩුවන්වෙල වලව්ව පුරාවිද්‍යාත්මක ස්මාරකයෙහි ආරම්භ කිරීමට යෝජිත පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානය සඳහා ප්‍රදර්ශන විස්තර පුවරු නිර්මාණය කිරීම.

### දකුණු පළාත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා නෙදර්ලන්ත සහයෝගිතා වැඩසටහන යටතේ සංරක්ෂණය කරන ලද මාතර ඓතිහාසික තාරකා කොටුවේ පිහිටුවන ලද පුරාවිද්‍යා කෞතුකාගාරය ශ්‍රී ලංකාවේ නෙදර්ලන්ත වැඩබලන තානාපති අතිගරු බාස් ෆන් නූර්ඩෙන මැතිතුමාගේ සහභාගීත්වයෙන් ජාතික උරුමයන් පිළිබඳ ගරු අමාත්‍ය ආචාර්ය ජගත් බාලසූරිය මැතිතුමා අතින් 2011 ජුනි 28 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

මුල්කිරිගල පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානය මහජන ප්‍රර්ශනයට සුදුසු ආකාරයෙන් ප්‍රදර්ශන සැලසුම සකස් කිරීම.

ස්ථානීය පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයක් වශයෙන් කසාගල පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානය මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීම.

### උතුරු පළාත

මෙම වර්ෂයේ දී වව්නියා කෞතුකාගාරයේ තැන්පත් කර තිබූ සියලුම පුරාවස්තු මිනුම්ගත කිරීම, දළ සැලසුම් ඇඳීම සහ විස්තර ඇතුලත් කරමින් දළ ආකෘති පත්‍රයට අනුව විධිමත් පරිදි ලේඛනගත කිරීම සිදු කරන ලදී.

## වයඹ පළාත

පඬුවස්නුවර කෞතුකාගාරයේ පැරණි ගොඩනැගිල්ල මහජන ප්‍රදර්ශනයට සුදුසු ආකාරයෙන් නවීකරණය කිරීම.

යාපහුව, පුත්තලම සහ රාජාංගනය යන තොරතුරු මධ්‍යස්ථානවල තැන්පත් කර තිබූ සංරක්ෂණයට භාජනය කළ යුතු සියළුම පුරාවස්තු ප්‍රධාන කාර්යාලයේ සංරක්ෂණ අංශය වෙත යොමු කිරීම.

ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්ගමුව පොලිස් වසමට අයත් අන්කෙන්ද වැව ප්‍රදේශයෙන් හමු වූ පඬුවස්නුවර කෞතුකාගාරයේ තැන්පත් කර තිබූ හිටි බුද්ධ ප්‍රතිමාව ගල්ගමුව බුදුරුවකන්ද විහාරාධිපති හිමියන්ගේ ඉල්ලීම පරිදි සති දෙකක කාලයක් සඳහා තාවකාලික ප්‍රදර්ශනය සඳහා ලබා දෙන ලදී.

## මධ්‍යම පළාත

මහනුවර කෞතුකාගාරයේ අක්‍රමවත්ව තැන්පත් කර තිබූ පුරාවස්තු සුරක්ෂිතව ගබඩා කිරීම සහ කෞතුකාගාරයේ ප්‍රතිසංවිධාන කටයුතු ආරම්භ කිරීම.

## නැගෙනහිර පළාත

දීඝවාපිය කෞතුකාගාරයේ වහලය අලුවැඩියාව සහ ගොඩනැගිල්ලේ ප්‍රතිසංවිධාන කටයුතු සිදු කිරීම.

## බස්නාහිර පළාත

මහජන ප්‍රදර්ශනය සඳහා කෞතුක භාණ්ඩ පිළිබඳ සහ කෝට්ටේ යුගය පිළිබඳ නරඹන්නන් හට විධිමත් දැනුමක් සහ අධ්‍යාපනයක් ලබා දීම සහ කෞතුකාගාරය ප්‍රසන්න ස්ථානයක් බවට පත් කිරීමේ අරමුණු ඇතිව මෙම වසරේ දී කෝට්ටේ පුරාවිද්‍යා කෞතුකාගාරයේ පුරාවිද්‍යා සති වැඩසටහන යටතේ විස්තර පුවරු නිර්මාණය කිරීම සිදු කරන ලදී. එම කෞතුකාගාරයේ සංරක්ෂණයට භාජනය කළ යුතුව තිබූ කෞතුක වස්තු 19 ක් පමණ රසායන සංරක්ෂණ කටයුතු සඳහා ප්‍රධාන කාර්යාලයේ සංරක්ෂණ අංශය වෙත යොමු කරන ලදී.

කොළඹ පරම විඥානාර්ථ බෞද්ධ සංගම් නිර්මාතෘ සෙන්පති ස්ටීල් ඕල්කට්තුමා සහ සංගමයේ ඉතිහාසය අන්තර්ගත කෞතුකාගාරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රදර්ශන සැලසුම් සකස් කර දෙන ලදී.

පොකුණුවිට කිත්සිරි මෙවන් රජමහා විහාරයේ කෞතුකාගාරයක් ආරම්භ කිරීම සඳහා ප්‍රදර්ශන සැලසුම් සකස් කර දෙන ලදී.

ශ්‍රී ලංකාවාසී සැමට ජාතික වශයෙන් සහ ඓතිහාසික වශයෙන් වැදගත්වන ඉපැරණි බුද්ධ ප්‍රතිමා මෙන් ම දුටුගැමුණු මහ රජුගේ භෂ්මාවශේෂ වැනි දුර්ලභ බෞද්ධ පුරාවස්තු ප්‍රදර්ශනය කරමින් ජාතික බෞද්ධ උරුමයේ මහඟු අගය පිළිබඳ අවබෝධ කර දීමේ පරමාර්ථය පෙරදැරිව ''පින්බර ලංකා'' යන තේමාව යටතේ මැයි මස 18 - 31 දක්වා කොළඹ කෞතුකාගාරයේ පැවති ප්‍රදර්ශනය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් පුරාවිද්‍යා කෞතුකාගාරයන්හි සහ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කර තිබූ දුර්ලභ පුරාවස්තු කිහිපයක් එම ප්‍රදර්ශනය සඳහා තැන්පත් කරන ලදී. එසේ ලබා දුන් පුරාවස්තු අතරින් උස 105cm පළල 30cm හා බර 75k 500g වූ කුඹුක්ගැටේ කෝම්බුව රජමහා විහාරයෙන් හමු වූ කෝම්බුව ලෝකඩ බුද්ධ ප්‍රතිමාව සහ ලෝකඩින් නිමවන ලද කොටස් පහකින් යුතුව තිබූ පල්ලම ලෝකඩ බුද්ධ ප්‍රතිමාව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් සංරක්ෂණය කිරීමෙන් අනතුරුව ස්ථිර ප්‍රදර්ශනය සඳහා එම දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදී.

කොත්මලේ ගාමිණී දිසානායක මධ්‍ය මහා විද්‍යාලයේ පවත්වන ලද පුරාවිද්‍යා ජංගම ප්‍රදර්ශනයට සමගාමීව ජූලි 28 සිට 31 දක්වා දුටුගැමුණු භෂ්මාවශේෂ සහ දුර්ලභ පුරාවස්තු කිහිපයක් ප්‍රදර්ශනය සඳහා ලබා දෙන ලදී.

සේරුවිල කැණීම් අවස්ථාවක දී හමු වූ අක්ෂර පේළි හතරකින් යුත් රන් මිශ්‍ර ලෝහ අක්ෂර පත් ඉරුව (6cm දිග, 1.3cm පළලින් යුත් 54mg බර) අභිලේඛන අංශයේ තිබී ආචාර්ය මාලනී ඩයස් මහත්මිය විසින් කෞතුකාගාර අංශය වෙත ලබා දෙන ලදී.

පොළොන්නරුව කෞතුකාගාරයේ තිබූ රන් මුදුවක් අභිලේඛන හා නාණක විද්‍යා අංශයේ වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ නාමල් කොඩිතුවක්කු මහතා භාරයේ තිබී කෞතුකාගාර අංශය වෙත භාර දෙන ලදී.

නීලගිරි සෑය කැණීම් කටයුතු මඟින් හමු වූ රන් ධාතු කරඬු සහිත පුරාවස්තූන්, නියෝජ්‍ය අධ්‍යක්ෂ නිමල් පෙරේරා මහතාගෙන් කෞතුකාගාර අංශය වෙත භාර ගන්නා ලදී.

2010 වර්ෂයේ දී හල්මිල්ලවැටිය ස්තූප කැණීමෙන් හමු වූ ලෝකඩ ප්‍රතිමාව රසායන සංරක්ෂණ අංශයෙන් අනතුරුව ප්‍රදර්ශන කටයුතු සඳහා කෞතුකාගාර අංශය වෙත භාර දෙන ලදී.

මීරිගම නගර සභා පිටියේ දී පවත්වන්නට යෙදුණු පුරාවිද්‍යා ජංගම ප්‍රදර්ශනය සඳහා 2011.12.13 සිට 18 දක්වා දුටුගැමුණු භෂ්මාවශේෂ ලබා දෙන ලදී.

# ප්‍රවර්ධන අංශය

## බස්නාහිර පළාත

ප්‍රධාන කාර්යාලයේ ප්‍රවර්ධන අංශය මඟින් මෙම වර්ෂය තුළ ව්‍යාපෘති 64 ක් ක්‍රියාත්මක කරන ලදි. එම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු මෙහි අඩංගු වේ.

**ජාතික පුරාවිද්‍යා සමුළුව**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් වසර පුරා ක්‍රියාත්මක වන වැඩසටහන් අතරින් ජාතික පුරාවිද්‍යා සමුළුව ඉතා ම උත්කර්ෂවත් අන්දමින් පවත්වන සුවිශේෂී උත්සවයකි. ක්ෂේත්‍රයේ ජ්‍යෝෂ්ඨ පුරාවිද්‍යාඥයින් හා අංකුර පුරාවිද්‍යාඥයින් පමණක් නොව පුරාවිද්‍යා විෂයයට අනුබද්ධ අනෙකුත් විෂයන්වල විද්වතුන් ඒකරාශී වන ඉකුත් වසරේ හා ආසන්න වසරවල ඔවුන් විසින් සිදු කළ පුරාවිද්‍යා පර්යේෂණයන් හා අනාවරණයන් පිළිබඳ තොරතුරු සාකච්ඡා කෙරෙන අවස්ථාවක් ලෙස මෙය හඳුන්වා දිය හැකි ය.

ජාතික පුරාවිද්‍යා දිනය සෑම වසරක ම ජූලි මස 07 වෙනිදාට යෙදෙන අතර, එදින හෝ ඊට ආසන්න දිනයක දී (ඇතැම් විට දින 02 ක් හෝ 03 ක්) ජාතික පුරාවිද්‍යා සමුළුව පවත්වනු ලැබේ.

මෙම වසරේ ජූලි මස 17 සහ 19 දෙදින පුරා මෙම සමුළුව පවත්වන ලදි. සමුළුවේ සමාරම්භක උත්සවය ජූලි මස 19 වන දින පෙ.ව. 9.00 සිට 11.00 දක්වා ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය ජගත් බාලසූරිය මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කෞතුකාගාර දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදි පැවැත්වුණි ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් කාන්ති විජේතුංග මහත්මිය මෙහි විශේෂ ආරාධිත අමුත්තා විය. මෙයට අමතරව ජාතික කෞතුකාගාර, ජාතික ලේඛනාරක්ෂක යන දෙපාර්තමේන්තුවල නිලධාරින්, මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරින් විශ්ව විද්‍යාලවල කථිකාචාර්යවරු, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් හා පුරාවිද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ ක්ෂේත්‍රවල විද්වතුන්, පර්යේෂකයන් ආදි පිරිස් සහභාගි වුහ. එහි සමාරම්භක උත්සවයේ දී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කෙරිණි.

1. ජාතික පුරාවිද්‍යා සමුළුව සඳහා වසර මුලදී පර්යේෂණ පත්‍රිකා කැඳවූ අතර එයින් පර්යේෂණ පත්‍රිකා 54 ක් තෝරා ගැණිනි. ඒවා ඇතුළත් කර සමුළු ප්‍රකාශනයක් එළිදැක්වීම සෑම වසරක ම සිදු කෙරේ. ඒ අනුව මෙවර එම ප්‍රකාශනය ''පුන්කලස'' ලෙස නම් කළ අතර, එහි I වන වෙළුමේ කොටස් දෙකක් එළිදක්වන ලදි.
2. පුරාවිද්‍යා ස්ථාන හතරක් පිළිබඳ ව මාර්ගෝපදේශන ග්‍රන්ථ එළිදැක්වීම
3. දෙපාර්තමේන්තුවේ කාර්යයන් පිළිබඳ ව තොරතුරු ඇතුළත් වර්ෂයක් පාසා ප්‍රකාශයට පත් කෙරෙන ''දායාද'' පුවත්පතේ පස්වන කලාපය මෙවර එළිදක්වන ලදි.

4. ඉකුත් වර්ෂයේ  ශ්‍රී ලාංකේය පුරාවිද්‍යා උරුමයේ යහ පැවැත්ම වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් කළ ආයතන හා පුද්ගලයින් සඳහා සම්මාන ප්‍රදානයක් ද මෙහිදී සිදුවිය. ඒ අනුව,

   1 ලංකා බැංකුවේ සභාපති.

   2 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

   3 ව්‍යාපාරික ආනන්ද පතිරණ මහතා

   යන අයට සම්මාන ප්‍රදානය කෙරිණි.

## Mobitel M Guide සේවාව

මොබිටෙල් ආයතනය, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සිදු කෙරෙන මොබිටෙල් එම් ගයිඩ් සේවාව එළිදැක්වීම ද මෙවර ජාතික පුරාවිද්‍යා සමුළුවේ දී සිදු වූ තවත් වැදගත් සිදුවීමකි. මෙම එම් ගයිඩ් සේවාව මඟින් ජංගම දුරකථනයෙන් අංක 888 ඇමතීමෙන් පුරාවිද්‍යා ස්ථාන, පුරාවිද්‍යා කටයුතු පිළිබඳව තොරතුරු ලබා ගැනීමට හැකියාව උදා වේ.

මෙවර දේශන සැසිවාර අවසන් වූ පසු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 2010 වර්ෂය තුළ කළ කාර්යයන් හා ඒවායේ ප්‍රගතිය පිළිබඳ විශේෂ දේශන සැසිවාරයක් සියලු අංශ (පාලන හා ගිණුම් අංශ හැර) ප්‍රධානීන්ගේ දායකත්වයෙන් පවත්වන ලදී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උපදේශක ආචාර්ය සිරාන් දැරණියගල මහතා මෙහි මුලසුන හොබවන ලදී.

## ප්‍රදර්ශන

ප්‍රවර්ධන අංශය මඟින් පහත සඳහන් ස්ථානවල පුරාවිද්‍යා ප්‍රදර්ශන සංවිධානය කරන ලදි. පාසල් දරුවන්, විශ්වවිද්‍යාල සිසුන් හා මහජනතාව පුරාවිද්‍යා උරුමය පිළිබඳ ව දැනුවත් කිරීම මෙහි අපේක්ෂාව විය.

i. දෙල්ගොඩ රාජ මහා විහාරය
ii. 2600 වෙනි සම්බුද්ධත්ව ජයන්තියට සමගාමීව දුටුගැමුණු හෂ්මාවශේෂ දැක්මක් ජාතික කෞතුකාගාර පරිශ්‍රයේ දී පවත්වන්නට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු කරන ලද්දේ එහි සංවිධානය කරන ලද පින්බර ලංකා ප්‍රදර්ශනය සඳහාය. මෙහි දී දුටුගැමුණු රජුගේ පිළිරුවක් ෆයිබර් ග්ලාස්වලින් සකස් කර ප්‍රදර්ශනය කෙරුණු අතර, අනුරාධපුර රුවන්මැලි සෑ මළුවේ ඇති පිළිමය මේ සඳහා ආදර්ශ කරගන්නා ලදී.
iii. ජාඇල ප්‍රාථමික විද්‍යාලය
iv. පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය
v. මීගමුව නිව්ස්ටඩ් බාලිකා විද්‍යාලය
vi. කිරිඳිවැල ජනානන්ද විද්‍යාලය
vii. ශාන්ත මරියා විද්‍යාලය, මට්ටක්කුලිය

viii. මීගමුව කදිරාන යටියල ශ්‍රී වාලුකාරාම විහාරය

ix. එමෙන් ම මෙරට පුරාවිද්‍යා උරුමය පිළිබඳ ව මහජනයා තුළ ඇල්මක් ඇති කිරීම, දැනුම වර්ධනය කිරීම හා එතුළින් මෙම උරුමය රැක ගැනීමට ජනතාව තුළ පෙළඹවීමක් ඇති කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් ආයතනය හා එක්ව පුරාවිද්‍යා ජංගම ප්‍රදර්ශනයක් නිර්මාණය කරන ලදි. එම ප්‍රදර්ශනය විවෘත කිරීම වෙනුවෙන් උත්සවයක් සංවිධානය කෙරිණි.

x. පුරාවිද්‍යා ජංගම ප්‍රදර්ශනයක් කොත්මලේ දී සංවිධානය කෙරිණි. ඊට සමගාමීව දුටුගැමුණු රජුගේ භෂ්මාවශේෂ ප්‍රදර්ශනයක් ද පැවැත්විණි.

xi. ප්‍රවර්ධන අංශය මගින් කසාගල රාජ මහා විහාරය සහ මාතර වෙහෙරහේන විහාරය යන ස්ථානවලදි ජංගම ප්‍රදර්ශන පැවැත්විණි.

xii. 2011 වර්ෂයේ පෙබරවාරි මස 04 සිට 10 දින දක්වා බුත්තල දී පැවැත්වූ 'දැයට කිරුළ' ප්‍රදර්ශනය සඳහා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය මඟින් විශාල ප්‍රමාණයේ ප්‍රදර්ශන කුටියක් නිර්මාණය කරන ලදී. එම ප්‍රදර්ශන කුටිය තුළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, ජනකලා කේන්ද්‍රය, ගාලු උරුමය පදනම ආදි ආයතනවල ප්‍රදර්ශන ඇතුළත් විය. එසේ වුව ද සමස්ත කුටිය නිර්මාණය කිරීමේ ප්‍රධාන වගකීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පැවරී තිබුණු අතර ප්‍රධාන කාර්යාලය, ඌව පළාත් කාර්යාලය හා එක්ව එය සංවිධානය කරන ලදී. මෙම ප්‍රදර්ශනය නම් කරන ලද්දේ "අපේ අතීත උරුමය - ප්‍රාග් මානව සංස්කෘතිය" නමිනි. එය කාගේත් අවධානයට ලක් විය.

xiii. තව ද මෙම වර්ෂය තුළදී ම 'වසන්ත උද්‍යානය' නමින් ප්‍රදර්ශනයක් බණ්ඩාරවෙල දී සංවිධානය කෙරිණි. මේ සඳහා ප්‍රදර්ශන කුටියක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කෙරිණි. මෙරට පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජනයා දැනුවත් කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය.

xiv. පාසල් දූ දරුවන් හා විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් තුළ මෙරට පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ දැනුවත් භාවයක් ඇති කිරීමේ අරමුණින් නැගෙනහිර විශ්වවිද්‍යාලයේ අම්පාර ඔලුවිල් මණ්ඩපය තුළ පුරාවිද්‍යා ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී. 2011 දෙසැම්බර් මස 01 වෙනිදා සිට 08 වෙනිදා දක්වා මෙය පැවැත්විණි.

**පුහුණු/වැඩමුළු**

මෙම වර්ෂයේ දී දෙපාර්තමේන්තු නිලධාරින් හා සේවකයන් වෙනුවෙන් පහත සඳහන් දේශන, පුහුණු වැඩමුළු පවත්වන්නට යෙදුණි.

1. සංරක්ෂණ ශිල්පි පුහුණු වැඩමුළුව
2. ගිණුම් අංශයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන
3. පාලන අංශයේ නිලධාරීන් සඳහා හැකියා වර්ධන වැඩසටහන
4. පරිපාලනමය නීති සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ වැඩමුළුව

5. ඵලදායීතාවය ඉහළ නැංවීමේ වැඩමුළු - වාරියපොළ සහ මහරගම
6. පරිගණක පුහුණු පාඨමාලාව - මිලෝදා ආයතනය
7. බිතුසිතුවම් සංරක්ෂණ පුහුණු වැඩමුළුව - මයුරගිරිය
8. පාලන අංශයේ හැකියා වර්ධන වැඩසටහන - කොළඹ
9. ග්‍රාමීය මට්ටමින් පුරාවස්තු ආරක්ෂණය කිරීම සඳහා කමිටු පිහිටුවීම වෙනුවෙන් ප්‍රාදේශීය නිලධාරින් දැනුවත් කිරීම
10. දකුණු පළාත් නිලධාරීන් සඳහා ඉංග්‍රීසි භාෂා පාඨමාලා
11. උතුරු මැද පළාතේ පරිගණක පුහුණු වැඩමුළුව
12. ප්‍රලේඛන මූලාශ්‍ර සම්පාදනය පිළිබඳ වැඩමුළුව
13. දකුණු ආසියානු කලාව හා කෞතුක වස්තු වාර්තාකරණය පිළිබඳ වැඩමුළුවක් අගෝස්තු මස 08 හා 09 දෙදින දෙපාර්තමේන්තු නිලධාරීන් වෙනුවෙන් සංවිධානය කළ අතර, වැඩමුළුව පවත්වන ලද්දේ මහාචාර්ය ඔස්මන්ඩ් බෝපෙආරච්චි මහතා විසිනි. මේ සඳහා දෙපාර්තමේන්තු නිලධාරින් 105 දෙනෙක් සහභාගි වූහ.
14. අස්ථි අධ්‍යයන වැඩමුළුව I, II (සත්ව හා මානව අස්ථි අධ්‍යයනය 2011.12.04 සිට 2011.12.13 දක්වා)
15. නිලධාරින් පුහුණු කිරීමේ වැඩමුළුව - සබරගමු පළාත
16. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් සංවිධානය කරන ලද "Productivity Concept and Practices" වැඩමුළුව දෙදිනක් පුරා පැවැත්වුණු අතර, ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධාරින් දෙදෙනෙකු සහභාගි විය.

මෙම දේශීය වැඩමුළු පුහුණු හා සම්මන්ත්‍රණ මෙන් ම නිලධාරින් සඳහා විදේශීය පුහුණු හා වැඩමුළුවලට ද ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා ද මෙවරත් අවස්ථාව ලබා දෙන ලදි.

1. ඉන්දියාවේ ඩෙකෑන් විශ්වවිද්‍යාලයේ පැවති අස්ථි අධ්‍යයන වැඩසටහන සඳහා නිලධාරින් දෙදෙනෙකු සහභාගී කරවීම.
2. ඉන්දියාවේ කල්කටාහි පැවති පුරාවිද්‍යා ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් සහභාගි විය.
3. තායිලන්තයේ පැවති යුනෙස්කෝ සංවිධානය මඟින් පවත්වන ලද මුහුදු පුරාවිද්‍යා පදනම් පාඨමාලාව සඳහා නිලධාරියෙකු සහභාගි වීම.
4. බ්‍රසීලයේ Dutch Ministry of Foreign Affairs, The Netherlands Institute for Cultural Heritage (ICN) and Cultural Heritage agency of Ministry of Education, Culture and Science Netherlands මඟින් පවත්වන ලද Managing Indoor Climate Risks පුහුණු පාඨමාලාව සඳහා නිලධාරියෙකු සහභාගි විය.

5. දකුණු කොරියාවේ පැවති යුනෙස්කෝ වැඩමුළුව මෙන් ම 2009 වර්ෂයේ ඩෙකෑන් විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා හැදෑරීම ආරම්භ කරන ලද නිලධාරින් සඳහා පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු හා ගුවන් ටිකට්පත් ගාස්තු ගෙවන ලදි.
6. ඉන්දියානු පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුබද්ධ පුරාවිද්‍යා අධ්‍යයන ආයතනයේ (Institute of Archaeology) එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා නිලධාරීන් දෙදෙනෙකු හා සය මාසික පාඨමාලාව සඳහා නිලධාරීන් තිදෙනෙකුට අධ්‍යයන කටයුතු සඳහා අවස්ථාව ලබා දෙන දෙන ලදි.
7. First Aid to Cultural Heritage in times of Conflict නමින් ICCROM ආයතනය විසින් පවත්වනු ලැබූ ඉතාලියේ රෝමයේ පැවැති පාඨමාලාව සඳහා නිලධාරිනියක් සහභාගී වූවාය.

**දේශන**

01. හිටපු පුරාවිද්‍යා කොමසාරිස්වරයෙකු වූ මහාචාර්ය සෙනරත් පරණවිතාන අනුස්මරණය කිරීමේ දේශනයක් මේ වසරේ ජනවාරි මස 21 වන දින ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි. මහාචාර්ය සෙනරත් පරණවිතාන පදනම මඟින් සංවිධානය කළ මෙම දේශනය සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන ලදි.
02. වයඹ පළාත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීම.
03. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට හා ප්‍රදර්ශනයට සමගාමීව පුරාවිද්‍යා කටයුතු පිළිබඳ ව රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීම.
04. මධ්‍යම පළාත් කාර්යාලය මඟින් පවත්වන ලද ශාස්ත්‍රීය දේශන මාලාව.

**පුස්තකාලය**

2011.03.29 වන දින සිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුස්තකාලය ප්‍රථම ශ්‍රේණියේ දෙපාර්තමේන්තු පුස්තකාලයක් ලෙස ශ්‍රේණිගත කරන ලදි.

**මාධ්‍යවේදීන් දැනුවත් කිරීම**

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය ගරු ආචාර්ය ජගත් බාලසූරිය මැතිතුමාගේ උපදෙස් පරිදි යාපනය අර්ධද්වීපයේ පුරාවිද්‍යා උරුමය පිළිබඳ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ ගවේෂණ චාරිකාවක් සංවිධානය කරන ලදී. මේ සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා ද සහභාගි විය.

මෙරට ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතනවල ජනමාධ්‍යවේදීන් උදෙසා මෙය සංවිධානය කෙරිණි. මෙම වැඩසටහන ඉතාමත් ම සාර්ථකත්වයට පත් වූ අතර, යාපනයේ පුරාවිද්‍යා ස්මාරක පිළිබඳ ව පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් ද ලැබිණි.